



★ 

# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின



අද පත්‍රය සමඟ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ අධි වප් පුර පසළොස්වක ලත් ගුරු දින | කාණ්ඩය 111 | පත්‍රය 246 | පිටු 36 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 01 බ්‍රහස්පතින්දා

## කොන්ත්‍රාත්කරුවන්ට සැපයුම්කරුවන්ට

# යහපාලන රජය නොගෙවූ කෝටි 22600ක් ගෙවයි

ජයසිරි මුණසිංහ

ප්‍රසුගිය රජය සමයේ කොන්ත්‍රාත්කරුවන්ට සහ රජයේ සැපයුම්කරුවන්ට නොගෙවා තිබූ රුපියල් කෝටි 24200ක (බිලියන 242) මුදලින් රුපියල් කෝටි 22600ක (බිලියන 226) පෙරේදා වන විට ගෙවා අවසන් කළ බව මුදල් අමාත්‍යාංශ ලේකම් එස්.ආර්. ආටිගල මහතා අවධාරණය කළේය.

පිට 06

## නවීන අවි ගත් කල්ලියක් කිඹුලාපිටියේ නිවෙසකින්

# කෝටි 4ක රන් - මුදල් කොල්ලකති





චන්ද්‍රිකා පෙරේරා සහ කොටදෙණියාව සමූහ එම්.පී. කුමාර

නවීන පන්නයේ අවි ගත් පස් දෙනකුගෙන් යුතු පාතාල කල්ලියක් කටාන කිඹුලාපිටියේ පිහිටි කෝටිපති ව්‍යාපාරිකයකුගේ නිවෙසකට ඊයේ (30) පෙරවරුවේ ඇතුළු වී, රුපියල් කෝටි තුනක මුදලක් සහ කෝටියකට ආසන්න වටිනා රන් භාණ්ඩ කොල්ලකා පලා ගොස් තිබේ.

පිට 06

# විදේශ ආයෝජනවලට ශ්‍රී ලංකාව විවෘතයි

■ ජනපති නව තානාපතිවරුන්ට දැනුම් දෙයි පිට 06



## 2021 අය-වැය නොවැම්බර් 17 දා

ජයසිරි මුණසිංහ

ලබන වසර (2021) සඳහා වූ අය වැය ලබන නොවැම්බර් 17 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව මුදල් අමාත්‍යාංශ ලේකම් එස්.ආර්. ආටිගල මහතා ප්‍රකාශ කළේය.

පිට 06

## ලෝක ළමා හා වැඩිහිටි දිනය අද

සිතාරා සේනානි, සන්ධ්‍යා කරුණාරත්න

ලෝක ළමා දිනය හා ලෝක වැඩිහිටි දිනය අදට (01) යෙදී තිබේ.

'අපේ රට - අපේ දැතින්' තේමාව යටතේ මෙවර ළමා දින ජාතික උත්සවය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේදී හෙට (2) පෙරවරුවේ පැවැත්වේ.

පිට 06



ලෝක ළමා දිනය අදයි. නව ලොවට යා වුණු පරිගණක තිරයට එබී සිටින මේ දීප්තිමත් සිඟිති මුහුණු පවසන්නේ ජාතියේ හෙට දවසේ සුබ පෙරනිමිති නොවේ ද?

*ඡායාරූපය - විමල් කරුණාතිලක*

## පෙරපාසල් විවිධ ප්‍රසංගවලට අවසර

සිතාරා සේනානි

කොවිඩ් වසංගතය හේතුවෙන් තාවකාලිකව පැවැත්වීම අත්හිටුවා තිබූ පෙර පාසල් විවිධ ප්‍රසංග සෞඛ්‍ය නීතිරීතිවලට අනුකූලව යළි ආරම්භ කිරීමට තීරණය කළ බව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහතා පවසයි.

පිට 06

## පෞරාණිකත්වයට හානි නොකර කොළඹ පැරණි ගොඩනැඟිලි පිළිසකර කරන්න

ජනපති-අගමැති නිලධාරීන්ට උපදෙස් දෙති පිට 06

## පළමු වසරට ඇතුළත් කිරීමේදී මින් පසු නිවෙසේ ඔප්පුවට ලකුණු නෑ

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි

පාසල්වල පළමු වසරට ළමයින් ඇතුළත් කිරීමේදී නිවෙසේ ඔප්පුව තහවුරු කිරීම සඳහා ලකුණු දීමේ ක්‍රමය ඉවත් කිරීමට රජයේ අවධානය යොමු වී ඇතැයි ජනමාධ්‍ය ඇමැති, සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා කියයි.

පිට 06

## සජිත්ගේ ජන හමුවකට ගල්ගැසුවැයි 2ක් අත්අඩංගුවට

චන්ද්‍රිකා පෙරේරා

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ රත්මලානේ පෙරේදා (29) පැවති ජන හමුවකට ගල් මුල්වලින් පහර දුන් සැකකරුවන් දෙදෙනකු පොලීසිය ඊයේ (30) අත්අඩංගුවට ගෙන තිබේ. මෙසේ අත්අඩංගුවට ගත් දෙදෙනා රත්මලාන රෂ්ටම්වත්ත ප්‍රදේශයෙ පදිංචි අවුරුදු 21 සහ 40 වයස්වල පසුවන්නන් බව පොලීසිය පැවසීය.

පිට 06

## එජාප ඉදිරි ගමන කෙසේ විය යුතු ද? වාර්තාව ලබන සතියේ රනිල් අතට

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතාගේ අධීක්ෂණය යටතේ සැකසුණු පක්ෂයේ ඉදිරි දේශපාලන ගමන් මාර්ගය කෙසේ විය යුතුදැයි යෝජනා ඇතුළත් වාර්තාව පක්ෂ නායක සහ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා වෙත ලබන සතියේ දී භාරදීමට නියමිතය.

පිට 06




## රැකියා සිහින මවා මුදල් ගත් අය ගැන විමර්ශන

පිට 06

## ඉස්ලාම් අන්තවාදය සම්බන්ධ යුද හමුදා බුද්ධි තොරතුරක් ආරක්ෂක ලේකම් ලෙස මට ලැබුණේ නෑ

පිට 06



## විපක්ෂ නායකට එරෙහි ප්‍රහාරය හෙළා දකිනවා

සමඟි ජන බලවේගයේ මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර

ශිවන්ති ප්‍රනාන්දු

රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ එක් කුලුනක් වන විපක්ෂ නායකවරයාට එරෙහිව පෙරේදා (29) නාඳුනන කණ්ඩායමක් එල්ල කළ ප්‍රහාරය සිය පක්ෂය හෙළා දකින බවත් ඒ පිළිබඳව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ඉදිරියේදී ගන්නා බවත් සමඟි ජන බලවේගයේ මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර මහතා ඊයේ (30) කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදී අවධාරණය කළේය.

පිට 06

## මංගලගේ කුරුඳු පොලු නඩුව ඉවරයි

පිට 06

දර්ශගේ 4වරං



★ නලින් බණ්ඩාර බලෙන් ඉන්න නිල නිවාසයෙන් එළියට දාන්න උසාවි නියෝග අරන්ලු බං..

♦ හපොයි.. පාරට වැටෙයිද දන්නෙ නෑ හාද්‍යාවි...

රේඩියෝ ගුරුවරයා ශිෂ්‍යත්ව විභාග II පත්‍රය අද දිනමිණ සමඟ

## ඉකුත් රජය සමයේ ගෙනවු සහල් මෙට්‍රික් ටොන් 600ක් හොර පාරේ කළු කඩවලට

පිට 06

# ප්‍රවීණ රංගන ශිල්පී ටෙනිසන් කුරේගේ දේහයට අගමැතිගෙන් අවසන් බුහුමන්.....





ශ්‍රී ලාංකික ප්‍රහසන රංග කලාවට නව මානයක් එක් කළ ප්‍රවීණ සිනමා, වේදිකා නාට්‍ය රංගන ශිල්පී හා අධ්‍යක්ෂවරයකු වූ ටෙනිසන් කුරේ මහතාගේ දේහයට අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (30) අවසන් ගෞරව දැක්වූ අයුරු. හිටපු පළාත් සභා මන්ත්‍රී මොරිස් විජේරත්න, මොරටුව උප නගරාධිපති සමන්ත සිල්වා, ප්‍රවීණ රංගධර බන්දු සමරසිංහ මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක් වූහ.

## ‘කම්පන’ ටෙලි චිත්‍රපටය අද ටීවී දෙරණින්

සමාජ ස්තරයන්හි සංකූලතා විචාරාත්මකව සංවාදයට ලක් කරන දිලූක ප්‍රසාද් ගුණතිලකගේ තිර රචනයක් සහ අධ්‍යක්ෂණයක් වන ටෙලි චිත්‍රපට මාලාවේ හතළිස් තුන්වැනි නිර්මාණය අද (01) යෙදෙන අධි වප් පොහෝ දින දහවල් 1.00ට ටී.වී. දෙරණ නාලිකාවේ විකාශනය වේ.



එම්. ඩබ්ලිව්. ක්‍රියේෂන්ස් නිෂ්පාදනයක් වන මේ ටෙලි චිත්‍රපටය සඳහා කැමරාකරණයෙන් මයුර කෞශල්‍ය, කලා අධ්‍යක්ෂණයෙන් සුරන්ජිත් බණ්ඩාර, සහාය අධ්‍යක්ෂණයෙන් නිමේෂ් ලක්මාල්, වේශ නිරූපණයෙන් උභය දිසානායක දායක වෙති.

මෙවර විකාශනය වන ටෙලි චිත්‍රපටය ‘කම්පන‘ නම් වේ. එහි රංගන දායකත්වයෙන් ජනක් ප්‍රේමලාල්, ගාමිණී ජයලත්, මාලි ජයවීර, නිමල් ජයසිංහ, රහල් බුලත්සිංහල වැනි ප්‍රවීණ රංගන ශිල්පීන් ශිල්පිනියන් දායක වී ඇත. වසර 2018 රයිගම් සම්මාන උලෙළේ හොඳම ටෙලි චිත්‍රපට අධ්‍යක්ෂණය වෙනුවෙන් ද, 2018 වසරේ රාජ්‍ය සම්මාන උලෙළේ ප්‍රශස්තම ටෙලි චිත්‍රපට අධ්‍යක්ෂණය වෙනුවෙන් ද, 2019 වසරේදී රයිගම් සම්මාන උලෙළේ ටෙලි චිත්‍රපට ප්‍රවර්ධනය උදෙසා ජූරියේ කුසලතා සම්මානයක් ද මේ ටෙලි චිත්‍රපටකරණය වෙනුවෙන් හිමි වී ඇත.

පොහෝ දිනයන්හිදී විකාශනය වන රූපවාහිනී වැඩසටහන් අතරට ටී.වී. දෙරණ රූපවාහිනී නාලිකාව හඳුන්වා දුන් මේ ටෙලි චිත්‍රපට ප්‍රේක්ෂකයාට නව අත්දැකීමක් විය.

## ලෝක ළමා දින පණිවිඩ

# රටේ අනාගත වත්කම අපේ දරු පරපුරයි

## ජනපති



රටේ අනාගත වත්කම අපේ දරු පරපුර බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සිය ලෝක ළමා දින පණිවිඩයෙන් කියා සිටියි.

දරුවන් දැනුමෙන් පෝෂණය කර කුසලතා වර්ධනය සඳහා අවස්ථාව සලසාදීම සමස්ත සමාජයේම වගකීම වන්නේයැයි ද ජනාධිපතිවරයා පවසයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිකුත් කළ ළමා දින පණිවිඩයේ මෙසේ ද දැක්වේ.

දරුවන්ගේ කායික මානසික පෝෂණය මෙන්ම යහපැවැත්ම තහවුරු කිරීම ප්‍රමුඛ කාලීන අවශ්‍යතාවකි.

රටක් ජාතික හෝ අන්තර්ජාතික සංවර්ධන නිර්ණායක කොපමණ දුරට ළඟා කර ගත්ත ද සමාජය මානව දයාව බඳු යහගුණ පිරි මනුෂ්‍යයන්ගෙන් තොර නම් එය ප්‍රතිරූප දේශයකැයි මම විශ්වාස නොකරමි. එවන් රටක් ගොඩනැඟීමට අප සියලු දෙනා ගුණ නැණ අතින් මෙන්ම ශිල්පීය වශයෙන් ද භාෂාමය ඥානයෙන් ද දරු පරපුර සන්නද්ධ කළ යුතුය.

භෞතික සහ මානසික දරිද්‍රතාව දුරු කළ පුරවැසියන් වාසය කරන රටක් ගොඩනැඟීම මගේ ඒකායන අපේක්ෂාවයි. එබඳු රටක දරුවන් සතුටින්, සැනසීමෙන්, සුවයෙන් වාසය කරනු නියතය. ඒ නියතය අත්දකින අත්විඳින පරපුරක් ගොඩනැඟීමට ඔබේ දරුවාගේ ළමා කාලය ඔබ කල්පනාකාරීව මෙහෙයවනු ඇතැයි මම සිතමි. මෙවර ලෝක ළමා දින තේමාව වන “අපේ රට අපේ දෑතින්” යන්න යථාර්ථයක් කර ගත හැක්කේ එවිටය.

# දරුවන්ගේ ලෝකය සුව පහසු ස්ථානයක් කිරීම සැමගේ වගකීමක්

## අගමැති



අනාගත ශ්‍රී ලංකාවේ අභිමානවත් උරුමකරුවන් වන අපගේ ආදරණීය දුවා දරුවන්ගේ ලෝකය සුව පහසු ස්ථානයක් බවට පත් කිරීම අප සැමගේ වගකීම බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පවසයි.

දරුවන් ලෝකයේ සියලු සෞන්දර්යයන් එකට කැටි කොට සොබාදහම නිමැවූ සොඳුරුතම දායාදය බවත් අපේ අනාගතය, අපේ ලෝකය ආදරණීය දරුවන් බව සිහිපත් කරමින් ලෝක ළමා දින ජාතික සැමරුමට සුබ පැතුම් එක් කරනුයේ ඉමහත් සතුටින් බව හෙතෙම පැවැසීය.

එම සුබ පැතුම් පණිවිඩයේ මෙසේද සඳහන් වේ.

අද ඔබගේ තුරුළෙහි හිනැහෙන, අව්‍යාජත්වය කැටිකර ගත් මේ ආදරණීය මුහුණු හෙට දවසේ අප රටේ අනාගතයයි. දරුවන්ගේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුව ඇති කාල වකවානුවක ඔවුන්ගේ ආරක්ෂාව, අධ්‍යාපනය හා සෙනෙහස ලැබීමට ඇති අයිතිය සුරක්ෂිත වන සේ සියලු මවුපියන්, වැඩිහිටියන් ප්‍රමුඛ සමස්ත සමාජයම ක්‍රියා කළ යුතුය. ඊට අවශ්‍ය සදාචාරමය හා නෛතික පසුබිම සැකසීමට අප රජයක් ලෙස නිරන්තරයෙන් කැප වී සිටී.

නිදහස් නිවහල් රටක දරුවන්ගේ ජීවිත සුරක්ෂිත හා පරිපූර්ණ ජීවිතයක් බවට පත් කිරීම සෑම මවුපියකුගේම ඒකායන අපේක්ෂාවයි. අපගේ අපේක්ෂාව වන්නේ රටේ සමාජ, ආර්ථික හා දේශපාලන ගැටලුවලින් පීඩා නොමැති පරිපූර්ණ සුන්දර ළමාවියක් රටේ සියලු දරුවන්ට උරුමකර දීමයි. පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරමින් නිදහස් අධ්‍යාපනය සුරක්ෂිත කිරීමටත්, නිදහස් සෞඛ්‍ය ආරක්ෂා කරමින් දරුවන්ගේ සෞඛ්‍ය, පෝෂණය හා මානසික අවශ්‍යතා සපුරාලීමටත්, රජයක් ලෙස අපි කටයුතු කරන බව අවධාරණය කරමු.

# දැනුම අභියෝගයක් නොවන අනාගතයකට අපි දරුවන් රැගෙන යමු

## අධ්‍යාපන ඇමැති



දරුවන් වෙනුවෙන් සියල්ල කළ යුතු බව, හොඳම දේ දරුවන්ට බව, අනාගතය දරුවන් බව ළමා දින සමරන සෑම වසරක ම දස දෙසින් අවධාරණය කරන සුලබ වදන්ය. එහෙත් දරුවන්ගේ ලෝකය දරුවන්ට පවරා දීම තුළ වැඩිහිටියන් දක්වන ප්‍රතිචාර ප්‍රශ්නකාරී වී ඇති බව මගේ පෞද්ගලික හැඟීමයි.

අසීමිතව දරුවන්ට ආදරය දෙන සෑම මව්පියෙකුට ම තමන්ගේ මුළු ජීවිත කාලයම දරුවන් වෙනුවෙන් මිඩංගු කළ හැකිය. දරුවන්ට දරුවන් සේ මතුවන්නට මඟ පෙන්විය හැකිය.

දරුවන් දළඹුවන් වැනිය. දළඹුවෙකු නියත වශයෙන් ම සමනලයකු වන බවට කිසිදු ලක්ෂණයක් දළඹු අවස්ථාවේ දී නොපෙන්වනවා නම් සියලු දළඹුවන් සමනලුන් කිරීම පැහැදිලිව ම අභියෝගයකි. එහෙත් දළඹුවන් සමනලුන් වනතුරු ඔවුන් නිසි පරිදි රැක බලාගැනීමේ ඒ අභියෝගය වැඩිහිටි පරපුරට පැවරෙයි. යම් දිනෙක සමනලුන් වන්නේ එසේ සුරක්ෂිතව හැදෙන වැඩෙන දළඹුවන්ය. ඔවුන්ට වැඩිහිටියන්ගේ පූර්ණ රැකවරණය නිරන්තරයෙන් ම අවශ්‍ය වෙයි. ඔවුහු ආදරය නොමඳව අපේක්ෂා කරති. පෝෂණය අපේක්ෂා කරති. මේ නිසා දරුවන් සතුටින් තැබීමට ඒ සියල්ල ඔවුන්ට ලබාදිය යුතුය. මවක, පියකු වශයෙන් පවුල තුළ ඒ සියල්ලට පූර්ණ හිමිකම ලබන දරුවා සමාජගත වන විට සමාජයෙන් ද නොඅඩුව ඔහුට හෝ ඇයට ඒ අවශ්‍යතා හිමිවිය යුතුය. පාසලට, ගුරුවරුන්ට, සමාජ නායකයන්ට, ආගමික සංස්ථාවට එහි දී පැවරෙන වගකීම අතිමහත්ය. ඒ සියල්ලටම වඩා මෙහිදී රජයට පැවරෙන කාර්යභාරය ද සුවිසල්ය.

මෙවර පැවැත්වෙන ලෝක ළමා දින ජාතික සමරු උලෙළ සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි සුබ පතමි. රට හදන සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් කරමින් අපේ වටිනාම සම්පත වන දරුවන් වෙනුවෙන් හොඳම දේ කරන්නට ඔබ සියලු දෙනාගේ ශක්තිමත් සහයෝගය ද අපේක්ෂා කරන්නෙමු.

# සුරක්ෂිත ළමා පරපුරක් තැනීමට අදිටන් කරගනිමු

## විපක්ෂ නායක



සුරක්ෂිත ළමා පරපුරක් හා නීරෝගි වැඩිහිටි පරපුරක් වෙනුවෙන් තිරසර අදිටන් ඇති කර ගැනීම මෙවර 2020 ලෝක ළමා දිනයේ සහ ලෝක වැඩිහිටි දිනයේ ප්‍රමුඛ අවශ්‍යතාව වී ඇති බව විපක්ෂ නායක සහ සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මහතා පවසයි.

ලෝක ළමා දිනය සහ ලෝක වැඩිහිටි දිනය වෙනුවෙන් විපක්ෂ නායකවරයා නිකුත් කළ විශේෂ නිවේදනයේ මේ බව සඳහන් වේ.

එම නිවේදනයේ වැඩිදුරටත් මෙසේද දැක්වේ.

ලෝක ළමා දිනය සහ ලෝක වැඩිහිටි දිනය වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ගැන අතිශයින් සතුටට පත්වෙමි. විශේෂයෙන්ම ළමා අයිතීන් සුරැකීම සඳහා ප්‍රමුඛතාව දීම සියලුම මානව වර්ගයාගේ අතිමහත් යුතුකම ලෙස ලෝකයම පිළිගනී. කෙසේ වෙතත් අන් කවරදාකටත් වඩා වර්තමානයේ දී දරුවන් අභියෝග රැසකට මුහුණ දී සිටී.

කෙසේ වෙතත් එවන් ශ්‍රී ලංකාවේ දැනට වැඩිහිටියන් සඳහා නිවාස 300ට වඩා ක්‍රියාත්මකය. වඩාත් සුරක්ෂිත, පවිත්‍ර ළමා පරපුරක් මෙන්ම නීරෝගි වැඩිහිටි පරපුරක් වෙනුවෙන් තිරසර අදිටනක් ඇති කර ගනිමුයැයි ආරාධනා කරමු.

# රටට වැඩදායි වැඩිහිටියන් බිහි කරන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

'වසංගත හමුවේ වැඩිහිටි අභියෝග' 2020 ජාත්‍යන්තර වැඩිහිටි දිනයේ මෙවර තේමාවයි.

වයස්ගත වීම, උපන් මොහොතේ සිට මරණය දක්වා නොනවත්වා සිදු වන ක්‍රියාවලියකි. මෙහි අවසන් අදියරේදී පුද්ගලයා වැඩිහිටි තැනැත්තකු ලෙස සලකනවා. එදින පටන් ඔහු හෝ ඇය වියපත් ජනගහනයේ කොටස්කරුවකු වෙනවා. වැඩිවන ලෝක ජනගහනය හමුවේ ශීඝ්‍රයෙන් වර්ධනය වන වියපත් ජනගහනය සමස්ත ලෝකයටම එක්තරා අභියෝගයක්. නමුත් ලංකාව තුළ වර්ධනය වන වැඩිහිටි ජනගහනය ශ්‍රී ලාංකේය සමාජයට අභිමානයකි. ඔවුන් ලංකාවේ අතීත උරුමයන් රටේ අනාගත පරපුර වෙත දායාද කිරීමට දායක වන වටිනා පිරිසකි. ශ්‍රී ලංකාවේ 2011 අංක 05 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත. ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුළින් ක්‍රියාකාරී, ජවසම්පන්න හා ඵලදායී වැඩිහිටි දිවියක් උදා කිරීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ දැක්මයි. වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය සහභාගීත්වය හා අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධනය කාර්යයයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය උනන්දු කරවීමත් හා දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැක දීමත් මේ ආයතනයේ මෙහෙවරයි.

ජාත්‍යන්තර වැඩිහිටි දිනය වෙනුවෙන් කරන කාර්යයභාරයේ වැදගත්කම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වැඩ බලන අධ්‍යක්ෂ චන්දන රණවීර ආරච්චි මහතා සමඟ සිදු කළ සංවාද සටහනකි මේ.

### ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමේ අරමුණ කුමක් ද ?

මුලින් ම සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට අදාළ වැඩිහිටියන්ගේ කටයුතු සිදු වුණා. ඉන් පසු 2000 අංක 09 දරණ වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමේ පනත මඟින් වැඩිහිටියන් සඳහා ජාතික සභාවක් ස්ථාපිත කළා. ජාතික සභාවේ සාමාජිකයන් පත් කර ඒ අයගේ තීරණවලට වැඩිහිටින්ගේ ශාරීරික, ආර්ථික අවශ්‍යතා මෙන්ම හව්හරණක් නැති අසරණ වැඩිහිටියන් රැක බලා ගන්න වැඩිහිටි මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගොඩ නැඟීම වෙනුවෙන් ජාතික සභාව ස්ථාපිත කළා. එම කාර්යයන් ඉටු කිරීමේදී ඊට සහාය වීමට ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවූවා.



**චන්දන රණවීර ආරච්චි මහතා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වැඩ බලන අධ්‍යක්ෂ**

### ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් ඉටු කරන කාර්යාභාර්යන් මොනවා ද?

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට භාණ්ඩාගාර ප්‍රතිපාදන සහ සමාජ ආරක්ෂණ අරමුදල යන ආකාර 02 කින් මූල්‍ය ප්‍රතිපාදන ලැබෙනවා. සමාජ ආරක්ෂණ අරමුදල මඟින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම වැඩිහිටි කමිටු සවිබලගැන්වීම සිදු කරනවා. ග්‍රාමීය වැඩිහිටි බල මණ්ඩල මඟින් වැඩිහිටියන් ඒකරාශී කර ඔවුන්ගේ අවශ්‍යතා සොයා බලා ග්‍රාමීය වැඩිහිටි බල මණ්ඩල මඟින් එම අවශ්‍යතා සඳහා ගන්නා තීරණ, ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩලවලට යොමු කරනවා. පසුව ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල මඟින් දිස්ත්‍රික් වැඩිහිටි බල මණ්ඩලවලට යොමු කරනවා. ග්‍රාමීය මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් විසඳ ගන්න බැරි යම් ගැටලු ජාතික මට්ටමින් විසඳ ගැනීමට කටයුතු කරනවා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් හැඳුනුම්පත් නිකුත් කරනවා. ඔවුන්ට අවශ්‍ය සේවා ලබා ගැනීමේ ද හැඳුනුම්පත් සඳහා ප්‍රමුඛතාව දෙනවා. ඊට අමතරව වැඩිහිටියන්ට අවශ්‍ය පුහුණු කටයුතු, කලා කුසලතා එළිදැක්වීම වැනි කාර්යයන් ද සිදු කරනවා. ඔක්තෝබර් 01 දින ජාත්‍යන්තර වැඩිහිටි දිනයේදී ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මඟින් ජාතික මට්ටමේ වැඩසටහන් පවත්වනවා.



වැඩිහිටි දිවාසුරැකුම් මධ්‍යස්ථානයක්

වෛද්‍ය කඳවුරු හරහා වැහිටියන්ට අවශ්‍යතා අනුව ශ්‍රවණ උපකරණ, අක්ෂි කාච වැනි දෑ ලබා දෙනවා. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් කතරගම, මාලිගාතැන්න, ප්‍රදේශවල වැඩිහිටි නිවාස දෙකක් පවත්වාගෙන යනවා. පන්නල Wellcome Village නිවාසය ජාත්‍යන්තර සංවිධානයක් මඟින් ගොඩනගලා අද වෙන කොට අත් හැර දාලා තියන වැඩිහිටි නිවාසයක්. දැනට එහි වැඩිහිටියන් 88ක් පමණ ඉන්නවා. තවම එම වැඩිහිටි නිවාසය, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට පවරගෙන නෑ. එම නිවාසයේ වත්මන් පරිපාලන කටයුතු ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් සහ පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු කරනවා.

නවතම සමීක්ෂණ අනුව ශ්‍රී ලංකාවේ පුද්ගලයන් 5 දෙනකුට වඩා රැකවරණය ලබා දෙන වැඩිහිටි මධ්‍යස්ථාන 341ක් තිබෙනවා. වැඩිහිටි නිවාස බහුතර ප්‍රමාණයක් නඩත්තු කරන්නේ පෞද්ගලික අංශයෙන්. කතරගම සහ මාලිගාතැන්න වැඩිහිටි නිවාස දෙක හැර වැඩිහිටි නිවාස 6ක් පළාත් සභාව යටතේ තිබෙනව. අනිත් වැඩිහිටි නිවාස පාලක සභාවෙන් සිදු කරනවා. එම වැඩිහිටි නිවාස ලියාපදිංචි කිරීම ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයෙන් මේ දිනවල සිදු කරනවා. එම වැඩිහිටි නිවාසවල යම් ඉදිකිරීමක් හෝ කිසියම් අවශ්‍යතාවක් වෙනුවෙන් ආධාර උපකාර කරනවා. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් එක් ලියාපදිංචි වැඩිහිටි නිවාසයකට භෞතික සම්පත් සංවර්ධනයට මිලියන දෙකක් දෙනවා.

### වැඩිහිටියන් සඳහා වූ 'නඩත්තු මණ්ඩලය' ගැන පැහැදිලි කළහොත්?

2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන් ආරක්ෂා කිරීමේ පනතේ 24 වගන්තිය මඟින් ස්ථාපනය කර ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය සාමාජිකයින් පහකින් සැදුම්ලත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන අධිකරණමය බලය සහිත ආයතනයක්. එහි සභාපති විශ්‍රාමික මහාධිකරණ විනිසුරුවරයකු විසින් දරනවා. දුවා දරුවන්ගේ රැකවරණය අහිමි ආර්ථික හැකියාවත් නොමැති අසරණ මවුපියන් සඳහා එම දරුවන්ගෙන් මාසිකව නඩත්තු සඳහා යම් මුදලක් ගෙන මවුපියන්ට ලබා දීම මේ මණ්ඩලයේ ප්‍රධාන අරමුණයි.

තම දරුවන්ගෙන් ස්වකීය අභිමතය පරිදි නඩත්තු මුදලක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමට ද වැඩිහිටියන්ට මෙහිදී අවස්ථාව ලැබෙනවා. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය හරහා ලබා ගන්නා විධිමත් ඉල්ලුම් පත්‍රයකින් නඩත්තු මණ්ඩලය වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකියි. සෑම බ්‍රහස්පතින්දා දිනකම නඩත්තු මණ්ඩලය රැස්වනවා. එහිදී එම ඉල්ලීම් පත්‍ර සළකා බලා පාර්ශවකරුවන් කැඳවා විභාග කිරීම, සමථයකට පත් කිරීම හෝ විධිමත් පර්යේෂණයකින් පසුව නඩත්තු මුදල් නියම කරනවා. මණ්ඩලය විසින් නියම කරනු ලබන නඩත්තු මුදල් නිසියාකාරව නොගෙවන අවස්ථාවලදී අදාළ නියෝගය එම ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණය මඟින් නඩත්තු අණ පනත යටතේ කරන ලද නියෝගයක් ලෙස බලාත්මක කරවා ගැනීමට හැකියි. වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 40 වැනි වගන්තියේ 'ඉ' වගන්තිය අනුව මණ්ඩලය විසින් නියම කරනු ලබන නියමයන් කඩ කරන පුද්ගලයකුට මහේස්ත්‍රාත් අධිකරණය මඟින් කරනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව රුපියල් ලක්ෂයකට නොවැඩි දඩ මුදලක්, එක් වසරකට නොවැඩි බන්ධනාගාරගත කිරීමක් හෝ දඬුවම් දෙකම හෝ පැනවීමට බලය තිබෙනවා.



**වැඩිම ළමුන් ප්‍රමාණයක් සිටින නාරම්මල මැණික්හාමි මාතාව**

### මෙවර ජාත්‍යන්තර වැඩිහිටි දිනයේ සිදු කරන විශේෂ වැඩසටහන් කවරේ ද?

'වසංගත හමුවේ වැඩිහිටි අභියෝග' මෙවර ජාත්‍යන්තර වැඩිහිටි දිනයේ තේමාවයි. කොවිඩ් -19 වසංගත තත්ත්වය අනුකූලව තේමාව නිර්මාණය කර තියනවා. ජාත්‍යන්තර වැඩිහිටි දිනය සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණියගේ ප්‍රධානත්වයෙන් ඔක්. 01 දින කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වීමට නියමිතයි.

කොවිඩ් - 19 වංසගත තත්ත්වය හේතුවෙන් විශාල වැඩිහිටියන් පිරිසක් පැමිණෙන්නේ නෑ. පිරිස 350කට පමණ සීමා කර තියනවා. වැඩිහිටියන්ට අවශ්‍ය නවාතැන් පහසුකම් සපයා වැඩිහිටියන් ඇගැයීමට වැඩසටහන් රැසක් ද සංවිධානය කර තියනවා. වයස්ගතම මව සහ පියාට, වයස අවුරුදු 75ට වඩා වැඩි දරුවන් වැඩි ප්‍රමාණයක් රටට දායාද කළ මවුවරුන් 10කට සහ වැඩිහිටි හරසර ක්‍රීඩාවෙන් ජයගත් වයස්ගතම ක්‍රීඩකයා සහ ක්‍රීඩිකාවට උපහාර පිරි නැමීම මෙන්ම 'ආදරයයි කරුණාවයි' ළමා නිර්මාණාත්මක වැඩසටහන ඇසුරින් කළ කෘතිය එළි දැක්වීම, වැඩිහිටි නිවාස ඉදි කිරීමට මුදල් ආධාර ලබා දීම, (එක් වැඩිහිටි නිවාසයකට මිලියන 2ක්) සහ ලියාපදිංචි වැඩිහිටි නිවාසවලටවත් ලියාපදිංචි සහතික ඇමැතිතුමිය විසින් පිරිනැමීම සිදු කරනවා.

### වැඩිහිටි මානසික සෞඛ්‍ය වර්ධනය සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් සිදු වෙන සේවාවන් මොනවා ද?

වයස්ගත වී ශාරීරිකව සහ මානසිකව දුර්වල වැඩිහිටියන්ට විවිධ මානසික ව්‍යාකූලතා ඇති වෙනවා. ඇතැම් දරුවන්ට ඒ අයගේ මානසිකත්වය ගැන තේරුමක් නෑ. දරුවන් සහ මවුපියන් අතර තිබෙන අනවබෝධය මත අවසානයේදී ගැටුම් ඇති වෙනවා. නිවෙස්වලට වී හුදකලා වූ වැඩිහිටියන්ට තනිකම දැඩිව දැනෙනවා. වැඩිහිටි පිරිසක් එක් ස්ථානයකට ඒකරාශී කරහම ඒ තනිකම යම්තාක් දුරකට නැති වෙනවා. වැඩිහිටි සංගම්, වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැනි ස්ථාන ඊට පිළියමක්

වැඩිහිටියන් යනු වසර ගණනාවක් රාජකාරි කළ අත්දැකීම් බහුල, පාරම්පරික ඥානය, දැනුම තියෙන, රටේ අතීත උරුමය අනාගත පරපුරට දෙන පිරිසක්. වැඩිහිටි සංගම් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින වැඩිහිටියන් විවිධ නිර්මාණ කිරීමට, නැටුම් ගැයුම් වැනි සෞන්දර්යාත්මක දේ සඳහා සහ සාමූහික වෙළෙඳපොළක් පවත්වා තම නිෂ්පාදන හා නිර්මාණ අලෙවියට අවස්ථාවක් ද ලැබෙනවා. වන්දනා චාරිකා ගමන් සඳහා ද අවස්ථාව ලැබෙනවා. තමන් තනි වී හුදකලා වී නෑ සමාජ සංවර්ධනයට අපිටත් හවුල් විය හැකියි මානසිකත්වය ඔවුන්ට රුකුලක්. එමෙන්ම වැඩිහිටියන් වෙනුවෙන් වෛද්‍යවරු සහ මනෝ වෛද්‍යවරු ස්වේච්ඡාවෙන් සේවය ලබා දෙනවා. වන්දනා චාරිකා සඳහා වැඩිහිටි සංගම්වලට රුපියල් 50,000ක මුදලක් ද ඔවුන්ගේ ස්වං රැකියා සඳහා රුපියල් 30,000ක ආධාරයක් ද ලබා දෙනවා.

### විදෙස් රටවල මෙන් අපේ රටේ වැඩිහිටි නිවාසවල පහසුකම් ගැන ලාංකිකයන්ට ධනාත්මකව හිතන්න බැරිවීම ගැන ඔබගේ අදහස ?

ලංකාවේ වැඩිහිටි නිවාස පිළිබඳව යහපත් ආකල්පයක් අප රටේ මිනිසුන්ට නෑ. අපේ රටේ වැඩිහිටි නිවාස, වැඩිහිටියන්ට හිතකර ස්ථානයක් බවට පත් විය යුතුයි. වර්තමානයේ පවතින ආර්ථික ක්‍රමවේදය තුළ දරුවන්ට මවුපියන් ගැන අවධානයකින් බලන්න බැරි තත්ත්වයක් තියනවා. ඒ නිසා මවුපියන් තනි වෙනවා. ඇතැම් දරුවන් විදෙස් රටවල ජීවත් වෙනවා. මවුපියන් ලංකාවේ තනි වෙනවා. අවසානයේ කෙසේ හෝ ඔවුන් තනිව ජීවත් වෙන්න හුරු වෙනවා. මේ නිසා අපේ වැඩිහිටියන් තනිකමෙන් හුදකලා ජීවිතයක් ගත කරන්න පුරුදු වෙලා ඉන්නවා.

මේ අනුව මුදල් ගෙවා වැඩිහිටි නිවාසවල ජීවත් වෙන වැඩිහිටියන් මෙන්ම තමන්ගේ විශ්‍රාම වැටුප දීලා වැඩිහිටි නිවාසවල ජීවත් වෙන පිරිසක් ද ඉන්නවා. කිසිඳු හව්හරනක් නැති වැඩිහිටියන් ද නිවාසවලට යනවා. වැඩිහිටි නිවාස යනු අපායට යන්න කලින් සිදු කරන පෙරහුරුවක් නෙමෙයි කියන හැඟීම මිනිසුන් තුළ ඇති කළ යුතුයි.

විදෙස් රටවල වැඩිහිටිවියට එළඹුනහම ඔවුන් වැඩිහිටි නිවාසවලට යන්න හුරු වෙලා. දරුවන් ඇවිත් ඔවුන්ව බලලා යනවා. මවුපියන්ට මානසික පීඩනයක් නෑ. අපේ රටේ ද මේ ආකල්පය ඇති කළ යුතුයි. තමන්ගේ අවසාන කාලයේදී සතුටින් ජීවත් වෙන්න පුළුවන් හිතකර ස්ථානයක් ලෙස ලංකාවේ වැඩිහිටි නිවාස නිර්මාණය කරන්න ඕන. පවුල තුළම වැඩිහිටියන් ආරක්ෂා කර සුරැකීමේ චිරාගත සම්ප්‍රදායට පටහැනි වීම නොවුණත් කලින් කිවූ කාරණා නිසා තනිවෙන වැඩිහිටියන් වෙනුවෙන් නිවැරදි වැඩපිළිවෙළක් අවශ්‍යයි.

### අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ 'සෞභාග්‍යයේ දැක්ම' සංකල්පයට අනුව අපේ වැඩිහිටියන්ගේ සුරක්ෂිතතාවට ලැබෙන දායකත්වය කෙසේ ද?

රට හදන සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක් බිහි කිරීමට පුළුල් වැඩපිළිවෙලක් යෝජනා කර තිබෙනවා. ඒ අනුව හඳුනාගත් සුමට සංවර්ධන ව්‍යාපෘති සහ අනාගත පරම්පරාවට තම ජීවන අත්දැකීම් හා ඉතිහාසය පිළිබඳ දැනුම ලබා දෙමින් ජ්‍යෙෂ්ඨ පුරවැසි දායකත්වය ලබා ගැනීමට 'ස්වේච්ඡා සේවා බලකායක්' ඇරඹීම, නිෂ්පාදන කාර්යයට දායක කරගනුවස් රාජ්‍ය හා පෞද්ගලික අංශය ඒකාබන්ධව ජීවනෝපාය සංවර්ධන පුහුණුවක් ඒ සඳහා අවශ්‍ය සම්පත් හා වෙළෙඳපොළ හඳුන්වාදීම, මවුපිය ආවරණ සැපයෙන නව රක්ෂණ ක්‍රමයක් දරුවන්ට හඳුන්වා දීම, වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම සහ ඒ සඳහා පෞද්ගලික ආයෝජන වැඩි කිරීමට පියවර ගැනීම වැනි යෝජනා ජාතික සභාව හා ලේකම් කාර්යාලය විසින් තවදුරටත් ශක්තිමත් කර ක්‍රියාවට නැංවීම ඉතා අත්‍යාවශ්‍ය කාර්යයක් සේ දකිනවා.

### අපේ වැඩිහිටි පරපුරේ අනාගතය ගැන සාධනීය බලාපොරොත්තු තබා ගත හැකි වේ ද?

2040 දී වැඩිහිටි ජනගහනය, සමස්ත ජනගහනයෙන් හතරෙන් එකක් වෙනවා. අපි වැඩිහිටි වියට එන විට අපිත් එක්ක අපේ දරුවන් ඉඳීවිද කියන ගැටලුව මතු වෙනවා. අතීතයේ වැඩිහිටියන්ට දරුවන් බොහෝ සිටියත් අද ඒ තත්ත්වය නෑ. බොහෝ විට එක පවුලකට ඉන්නේ එක දරුවයි. ඒ තත්ත්වයක් තුළ වැඩිහිටිවියට එළඹෙන අය “කවදාහරි මටත් තනියෙන් ජීවත් වෙන්න සිදු වෙනවා“ කියන හැඟීම අවබෝධ කර ගනිමින් මානසිකව සූදානම් වෙන්න ඕන. වැඩිහිටි සුරක්ෂණ මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා පෞද්ගලික අංශය, ආයෝජන සඳහා දිරිමත් කරන්න ඕන. වැඩිහිටි නිවාසවල යටිතල පහසුකම් දියුණු කරමින් ලංකාවේ වැඩිහිටි නිවාස පිළිබඳව මිනිසුන්ට තිබෙන ආකල්පය වෙනස් කරන්න ඕන. පොදු ප්‍රවාහනයේදී, මහා මාර්ගයේදී වැඩිහිටියන්ට අවශ්‍ය පහසුකම් සහ සැළකිලි දක්වන්න ඕන. උදාහරණයක් විදිහට ජපානයේ වැඩිහිටියන්ගේ දැනුම ඒ රටේ සංවර්ධනට සහ සමාජයේ යහපැවැත්මට උපයෝගී කර ගන්නවා. වැඩිහිටියන්ව අවතක්සේරු නොකර වැඩිහිටියන් ලංකාවට වැඩදායී කොටසක් බවට පත් කරන්න අවශ්‍ය කටයුතු කරන්න ඕන. එහෙම කළොත් ලංකාවේ වැඩිහිටියන්ගේ අනාගත පිළිබඳව සාධනීය බලාපොරොත්තු තබා ගන්න පුළුවන්.

සටහන– මදාරා මුදලිගේ
සංස්කරණය – අනුෂා ගුරුසිංහ

## ආරච්චිකට්ටුවේ ග්‍රාම නිලධාරී වසම් 7ක

# මව්පිය රැකවරණය අහිමි දරු දැරියන් 21ක් සොයාගෙන

**මුන්නේශ්වරම සමූහ**

මව්පිය රැකවරණය හා ආරක්ෂාව නොමැතිව අනාරක්ෂිත ලෙසින් දිවි ගෙවන දරු දැරියන් 21 දෙනකු ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් හතක ජීවත් වෙමින් සිටිය දී සොයා ගත් බව හලාවත කොට්ඨාස ළමා හා කාන්තා කාර්යා

ග්‍රාම නිලධාරී වසම් හතේ ග්‍රාම නිලධාරීන් සොයා ගත් කරුණු පදනම් කැර ගෙන කළ මෙහෙයුමක දී දරු දැරියන් 18 දෙනෙකු හමු වූ බවත් මෙම මෙහෙයුම සිදු කරන අතර තවත් දරුවන් තුන් දෙනකු සොයා ගත් බවත් වාර්තා වෙයි.

මේ වන විට දිනෙන් දින සිදු වන ළමා හිංසන හා ළමා අපරාධ අවම කැර ගැනීමේ අරමුණින් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාම නිලධාරීන් වෙතින් ලබා ගත් වාර්තා අනුව එවන් දරුවන් ජීවත් වන ආකාරය සොයා සිදු කළ සමීක්ෂණය අනුව මෙම දරුවන්ගේ මව්පියන් වෙනත් සම්බන්ධතාවන් මත වෙන් වී සිටින බවත් සමහර අඹු සැමි විරසකයන් මත මව විදේශගත ව ඇති නිසා මෙම දරුවන් ආච්චිලා සීයලා වෙත හෝ ඥාතීන් වෙත බාර දී ඇති බවත් සොයා ගෙන ඇත.

වැඩිවියට පත් දැරියන් පියා සමඟ ජීවත්ව සිටිය දී ද සොයා ගෙන ඇත. මෙම දරු දැරියන් බලා ගන්නා ඔවුන් රඳවා ගෙන සිටින වැඩිහිටියන් ගෙන්වා දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම දැරිය යුතු බව අවධාරණය කළ අතර මෙම දරුවන් සම්බන්ධයෙන් වසමේ ග්‍රාම නිලධාරීන් නිසි අවධානයෙන් රාජකාරි කළ යුතු බව පොලීසිය පෙන්වා දී තිබේ.

## කසළ මගේ සඟවාගෙන මොරටුවේ සිට වැල්ලවායට කුඩු ගෙනිච්ච 4ක් කොටු වෙති

**ඌව වෙල්ලස්ස විශේෂ**

මොරටුව ප්‍රදේශයේ සිට වැල්ලවාය දෙසට ධාවනය වූ බස් රථයක ගමන් කළ සිව් දෙනකු සිය ගුද මාර්ගවල සඟවා හෙරොයින් ගෙන යෑමේ සිද්ධියක් පෙරේදා (29) වාර්තා වෙයි.

මෙම සැකකරුවන් සිව්දෙනා කුඩාඔය ප්‍රදේශයේ දී ඌව-කුඩාඔය පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන් හෙරොයින් පැකට් 100ක් සිය ගුද මාර්ගයේ සඟවා ගෙන ප්‍රවාහනය කැර ඇති අතර එහි බර ග්‍රෑම්ස් 6 මිලිග්‍රෑම් 750 පමණ වේ.එම හෙරොයින් වල වටිනාකම රුපියල් ලක්ෂ 08 පමණ වේ.

සැකකරුවන් කුඩාඔය සහ මොරටුව ප්‍රදේශවල පදිංචි 23,32,36 සහ 42 හැවිරිදි වියේ පසුවන පුද්ගලයන් බව ද වාර්තා වෙයි.

සැකකරුවන් සන්තකයේ තිබූ ජංගම දුරකථන සහ ටෙලර් කාඩ් කිහිපයක්ද පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරුවන් සහ නඩු භාණ්ඩ වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

කුඩාඔය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.ඒ.සී ප්‍රසාද් මහතා ඇතුළු කණ්ඩායමක් මෙම වැටලීම සිදු කැර ඇත.

## ඩෙංගු කීටයන් වැඩි වෙලා

**මාතලේ මධ්‍යම සමූහ**

මාතලේ දිස්ත්‍රික්කයට මේ දිනවල ඇදහැලෙන කඩින් කඩ වර්ෂාව හේතුවෙන් ඩෙංගු බෝකරන රෝග කීටයන් වර්ධනය වීමේ ප්‍රවණතාවක් මතු වී ඇතැයි සෞඛ්‍ය අංශ අනතුරු අඟවයි.

නව ඉදිකිරීම් සිදු කරන ගොඩනැගිලි, ක්‍රීඩාපිටි, රාජ්‍ය කාර්යාල, පාසල් හා නිවාසයන්හි ඩෙංගු මදුරුවන් බෝවිය හැකි ජලය රඳා පවතින ස්ථාන පිරිසිදු කිරීමට පියවර නොගතහොත් ඉදිරි සති කිහිපය තුළදී මාතලේ දිස්ත්‍රික්කයේ ඩෙංගු රෝගීන්ගේ වැඩිවීමක් ඇති විය හැකි බැවින් වහාම තම අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය අංශ ජනතාවගෙන් ඉල්ලා සිටියි.

## යාපනයේ අරාලී ප්‍රදේශයේ සැඟව සිටි මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ අත්අඩංගුවට



**උතුරු පළාත් විශේෂ**

යාපනයේ අරාලී ප්‍රදේශයේ ඊයේ (30) අලුයම සිට යුද හමුදාව, පොලීසිය සහ පොලිස් විශේෂ කාර්ය බළකාය සිදු කළ විශේෂ මෙහෙයුමකදී මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඇතුළු 8 දෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

මීට අමතරව තවත් පනහකට වඩා වැඩි පිරිසකගෙන් ප්‍රශ්න කැර ගෙන යන අතර යාපනයේ අරාලී දකුණ ජේ-160 ග්‍රාම නිලධාරී වසම7 පුරා මෙම විශේෂ මෙහෙයුම ක්‍රියාත්මක කොට තිබේ.

එම ප්‍රදේශයේ නිවාස පුද්ගලයන් හා සියලු වාහන පරීක්ෂාවට ලක් කොට තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට පොලීසිය පියවර ගෙන ඇති අතර සෙසු සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම් ආරම්භ කොට තිබේ.

### ශ්‍රීකාන්තගේ ප්‍රීදූපත



- ටෙනිසන්ගෙ අඩුව පුරවන්න කෙනෙක් මේ කපේදි හොයා ගන්න වෙන්නෙ නෑ බං !
- එක්කෙනෙක් ඉන්නවනෙ සර්, පොල් මිල සූත්‍රය හදපු කෙනා !

## වන අලි පහර දීමෙන් කතුන් දෙදෙනෙක් මරුට

**පොලොන්නරුව දිසා සමූහ**

වන අලි ප්‍රහාරවලින් කාන්තාවන් දෙදෙනකු මිය ගොස් සිවිල් ආරක්ෂක භටයින් දෙදෙනකු බරපතළ තුවාල ලබා පොලොන්නරුව රෝහලට ඇතුළත් කිරීමේ සිද්ධියක් මැදිරිගිරිය හා පුලස්තිපුර පොලීසිවලින් වාර්තා වේ.

මෙසේ මිය ගොස් ඇත්තේ මැදිරිගිරිය, දර්ශනපුර ගම්මානයේ පදිංචිව සිටි ඩී. පී. විමලාවතී (72) හා පුලස්තිපුර, පමුණුගම ගම්මානයේ පදිංචිව සිටි එච්. එම්. මල්කාන්ති (58) යන අය වෙති.

සැප්තැම්බර් 30 වැනිදා අලුයම 5.45ට පමණ මෙම කාන්තාවන් දෙදෙනාටම ඔවුන්ගේ නිවෙස් අසල ගෙවතුවලදී වන අලි පහර දී ඇති බව පොලීසිය කියයි. මේ අතර, පටුනුගමදී කාන්තාවකට පහර දුන් වන අලියා ඒ අසලින් ගමන් ගත් සිවිල් ආරක්ෂක භටයින් දෙදෙනකුට ද පහර දී පලා ගොස් ඇත.





| | |
|---|---|
| දරු පරපුරම දෑ ගස ලියලන | අතුය |
| රට-දැය-සමය සුරැකුම ඒ ගස | සතුය |
| ගස සුරකින පොහොර දිය වටපිට | තතුය |
| ලෝක ළමා දින එය දැනගත | යුතුය |
| | |
| උපදින දරුවන්ට යහ මඟ | සැලසීම |
| වැඩිහිටි ගුරු දෙගුරු කාගෙත් | වගකීම |
| මත් දෑ කුරිරුකම් ඇසුරෙන් | රැකදීම |
| දරු පරපුරේ සැනසුම දෑ | සැනසීම |

රටේමුල්ලේ මුදන්නායක

### ගීතිකාව

| | |
|---|---|
| වෙර වීරිය වියැකුණාම අපහසුකම් තදින් | දැනේ |
| හැකි දා කළ කී ඒවට එතැනදි දිය යුතුය | ගුණේ |
| වයසට යන විට ආයෙත් පොඩි දරුවන් වගෙයි | වුණේ |
| වැඩිහිටියන්ටත් අයිතියි පළවෙනි දා ළමා | දිනේ |



ගාමිණී ගෝනා

## නැන්දම්මාට බෑනා අතවර කරලා

**අනුරාධපුර මධ්‍යම විශේෂ**

හැටපස් හැවිරිදි කාන්තාවක දියනෑමට ගිය අවස්ථාවේ ඇයට අතවර කැර ඇතැයි පූනෑව දෙමටමල්වැව ප්‍රදේශයෙන් වාර්තා වෙයි.

මේ සම්බන්ධයෙන් ඇයගේ බාල දියණියගේ සැමියා බව කියන විශ්‍රාමික යුද හමුදා සෙබළෙකු මැදවච්චිය පොලිසියේ ළමා හා කාන්තා කාර්යංශය මඟින් ඊයේ (30) සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ.

තිදරු මවක වන ඇය නිවෙසේ ජලය පුරවා ඇති ටැංකිය අසලට දිය නෑමට ගිය අවස්ථාවේ මෙම අතවර කළ බව ඇය මැදවච්චිය පොලිසියට පැමැණිලි කැර තිබේ.

ඇය තම බාල දියණිය සමඟ අමනාප වී තනිවම නිවෙසක කල් ගත කරන බව පොලිසිය සිදු කළ මූලික පරීක්ෂණ වලදී අනාවරණය වී තිබේ.

බෑනා තමන්ට පහරදුන් බව කියමින් මැදවච්චිය රෝහලට ඇතුළත් වූ ඇයව වැඩිදුර පරීක්ෂණ සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා හමුවට ඉදිරිපත් කළ අවස්ථාවේ හෙළි වී ඇත්තේ ඇයව දරුණු අතවරයකට ලක් වී ඇති බවයි.

පසුව පොලිසිය සිදු කළ ප්‍රශ්න කිරීම් වලදී ද ඇය බෑනා පහරදුන් බව පවසා ඇතත් වෛද්‍ය වර්තාවෙන් අනාවරණය වුයේ ඇය අතවරයට ලක්ව ඇති බවයි.

ඒ අනුව 43 හැවිරිදි සැකකාර එක්දරු පියා පොලිසිය අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු පවසා ඇත්තේ නැන්දම්මා තමන් සමඟ පවතින අමනාපකම් නිසා බොරු පැමිණිල්ලක් ඉදිරිපත් කැර ඇති බවයි.

විශ්‍රාමික යුද හමුදා සෙබළා ඊයේ (30) අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.මැදවච්චිය පොලිස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අනුර බණ්ඩාර මහතාගේ උපදෙස් මත ළමා හා කාන්තා කාර්යංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂිකා අජන්තා කීර්තිසිංහ මහත්මියගේ මෙහෙයවීමෙන් පොලිස් සැරයන් අශෝක ධර්මරත්න (7959) මහතා ඇතුළු කණ්ඩායමක් පරීක්ෂණ පවත්වති.


## ප්‍රසිද්ධ නිවේදනයයි

**2007 අංක 07 දරන සමාගම් පනතේ 242(1) කොටසේ වගන්තිවලට අනුව සමාගම් ඒකාබද්ධ කිරීම**

මෙමගින් නිවේදනය කරන පරිදි එල් ඕ එල් සී හෝල්ඩිංස් පීඑල්සී - PQ 70 (LOLC) අයි පේ (ප්‍රයිවට්) ලිමිටඩ් - පීබී 3850 පිවී (iPay) යන සමාගම් දෙකෙහි අධ්‍යක්ෂ මණ්ඩල 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) කොටසේ වගන්තිවලට අනුව LOLC සමාගම iPay සමාගම සමග ඒකාබද්ධ කිරීම සඳහා තීරණයකට පැමිණ තිබේ. iPay සමාගම LOLC සමාගම මගින් පූර්ණ පරිපාලිත සමාගමකි. මෙම ඒකාබද්ධ කිරීමේ කොන්දේසි වලට අනුව iPay හි සියලු කොටස් ගෙවීමකින් හෝ කිසිදු සලකා බැලීමකින් තොරව අවලංගු කෙරෙන අතර LOLC මගින් iPay හි සියලු වත්කම් හා වගකීම් අත්පත් කර ගනු ලැබේ. LOLC මෙහිදී අඛණ්ඩව ක්‍රියාත්මක වන සමාගම වේ. LOLC සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ කිරීමෙන් පසු එලෙසම ඒකාබද්ධ කළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස කටයුතු කරනු ඇත.

යෝජිත ඒකාබද්ධ කිරීම සමාගම් දෙකෙහිම උපරිම යහපත උදෙසා වන බවත් ඒකාබද්ධ කළ වහාම ඒකාබද්ධ කරන ලද LOLC සමාගම නුබුනුවත් පරීක්ෂණය සම්පූර්ණ කරන බවත් සමාගම් දෙකෙහිම අධ්‍යක්ෂ මණ්ඩලවල මතය වේ.

මෙම යෝජිත ඒකාබද්ධ කිරීම 2020 ඔක්තෝබර් 29 වෙනි දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තීරණය කරනු ලබන වෙනත් දිනයක සිට බලපැවැත්වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලවල නියෝගය පරිදි,**

**එල් ඕ එල් සී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

එල් ඕ එල් සී හොල්ඩිංස් පීඑල්සී හි සහ අයි පේ (ප්‍රයිවට්) ලිමිටඩ් හි සමාගම් ලේකම්වරු

2020 ඔක්තෝබර් 01



**දිනුම් වාරය - 4260 නිල ප්‍රතිඵල** NLB

## මහජන සම්පත

**දිනයඃ 2020-09-29**

ජයග්‍රාහී අක්ෂරය: **J** ජයග්‍රාහී අංක: **3 5 9 2 9 5**

**ත්‍යාග රටාව - අග සිට මුලට**

| ත්‍යාගය | අංක | මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 3 5 9 2 9 5 | රු. 2,000,000/- | 01 |
| 2 වැනි ත්‍යාගය | 5 9 2 9 5 | රු. 100,000/- | 12 |
| 3 වැනි ත්‍යාගය | 9 2 9 5 | රු. 10,000/- | 115 |
| 4 වැනි ත්‍යාගය | 2 9 5 | රු. 1,000/- | 1,143 |
| 5 වැනි ත්‍යාගය | 9 5 | රු. 100/- | 11,436 |
| 6 වැනි ත්‍යාගය | 5 | රු. 20/- | 113,412 |

**ත්‍යාග රටාව - මුල සිට අගට**

| ත්‍යාගය | අංක | මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 3 5 9 2 9 | රු. 10,000/- | 12 |
| 8 වැනි ත්‍යාගය | 3 5 9 2 | රු. 1,000/- | 108 |
| 9 වැනි ත්‍යාගය | 3 5 9 | රු. 100/- | 1,138 |
| 10 වැනි ත්‍යාගය | 3 5 | රු. 50/- | 11,311 |
| 11 වැනි ත්‍යාගය | J | රු. 20/- | 45,410 |

**දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 10,720,390.00**

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ **සුපිරි ත්‍යාගය රු.17,063,870.00**

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථනඃ 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk


# තෙවනැසින් දකින සොභාදම් සාරය...

ආදරණීය දුවේ, පුතේ "සොබාදහම" යන වදන කී වන ම ඔබේ මනසට නැගෙන්නේ අලංකාර කඳුවැටි කිහිපයක්, ගලායන දෙලපාරක දර්ශනයක්, හිරු බැසයන දසුනක් සහිත මුහුදු වෙරලක්, ගලායන දිය ඇල්ලක් හෝ මිදුම් සහිත වෙල්යායක් වැනි දර්ශන සමූහයක් විය හැකිය. සොබාදහමෙහි අලංකාරය රැඳී ඇත්තේ මා ඉහත සඳහන් කළ දර්ශනයන්හි පමණක් නොවේ. ඔබ අවට, ඔබේ නිවස අසල, ඔබේ වත්ත පහළ සොබා දහමෙහි අපූරු දර්ශන බහුලව තිබෙන බවට ඔබ මෙතෙක් සැලකිල්ලක් දක්වා නැත. මෙම ලිපියට අදාළ ඡයාරූප පරීක්ෂකාරීව නරඹන ඔබට සොබා දහමෙහි අලංකාර වර්ණයන් සහ පැහැයන්, රටා සහ මෝස්තර ඔබ අවට සැරිසරමින් සිටින බව පෙනී යයි.


ඡයාරූප ශිල්පය (Photography) යන වදනෙහි අර්ථයදී "ආලෝකයෙන් ඇඳීමයි" ආලෝකයෙන් ඇඳීමට අපි 'කැමරාව' නැමති උපකරණය භාවිත කරන්නෙමු. දැන් අපි පාවිච්චි කරන සෑම මොබයිල් දුරකථනයක ම පාහේ කැමරාවක් අන්තර්ගතව ඇත. සෙල්ෆි ගැනීමට අමතරව සොබා දහමෙහි මෙවන් අපූරු වර්ණවත්, අර්ථවත් වස්තූන් ඡයාරූප ගතකර තබා ගැනීමෙන්, නැරබීමෙන් ඔබට කොතරම් ආස්වාදයක් ලැබිය හැකිද? ඔබට දුරකථනයක් නැත්නම් ඔබේ දෙමාපියන්ගේ දුරකථනයෙන් එය ඔබට කළ හැකිය. ඔබ දෙමවුපියන්ගේ දුරකථනය ගෙන "ගේම් ගහනවාට" ඔවුන් අකමැති වුවත් ඔබ මෙවැනි නිර්මාණාත්මක දෙයක නියැලෙනවාට ඔවුන් කිසි විටෙක අකමැති වන්නේ නැත.



ඡයාරූප ශිල්පය යනු තම විනෝදයට, තම අධ්‍යාපනයට, තම වෘත්තියට, තම ජීවිතයට ඉතා සම්බන්ධ, නැතිව බැරි විෂයක් බව මතක තබා ගන්න. අද යාන්ත්‍රික පරිසරයක වෙසෙන ඔබ සොබාදහමෙහි අලංකාර කුඩා වස්තූන් ගැන සැලකිල්ලක් නොදක් වන්නේ ඇයි? කුඩා වුව ද බිම්මල කොතරම් අලංකාර වස්තුවක් ද එහි පැහැයන් ගැන සැලකිල්මත් වන්න. බිම් මලක තිබෙන රටාවන් කොතරම් අලංකාරවත් ද? වැටුණු කොළයක් දිරාපත් වීමෙන් මතුවූ මෝස්තර, රේඛා කොතරම් ලස්සන දැයි එය අවට අල්ලා බලන්න. දිරා ගිය කොළයක් කොතරම් අර්ථයක් දිනවන්නේ දැයි සිතා බලන්න. ඡයාරූප ගත නොකරන්නේ නම් එය අතට ගෙන එහි ඇති අලංකාරය රස විඳීමට පුරුදු වන්න.

ඡයාරූපය යනු ආලෝකයෙන් ඇඳීම යැයි මම ඉහත සඳහන් කළෙමි. ඕනෑම කුඩා වස්තුවක් ඡයාරූප ගත කිරීමේදී ද එම වස්තුවට ආලෝකය ලැබී තිබෙන ආකාරය සහ දිසාව ඉතා වැදගත් බව මතක තබා ගන්න. ඔබ ඡයාරූප ගත කරන කුඩා වස්තුවෙහි අලංකාරය වැඩිවන අයුරින් එය ආලෝකවත් කරන, එය තිබෙන තැන ආලෝකය අඩුනම්, පරිසමින් එය එතැනින් ඉවතට ගෙන සුදුසු තැනක තබා හෝ එල්ලා හොඳින් ආලෝකමත් වන අයුරින් ඡයාරූප ගතකරන්න. යම් වස්තුවක් තිබෙන තැන එය පසුබිමෙන් ඉස්මතු වී නොපෙනෙන්නේ නම් එයට පිටුපසින් කුඩා කලු රෙද්දක් යොදාගන්න. ඒ සඳහා කළු ටී ශර්ට් එකක්, කළු හැට්ටයක් හෝ කලු කාඩ්බෝඩ් කැබැල්ලක් භාවිත කළ හැකිය.

ආදර දුවේ, පුතේ ඔබ මෙතෙක් නොසැළකිල්ලෙන් ඉවතලූ දේ, මා ඔබ හිස මත පැටවූයෙන්, ඔබ අවට තිබෙන සොබාදහමෙහි කුඩා වස්තූන් තුළ ඇති අපූරු රටා සහ අපූරු වර්ණයන් හි ඇති සෞන්දර්ය වෙත මින් ඉදිරියට වැඩි සැලකිල්ලක් යොමු කරුණු ඇතැයි බලාපොරොත්තු වෙමි.







දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 ඔක්තෝබර් 01 බ්‍රහස්පතින්දා

# විස්සේ කොස්ස තාවකාලිකයි!

විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුවේ දේශපාලන පාර්ශ්ව අතර විවිධ මත තිබුණත් අවසන් ලෙස එක් මතයකට එන බව ද එය පහසුවෙන් ජයග්‍රහණය කරන බව ද අගමැතිවරයා කියා සිටී. ආණ්ඩුව නියෝජනය කරන දේශපාලන පක්ෂ කිහිපයක් ඇති අතර, එම පක්ෂවලට ස්වාධීන මත තිබෙන්නට පුළුවන් බව ද අගමැතිවරයා පෙන්වා දෙයි. ස්වාධීන මතවලට අවකාශ සලසා දීම ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රමුඛ ලක්ෂණයකි. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජාතික නිදහස් පෙරමුණ, කොමියුනිස්ට් පක්ෂය, සමසමාජ පක්ෂය විසි වන සංශෝධනය සම්බන්ධයෙන් විවිධ අදහස් පළ කර ඇත. එහෙත් ආණ්ඩුවක් වශයෙන් පොදු මතයකට පැමිණීමේ අවශ්‍යතාව පවතී. අවසන් සාකච්ඡාවේදී පොදු මතය ඉදිරියට එන බව ද මහින්ද මහතා පෙන්වා දෙයි.

ජනාධිපතිවරයා පත් වී ඇත්තේ ද ආණ්ඩුව බලයට පත් වී ඇත්තේ ද විශාල ජනවරමක් සහිතවය. මේ ජනවරම ලැබී ඇත්තේ දහනව වන ව්‍යවස්ථා සංශෝධනය පරාජය කිරීමේ පොරොන්දුව මත යැයි කිව හැකිය. ජනාධිපතිවරණය පවතින සමයේ ද මහ මැතිවරණය පවතින සමයේ ද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා වී ඇත. එය අහෝසි කළ යුතුය යන්න රටේ බහුතරයකගේ මතය වෙයි. ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් ලැබී ඇත්තේ ද දහනවය පරාජය කිරීමට යැයි තර්කයක් ගොඩනැඟිය හැකිය. දහනවය රටට සිදු කළ හානිය ජනතාව මැනැවින් වටහාගෙන ඇතැයි කිව හැකි අතර, ස්වකීය ඡන්දය පාවිච්චි කර ඇත්තේ ද සාධනීය වෙනසක් අපේක්ෂාවෙන් බව සිතන්නට පුළුවන.

මෑත කාලීන දේශපාලන ඉතිහාසය නිරීක්ෂණය කළ හොත් වත්මන් ආණ්ඩුව තරම් ශක්තිමත් ආණ්ඩුවක් මෑත කාලයේ බිහි වී නැත. ජනාධිපතිවරයා ද ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂය නියෝජනය කරන අතර, ඔහු බලයට පත් වන්නේ ද වාර්තාගත ඡන්ද ප්‍රමාණයක් ලබමිනි. මේ අනුව විධායකය හා ව්‍යවස්ථාදායකය වෙනදාට වඩා ශක්තිමත් වන අතර, පාර්ශ්ව දෙකම එක් මතයකට හා එක් වැඩපිළිවෙළකට ගොනු වී ඇත. මෙය සුවිශේෂ තත්ත්වයකි. දහනව වන ව්‍යවස්ථා සංශෝධනය නිසා දුරස් වී තිබූ විධායකය හා ව්‍යවස්ථාදායකය අද අවබෝධාත්මක එකඟතාවක සිට වැඩ කරනු දැක ගත හැකිය. දහනවය අහෝසි වීමෙන් පසු මේ තත්ත්වය තවදුරටත් තහවුරු වනු ඇතැ'යි උපකල්පනය කළ හැකිය.

විස්සට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් ගණනාවක් ඉදිරිපත් වී ඇත. බොහෝ පෙත්සම්වල හරය වන්නේ විස්ස සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයට අමතරව ජනමත විචාරණයක් වෙත ද යා යුතු බවය. ශ්‍රේෂ්ඨාධිකරණය ඉහත පෙත්සම් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ පූර්ව නිගමනයකට පැමිණිය නොහැකිය. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට අනුව ජනමත විචාරණයකට ගිය ද ආණ්ඩුව එහිදී පරාජයට පත් වන්නේ නැත. ජනතාව ජනාධිපතිවරයා කෙරෙහි මෙන්ම ආණ්ඩුව කෙරෙහි ද බලවත් විශ්වාසයකින් කටයුතු කරන බව ඉතා පැහැදිලිය. පොදු ජනයාගේ මතය වන්නේ වැඩ කරන ජනාධිපතිවරයකු හා වැඩ කරන ආණ්ඩුවක් අවශ්‍ය බවය. දහනවය ඊට බාධාවක් බව රටේ පොඩි ළමයි පවා දනිති.

ජනාධිපතිවරයා ගමින් ගමට යමින් පොදු ජනයාගේ අවශ්‍යතා සොයා බලමින් ඒවාට ක්ෂණික විසඳුම් දෙන වැඩසටහනක් ආරම්භ කර තිබේ. ඊට ලැබෙන ජනතා ප්‍රතිචාරය ඉතා ඉහළය. වැඩ කරන රාජ්‍ය නායකයකුගේ අවශ්‍යතාව ජනතාව හොඳින් වටහාගෙන තිබේ. විධායක ජනාධිපති ක්‍රමය ශ්‍රී ලංකාව තුළ පැළපදියම් වී ඇති අතර, එය මහජනයාගේ අනුමැතියට ලක් වූ ආණ්ඩු ක්‍රමයක් බවට පත් වී ඇත. රාජ්‍ය නායකයකුට නිර්භීත තීන්දු තීරණ ගනිමින් රටක් ගොඩනැඟීමට අවශ්‍ය බලය මේ ආණ්ඩු ක්‍රමයෙන් ලැබෙයි. ප්‍රංශය ඩිගෝල්ගේ පාලන සමයේ සිට විධායක ජනාධිපති ක්‍රමය අනුගමනය කරයි. සිංගප්පූරුව, දකුණු කොරියාව වැනි රටවල් වේගවත් ආර්ථික සංවර්ධනයක් අත්කර ගත්තේ මේ ක්‍රමය අනුගමනය කිරීමෙනි.

1978 ජනරජ ව්‍යවස්ථාව විවිධ පැතිකඩ ඔස්සේ විවේචනයට ලක් වී ඇතත්, එයින් රටට සිදු වූ වැදගත් සේවාවන් රාශියක් තිබේ. එක් පැත්තකින් ආර්ථික දියුණුවක් ලබන්නට එය හේතු සාධක විය. තව පැත්තකින් ඒකීය ශ්‍රී ලංකාව තහවුරු කිරීමට ද එය හේතු සාධක විය. තිස් අවුරුද්දක් පුරා පැවැති යුද්ධය හා ත්‍රස්තවාදය පරාජය කරන්න හැකි වන්නේ විධායක ජනාධිපති ක්‍රමය නිසාය. මේ සම්බන්ධයෙන් කරන ලද ශාස්ත්‍රීය විග්‍රහ ගණනාවක් ප්‍රකාශයට පත් වී ඇත. අද පවතින්නේ 1978 ජනරජ ව්‍යවස්ථාවේ විකෘතියකි. එය දහනව වතාවක් සංශෝධනය වී ඇත. එයින් දාහත, දහනවය වැනි සංශෝධන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික හරයට අභියෝග කරන බව පැහැදිලිය. ජනාධිපතිවරයාගේ බලය සීමා කිරීම ඉහත ව්‍යවස්ථාවේ මූලික හරයට විරුද්ධය.

දහනව වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනු ලබන්නේ ද එය සම්මත කරගනු ලබන්නේ ද නායකයන් කිහිප දෙනකුගේ පෞද්ගලික අරමුණු ජය ගැනීම සඳහා යැයි චෝදනා එල්ල වී ඇත. එය අසත්‍යයක් නොවන වග දහනවයේ වගන්ති විශ්ලේෂණය කරන විට පැහැදිලි වෙයි. රටේ යහපත පසෙක ලා දේශපාලන පක්ෂයක නායකයන්ගේ අභිමතයට ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත කර ගැනීම ජාතික අපරාධයකි. දහනවය පිළිබඳ අවබෝධයක් එදා ජනතාවට තිබුණේ නැත. එය සම්මත කරගන්නා විට ද පුළුල් සංවාදයක් පැවතියේ නැත. විස්ස සංශෝධනය ඊට වෙනස්ය. එය සංවාදයට ලක් කිරීමට, නිරීක්ෂණය කිරීමට පමණක් නොව, ඊට එරෙහි වීමට ද අවකාශ සලසා ඇත. ආණ්ඩුවේ දේශපාලන පාර්ශ්ව අතර පවා විවිධ මත දකින්නට ලැබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය නිසාය.


ආණ්ඩුවේ මතය වන්නේ නව ව්‍යවස්ථා කෙටුම්පතක් සම්පාදනය කිරීමය. එය රටට හා රටේ ඉදිරි ගමනට ගැළපෙන එකක් විය යුතුය. මේ සම්බන්ධයෙන් විද්වත් කමිටුවක් පත් කර ඇති අතර, එහි කටයුතු කෙරීගෙන යයි. නව ව්‍යවස්ථාවක් ගෙනෙන තුරු රට අකර්මණ්‍ය වීමට ඉඩ හැරිය නොහැකිය. විස්ස අන්තර්කාලීන වැඩසටහනකි. එය නැතිව රටේ වැඩ කොටස් ඉදිරිගාමී කළ නොහැකිය.

### දිල්රුගෙ සීවිද

පෙති විදහන්නෙ හෙට සුවඳක් — විහිදන්නයි
යුතුකම සැමට ඇති, ඒ මල් රැක — ගැන්මයි
සෙනෙහස ආදරය ඒ හිත් — බලන්වයි
දවසක් නොවෙයි හැම දවසම — දරුවන්ටයි



# ගිලිහුණොත් රැකවරණය ඔවුහු අඳුරටය



**එම්. කාංචනා සුබසිංහ**
මනෝ සමාජීය නිලධාරී
(ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය)

රටකට උතුම්ම සම්පත දරුවෝ ය. මේ නිසා සෑම රටක්ම දරුවන්ගේ සුරක්ෂිතාව වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ ද දරුවන් ගේ රැකවරණය සහ ඔවුන්ගේ අයිතින් තහවුරු කර දීම සඳහා විවිධ ක්‍රමෝපායන් යොදා ඇත. ලෝක ළමා දිනයක් එළැඹ ඇති මේ මොහොතේ ජාතියක් වශයෙන් දරුවන් සම්බන්ධයෙන් ඉටු කර ඇති යුතුකම් සහ වගකීම් මෙන්ම ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටු විය හැකි පාරිසරික වටපිටාවක් සකස් කර ඇත්ද යන්න පිළිබඳව ස්වයං විවේචනයකට ලක් කිරීමේ අවශ්‍යතාව මතු වි ඇත.

අද වන විට ළමයින් සම්බන්ධයෙන් අසන්නට දකින්ට ලැබෙන්නේ ඔවුන්ගේ අනාගතය සම්බන්ධයෙන් එතරම් සුබදායි බලාපොරොත්තු ඇති කර ගැනීමට හැකි සිද්ධීන් නොවේ. එය නීතියේ අඩු ලුහුඬුකම් මතම සිද්ධ වන කාර්යයක් නොවන අතර සමාජයේ සදාචාරාත්මක පරිහානිය මොනවට ඔප්පු කරන්නකි.

ළමයා යනු ළමයාමය. එය පළමු කොට අවබෝධ කරගත යුත්තේ වැඩිහිටියන් ය. මක් නිසා ද ළමයා ට සිය හිමිකම අහුරා ඇත්තේ වැඩිහිටියන් විසිනි. අද සමාජයේ අවධානය යොමුකළ යුතුම කාරණය වන්නේ මවුපියභාවය පිළිබඳ ප්‍රශ්නයයි. එනම් මව සහ පියා දරුවන් විෂයෙහි ඉටු කළ යුතු කාර්යභාරය ඉටු කරන්නේද යන්න යි. මේ ප්‍රශ්නාර්ථය පැන නැගී ඇති නිසා ම දරුවන් සම්බන්ධයෙන් මව්පියන්ගේ වගකීම තවත් පාර්ශ්වයකට පවරා මව්පියන් යනු ළමයාගේ ස්වභාවික භාරකරුවන් පමණි යන නීතිමය අර්ථකථනය ලබා දි ඇත. ළමයින් සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින රජයකට අධිකරණය හරහා ඕනෑම තීරණයක් ගැනිමේ බලය ඇත. නීතියට අනුව ළමයා ගැන මව්පියන්ට ඕනෑම තීරණයක් ගැනීමේ බලයක් නැත. අද වන විට ළමයින්ට මුහුණදිමට සිදු ව ඇති සහ ඇතැම් විට දරුවන් අත්විඳින ක්‍රෑරත්වයන් හා උල්ලංඝනය වී ඇති දරුවාගේ අයිතිය හමුවේ මවුපියන්ට වඩා රජය ට දරුවන්ගේ භාරකාරත්වය පැවරී තිබීම කෙතරම් කාලෝචිතදැයි හැඟේ.

නමුත් අප ඇතුළු ආසියාතික රටවල්වල කුටුම්භය තුළ දරුවාට හිමි තැන බොහොම බලවත්ය. දරුවා පෝෂණය කිරීම, නිසි රැකවරණය, ආදරය, මාර්ගෝපදේශකත්වය මේ කී නොකී බොහෝ කාර්යයන් මවුපියන්ට පැවරී ඇත. මේ බන්ධනය නිසාම ළමයින් ට වැඩිහිටියන් විසින් සැලකිය යුතු ආකාරය පිළිබදව පුරෝකථනයක් සැකසී ඇත. මේ සමාජ සම්මතයට හිස නමමින් මවුපියන්ගේ අයිතින් හා වගකීම්වලට රජය ගරු කළ යුතුය යන කාරණයට ද නීතයේ දී ප්‍රබලත්වයක් ලබා දී ඇත.

අද වන විට දරුවන් සම්බන්ධයෙන් පැන නැගී ඇති බරපතළම ප්‍රශ්නය භාරකාරත්වයයි. භාරකාරත්වය යනු වගකීමෙන් බැඳී තිබෙන්නා වු කාර්යාවලියකි. එය සැහැල්ලුවෙන් තැකිය හැකි නොහේ. ලංකාවේ දරුවන්ගේ භාරකාරත්වය හා රැකවරණය අභියෝගයකට ලක් වුණේ මව්වරුන් විදෙස් ගෘහ සේවය ට අවතීර්ණ විමේ ක්‍රියාවලියත් සමඟ යැයි මතයක් පවතී. එය එක් අවස්ථාවක් පමණි. මෙය වඩාත් විවාදාපන්නව සමාජයෙන් මතු වුණු සිද්ධියක් බවට පත් වු මුත් දැන් දැන් ඊට වඩා වෙනස් හේතූන් කරළියට පැමිණ ඇත. එහෙත් ඉකුත් කොරෝනා සමයේ ළමයින් බොහොමයක් අත්විඳි අවාසනාවන්ත සිද්ධීන් බලන විට මව්පියන් ළඟ සිටිද්දි ම දරුවන් අගතියට පත්වු අවස්ථා වාර්තා විය. ඇතැම් දරුවන් ගේ ආරක්ෂාව වැඩියෙන් සහතික කිරීමට නම් ළමයින් මවුපියන් සහ වැඩිහිටියන්ගෙන් ඈත් කර තැබීම සඳහා තිරණ ගැනීමේ නීතිමය බලය රජය සතුය යන කාරණයේ වැදගත් වන්නේ මෙවන් විටෙකය. දරුවන් මවුපියන්ගෙන් වෙන් කර තැබීම යන කාරණය විශ්ව ළමා ප්‍රඥප්තියේ 9 වැනි වගන්තියේ ද සඳහන් වෙයි. මවුපියන්ගෙන් ළමයාට ලැබිය යුතු උපරිම භාරය සහ ආරක්ෂාව නොලැබෙන්නේ නම්, ළමයා නොසලකා හැර ඇත්නම් මවුපියන්ගේ වෙන් කර තැබිමට රජයට අයිතියක් ඇත.

වර්තමානයේ දී ළමයින් හමුවේ පවතින ඛේදනීය සමාජ පසුබිම එකවර වෙනස් කිරීම උගහට කරුණක් මුත් ළමයා ආරක්ෂා කර ගැනීමේදී හැදු වැඩු මව්පියන්ට භාරකරුවන්ට බරපතළ වගකීමක් පැවරි ඇත. යම් හෙයකින් කිසියම් අපයෝජනයකට ක්‍රෑරත්වයකට, කායික මානසික හිංසනයකට ළමයා ලක් වුව හොත් නීතියෙන් සඟවා තැබීම කිසි සේත්ම නොකළ යුතුය. නීතිය හමුවට

> කායික මානසික හිංසනයකට ළමයා ලක් වුව හොත් නීතියෙන් සඟවා තැබීම කිසි සේත්ම නොකළ යුතුය. නීතිය හමුවට ගෙන යෑමෙන් ළමයා තවදුරටත් අගතියට පත් වන බවට පවතින දුර්මතය ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීමට බාධාවකි. අද බොහෝ විට මේ තත්ත්වය දැකිය හැකිය. මින් සිද්ධ වන්නේ අපරාධකරුවන්ට ආරක්ෂා වීමට ඉඩ සැලසීම මෙන්ම ළමයා තවදුරටත් අපයෝජනයේ ගොදුරක් වීමට මග සැලසීමයි.

ගෙන යෑමෙන් ළමයා තවදුරටත් අගතියට පත්වන බවට පවතින දුර්මතය ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීමට බාධාවකි. අද බොහෝ විට මේ තත්ත්වය දැකිය හැකිය. මින් සිද්ධ වන්නේ අපරාධකරුවන්ට ආරක්ෂා වීමට ඉඩ සැලසීම මෙන්ම ළමයා තවදුරටත් අපයෝජනයේ ගොදුරක් වීමට මග සැලසීමයි. යම් හෙයකින් ළමයකු මෙවැනි අවසානාවන්ත සිද්ධියකට මුහුණ පෑ අවස්ථාවක වහාම ළඟම ඇති පොලිසියට, ළමා රක්ෂණ අධිකාරිය හෝ දරුවන් සම්බන්ධයෙන් නීතිය හා රැකවරණය ලබා දීමට වගකීමෙන් සිටින ආයතනයකට යොමු වීම මව්පියන් සහ භාරකරුවන්ගේ පළමු සහ අනිවාර්ය වගකීමයි. එමෙන්ම අදාළ සිද්ධියේ සාක්ෂිවලට කිසිදු හානියක් නොවන පරිදි ළමයා යොමු කිරිමෙන් අපරාධකරුවන්ට, වැරැදිකරුවන්ට සැඟව සිටිමේ ඉඩ ප්‍රස්තා අහුරනු ලබයි.

උදාහරණයක් ලෙස ලිංගික අපයෝජනයකට දරුවකු ලක්ව ඇති බවට සිද්ධිය සිදු වු අවස්ථාවේම දැනගත හොත් සැකකරු ගේ අනන්‍යතාව සනාථ කර ගත හැකි සාක්ෂිවලට හානියක් නොවන ලෙස රැගෙන යා යුතුය.

ළමයින් සම්බන්ධව කටයුතු කිරීමට නීතිය පැත්තෙන් විශාල ප්‍රතිපාදනයන් දක්නට ලැබේ. නීති රීති අණ පනත්, ප්‍රඥප්ති, ප්‍රකාශන, දක්නට ලැබේ. එයින් ප්‍රධාන වශයෙන් දණ්ඩ නීති සංග්‍රහය හා එහි සංශෝධන, 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත, සාක්ෂි ආඥා පණත, 1939 අංක 48 ළමා ළමා හා යෞවනයින් පිළිබද ආඥා පනත, 1956 අංක 48 දරණ ළමයින් හා යෞවනයින් පිළිබඳ (හානිකර ප්‍රකාශන) පනත, 1954 අංක 19 සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ පනත, 1956 අංක 47 දරන කාන්තාවන් යෞවනයන් හා ළමයින් සේවයේ යෙදවීමේ පනත, හා එහි සංශෝධන, 1841 අංක 04 දරන අයාල ආඥා පනත, සාක්ෂි ආඥා පනත, සුනාමි විධිවිධාන පනත, 1981 අංක 79 වයෝපූර්ණත්ව පනත, 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත ඇතුළු නීතිමය තත්ත්වයන් විශාල ප්‍රමාණයක් ළමයා සම්බන්ධයෙන් කටයුතු කිරීමට අප සතුව තිබේ.

මීට අමතරව ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය, කම්කරු ආඥා පනත, විවාහ ආඥා පනත, අනිවාර්ය අධ්‍යාපන පනත, අධ්‍යාපන පරිපාලන චක්‍රලේඛ ආදී නීතිමය තත්ත්වයෙන් පසු ළමයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට විවිධ අණපනත් ක්‍රියාත්මක වේ.

වර්තමානයේදී මෙම නීතිවලින් වැඩි වශයෙන් භාවිතා වන අවස්ථාවන් කිහිපයක් තිබේ.ළමයින් සම්බන්ධ නීතිමය ප්‍රතිපාදන කොතෙක් තිබුණත්, ළමයින් සම්බන්ධ නීතිමය තත්ත්වය භාවිතයේදී 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන පනත යනු ළමයා සම්බන්ධ නීති ක්ෂේත්‍රයේ සන්ධිස්ථානයක් හා හැරවුම් ලක්ෂ්‍යයකි. එයට හේතුව ලෙස පෙන්වා දිය හැක්කේ මීට පෙර කෙතරම් නීති දක්නට ලැබුණද ළමයාට එරෙහිව සිදුකරනු ලබන අපයෝජන සම්බන්ධ කටයුතු කිරීමට නීතියේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොවීමයි. මෙම සංශෝධනය එන තුරුම ළමයින් සම්බන්ධ කටයුතු කරන ලද්දේ රටේ පොදු නීතිය යටතේය. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධ පනත මඟින් ළමයින් සම්බන්ධව කටයුතු කිරීමට නව කාරණා ගණනාවක් හඳුන්වා දෙන ලදී. ඒ අතර, බරපතළ ලිංගික අපයෝජනය (365 ආ), ලිංගික අතවර කිරීම (360 ඇ), ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍ර යෝජන ගැනීම (360ආ), කුට්ඨනය (360අ), ව්‍යභිචාරය(364අ), තැනැත්තන් වෙළෙඳම් කිරීම (360ඇi), ළමයින්ට ක්‍රෑරකම් කිරීම(308 අ) අසභ්‍ය ප්‍රදර්ශන හෝ දර්ශන ඡායාරූප සඳහා ළමයින් යොදාගැනීම (386(1) ආදිය වැඩිහිටියන් විසින් ළමයින්ට සිදුකරනු ලබන වැරැදි ලෙස හඳුනවා දි ඇති අතර, නීතියෙන් දඬුවම් කළ යුතු අපරාධ ලෙස සලකා ඇත.

උක්ත කාරණාවල දක්නට ලැබුණ විශේෂ ලක්ෂණ කීපයක් ළමයින් වෙනුවෙන් වඩාත් ප්‍රයෝජන බව පෙන්වා දිය හැක. කලින් පැවති වැරැදි සඳහා නීතිය මඟින් දඬුවම් නියම කරන ලදී. ළමා අපයෝජන වැරදි සඳහා අනිවාර්ය අවම සිර දඬුවම් පැමිණ වීමට විධිවිධාන සකස්කරන ලදී.

මෙම වැරදිවලට ගොදුරු වන වයස අවුරුදු 18 අඩු ලෙස සලකා ඇති අතර, අවු.18 අඩු පුද්ගලයෙකු සඳහා නීතියේ රැකවරණය ලැබීම, ළමයකුට එරෙහිව සිදුකරන සෑම ලිංගික අපරාධයකම නියමිත දඬුවම අවු10ක අවම සිර දඬුවම් අනිවාර්ය කිරීම, එසේම අපරාධයට ගොදුරු වන ළමයාට වරද කරනු ලැබූ පුද්ගලයා විසින් වන්දියක් ගෙවීමට මේ තුළින් ප්‍රතිපාදන ඇත.

වර්තමානයේ ළමයින් සම්බන්ධයෙන් වාර්තා වන බහුල සිද්ධීන් කිහිපයකි. සිඟමනේ යෙදවීම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සඳහා යෙදවීම මේ අතර වෙයි.ඒ සම්බන්ධයෙන් නීති තිබේ. එහෙත් බොහෝ දෙනෙක් මේ ගැන නොදනිති. ඒ සම්බන්ධ නීති ප්‍රතිපාදන ඉතා පැහැදිලිව දක්නට ඇත. දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන අතර 1998 අංක 29 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන පනත මඟින් ළමයින් සිගා කෑමෙහි යෙදවීම හෝ සිඟමන් යැදීම සඳහා ළමයින් යොදවා ගැනීම, සපුරා තහනම් කර ඇත (288), අපට ඇතැම් අවස්ථාවන්වලදී දක්නට ලැබෙන්නේ ළමයින් වඩාගෙන දරුවන් පෙන්වමින් අසරණ භාවය පෙන්වමින් බස් රථ තුළ, මාර්ග තුළ, සෙනග ගැවසෙන ස්ථානවල සිඟමන් යැදීමයි. එය නීතියෙන් වරදකි.

නීති කොපමණ පැවතිය ද සමාජය ඒ ගැන නොදන්නේ නම් ළමයාට ඇති හිමිකම තහවුරු කිරීම ගැටලු සහගතය. සැබැවින් ම මේ නීති සම්බන්ධයෙන් සාමාන්‍ය ජනයාගේ දැනුවත් භාවය ඉතා අවම ය. සාමාන්‍ය ජනයාගේ පමණක් නොව මෙම ක්ෂේත්‍රයට සම්බන්ධව ක්‍රියාකරන නිලධාරීන්ට ද ළමා නීතිය පිළිබඳ ගැඹුරින් දැනුවත් වීම අවශ්‍යය. ඒ පිළිබඳ සියලු ප්‍රජාව දැනුම්වත් වීම මඟින් අපයෝජනයක් සිදුකිරීමට පෙර එහි අවදානම අපයෝජකයකුට අවබෝධ වීම, නීතියේ පිළිසරණ අවශ්‍ය පාර්ශ්වයට කඩිනමින් ක්‍රියාත්මක වීමේ හැකියාව, නිලධාරීන් ලෙස සම්බන්ධීකරණය හා නීතිය ක්‍රියාත්මක කිරීම සිදු කිරීමේ හැකියාව ඒ මඟින් ඇති වේ.

නීති කොපමණ පැවතියද නිතියේ හිඩැස් ද නැතුවා නොවේ. ළමයා පිළිබඳ නිර්වචනය ස්ථාවර නොවීම විවිධ අණපනත් අනුව ළමයාගේ වයස් සීමාව වෙනස් වීම නීතිය ක්‍රියාත්මක කිරීමේ දී සිමාවන් ඇති කරයි. පවතින සමාජ ප්‍රවණතාවන්ට අනුව පනත් සංශෝධනයන් නොවීම ද ගැටලුවකි. උදාහරණ ලෙස වර්තමානයේ ළමයින් සම්බන්ධයෙන් වැඩි වශයෙන් අන්තර්ජාල හා ජංගම දුරකතන ආශ්‍රිත අපරාධ වාර්තා වීම සිදු වේ. ඒත් ඒ සම්බන්ධ නීතියේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නැත. 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන පණතේ පරිගණක මගින් ළමයින් අපයෝජනයට පත් වීම වැළැක්වීම හා එවැනි සිදුවීම් පිළිබඳ තොරතුරු වාර්තා කිරිම අදාළ පරිගණක සේවා සපයන්නා විසින් ම කළ යුතු බවට (286 ආ) ඇත. එහෙත් එවැනි තත්ත්වයන් ප්‍රායෝගික නොවන අතර, අද ළමයින් අන්තර්ජාල අපරාධ සිදු කරන්නේ තම හෝ මවගේ පියාගේ ජංගම දුරකතනය භාවිත කිරීමෙන්ය.

නීතියේ ප්‍රතිපාදන පැවතියත් දඬුවම් දීමක් සිදු නොවීම ද ගැටලුවකි. දණ්ඩ නීති සංග්‍රහයේ 363, 364 වගන්ති ස්ත්‍රී දූෂණය පිළිබඳ සලකා බැලීමේදී අවුරුදු 10ට නොඅඩු අවුරුදු 20ට නොවැඩි බරපතළ සිර දඬුවමක්, දඩයක් , අගතියට පත් කාන්තාවට වන්දියක්, වන්දිය ගෙවීමට අපොහොසත් නම් තවත් අවුරුදු 2 දක්වා සිර දඬුවම් දීර්ඝ වේ. එහෙත් එම දඬුවම් පැමිණවීම, ව්‍යභිචාරය(ඥාතීන් අතින් දූෂණයට ලක් වීම) අවුරුදු 15 සිර දඬුවම් නීතියේ තිබුණ ද ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ විරලතාවක් දක්නට ඇත.

පිරිමි ළමයා සම්බන්ධ දූෂණයට නීතියේ ප්‍රතිපාදනය නොමැති වීම අද නීතයේ පවතින හිඩැසකි.අද ඇතැම් නඩු විසදීමට කාලයක් ගත විම ද වින්දිතයාට සිදු විය යුතු සාධාරණය ඉටු කිරීමට බාධාවක් වී ඇත. මානසික අපයෝජනයට පත් වීම ඔප්පු කර ගැනීමේදී ඇති බව බාධාවන් ද සුලබය.

ඒ කෙසේ වෙතත් නීතිය කෙසේ ක්‍රියාත්මක වේද , සමාජය නිවැරිදි මගට අවතීරණ වන්නේ කවදාදැයි සිතීමට වඩා වර්තමානයේ මේ සිද්ධි බලන විට මව්පියන් සහ භාරකරුවන් දරුවන් ගැන මීට වඩා වගකිමෙන් කටයුතු කිරිමේ අවශ්‍යතාව දැඩිව මතු ව තිබේ. එමෙන්ම සමස්ත ළමා පරපුරේ අනාගතය සම්බන්ධයෙන් රතු එළියක් නිකුත් වි ඇති බව සිහි තබා ගත යුතුය.

**සකුන්තලා ජයසිංහ**
ඡායාරූපය - දමින්ත ගුණරත්න





# ජාතිකවාදී දේශපාලනය යල්පැනගිය සංකල්පයක් නොවෙයි

අද බොහෝ දෙනා මෙම 'ජාතිකවාදී' යන වචනය දෙස බලන්නේ වපර ඇහැකිනි. ජාතිය, සිංහල වැනි වදන් කාලයක් තහනම් වචන බවට පත්ව තිබිණි. ඒ නිසා, අප ඒ සම්බන්ධ කතිකාවක්, සම්භාෂණයක් ආරම්භ කිරීමට මුලපිරිය යුතුව තිබේ. නිදහස ලැබීමෙන් පසුව මේ රට පාලනය කළ නොයෙක් වැදගත් දේශපාලන නායකයන්, වැදගත් දේශපාලන පක්ෂ අනුගමනය කළ ප්‍රතිපත්ති සියල්ල අසාර්ථක බව, අදටත් විසඳාගත නොහැකි ප්‍රශ්න අප හමුවේ තිබීමෙන් පැහැදිලි වෙයි.

මා මෙහි දී අවධානය යොමු කරන්නට බලාපොරොත්තු වන්නේ, මේ රටේ නායකයන් අනුගමනය කළ දේශපාලන ප්‍රතිපත්ති පිළිබඳ නොව, ඔවුන්ගේ දේශපාලන දර්ශනය ගැනය. අපට වුවමනා තරම් ප්‍රතිපත්ති සකස් කළ හැකි අතර, එසේ සකස් කළ ප්‍රතිපත්ති ද ඕනෑතරම් තිබේ. අප මේ සා කාලයක් සකස් කළ ප්‍රතිපත්ති අප අසමත් කර ඇති බව පෙනෙන්නට තිබේ. එසේනම්, අපට අවශ්‍යව තිබෙන්නේ කුමක් ද? අපට අවශ්‍යව තිබෙන්නේ දේශපාලන දර්ශනයකි.

දේශපාලන දර්ශනයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? දේශපාලන දර්ශනයක් යන්නෙන් අදහස් කරන්නේ දේශපාලන ක්‍රියාවලියේ අරමුණ සහ දේශපාලන ක්‍රියාවලියේ ස්වභාවය යි. (The nature and the purpose of the political life) ඉඳුරාගාරේ ධම්මරතන නාහිමියන් පැවසූ පරිදි ම මෙය සාකච්ඡා කිරීමට නම් අපට අලුත් ක්ෂිතිජයක් දෙස අලුත් ඇසකින් සහ අලුත් අපේක්ෂාවලින් බැලිය යුතුව තිබේ.

දේශපාලන දර්ශනයක් ඔස්සේ මේ රටට ගැළපෙන මේ රටේ ඥානය ගැන, මේ රටේ සම්පත් ගැන විශ්වාසය ඇති කර ගන්නට හැකි ආකාරයේ දර්ශනයක් නිර්මාණය කර ගැනීම අපට අවශ්‍යව තිබේ. අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ මේ රට ධීර වීර පාලකයන් විසින් පාලනය කළේ දර්ශනයක් ඇතිව ය. ඒ සම්බන්ධ තොරතුරු අපට පැරණි මූලාශ්‍රයවලින් සොයාගත හැකිය. 'පාලි රසවාහිනියේ' සඳහන් එවැනි පාඨයක් මම මෙහි දී උපුටා දක්වන්නට කැමැත්තෙමි. ඒ, 'රාජ ධම්මො පජා රක්ඛා' යන්නය. එනම්, 'රාජ ධර්මය නම් ප්‍රජාව ආරක්ෂා කිරීමයි'.

පසුගිය දිනවල මේ සමාජයේ ඇති වූ ව්‍යසනවලින් ප්‍රජාවගේ ආරක්ෂාව ගිලිහී ඇති බව අපගේ අවධානයට ලක් විය. මීට අවුරුදු දස දහස් ගණනක් එපිට කාලයේදීත්, අපේ ධීර වීර සම්පන්න දූරදර්ශී නායකයන් රාජ ධර්මය යැයි සැලකුවේ ප්‍රජාවගේ ආරක්ෂාවය. මහාධිරාජ අශෝක රජතුමා ඔහුගේ එක්තරා ශිලා ලේඛනයක 'සවේ මුනිසා පජා මම' යනුවෙන් ලියා තිබේ. එයින් අදහස් කරන්නේ 'සියලු ප්‍රජාව මාගේ දරුවෝය' යන්නය. රාෂ්ට්‍ර පාලකයාගේ දර්ශනය එයයි.

ප්‍රතිපත්ති සකස් කළ යුත්තේ එම දර්ශනය මත සිටය. දර්ශනයක් නොමැතිව සකස් කරන ප්‍රතිපත්ති යනු, මාලිමාවක් නොමැතිව යාත්‍රා කරන නෞකාවක් මෙනි. එනිසා, මේ සමාජය මුහුණ දී සිටින තීරණාත්මක අවස්ථාවේ දී, අප සියලුදෙනා මාතෘභූමියට ඇති ආදරයෙන් රට, දැය, සමය යන අදහස් තුන ඉදිරියේ තබාගෙන, ජාතිකවාදී මාර්ගයකට අවතීර්ණ වීම අවශ්‍යව තිබේ.

මිහිඳු මහ රහතන් වහන්සේ මේ රටට වැඩමකොට, සමකාලීන දේවානම්පියතිස්ස රජතුමාට ධර්මය දේශනා කොට, උන්වහන්සේ සමග පැමිණි එක්තරා ගිහි සිල්වතකු පැවිදිකොට අවසන් වූ පසුව, දේවානම්පියතිස්ස රජතුමා මිහිඳු මහරහතන් වහන්සේගෙන් 'ස්වාමීනි ! ධර්මය පිහිටියේදැයි' විමසා සිටියේය. උන්වහන්සේගේ පිළිතුර වූයේ 'නැත මහරජ !' යන්න ය. 'එසේනම්, මේ රටේ ධර්මය පිහිටුවන්නේ කෙලෙසදැයි' රජතුමා විමසා සිටි විට, මිහිඳු මහරහතන් වහන්සේගේ පිළිතුර වූයේ, 'මේ රටේ උපන් දරුවකු පැවිදි කරන තෙක් මේ රටේ ධර්මය නොපිහිටන්නේය' යන්න ය.

මේ ප්‍රකාශය තුළ තිබෙන දර්ශනය අනුව යමින්, මේ රට සංවර්ධනය කරන්නට, මේ රට ඉදිරියට ගෙන යන්නට අවශ්‍ය කරන ඥානය අප සොයාගත යුත්තේ, අපේ මේ මාතෘභූමිය තුළින්මය. එනිසා, අප දරන මත, අප දරන වරණය කුමක් වුවත්, අප රට වෙනුවෙන් කල්පනා කරන්නේ නම්, එවන් දූරදර්ශී දැක්මක් අප ඇතිකර ගත යුතු ය. ජාතිකවාදී දේශපාලනය, ජාතිකවාදී මතය යැයි අප විශ්වාස කරන්නේ, අපේ මාතෘභූමියෙන් සහ අපේ ඉතිහාසයෙන් හා සම්ප්‍රදායෙන් අප සොයා ගන්නා අදහස් මත ඉදිරියට යාමකි.

අප මෙසේ පවසන විට බොහෝ දෙනෙක් අද ලෝකයේ ඇති සංකීර්ණ අර්බුද අපේ ඉතිහාසයෙන් සහ සම්ප්‍රදායෙන් විසැඳිය හැකි දැයි අපෙන් ප්‍රශ්න කරති. ලෝකයේ පළමුවැනි තානාපති ගමන සිදුකළ නායකයා සිටියේ අපේ රටේය. ඒ, පළමුවැනි ගජබා රජුය. ඔහු පත්තිනි දේවාලයක් විවෘත කිරීම සඳහා චේල රටට ගොස් තිබේ. අන්තර්ජාතික ප්‍රශ්න සමග ගනුදෙනු කරන්නට හැකි දැනුමක් එකළ ද අපට තිබිණි.

ක්‍රිස්තු වර්ෂ දෙවැනි ශතවර්ෂයේ දී අම්බලන්තොට ගොඩවාය විහාරය අසල පිහිටි තොටුපළෙන් එකළ රේගු බදු, තීරු බදු අයකර තිබේ. ඒ බව එහි ඇති ශිලා ලේඛනයක සඳහන්වේ. මේ නූතන අදහස්, අන්තර්ජාතිකය සමග ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් අපට ඇති අත්දැකීම් යන සියල්ලක්ම අපේ ඉතිහාසය තුළ අපට අවේණික අනන්‍යතාවකින් යුතුව සටහන් වී තිබේ. එනිසා, අප වෙත ඇති දර්ශනය, අප වෙත ඇති අදහස් මේ වර්තමානයේ ඇති ගැටලු විසඳාගැනීමට භාවිත කළ හැකිව තිබේ.

මට හමුවූ එක්තරා සාහිත්‍ය මූලාශ්‍රයක ඇති විමර්ශනයක සඳහන් වන්නේ 'රට නොමැති නම් රාජ්‍යයක් නොමැත' යනුවෙනි. එහෙයින්, රාජ්‍ය ආරක්ෂා කිරීම සඳහා කරන කටයුතුවලට පෙර, රට ආරක්ෂා කිරීම සඳහා කළයුතු කාර්යය රාශියක් තිබේ. පුරවැසියන් ලෙස අප සියලු දෙනාගේම වගකීම විය යුත්තේ යැයි මා අදහස් කරන්නේ, මේ රට ආරක්ෂා කර ගැනීමට අපේ සියලු හැකියාවවලින් සහ සියලු ඥාන සම්භාරයෙන් කටයුතු කිරීමය.

මා මේ අදහස් පුන පුනා ප්‍රකාශ කිරීමට හේතුව වන්නේ, අපේ රට මුහුණ දී තිබෙන ජාත්‍යන්තර හෝ වේවා දේශීය හෝ වේවා අභියෝග දෙස බැලීමට හා එම අභියෝග ජය ගැනීමට අවුරුදු දහස් ගණනක් තිස්සේ අප විසින් නිර්මාණ කරගත් දේශපාලන දර්ශනය, ආර්ථික දර්ශනය අනුගමනය කිරීමට හෝ එයින් කිසියම් ආභාසයක් ලබා ගැනීමට අපට අවශ්‍යව තිබීමය.

අපි මේ තාක් කල් ඇරිස්ටෝටල්ගේ පටන් ලෙවියතාන්, හොබ්ස්ලා දක්වා ලෝකයේ නොයෙක් ආර්ථික විද්‍යාඥයන්ගේ දේශපාලන හා ආර්ථික දර්ශන අනුගමනය කර ඇත්තෙමු. එහෙත්, තවමත් අපි අසාර්ථකව සිටිමු. අපේ ඉතිහාසය රැගෙන ආ දාර්ශනික අදහස් මුළුමනින් ම යාවන්නේ ජාතිකවාදී අදහස්වලට ය.

1947 ඉන්දියාවට නිදහස ලැබීමෙන් පසුව ඉන්දීය ව්‍යවස්ථාව කෙටුම්පත් කරන අවස්ථාවේ ජවහර්ලාල් නේරුතුමා කළ ප්‍රකාශයක් මට මෙහි දී සිහිපත් වේ. එම ප්‍රකාශය නම්, 'අනාගත ඉන්දියාව ගොඩනැඟීමට නම්, ඉන්දියානුභාවය හා ජාතිකවාදය වෙත අවධානය යොමු කළ යුතු යි' යන්න ය. විශාල ජන විවිධතාවක් තිබෙන, ආගම් විවිධතාවක් තිබෙන ඉන්දියාවට එම චින්තනය අහිතකර නොවී ය. උෂබාස්බි කියන අදහස ඉන්දියාව පුරා ඇති කරන්නට එම ව්‍යවස්ථාවෙන් සම්පාදිත කරුණු බෙහෙවින් ඉවහල් වී ය.


අවසාන වශයෙන් අපේ අතීත පාලකයන් ඔවුන් සතු වගකීම් දුටු ආකාරය ඔබ හමුවේ තබන්නට මම අදහස් කරමි. ලංකාවේ තිබෙන එක ම රජ පිළිමය සේ සැලකෙන්නේ රුවන්වැලි සෑ මළුවේ ඇති භාතිකාභය රජතුමාගේ ප්‍රතිමාවයි. මා මෙය තෝරාගත්තේ රටක පාලකයකුගේ, දේශපාලනඥයකුගේ දර්ශනය කුමක් දැයි පෙන්වා දීමට ය.

පළමුවැනි විජයබාහු නැතහොත්, කීර්ති විජයබාහු නමැති රණකාමී වීර රජතුමා චෝල පාලනය විද්වංසනය කොට මේ රට එක්සේසත් කළේ ය. එක් අවස්ථාවක ඒ රජතුමා ශ්‍රී පාද වන්දනාව සඳහා ගමන් කළ අතර, ඒ ගමනේ දී ගිලීමලේ නම් ගම ශ්‍රී පාදස්ථානයට පූජා කිරීම සටහන් කිරීම සඳහා නාවලපිටිය, අඹගමුව අසල ශිලාලේඛනයක් ස්ථාපිත කර තිබේ. එම අඹගමුව ශිලා ලේඛනයෙන් අපට විජයබාහු රජු තුළ පැවැති උසස් ගුණාංග පැහැදිලි වෙයි.

එය ආරම්භ වන්නේ 'තුනුරුවනට පුද' යනුවෙනි. එහෙත්, අප අද වාසය කරන්නේ තුනුරුවන් දෙරුවන් වන අවාසනාවන්ත සමයක ය. මේ රටේ යම්කිසි පාලකයෙක් සිටීනම්, ඔහුගේ පළමුවැනි ගුණය 'තුනුරුවනට පුද සත්කාර කිරීම' ය. එසේ ම, එහි දක්වා ඇති අනෙක් ගුණාංග මෙසේ ය. 'ඇජරනට උවටැන්' - ගුරුවරුනට උපස්ථාන කිරීම, 'යුද්මෙට ගැවුරුම්' -, 'වියත්නට සසිරි'- වියතුනට සශ්‍රීකත්වය. මෙහිදී වියතුන් යනු කවුරුන් ද යන්න පිළිබඳව නායකයන්ට හොඳ විනිශ්චයක් තිබිය යුතු ය. 'සතුරන්ට දප' එය ද, අපේ නායකයින් තුළ තිබිය යුතු ගුණාංගයකි. සතුරෙක් සිටී නම් ඔහුව මර්දනය කිරීම ඒ රාජ න්‍යායේ තිබෙන ලක්ෂණයකි. එම සෙල් ලිපියේ සඳහන් ඉතාමත් වැදගත් ම ගුණාංගය වන්නේ 'සබවට නුවණ' - සභාවක දී ඥානාන්විතව කතා කිරීම සහ රටේ සියලු ප්‍රජාවන්ට ආදර්ශයක් වන ලෙස කතා කිරීම ය.

මේ සියලු දේ සවිසත්නට කුලුණුවත්භාවයෙන් පාලකයා විසින් සිදු කළ දෑ ය. එනිසා, ජාතිකවාදී දේශපාලනය යනුවෙන් අදහස් කරන්නේ යල්පැන ගිය සංකල්පයක් නොවේ. ජාතිකවාදී දේශපාලනය යනු අවුරුදු දෙදහස් පන්සියයකට වැඩි කාලයක් තිස්සේ පමණක් නොව, චීනයේ සිට ඊජිප්තුව දක්වා විහිද ගිය විශාල සමුද්‍රික කලාපය තුළ හරිමැද පිහිටි උපායමාර්ගික රටක් ලෙස අපේ රට තුළ මෙන් ම, ජාත්‍යන්තරයේත් අප ක්‍රියාකරමින් නිෂ්පාදනය කළ දැනුමින් සමන්විත ඉතිහාසයට හා සම්ප්‍රදායට ය.

බටහිරින් ඊජිප්තුව දක්වා මේ රට 'සිංහල ද්වීපය' බව දැන සිටියේ ය. එනිසා, අරාබි ජාතිකයෝ ඔවුන්ගේ උච්චාරණයෙන් මෙරට 'සෙරන්ඩිබ්' යනුවෙන් හැඳින්වූහ. මෙය සිංහල දේශය නිසා ඇතැම්හු මෙයට 'සෙයිලාන්' යැයි පැවසූ හ. 'තම්බපණ්ණිය', 'තැප්‍රොබේන්' යනුවෙන් උච්චාරණය කළෝ ය. මුළු ලෝකය ම මේ කුඩා දිවයින ගැන දැන සිටියේ ය. මේ කුඩා දිවයින අවුරුදු දස දහස් ගණනක් තිස්සේ ලෝකය සමග කටයුතු කළ දිවයිනකි. එසේ කිරීමෙන් උත්පාදනය කරගත් ඥාන සම්භාරය ඉතිහාසය හා සම්ප්‍රදාය තුළ ගැබ්ව තිබේ. ඒ දෙස නැවත වරක් ප්‍රත්‍යවේක්ෂා කොට ඉන් ගත හැකි පාඩම් ලබාගෙන මේ රට ඉදිරියට ගෙනයාම සඳහා තීන්දු තීරණ ගන්නා හැටියට මේ රටේ වැදගත් දේශපාලන නායකයන් සිතා බැලිය යුතු ය.



මහාචාර්ය රාජ් සෝමදේව

**අනුර බී. සෙනෙවිරත්න**

# වියපත්

## ජනගහන වර්ධනය සමාජ ගැටලුවක් ද?



වැඩිහිටියකු, දරුවකු නොමැති නිවෙසක සිරියාවක් නොමැති බවට විශ්වාසයක් තිබේ. මිනිස් ප්‍රජාව තුළ මේ දෙකොට්ඨාසයටම හිමි වන ස්ථානය ඉහළය. අද ලෝක ළමා දිනය මෙන්ම, වැඩිහිටි දිනය ද වේ. එකම දිනයකදී, මේ දෙකොට්ඨාසයම ඇගැයීමට ලක් වීම ද විශේෂතාවකි.

ලෝක ජාතික සැමරුම් දිනපොත, සෑම වසරකම ඔක්තෝබර් 01 වැනි දින, ලෝක ජනගහනයේ වටිනා පුද්ගල කාණ්ඩ දෙකක් වෙනුවෙන් වෙන් කර ඇත. ඒ, පුද්ගලයකුගේ මූලික වර්ධන අවධියට අයත් පුද්ගල කාණ්ඩයක් වන ළමයින් සහ ජීවන අත්දැකීම් එකතුවක් සහිත පුද්ගල කාණ්ඩය වන වයස්ගත පුද්ගලයන් වෙනුවෙනි. මේ කාණ්ඩ ද්විත්වයම අනාගත මිනිස් ප්‍රජාවේ යහ සංවර්ධන අවස්ථා වර්ධනය සඳහා සෘජුවම දායක වේ. ඒ අතුරින්, ලෝක වයස්ගත පුද්ගලයන් වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත්ය. මෙවර ලෝක වැඩිහිටි දිනයේ තේමාව වන්නේ, "වසංගත හමුවේ වැඩිහිටි අභියෝග"යන්නයි. ලෝකය මුහුණු පා ඇති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ, වැඩිහිටි දිනයට ද නව මුහුණුවරක් එක්ව ඇත්තේ, එම වසංගත තත්ත්වය, වැඩිහිටි පුද්ගල කොට්ඨාසය වෙත දැඩි අභියෝගයක් එල්ල කිරීම හේතු වන්නට ඇත. එමෙන්ම, වසංගත අවස්ථා හමුවේ වියපත් වීම සහ වියපත් වීම ආමන්ත්‍රණය කිරීම අන්තර්ජාතික වැඩිහිටි දිනයේ අපේක්ෂාව ද වී ඇත.

1990 දෙසැම්බර් 14 වැනි දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය (45/106 යෝජනාව අනුව) ඔක්තෝබර් 1 වැනි දින වැඩිහිටි පුද්ගලයන්ගේ අන්තර්ජාතික දිනය ලෙස නම් කෙරිණ. ඒ අනුව, මේ නිවාඩු දිනය පළමු වරට 1991 ඔක්තෝබර් 1 වැනි දින සැමරින. වැඩිහිටියන්ට බලපාන ගැටලු ලෙස මූලිකව සැලකෙන, වැඩිහිටිභාවය සහ වැඩිහිටි අපයෝජනය වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, වැඩිහිටි ප්‍රජාව වියපත් වීමත් සමග මුහුණ දෙන සියලුම ගැටලු පිළිබඳ දැනුවත් කිරීමේ සහ සාකච්ඡා කිරීමේ වැඩසටහන් රාශියක්, මෙදින ලොව පුරා සැමරේ.

වර්තමානයේ මෙරට වයස අවුරුදු 60ට වැඩි වයස්ගත ජනගහනය ප්‍රතිශතයක් ලෙස ගත් කල 12.4%කි. ඔවුහු, අප රටෙහි රිදී ආර්ථිකයට (Silver Economy) දායක වෙති. ලෝකයට සමගාමීව ශ්‍රී ලංකාව ද කොවිඩ් වසංගතය හමුවේ වැඩිහිටි ජනතාව ඉන් බේරා ගැනීමේ අභියෝගයට මුහුණපාමින් සිටී.

දියුණු රට වල වයස අවුරුදු 65ට වැඩි ජනගහනය වියපත් ජනගහනය ලෙසත්, දියුණු වෙමින් පවතින අප රට වැනි රටවල අවුරුදු 60ට වැඩි ජනගහනය වියපත් ජනගහනය ලෙසත් ගණන් ගැනේ. රටක ජනගහනය ප්‍රධාන කොටස් 03ක් යටතේ වර්ගීකරණය කෙරෙන අතර, උපතේ සිට වයස අවුරුදු 14 දක්වා ළමා ජනගහනය ලෙසත්, අවුරුදු 15ත් 59ත් අතර ජනගහනය ශ්‍රම බළකාය ලෙසත්, 60ට වැඩි ජනගහනය වියපත් ජනගහනය ලෙසත් සැලකෙයි. මෙරට, 2050 වන විට මුළු ජනගහනයෙන් වැඩිහිටි ජනගහනය 30%ක් බවට පත් වනු ඇතැයි ගණන් බලා ඇති අතර, ඉදිරි වසර පහ තුළ වැඩිහිටි සෞඛ්‍යය පිළිබඳ සහ ඔවුන්ගේ යහ පැවැත්ම උදෙසා අප රටෙහි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ පියවර රැසක් ඇත.

විශ්‍රාම යන වයස්හි පසුවන්නන් වියපත් ප්‍රජාව වන අතර, වර්තමානයෙහි ළමා ජනගහනය අඩු වීමටත්, වියපත් ජනගහනය ක්‍රමිකව වැඩි වීමටත් හේතුව ලෙස විශේෂයෙන් කැපී පෙනෙන්නේ, පුද්ගල උපතේදී ආයු අපේක්ෂාව වැඩි වීමයි. වියපත් ජනගහනය තුළ ද වයස් කාණ්ඩ හඳුනා ගත හැකිය. එනම්, 60 – 70 වයස් කාණ්ඩය වියපත් ජනගහනයේ වැඩි පිරිසක් නියෝජනය කරයි. එම බහුතරය තුළ මනා සෞඛ්‍යයක් ද, හොඳ කාර්යක්ෂමතාවක් ද පවතින බව වාර්තා වේ. අනෙකුත් වියපත් ජනගහනයට සාපේක්ෂව මොවුන් ආර්ථිකයට ඵලදායී ලෙස යොදාගත හැකි පිරිසකි. ඒ නිසා මේ ජනගහනය, රටට වටිනා මානව සම්පතක් ලෙස සලකා සුවිශේෂ අවධානයක් යොමු කිරීම වැදගත්වේ. විශ්‍රාම යාමෙන් පසු වැඩිහිටියන් හුදෙකලාව මානසික පීඩනවලට හසු වීම, සමාජ ගැටලුවක් බවට පත්වීම වැළැක්වීමට කටයුතු කිරීමේ අවශ්‍යතාව පැන නැඟී ඇත. ඒ අතුරින්, කාන්තාව සුවිශේෂ ස්ථානයක් ගෙන තිබීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු තවත් සංවේදී අතුරු පැනයකි. කාන්තාවන්ගේ සාමාන්‍ය ආයු අපේක්ෂාව අවුරුදු 78කි. පුරුෂයන්ගේ එම වයස අවුරුදු 72ක් ලෙස දැක්වේ. වියපත් කාන්තා ප්‍රතිශතය වැඩි අගයක් ගැනීම එයට හේතු සපයන්නකි. ශ්‍රම බලකායට දායක වන කාන්තාවන්, පුරුෂයන්ට සාපේක්ෂ ලෙස අවම වීමත්, වැන්දඹුභාවයත් හේතුවෙන් වියපත් කාන්තාවන්ට සුවිශේෂී රැකවරණයක් සැලසීමට සිදුවීම, සොයා බැලිය යුතු සංවේදී කාරණයකි.

සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ ඇති වැඩිහිටි මහා ලේකම් කාර්යාලය මඟින් ද, වැඩිහිටියන් වෙනුවෙන් විවිධ සේවා රැසක් ඉටු කරනු ලැබේ. වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් වෙනුවෙන් රුපියල් දෙදහසක දීමනාවක් පිරිනැමීම ද ඉන් එක් පියවරකි. වැඩිහිටියන් වෙනුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීමට වැඩිහිටි මහා ලේකම් කාර්යාලය රුපියල් මිලියන 02ක් වෙන් කිරීම මඟින්, ඔවුන්ගේ කුසලතා දැක්මට ඉඩකඩ ලබා දීම රජය වැඩිහිටියන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැදගත් තීරණයක් ලෙස සැලකිය හැකිය. ඔවුන්ට අවශ්‍ය උපකරණ පිරිනැමීම, පුහුණු අවස්ථා ලබාදීම ද වැඩිහිටි ලේකම් කාර්යාලයේ සැලසුම වී තිබේ. රට තුළ තිබෙන පෞද්ගලික අංශයේ වැඩිහිටි නිවාස 300 සහ රජයේ වැඩිහිටි නිවාස 06ද පරීක්ෂා කර ලියාපදිංචි කර ප්‍රමිතිගත කිරීමට, වැඩිහිටි ලේකම් කාර්යාලය ගෙන ඇති තීරණය ද ප්‍රශංසා සහගතය. ගම් මට්ටමෙන් පවත්නා වැඩිහිටි කමිටු සවිබල ගන්වමින්, ඒවාට අවශ්‍ය උපකරණ සහ ස්ථාන ලබා දෙමින් කටයුතු කිරීම, අවුරුදු 60ට වැඩි සියලු පුරවැසියන් සඳහා දැනට පිරිනමා ඇති යම් යම් වරප්‍රසාදවලට හිමිකම් කියන වැඩිහිටි හැඳුනුම්පත සඳහා හිමිවන වරප්‍රසාද ප්‍රමාණය ද ඉදිරියේදී වැඩි කිරීම වැනි තීරණ සහතිකව ක්‍රියාත්මක වුවහොත්, මෙරට වැඩිහිටි ප්‍රජාව ද නව පණක් ලබනු ඇත.

රටක වියපත් ජනගහනයේ අත්දැකීම් බහුලතාව සහ දැනුම පිළිබඳ සලකා බලා ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීමට සැලැසුම් සකස් කිරීම ඉතා වැදගත්ය. ශීඝ්‍රයෙන් වර්ධනය වන වියපත් ජනගහන ගැටලුව සමාජ ගැටලුවක් කර ගන්නවාට වඩා, ඔවුන්ගේ ඥානය සහ කායික ශ්‍රමය රටක ශ්‍රම බලකායට යොදවා ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු බව හැඟේ. එය රටට මෙන්ම ගෞරවනීය වැඩිහිටි ප්‍රජාවේ මානසික තෘප්තිය වෙනුවෙන් සුවිශාල මෙහෙයක් ඉටු කරලනු ඇත. අධ්‍යාත්මික දියුණුවකින් සපිරි යහපත් අනාගත පරපුරක් බිහි කිරීමට අවශ්‍ය පුද්ගල මනස, වැඩිහිටි ප්‍රජාව තෘප්තිමත්ව වාසය කිරීමට ලැබීමෙන්, ළඟා කරගත හැකිය.

**චින්තා රණසිංහ**

| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා | ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 - 09 - 29 | 2020 - 09 - 21 | 2020 - 09 - 08 | 2020 - 09 - 27 | 2020 - 07 - 31 | 2020 - 09- 09 | 2020 - 09 - 09 | 2020 - 09- 27 | 2020 - 09-02 | 2020 - 09 - 09 | 2020 - 09 - 28 | 2020 - 07 - 30 |
| දිනුම් වාරය - 2555 | දිනුම් වාරය - 1537 | දිනුම් වාරය - 2916 | දිනුම් වාරය - 630 | දිනුම් වාරය - 354 | දිනුම් වාරය - 1688 | දිනුම් වාරය - 3366 | දිනුම් වාරය - 1228 | දිනුම් වාරය - 1051 | දිනුම් වාරය - 1036 | දිනුම් වාරය - 1617 | දිනුම් වාරය - 013 |
| 05 12 28 62 | 01 33 37 57 | 21 37 45 59 | 11 21 45 64 | 22 23 40 | 07 31 35 43 | 31 34 60 64 | 11 27 35 42 | 6 4 8 3 9 6 | 07 12 39 48 | 37 46 48 58 | 04 12 33 63 |
| අක්ෂරය I | සුපිරි අංකය -01 | ලග්නය-මිතුන විශේෂිත අංක රු 500 ත්‍යාග සඳහා-9609 | ඉංග්‍රීසි අක්ෂරය- E | දෛව අංකය - 02 අක්ෂරය- L | අක්ෂරය-A | අක්ෂරය - D | අක්ෂරය - Q විශේෂ අංකය -5767 | අක්ෂරය -K | අක්ෂරය - K රු 500 ත්‍යාග සඳහා-2169 | අක්ෂරය - G | අක්ෂරය - U |

# පෞරාණිකත්වයට හානි නොකර කොළඹ පැරණි ගොඩනැගිලි පිළිසකර කරන්න

## ජනපති-අගමැති නිලධාරීන්ට උපදෙස් දෙති

කොළඹ නගරයේ පැරණි ගොඩනැගිලි පෞරාණිකත්වය ආරක්ෂා වන අයුරින් පිළිසකර කරන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ යන මහත්වරුන් නාගරික සංවර්ධන අධිකාරියේ බලධාරීන්ට උපදෙස් දී තිබේ.

එම උපදෙස්වලට අනුව කොළඹ නගරයේ පැරණි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර

පුරාවිද්‍යා ආඥා පනත යටතේ ගැසට් පත්‍රියක් මගින් ප්‍රසිද්ධියට පත් කර ඇති වසර 105ක් පැරණි ගෆූර් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණය කරනු ලබන්නේ ද ඊට අදාළවය. එම ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 620 ක් වෙන් කර ඇති අතර නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාව, මොරටුව විශ්ව විද්‍යාලය එම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනු ලබයි.

මහල් 5 කින් සමන්විත වර්ග අඩි 8250 කින් යුත් එම ගොඩනැගිල්ල කුට්ටි හැඩයෙන් යුක්ත අතර මෙම සුවිසල් පෞරාණික ගොඩනැගිල්ල කොළඹ වටිනාකම වැඩිකළ නිර්මාණයක් වශයෙන් ද හැඳින්වේ.

මෙහි ඇති පෞරාණික බව නිසාවෙන්ම එය 2000 වසරේ ඔක්තෝම්බර් 04 වැනිදා පුරාවිද්‍යා ස්ථානයක් ලෙස පුරාවිද්‍යා ආඥා පනත යටතේ ගැසට් පත්‍රයක් මගින් ප්‍රසිද්ධියට ද පත්කර තිබෙන අතර මෙහි පෞරාණික වටිනාකම අධ්‍යයනය කිරීමෙන් අනතුරුව පෞරාණික උරුමයන් ද ආරක්ෂා වන ආකාරයෙන් වර්තමාන රජය ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇත.

වසර 100කට වඩා පැරණි කොළඹ නගරයේ පෞරාණික ගොඩනැගිලි කඩා වැටීමට පෙර නිසි පරිදි අලුත්වැඩියා කිරීමේ වැඩසටහනක් 2015 වසරට පෙර එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සහ එවකට රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මෙහෙයවීමෙන් සිදු කෙරුණු නමුත් 2015 සිට වසර 4 1/2 කට ආසන්න කාලය තුළ කොළඹ නගරයේ පැරණි ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ කටයුතු කිසිවක් සිදු කෙරුණේ නැත.

මේ නිසා කොළඹ නගරයේ ඇතැම් පැරණි ගොඩනැගිලි විශාල වශයෙන් ගරාවැටී කඩාවැටීමට ආසන්න මට්ටමකට පැමිණි අතර ඇතැම් පැරණි ගොඩනැගිලිවල ඇතුළත බදාම තට්ටු කඩාවැටී තිබුණු අවස්ථා පිළිබඳව ද නාගරික සංවර්ධන අධිකාරියට වාර්තා වී තිබිණි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති හර්ෂාන් ද සිල්වා, එහි අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාද් රණවීර යන මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම ගෆූර් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකෙරේ.

# විදේශ ආයෝජනවලට ශ්‍රී ලංකාව විවෘතයි

## ජනපති නව තානාපතිවරුන්ට දැනුම් දෙයි

**ධනුෂ්ක ගොඩකුඹුර**

ශ්‍රී ලංකාව විදේශ ආයෝජන සඳහා විවෘත යැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති මන්දිරයේ දී නව තානාපතිවරු හමුවේ ඊයේ (30) ප්‍රකාශ කළේය. අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සහිත සංවර්ධන සහයෝගීතාව මෙරට ප්‍රථම ප්‍රමුඛතාවය බව අවධාරණය කළ ජනාධිපතිවරයා, ශ්‍රී ලංකාව උපායමාර්ගික වැදගත්කමක් ඇති ස්ථානයක පිහිටා තිබෙන බැවින් බොහෝ පාර්ශ්වයන්ගේ ආකාර්ශනයට ලක් ව තිබෙන බවත් කීවේය. මේ වාතාවරණය හමුවේ ශ්‍රී ලංකාව මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන බවත් රාජපක්ෂ මහතා නව තානාපතිවරු හමුවේ පැවැසීය.

ශ්‍රී ලංකාවට අලුතින් පත් වූ නව තානාපතිවරු සිව් දෙනෙකු ඊයේ (30) ජනාධිපති මන්දිරයේදී ජනාධිපතිවරයා වෙත අක්තපත්‍ර පිළි ගැන්වූ අතර ඔවුන් සමඟ කෙටි පිළිසඳරකට එක් වෙමින් ජනාධිපතිවරයා මේ බව ප්‍රකාශ කළේය.

කොරියානු ජන රජය වෙනුවෙන් ජොන්ග් වුන්ජින්ග්, ජර්මනිය වෙනුවෙන් හොල්ගර් ලෝතර් සොයිබෙයට්, වතිකානය වෙනුවෙන් මොන්සිඤ්ඤෝර් ධුරන්දර බ්‍රයන් උඩයිවේ හිමිපාණන් සහ ස්විට්සර්ලන්තය සඳහා ඩොමිනික් ෆර්ග්ලර් යන නව තානාපතිවරු මෙසේ ජනාධිපතිවරයා වෙත අක්තපත්‍ර පිළි ගැන්වූහ.

ඉන්දීය සාගරය අරභයා ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිය පිළිබඳ ව පැහැදිලි කරමින් ජනාධිපතිවරයා මෙහිදී පැවැසුවේ ඉන්දීය සාගරය සියලු රටවලට විවෘත හා නිදහස් කලාපයක් විය යුතු බවයි. ඉන්දීය සාගරය සාම කලාපයක් කළ යුතු බවට දශක පහකට පමණ පෙර ප්‍රථමයෙන් යෝජනා කළේ ශ්‍රී ලංකාව බව ජනාධිපතිවරයා සිහිපත් කළේය.

මෑත කාලීන ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යායාමය ගැන තානාපතිවරු හමුවේ පැහැදිලි කළ ජනාධිපතිවරයා, 2009දී ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පසු ආණ්ඩුවේත්, ජනතාවගේත් ප්‍රමුඛ අභිලාෂය වූයේ කඩිනම් සංවර්ධනයක් අත් කර ගැනීම බව පැවසීය. ත්‍රස්තවාදය නිසා රටේ ආර්ථිකය පරිහානියට ගියා. ඉක්මන් සංවර්ධනයක් සඳහා අපට විදේශ ආධාර අවශ්‍ය වුණා. මෙරට සංවර්ධන ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට චීනය ඉදිරියට පැමිණියා. අප දෙරට අතර සිදු වූයේ ගනුදෙනුවක්. එහෙත් ඇතැම් පිරිස් මේ සබඳතාව විග්‍රහ කළේ චීනයට පක්ෂපාතී වීමක් ලෙස. ශ්‍රී ලංකාව හැම රටක් සමගම මිතුරු යැයි ද ජනාධිපතිවරයා කීවේය.

"කළ යුතු දේ තෝරා ගැනීමට ශ්‍රී ලංකාව සමත් බව අපට විශ්වාසයි. ශ්‍රී ලංකාවේ සංවර්ධන අපේක්ෂා සපුරා ගැනීමට කළ හැකි දේ කරන්නට අපි සූදානම්" යැයි ජර්මානු තානාපති හා ස්විට්සර්ලන්ත තානාපති ඩොමිනික් ෆර්ග්ලර් මහත්වරු මෙහිදී ප්‍රකාශ කළහ.

ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ 2015 දී ශ්‍රී ලංකාවේ කළ චාරිකාවට තමාද එක්ව සිටි බව කී වතිකානයේ නව තානාපති බ්‍රයන් උඩයිවේ හිමිපාණෝ, ජනාධිපතිතුමාට ලැබී ඇති විශාල ජනවරම පිළිබඳව වත්මන් පාප් වහන්සේගේ සුබ පැතුම් එක් කළහ. භූගෝලීය පිහිටීම ශ්‍රී ලංකාවට හිමිව ඇති අනගි දායාදකැයි ද උන්වහන්සේ කීහ.

# රත්නපුර හිටපු සමෘද්ධි කොමසාරිස් නාගසේන අභාවප්‍රාප්ත වෙයි



රත්නපුර දිස්ත්‍රික් හිටපු සමෘද්ධි කොමසාරිස් නාගසේන පීරිස් මහතා දා පෙරේදා (29) අභාවප්‍රාප්ත විය. මිය යන විට ඒ මහතා 70 වැනි වියේ පසු වූයේය

දේහය රත්නපුර හිදැල්ලන වීරගොඩ අංක -1, නිවසේ තැන්පත් කර ඇත. අවසන් කටයුතු රත්නපුර පොදු සුසාන භූමියේ පිහිටි අදාහනාගරයේ දී සවස 5ට සිදුකෙරේ.

# කලවාන ප්‍රා. සභාවේ උප සභාපතිගේ මෑණියන්ගේ අවසන් කටයුතු අද



කලවාන ප්‍රාදේශීය සභාවේ උප සභාපති ප්‍රියන්ත අතුකෝරළ මහාතාගේ මෑණියන් වූ යූ .සිලවති මහත්මිය අභාවප්‍රාප්ත විය. දරුවන් හතර දෙනකුගේ මවක් වන ඇය ප්‍රදේශයේ සමාජ සේවිකාවකි.

කලවාන වෙම්බියගොඩ පිහිටි නිවසේ දේහය තැන්පත් කර ඇති අතර, අවසන් කටයුතු අද (1) පවුලේ සුසාන භූමියේදී සිදු කෙරේ.

# ඉස්ලාම් අන්තවාදය සම්බන්ධ යුද හමුදා බුද්ධි තොරතුරක් ආරක්ෂක ලේකම් ලෙස මට ලැබුණේ නෑ

## හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු

**සුභාෂිණී සේනානායක**

ඉස්ලාම් අන්තවාදය, NTJ සංවිධානය, සහරාන් හෂීම් හෝ ඔහුගේ කණ්ඩායම් පිළිබඳව කිසිදු බුද්ධි තොරතුරක් තමන් ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ මාස පහමාරක කාලය තුළ යුද හමුදා බුද්ධි අංශය විසින් තමන්ට ලබා දී නැතැයි හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පාස්කු කොමිසමේදී ඊයේ (29) කියා සිටියේය. රාජ්‍ය බුද්ධි ප්‍රධානියා මෙවැනි කරුණු සම්බන්ධයෙන් එවා තිබූ බුද්ධි තොරතුරු ඇතුළත් වාර්තාව ලැබුණු බවත් ජාතික ආරක්ෂක කවුන්සිලයේ යුද හමුදා බුද්ධි ප්‍රධානියා එහිදී මෙම කරුණු සාකච්ඡා කරනවා තමන්ට මතක බවත් කියා සිටි එ මහතා කිසිදු දිනෙක ජාතික බුද්ධි ප්‍රධානි මෙම තොරතුරු තමන්ට යොමු කළේ නැතැයි ද කියා සිටියේය.

යහපාලන ආණ්ඩුවට පෙර පැවති රජයේ බුද්ධි ප්‍රධානියා වගකිවයුතු තනතුරක් දරා ඇති බව කියා සිටි ඒ මහතා සියලු අංශ යොමු කරන වාර්තා එකතු කර විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ආරක්ෂක ලේකම්වරයාට දැනුම් දුන් බවද කියා සිටි ඒ මහතා මෙවැනි කිසිදු වාර්තාවක් තමාට නොලැබුණු බවද කියා සිටියේය.

යුද හමුදා බුද්ධි අංශය යොමු කර තිබූ වාර්තා අවසානයේ විශ්ලේෂණයන් ඉදිරිපත් කර තිබෙනවා. මම කණගාටු වෙනවා මේ වාර්තා ජාතික බුද්ධි ප්‍රධානි විසින් මට යොමු නොකිරීම ගැන. එම වාර්තා යොමු කර තිබුණේ ආරක්ෂක ලේකම් කාර්යාලය වෙත නෙමෙයි. ජාතික බුද්ධි ප්‍රධානි වෙතටයි යනුවෙන් හේමසිරි ප්‍රනාන්දු මහතා කියා සිටියේය.

රජයේ සොලිසිටර් ජෙනරාල් වරිය

ඔබ කාර්ය බහුල නිසා එසේ නොකලා විය නොහැකිද

සාක්ෂිකරු

මම වැඩිපුරම හිටියේ ආරක්ෂක අමාත්‍යාංශයේ. මම ජාතික බුද්ධි ප්‍රධානිට කියා තිබුණේ මාව හමුවන්න වෙලාව වෙන් කරගන්න එපා කියලා. ඒ විදියටම ඔහු මාව මුණ ගැසුනා.

# මංගලගේ කුරුඳු පොලු නඩුව ඉවරයි

**ජයසිරි පේදුරුආරච්චි - ගන්දර සමූහ**

හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතා ඇතුළු කණ්ඩායමකට එරෙහිව ක්‍රියාත්මකවූ කුරුඳු පොලු නඩුව ඊයේ (30) දින සමථයකට පත්විය. එක්සත් ජාතික පක්ෂ දෙපිරිසක් අතර මාතර මහා නගර සභාව ඉදිරිපිටදී ඇතිවූ ගැටුමකට අදාළව මෙම නඩුව වසර හතක් පුරා මාතර මහෙස්ත්‍රාත් අධිකරණයේදී ක්‍රියාත්මකවෙමින් තිබුණි.

මාතර මහෙස්ත්‍රාත් අධිකරණයේදී ඊයේ (30) දින නඩුව කැඳවූ අවස්ථාවේදී විත්තියේ ඉල්ලීමට එකඟවූ පැමිණිලි පාර්ශ්වය එය සමථයකට පත්වීමට දැක්වූ කැමැත්ත මත චෝදනාවට ලක්ව සිටි හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතා ඇතුළු සියලු සැකකරුවන් චෝදනාවලින් නිදහස් කිරීමට මාතර ප්‍රධාන මහෙස්ත්‍රාත් ඉසුරු නෙත්තිකුමර මහතා නියෝග කළේය.

එක්සත් ජාතික පක්ෂ නායකත්වයට එරෙහිව ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා ඇතළු පාක්ෂිකයන් කණ්ඩායමක් 2013 ඔක්තෝබර් 05 දින දෙවිනුවර ඓතිහාසික උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය ඉදිරිපිටින් ඇරඹි විරෝධතා පාගමනක් කොළඹ බලා ගමන්කරමින් සිටියදී ඊට එරෙහිව පැමිණි මංගල සමරවීර මහතා ඇතුළු කණ්ඩායමක් අතර මාතර මහා නගර සභාව ඉදිරිපිටදී ඇතිවූ ගැටුමක් සම්බන්ධයෙන් කරන ලද පැමිණිලි මත වසර හතක් පුරා මෙම නඩු විභාගය ක්‍රියාත්මක විය.

අයුතු ජනරාශිය, පහරදීම, තුවාල සිදුකිරීම හා ශබ්ද විකාශන යන්ත්‍රයක් පැහැරගැනීම යන චෝදනා යටතේ මෙම ගැටුමට අදාළව නඩු තුනක් ක්‍රියාත්මකවූ අතර එහි සක්ෂිකරුවන් ලෙස මෛත්‍රී ගුණරත්න, හර්මන් ගුණරත්න හා චරිත් මෛත්‍රී ගුණරත්න මහත්වරු පෙනී සිටි අතර පැමිණිල්ල වෙනුවෙන් මාතර මූලස්ථාන පොලිසිය හා අධි නීතිඥ අජිත් සමරසිංහ මහතා පෙනීසිටියහ. විත්තිකරුවන් වෙනුවෙන් ජනාධිපති නීතිඥ කපිල මනම්පේරි, මහේෂා වර්ණසූරිය, යමුනා මහගමගේ මහත්ම මහත්මීන් ඇතුළු නීතිඥ කණ්ඩායමක් පෙනී සිටියහ.

ගැටමුට සම්බන්ධ එකම පක්ෂයේ කණ්ඩායම් දෙකක්වීම නිසා සමථයකට පත් වන්නැයි විත්තියෙන් කරන ලද ඉල්ලීම මත සානුකම්පිතව සලකා බලා නඩුව සමථයකට පත්වීමට පැමිණිල්ලේ නීතිඥ අජිත් සමරසිංහ මහතා එකගතාව ප්‍රකාශ කිරීම නිසා ගැටුමට අදාළව ක්‍රියාත්මකවූ නඩු තුනකින් දෙකක් සමථයකට පත්වීම සිදුවූ අතර පහරදී ශබ්දවාහිනී යන්ත්‍රයක් පැහැරගැනීමට අදාලව මංගල සමරවීර මහතා ඇතුළු සැකකරුවන් හයදෙනකුට එරෙහිව ක්‍රියාත්මකවූ නඩුව ඔක්තෝබර් මස 26 දින දක්වා කල්තබන ලදී.

ඊයේ (30) දින උසාවියේ පෙනී නොසිටි සැකකරුවකුවූ කිත්සිරි කහඳපිටිය මහතා වහා අත්අඩංගුවට ගෙන අධිකරණට ඉදිරිපත්කරණ ලෙසත් එදිනට නඩුව තවදුරටත් පවත්වාගැනීමට අදාළව සාක්ෂි ඇත්නම් එය ගොනුකරන ලෙස හා සාක්ෂි නොමැත්තේ නම් පැමිණිලි පාර්ශ්වය සමඟ සාකච්ඡාකර නඩුව සමථයකට අවශ්‍ය පියවර වාර්තාකරන ලෙසත් මහෙස්ත්‍රාත් ඉසුරු නෙත්තිකුමාර මහතා පොලීසියට නියෝග කළේය.

වසර හතක්පුරා ක්‍රියාත්මකවූ නඩුව සමථයකට පත්වීමත් සමඟ චෝදනා ලැබ සිටි මංගල සමරවීර මහතා ඇතුළු සැකකරුවන් හැට දෙදෙනකුට ඉන් නිදහස්වීමේ අවස්ථාව හිමිවිය.

නඩුව කැඳවූ අවස්ථාවට හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතා මෙන්ම සමගි ජන බලවේගයේ ජාතික සංවිධායක පාර්ලිමෙන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක මහතා ද පැමිණ සිටියේය. ක්‍රියාත්මකවූ සෑම නඩුවාරයකටම තිස්ස අත්තනායක මහතා පැමිණීම විශේෂත්වයකි.

# රැකියා සිහින මවා මුදල් ගත් අය ගැන විමර්ශන

**රෝෂන් තුෂාර**

අධිකරණ අමාත්‍යාංශයේ රැකියා ලබාදෙන බවට කූට ලේඛන සකසමින් තරුණ තරුණියන්ගෙන් ලක්ෂ ගණනින් මුදල් ලබාගත් පුද්ගලයන් පිළිබඳ පොලිස්පතිවරයාගේ උපදෙස් පරිදි වංචා විමර්ශන කාර්යාංශය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊයේ (30) විමර්ශන ආරම්භ කළේය.

වංචාකරුවන් පිළිබඳව කඩිනමින් විමර්ශන පවත්වා නීතිමය ක්‍රියාමාර්ග ගන්නැයි අධිකරණ ඇමැති අලි සබ්රි මහතා විසින් පොලිස්පතිවරයා ඇතුළු අදාළ අංශ දැනුවත් කිරීමෙන් අනතුරුව මෙම විමර්ශන ආරම්භ කළේය.

අධිකරණ අමාත්‍යාංශයේ පත්වීම් ලබාගැනීම සඳහා පසුගිය දින තුන ඇතුළත තරුණ තරුණියන් 50කට අධික පිරිසක් අමාත්‍යාංශය වෙත පැමිණ තිබූ අතර ඊයේ (30) දිනයේ දී අම්පාර, දෙහිඅත්තකණ්ඩිය, රත්මලාන යන ප්‍රදේශවල තරුණ තරුණියන් 36 දෙනකු පැමිණ සිටියහ

අධිකරණ අමාත්‍යාංශයේ කාර්යාල කාර්ය සහායක, රියදුරු, මුරකරු හා III ශ්‍රේණියේ තනතුරු සඳහා පත්වීම් ලබාදීමට අදාළ දිනවල අමාත්‍යාංශයට පැමිණෙන ලෙසට ලිපි ලබාදී ඇති වංචාකරුවන් එක් පත්වීමක් සඳහා රුපියල් 17500 සිට රුපියල් 185000ක් දක්වා මුදල් ලබාගත් බව පැවසේ.

අධිකරණ ඇමැතිවරයාගේ ඉල්ලීම පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක අයි. ඩී. එස්. වීරසිංහ මහතා ඇතුළු නිලධාරීන් පිරිසක්ද ඊයේ පරීක්ෂණවලට සහභාගි වී සිටියහ.

# 01 වැනි පිටුවෙන්...

## පළමු වසරට...

මේ ක්‍රමය යටතේ, ඔප්පුව අදාළ මව හෝ පියා නමට නිවෙසේ ඔප්පුව නොමැති වීමෙන් පාසල ඉදිරිපිට වසර 30-40 පදිංචි වී තිබෙන පවුල්වල සාමාජිකයන්ට පවා තම දරුවන් එම පාසලට ඇතුළත් කිරීමට නොහැකි වී ඇතැයි ද ඇමැතිවරයා පෙන්වා දෙයි. මේ අනුව ඡන්ද හිමි නාමලේඛනයේ අඛණ්ඩව වසර 05 කට වඩා නම සඳහන්ව පදිංචිය තහවුරු වී ඇත්නම් සහ ග්‍රාමසේවක සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඒ බැව් සනාථ කර ඇත්නම් ඔප්පුව මවුපියන් නමට නැති වුවද ළමයා අදාළ පාසලට ඇතුළත් කර ගැනීමට ලබා දෙන ලකුණු ප්‍රමාණය හිමිවන බවද ඇමැතිවරයා පවසයි.

ඊයේ (29) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවට එක්වෙමින් ඇමැතිවරයා මේ බැව් අනාවරණය කළේය.

## 2021 අය-වැය ...

කොළඹ කොටුව පිහිටි මුදල් අමාත්‍යාංශයේ ඊයේ (30) දහවල් පැවති විශේෂ මාධ්‍ය හමුවට එක්වෙමින් අමාත්‍යාංශ ලේකම්වරයා මේ බව කියා සිටියේය. ශ්‍රී ලංකා අය වැය ඉතිහාසයේ අය වැය ලේඛනයක් නොමැතිව මේ වසර රජයේ ආදායම් වියදම් සිදු වීම විශේෂත්වයකි.

එනමුත් මේ වසර සඳහා අතුරු සම්මත ගිණුම් මගින් ආදායම් වියදම් වලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සිදු කෙරිණි. මේ වසරේ අය වැය හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 9%ක් වනු ඇතැයි තමන් අපේක්ෂා කරන බව ද එනමුත් ලබන වසරේ අය වැය හිගය කොතරම් අභියෝග හමුවේ වුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 4.5%ක් මට්ටමකට රඳවා ගැනීමට බලාපොරොත්තු වන බවද ආටිගල මහතා සඳහන් කළේ මාධ්‍යවේදියකු නැගූ පැනයකට පිළිතුරු ලබාදෙමිණි.

අගමැති හා මුදල් ඇමැතිවරයා ලෙස මහින්ද රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් කරනු ඇත. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව තුළ ජනතා කේන්ද්‍රීය සංවර්ධනයත්, ජනතාවගේ ආර්ථික දියුණුවත්, සුබසාධනයත් සැලසෙන අතරම බිඳවැටී ඇති ව්‍යාපාර සහ ව්‍යාපාරික ක්ෂේත්‍රය නැවත බලගැන්වීම සඳහා වූ යෝජනා අය වැය තුළින් රජය ඉදිරිපත් කරනු ඇත.

## ලෝක ළමා හා ...

මේ අතර ලෝක වැඩිහිටි දින ජාතික උත්සවය 'වසංගත හමුවේ වැඩිහිටි අභියෝග' මැයෙන් සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී අද (1) පෙරවරුවේ පැවැත්වේ. ලෝක ළමා දින ජාතික උත්සවය කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ සංවිධායකත්වයෙන් පැවැත්වෙන අතර, වැඩිහිටි දින ජාතික උත්සවය ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ සංවධායකත්වයෙන් පැවැත්වේ.

## සජිත්ගේ ...

එම ප්‍රහාරවලින් කිසිවෙකුටත් අනතුරක් සිදුව නැති අතර සිද්ධිය සම්බන්ධයෙන් ගල්කිස්ස පොලිසිය පරීක්ෂණ සිදු කර ඊයේ උදේ එක් අයකු අත්අඩංගුවට ගැනීමෙන් පසු තවත් පුද්ගලයකු පොලිසියට බාර වී තිබේ. සැකකරුවන් ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට පැමිණ වීමට නියමිතය.

සජිත් ප්‍රේමදාස මහතා වේදිකාවේ කතා පවත්වමින් සිටයදී එක දිගටම වේදිකාව දෙසට ගල් මුල් ප්‍රහාර එල්ලවීම නිසා පැවති හමුවට බාධා වී තිබේ. එසේ අවස්ථාවේ ප්‍රේමදාස මහතා කතා පැවැත්වීම නොනවත්වා ප්‍රකාශකර ඇත්තේ තමන් මදාවියන්ට බය නොවන බවය. ඕනෑම අභියෝගයකට මුහුණ දීමට තමා සූදානම් බව ද කිව්වෙකුට බය නැති බව ද හෙතෙම එහිදී පවසා ඇත.

## එජාප ඉදිරි ගමන ...

එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් අකිල විරාජ් කාරියවසම් ,හිටපු ඇමැති සහ හිටපු තානාපති කරුණාසේන කොඩිතුවක්කු ,හිටපු ඇමැති සාගල රත්නායක සහ සිරිකොත විධායක අධ්‍යක්ෂ ශමල් සෙනරත් යන මහත්වරු වාර්තාව කෙටුම්පත් කිරීම සිදු කරති . රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් මත එක්සත් ජාතික පක්ෂ ජාතික සංවිධායක නවීන් දිසානායක ,හිටපු ඇමැති වජිර අබේවර්ධන සහ අර්ජුන රණතුංග හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සංදිත් සමරසිංහ, මහාචාර්ය ආශු මාරසිංහ මහත්වරුන්ගේ අදහස් ද අවසන් වාර්තාව සඳහා ලබා ගෙන තිබේ. මෙම වාර්තාව ඉදිරියේදී පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. මේ අතර පක්ෂයේ ප්‍රතිසංවිධාන වැඩපිළිවෙළ ඇතුළත් වාර්තාව සැකසීමේ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතින බව නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා පැවසීය.

## පෙරපාසල්...

පෙරපාසල් ගුරු සංගම් වෙතින් ඉදිරිපත්ව තිබූ ඉල්ලීම් සලකා බලා මෙම පියවර ගත් බවද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කරයි. පෙර පාසල් දරුවන්ගේ කුසලතා එළිදැක්වීමත්, ඔවුන්ගේ ආත්ම ශක්තිය නගා සිටුවීමටත්, ආකල්ප හා ක්‍රියාකාරකම් වර්ධනය කිරීමටත් වසර අවසානයේ පැවැත්වෙන මෙම විවිධ ප්‍රසංග බෙහෙවින් උපකාරී වන බව පවසන රාජ්‍ය ඇමැතිවරයා, මෙම තීරණයත් සමඟ දරුවන්ට නැවත ඒ අවස්ථාව ලැබෙන බවත් සඳහන් කරයි. අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා සහ සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මේ පියවර ගත් බවද රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහතා පවසයි. රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවසුවේ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ ඊයේ (30) පැවැති මාධ්‍ය හමුවේදී ය. ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැති රට පුරා පාසල්වලට එම පහසුකම් ලබා දීම සඳහා රාජ්‍ය මෙන්ම, පෞද්ගලික අංශයේ ද සහාය ලබා ගනිමින් කටයුතු කරන බවද, දෙසැම්බර් 31 දිනට පෙර එම කටයුතු සිදුකරන බවද රාජ්‍ය ඇමැතිවරයා මෙහිදී පැවැසීය.

# 01 වැනි පිටුවෙන්...

## කෝටි 4ක...

කිඹුලාපිටිය අක්කර 50 ප්‍රදේශයේ පිහිටි ව්‍යාපාරිකයාගේ නිවෙසට කොල්ලකරුවෝ නවීන පන්නයේ නිල් පැහැති මෝටර් රථයකින් පැමිණ මුදල් සහ රන් භාණ්ඩ කොල්ලකා ගොස් ඇති බව පොලිසිය පැවසීය.

කලකට පෙර දන්නා හඳුනන හිතවතුන් ලෙස එදින උදේ 9.30ට පමණ පැමිණ ඇති මේ කොල්ලකරුවෝ අතර සිටි දෙදෙනකු යතුරු පැදි වලට පළඳින ආරක්ෂිත හිස් ආවරණ පැළඳ, මුව ආවරණ සහ ජැකට් ද පැළඳ සිටි බව නිවැසියන් පවසා ඇත. ව්‍යාපාරිකයා හොඳින් හඳුනන අය ලෙස මොවුහු මුරකරු රවටා පසුව මුරකරු අත්අඩංගුවට ගෙන, ගිනි අවි පෙන්වා නිවැසියන්ට මරණීය තර්ජනය කර ඇත. නිවෙසේ ආරක්ෂිත කැමරාවලද එම දර්ශන සටහන් වී තිබෙන බව පොලිසිය පැවසීය. මෙසේ හඳුනා ගැනීමට නොහැකි ලෙස කල්ලියේ පස්දෙනාම මුව ආවරණ පැළඳ සිට ඇති අතර පැයක පමණ කාලයක් නිවෙසේ තැන තැන මුදල් සහ දේපළ සොයා ඇති බව මූලික පොලිස් පරීක්ෂණවලින් හෙළිව තිබේ. මෙසේ නිවැසියන් බිය වද්දා මුදල් කොල්ල හා රන් අභරණ කා පළා ගොස් තිබේ.

යතුරුපැදි හිස් වැසුම් පැළඳ සැකකරුවන් දෙදෙනකු සිටියද යතුරු පැදියක් මේ කොල්ලයට පැමිණ ඇති බවට කිසිදු තොරතුරක් ලැබී නැත.

මුදල් හිමි ව්‍යාපාරිකයාගේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ නවීන බේකරි ව්‍යාපාරය වන අතර නිතර මුදල් ගැවසීම නිසා එකවර බැංකු ගත කිරීමට එම මුදල යොදවා නැති බවට හෙළිව ඇත. ව්‍යාපාරික අවශ්‍යතාව අනුව නිතර මෙවැනි මුදලක් අතේ තිබීම අවශ්‍ය බැවින් ඔහු එය බැංකුවට බැර කිරීම පමා කර ඇත.

මේ අනුව එම මුදල් ප්‍රමාණය ව්‍යාපාරිකයා සතුව නිතර ගැවසෙන බව හොඳින් දන්නා අයකුගේ උපකාරය මේ කොල්ල කල්ලියට ලැබී තිබෙන බවට පොලිසිය සැක කරයි. මේ කොල්ලය පාතාල නායකයකුගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක සහාසික කොල්ල කල්ලියක් සම්බන්ධ බවට සැක කෙරේ. මේ අනුව විවිධ තොරතුරු රැසක් පොලිසියට ලැබී ඇත. ඒ අනුව කොල්ලකරුන් සහ පැමිණි රථයත් කොල්ල කෑ මුදලත් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිසිය විශේෂ කණ්ඩායම් කිහිපයක් යොදවා ඇත.

සිද්ධිය පිළිබඳ කොළඹ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්ධු තෙන්නකෝන්ගේ උපදෙස් මත කොළඹ, උතුර බාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහගේ මෙහෙයවීමෙන්, මීගමුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරා, සහකාර පොලිස් අධිකාරි පාලිත අමරතුංග මහත්වරුනගේ අධීක්ෂණය යටතේ සහ කටාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩිලාන් රාජපක්ෂ ඇතුළු නිලධාරීහු, සෝකෝ ඇතුළු පාර්ශයව කිහිපයක් පරීක්ෂණ සිදු කරයි.

## විපක්ෂ නායකට ...

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා සහභාගි වූ රත්මලානේ පැවති රැස්වීමකට මෙම නාඳුනන ප්‍රහාරය එල්ල වී තිබූ අතර ආණ්ඩුව ඒකාධිපති පාලනයකට ගොස් ඇති බව එමගින් පෙනෙන්නට තිබෙන බව කී මහ ලේකම්වරයා වැඩිදුරටත් මෙසේද පැවසීය.

මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය, ජනතා අයිතිය වෙනුවෙන් 19 වැනි සංශෝධනය විශාල කාර්යභාරයක් කළා. ජනතාවට අයිතිය තිබ්බා ප්‍රජාතන්ත්‍රවාදී රැස්වීම් තියන්න, උද්ඝෝෂණය කරන්න. ඒක විනාශ වෙමින් යන්නේ. දැන්, 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය එනවත් එක්කම ත්‍රස්තවාදී මැර කල්ලි ආයුද, ගල්, තුවක්කු අතට අරන් වැඩ පටන් අරගෙන තියෙනවා. වචනවලින් වෙනුවට තුවක්කුවලින්, ගල්වලින්, වෙඩිවලින් කතා කරන යුගය දැන් ඇවිත්. කොච්චර ඒකාධිපති පාලනයකට ආණ්ඩුව ගිහින්ද කිව්වොත් 19 වැනි සංශෝධනයෙන් අපි ලබා දුන්න ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අද රාජපක්ෂ පාලනයෙන් විනාශ කරලා තිබෙනවා.

## යහපාලන රජය නොගෙවූ...

මෙලෙස කොන්ත්‍රාත්කරුවන්ට රජයේ සැපයුම්කරුවන්ට හිඟ තබා තිබූ මුදල් නැවත ගෙවීම නිසා ඔවුන් අතට මුදල් ගලාඒම තුළ ආර්ථිකයේ පිබිදීමක් ඉදිරි දිනවලදී සිදු වනු ඇතැයි ද මුදල් ලේකම්වරයා පෙන්වා දුන්නේය. මුදල් අමාත්‍යාංශයේ ඊයේ (30) උදේ පැවති මාධ්‍ය හමුවට එක්වෙමින් ලේකම්වරයා මේ බව කීය.

විවිධ සංවර්ධන කටයුතු සහ රජයේ සැපයුම් සඳහා මුදල් නොගෙවීම තුළ වැලේ වැල් නැතිව සිටි සැපයුම්කරුවෝ සහ කොන්ත්‍රාත්කරුවෝ මේ මුදල් ලබාදීම පිළිබඳව රජයට ස්තූතිවන්ත වන බවද ලේකම්වරයා පැහැදිලි කළේය.

# ඉකුත් රජය සමයේ ගෙන්වූ සහල් මෙට්‍රික් ටොන් 600ක් හොර පාරේ කළු කඩවලට

**සිරන්ජනි කුමාරි**

ඉකුත් රජය සමයේ විදේශවල සිට මෙරටට ආනයනය කළ සහල් මෙට්‍රික් ටොන් 600ක් සහල් කන්ටේනර් පිටින් හොර පාරේ කළු කඩ වෙත විකිණීමේ ජාවාරමක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ විමර්ශනයක් ආරම්භ කර තිබේ.

මෙලෙස ආනයනය කරන සහල් සතොස ගබඩා වෙත නොයවා හොර රහසේ කන්ටේනර් පිටින් පුද්ගලික ආයතන වෙත යොමු කළ බවට තොරතුරු ලැබී තිබේ.

මෙම සහල් ආනයනය සඳහා අමාත්‍යාංශය බැංකු අයිරා ලබාගෙන ඇති අතර ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියක් ද ලබාගෙන නැති බවට තොරතුරු අනාවරණය වී ඇත.

මෙලෙස රජයට පාඩු කරමින් සහල් ඉන්දියාව පාකිස්ථානය හා පිලිපීනය වැනි රටවලින් ආනයනය කර සඟවා තබාගෙන ව්‍යාජ සහල් හිඟයක් ඇති කර ඇති බවට ද කරුණු අනාවරණය වී තිබේ.

බැංකු මගින් ලබාගත් අයිරා පහසුකම් ද මේ දක්වා පියවා නොමැති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරන ලද විමර්ශනවලදී කරුණු අනාවරණය වී තිබේ.

මෙසේ සතොස ගබඩා කරා නොයවා හොර පාරේ විවිධ වෙළෙඳ සැල් කරා ගෙන ගිය සහල් මනුෂ්‍ය පාරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පැමිණෙන තෙක් රඳවා සිටින බවට තොරතුරු අනාවරණය වී ඇත.

සිද්ධියට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන පවත්වන අතර ඉදිරියේ දී අධිකරණය වෙත කරුණු වාර්තා කර අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගන්නා බවට රහස් පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි.

# ජාතික රුක් රෝපණ සතිය හෙට සිට

**නදී මාණික්කගේ**

ජාතික රුක් රෝපණ සතිය ඔක්තෝබර් හෙට (2) අනුරාධපුර රුවන්වැලි සෑය අභියසදී ආරම්භ කෙරෙන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා ඊයේ (30) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති මාධ්‍ය හමුවකට එක් වෙමින් පැවසීය.

මෙම ජාතික රුක් රෝපණ සතිය ඔක්තෝබර් 2 දින සිට රට පුරා ආරම්භ වන බව පැවසූ ඇමතිවරයා, පාසල් දරුවන්, දහම් පාසල් දරුවන් හා ගොවි මහතුන් ඉලක්ක කර මෙම පැළ බෙදා දීමට කටයුතු කරන බවත් ඊට පැළ මිලියන 2ක් වෙන් කර ඇති බවත් කීවේය.

ලබා දෙන සෑම පැළයකටම අයිතිකාරයෙක් නම් කිරීමට බලාපොරොත්තු වන බව කී අමාත්‍යවරයා මින් පෙර ලබා දුන් පැළ සම්බන්ධයෙන් නිසි නඩත්තුවක් සිදු කර තිබුණේ නම් මෙරට වනාන්තරවලින් පිරි රටක් වන බවත්, එසේ නොවීම නිසා මෙවැනි පියවරක් ගත් බවත් වැඩි දුරටත් පැවසීය.



# සංචාරක ක්ෂේත්‍රය හැර අන් සෑම අංශයකම කැපී පෙනෙන වර්ධනයක් ඇති වෙලා

## රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල්

**ජයසිරි මුණසිංහ**

සංචාරක ක්ෂේත්‍රය හැර අන් සෑම අංශයකින්ම කැපී පෙනෙන වර්ධනයක් මේ වන විට වාර්තා කොට ඇතැයි මුදල්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා ප්‍රකාශ කළේය.

කොවිඩ් - 19 ගෝලීය වසංගතය හමුවේ මෙරට ආර්ථිකය මේ වසර මුලදී පසුබෑමකට ලක් වූ අතර, මේ වන විට එය ක්‍රම ක්‍රමයෙන් වර්ධනයක් කරා ළඟා වෙමින් පවතින බව සෑම ආර්ථික දර්ශකයකම වැඩි-වීම තුළින් දක්නට ලැබෙන බවද රාජ්‍ය ඇමැතිවරයා පැහැදිලි කළේය.

කොළඹ කොටුව පිහිටි මුදල් අමාත්‍යාංශයේ රන්දොර ශ්‍රවණාගාරයේ ඊයේ (30) දහවල් පැවති විශේෂ මාධ්‍ය හමුවට එක්වෙමින් රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අජිත් නිවාඩ් කබ්රාල් මහතා- ගෝලීය වසංගතය හමුවේ මේ වසරේ පළමු සහ දෙවැනි කාර්තුවල පහළ බැස තිබූ විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ විදෙස් මුදල් ලැබීම් මේ වන විට වර්ධනය වී තිබේ. මේ වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල විදේශගත ශ්‍රමිකයන්ගේ ලැබීම් ගිය වසරේ එම කාලයට වඩා වැඩි බව සංඛ්‍යාලේඛන වලින් දක්නට ලැබෙනවා. ඒ අනුව වසර 2019 මෙරටට ලැබුණු විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ඉපැයුම්වලට සමාන මුදලක් මේ වසර නිමාවන විට රටට ලැබෙණු ඇතැයි විශ්වාස කරනවා.

ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ගලා ඒම වසර මුලදී මන්දගාමී වූ අතර, ඉදිරියේදී එහි යහපත් තත්ත්වයක් ඇති කරමින් වසර අවසන් වන විට වැඩි වශයෙන් විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට ලැබේවි. විශේෂයෙන් කොළඹ වරාය නගර ව්‍යාපෘතිය හරහා නව ආයෝජන ගලා එනවා. ඊට අවශ්‍ය වන නීතිමය තත්ත්වයන් රජය නුදුරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමට සූදානම්.

කොළඹ කොටස් වෙළෙඳපොළ ගනුදෙනු සම්බන්ධයෙන් සමාජයේ පැවති දුර්මතයක් වූයේ විදේශීය ආයෝජකයන්ගේ කොටස් මිලදී ගැනීමට ස්වදේශික ආයෝජකයන් ශක්තිමත් නැතැයි යන්නයි. නමුත් දැන් එහි වෙනසක් සිදු වෙමින්, මේ වන විට ශ්‍රී ලාංකික ආයෝජකයන් වැඩි වැඩියෙන් විදේශ ආයෝජකයන්ගේ කොටස් මිලදී ගැනීමට තරම් ශක්තිමත් වී තිබීම යහපත් ප්‍රවණතාවක්.

දේශීය ආයෝජකයන්ගේ ශක්තිය සම්බන්ධයෙන් පැවති අයහපත් ආකල්ප මේ වන විට වෙනස්වෙමින් පැවතීම ඉතා හොඳ අනාගතයක පෙර නිමිත්තක්. ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ ණය කළමනාකරණය කිරීමේ කටයුතු සිදු කරන අතර, අඩු පොලී අනුපාත යටතේ භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටිනවා. එනිසා අඩු පොලී සමඟින් මුදල් ලබා ගැනීම නිසා රජයට විශාල සහනයක් සැලසී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විදේශීය වශයෙන් ස්වෛරීත්ව බැඳුම්කර හරහා ජාත්‍යන්තරයෙන් අරමුදල් එක්රැස් කිරීම සිදු කරන අතර, නුදුරේදීම පැන්ඩා ස්වෛරීත්ව බැඳුම්කර (චීනය) සමුරායි ස්වෛරීත්ව බැඳුම්කර (ජපානය) සිදු කර රටට ඩොලර් බිලියනයක මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කරනවා.

මෙරට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රජයේ ණය ප්‍රමාණය වසර 2015 සිට 2019 දක්වා විශාල ලෙස ඉහළ ගිය බව පැහැදිලි කළ කබ්රාල් මහතා, යහපාලන රජය මෙම අවාසනාවන්ත තත්ත්වය රටට උදා කළ බවද කීය. වසර 2015 දළ නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 71%ක් වූ රජයේ ණය ප්‍රමාණය යහපාලන රජය පාලන බලයෙන් ඉවත් වන විට 91% දක්වා (වසර 2019) වැඩිකොට තිබිණි. මෙම තත්ත්වය නැවතත් යහපත් අතට හරවා ගනිමින් වසර 2025 වන විට රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 70% දක්වා පහළ දැමීම වත්මන් ඉලක්කය බවද රාජ්‍ය ඇමැතිවරයා මෙහිදී සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ විදේශ නිල සංචිතය වසර 2019 විශාල ලෙස අඩු වූ අතර, එය මේ වන විට ඩොලර් බිලියන 7.4 දක්වා වැඩි කරගැනීමට සමත් වී ඇතැයි ද හෙතෙම වැඩි දුරටත් කීවේය.

## ශ්‍රී ලංකා යුද හමුදාවේ ධජ ආශිර්වාද පූජාවෙන්









**රත්නසිරි පතිරණ,රක්ෂණ ශ්‍රියන්ත සහ අනුරාධපුර මධ්‍යම විශේෂ**

ශ්‍රී ලංකා යුද හමුදාවට වසර 71ක් සපිරීම නිමිත්තෙන් විශේෂ ආශිර්වාද පූජාවක් ඊයේ (30) අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියසදී පැවැත්විණි.

මීට සමගාමීව යුද හමුදාවට අයත් සියලු රෙජිමේන්තුවල ධජවලට ආශිර්වාද කිරීම සිදු විය. යුද්ධ හමුදාපති ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ මෙම ආශිර්වාද පින්කම සිදු කෙරිණි.

මෙම අවස්ථාවට පල්ලේගම සිරිනිවාස නාහිමි ප්‍රමුඛ මහා සංඝරත්නය ආශිර්වාද කළ අතර, මහත් වූ භක්තියෙන් යුක්තව සියලු ධජ ආශිර්වාද ගැන්වීම සිදු කළහ.

ඉන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දැක්වූ යුද හමුදාපති ශවේන්ද්‍ර සිල්වා මහතා පවසා සිටියේ කොවිඩ් වසංගතය දුරු කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව ඇතුළු සෞඛ්‍ය අංශ මැදිහත්වීම නිසා අප ලැබූ ජයග්‍රහණය මේ වන විට ලෝකයේ දෙවන ස්ථානයට පත් වූ බවයි.

ජය ශ්‍රී මහා බෝධියට පූජා කරන සියලු පොල් පැළ අටමස්ථානාධිපති නාහිමියන් යුද හමුදාවට ලබා දී තිබෙනවා. එම පොල් පැළ රෝපණය කර රැක බලාගෙන, එයින් ලබන පලදාව රටේ ආර්ථික අර්බුදය ජය ගැනීමට යොදා ගන්නා බවද හමුදාපතිවරයා කීවේය. මේ වන විට ද කුඹුරු අක්කර දහස් ගණනක් වගා කිරීමට යුදහමුදාව පියවර ගෙන ඇති බවත් හෙතෙම වැඩි දුරටත් පැවසීය.

ඉන් අනතුරුව ආබාධිත රණවිරුවන්ට රැකවරණය දෙන අභිමන්සල වෙත ගිය හමුදාපතිවරයා ඔවුන්ගේ සුවදුක් විමසා බැලීය.

**ඡායාරූප - සමන්ත වීරසිරි**



## වසර 40ක අමිල සේවයෙන් සාමාන්‍යාධිකාරී අභය අමරදාස පත්තර මහ ගෙදරින් සමු ගනී

වසර 40ක කාලයක් ශ්‍රී ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අමිල සේවයක් සිදු කළ සාමාන්‍යාධිකාරී අභය අමරදාස මහතා සේවයෙන් විශ්‍රාම ගත්තේය. ඔහු ලේක් හවුස් ආයතනයේ සේවයට එක් වූයේ 1980 වසරේදීය. මුද්‍රණ ක්ෂේත්‍රයේ පෙර මුද්‍රණ කටයුතු සම්බන්ධ ප්‍රවීණතාවක් උසුලන ඔහු මුද්‍රණ ආයතනයේ යාවජීව සාමාජිකයෙකි.

අනූව දශකයේ මුල් කාලයේ ලේක් හවුස් ආයතනයේ සිංහල සහ දෙමළ ෆොටෝ ටයිප් සෙටින් සහ ඩිජිටල් පිටු සැකසුම ආරම්භ කිරීමට දැක්වූ දායකත්වය ගැන ඔහුට කීර්තියක් අත් වී තිබේ.

එසේම වසර 25කට පෙර ඔහු ඩේලි නිවුස් සහ සන්ඩේ ඔබ්සර්වර් වෙබ් අඩවි දියත් කිරීමට ද මූලිකත්වය ගත්තේය. 2000 වසරේ දී ආයතනයේ සාමාන්‍යාධිකාරී තනතුරට පත්වීමත් සමග ඔහු එම තනතුර බැබළුවේය. අභය අමරදාස මහතා ආදි රාජකීයයෙකි.

# පාස්කු දා ප්‍රහාරය ගැන බුද්ධි අංශයට තිබුණේ විදේශ බුද්ධි තොරතුරු පමණයි

## ඔවුන් සොයා ගත් කිසිදු නිශ්චිත තොරතුරක් ඉදිරිපත් කළේ නෑ

## හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර ජනාධිපති කොමිසමට කියයි

**සුභාෂිණී සේනානායක**

පාස්කු දා ප්‍රහාරය පිළිබඳ රාජ්‍ය බුද්ධි අංශයට තිබුණේ විදේශ බුද්ධි තොරතුරු පමණක් බවත්, ඔවුන් සොයා ගත් කිසිදු නිශ්චිත තොරතුරක් ඉදිරිපත් කර නොතිබුණු බවත් හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා ජනාධිපති කොමිසම හමුවේ පෙරේදා (29) ප්‍රකාශ කළේය.

ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නායක සහරාන් හෂීම් මෙවැනි ප්‍රහාරයක් සිදු කිරීමට තැත් කරන බවට නිවැරදි කිසිදු බුද්ධි තොරතුරක් රාජ්‍ය බුද්ධි අංශය ලබා දී තිබුණේ නැති බව කියා සිටි හිටපු පොලිස්පතිවරයා සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කරන ප්‍රචාරණයන් ගැනත් විදේශ රටවල ත්‍රස්ත සංවිධාන ගැන තොරතුරුත් ඉදිරිපත් කර තිබූ බවත් කියා සිටියේය.

පාස්කු ප්‍රහාරය එල්ල වන අවස්ථාවේ මෙරට පොලිස්පතිවරයා ලෙස කටයුතු කළ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා පෙරේදා (29) පස්වන දිනටත් ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි ලබා දෙමින් මේ බව කියා සිටියේය.

**කොමිසම-** විදේශ බුද්ධි වාර්තාව නොලැබුණේ නම් රාජ්‍ය බුද්ධි සේවය කිසිවක් නොදැනම පිපිරීම සිදු වන්න ඉඩ තිබුණා නේද ?

**සාක්ෂිකරු** - එසේය ස්වාමිනී. රාජ්‍ය බුද්ධි සේවයේ වගකීම වන්නේ හුදු වාර්තා ඉදිරිපත් කිරීම පමණක් නොවයි. ඔවුන් භූමියේ සිදු කරන විමර්ශන බුද්ධි වාර්තාවලට අදාළව නිර්දේශ ඉදිරිපත් කිරීම ඔවුන්ගේ වගකීමයි.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය** - එක රැයකින් එළිවෙන්නේ නැහැ, යැයි පැරණි සිංහල කියමනක් තිබෙනවා නේද? පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය ද එක් රැයකින් සැලසුම් වූවක් නොවන බව ඔබ පිළිගන්නවා ද?

**සාක්ෂිකරු** - ස්වාමිනී! සහරාන් ඇතුළු කණ්ඩායම අන්තවාදී මතවාදයක් ගෙන ගියාට මෙවැනි ප්‍රහාරයක් කළ යුතුයි කියන තීරණයට ඔවුන් කොයි අවස්ථාවේ පැමිණියා ද කියා මට කියන්න බැහැ. ප්‍රහාරයෙන් පසුව සහරාන් තවත් දරුවකු අපෙක්ෂාවෙන් වෛද්‍යවරයකු පවා හමු වී තිබුණා කියා, මට පෞද්ගලික තොරතුරක් ආවා. එවැනි දෙයක් ඇත්තටම වෙලා තිබුණා නම් ඔහුගේ මනසට මෙවැනි විනාශකාරී සිතුවිල්ලක් කොයි මොහොතේ ආවද කියන එක මට හරියටම කියන්න අමාරුයි. සහරාන් කිසියම් පිරිසක් මෙහෙය වූවාද කියන සැකය තිබෙනවා. ප්‍රහාරයක් පිළිබඳ විදෙස් බුද්ධි අංශයකින් කළ පෙර දැනුම්දීම් ස්ථිර කරගැනීමට හෝ මෙරට රාජ්‍ය බුද්ධි සේවය සමත් වුණේ නැහැ. ඒ පිළිබඳ ප්‍රහාරය වෙනකල්ම කිසිදු තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවය කිසියම් නිශ්චිත තොරතුරක් සොයා ගෙන තිබුණේ නැහැ. ඔවුන් සිදු කළේ සහරාන් ජාතික තවුහිද් ජමාත් සංවිධානය ඇතුළු කණ්ඩායම් ගැන සිදු කරන විමර්ශන සම්බන්ධයෙන් මෙන්ම, විදේශයන්හි අයි. එස්. අයි. සංවිධානය සිදු කරන දේ ගැන වාර්තා කිරීම පමණයි.



> සහරාන් ඇතුළු කණ්ඩායම අන්තවාදී මතවාදයක් ගෙන ගියාට මෙවැනි ප්‍රහාරයක් කළ යුතුයි කියන තීරණයට ඔවුන් කොයි අවස්ථාවේ පැමිණියා ද කියා මට කියන්න බැහැ

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය-** සහරාන් ඇතුළු කණ්ඩායම මෙවැනි ප්‍රහාරයක් එල්ල කළේ ඔවුන් අයි.එස්.අයි. සවිධානයේ මතවාදය පිළිගත් නිසා ද?

**සාක්ෂිකරු-** මට එහෙම කාගෙවත් මනසේ තිබ්බ දෙයක් ගැන මගේ මතය කියන්න බැහැ. ඔවුන් අයි. එස්.අයි මතය පිළි ගත්තා වෙන්නත් පුළුවන්. අයි.එස්. අයි. ඔවුන්ට පෙළඹවීමක් කළා වෙන්නත් පුළුවන්. ඒ වගේම මේ ප්‍රහාරය වෙනත් කාගේ හරි වුවමනාවකට කළා වෙන්නත් පුළුවන්. නමුත් මට කියන්න තියෙන එකම දේ මේ සිදුවීමෙන් පසු ඇති වූ සෝචනීයම තත්ත්වයට ලක් වුණු පුද්ගලයන් දෙදෙනාගෙන් කෙනෙක් හැටියට මේ සිදුවීම ගැන සියුම් ලෙස සොයා බැලිය යුතුයි කියන එකයි.

**රජයේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය** - අප්‍රේල් 9 වැනි දා රාජ්‍ය බුද්ධි සේවයෙන් හා ජාතික බුද්ධි ප්‍රධානී වෙතින් ප්‍රහාරයක් සම්බන්ධ පූර්ව දැනුම් දීමේ තොරතුර ලද විට තමන් ගත්තේ කුමන පියවරක් ද?

**සාක්ෂිකරු** - ස්වාමීනි මම ඒක නිශ්චිත වැදගත් තොරතුරක් ලෙස සැලකුවා. මම ඒ ලිපියට FNA ලෙස යොදා මගේ යටතේ සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු 4 දෙනකුට යැව්වා. මම එය නොසලකා හැරියේ නැහැ.

**කොමිසම** - ඇයි ඔබ FNA කියලා දැම්මේ. ඔබ පොලිස්පතිවරයා ලෙස ඊට වඩා වැඩියමක් සඳහන් කළ යුතුව තිබුණා නේද? ඇයි කළ යුතු දේ පිළිබඳ උපදෙස් දීමක් සිදු නොකළේ?

**සාක්ෂිකරු** - මේ තොරතුර ලද සැණින් මා කටයුතු කර තිබෙනවා. පමා වුණේ නැහැ. FNA කියන්නේ For Necessary Action කියන එකයි. නමුත් සමහර අය මේක For No Action හැටියට අපහාසාත්මකවත් අරන් තිබ්බා. මෙම තොරතුර විදේශ බුද්ධි අංශයකින් එවූ නිශ්චිත තොරතුරක්. නමුත් ඊට අදාළව කිසිම තොරතුරක් අපේ රාජ්‍ය බුද්ධි සේවයෙන් සොයාගෙන තිබුණේ නැහැ. ඔවුන් මේක වගකීම් සහගත විදිහට නෙමෙයි එවලා තිබ්බේ. ඉහත සඳහන් තොරතුර පිළිබඳ තව දුරටත් පරීක්ෂණ කරනවා කියායි ඔවුන් දැනුම් දුන්නේ. ඒ කියන්නේ තොරතුරේ අවසානයක් නැහැ කියන එකයි. ඒ වෙද්දී DIGලා දන්නවා රටේ තිබුණ තත්ත්වය. ආරක්ෂක කටයුතු ලිහිල් කරල, සහජීවනයට තැන දීලයි තිබුණේ. ඒ දේශපාලන පීඩනය ගැනත් මගේ ඉහළ නිලධාරීන් යම් මට්ටමකට හෝ දැනගෙන ඉන්න ඇති. ඒ පීඩනයත් දරාගෙන තමයි මා වැඩ කළේ. රාජ්‍ය බුද්ධි සේවයට තියෙන පහසුකම් හා වරප්‍රසාද එක්ක බලද්දි ඔවුන්ට නිරත වන්න තියෙන එකම වෘත්තීමය ක්ෂේත්‍රය තමයි බුද්ධි තොරතුරු කියන්නේ. එහෙම වටපිටාවක් තුළත් ඔවුන් මේකට කිසිවක් එකතු කර තිබුණේ නැහැ. විදෙස් බුද්ධි තොරතුර විතරයි එවා තිබුණේ. නමුත් එය වැදගත් තොරතුරක්. මේක මට යොමුකර තිබුණේ Top Secret Eyes Only කියල. Eyes Only කියන්නේ මගේ අවධානයට විතරයි කියන එකයි. නමුත් තොරතුරේ බරපතළකම නිසා මගේ අවධානයට විතරක් යොමුවෙලා මදි නිසා තමයි, ක්‍රියාත්මක විය හැකි මගේ යටතේ සිටි ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් හතර දෙනාට යැව්වේ. මෙවැනි දෙයකට ක්‍රියාත්මක විය යුතු ආකාරය ඔවුන් දන්නවා. මා බලාපොරොත්තු වුණේ රහසිගතව මෙය කරන්නයි. නැත්නම් මහ කලබැගෑනියක් වෙනවා කියා මා දන්නවා. මා වැඩ කළේ පොලීසියට එන චෝදනාව මඟ හරවා ගන්නයි.

**සමාජ මාධ්‍යවල පළ වූ ප්‍රචාර, විදෙස් රටවල ත්‍රස්ත සංවිධාන ගැන තොරතුරු දී තිබුණා**

**රාජ්‍ය බුද්ධි සේවය රාජකාරි කළේ වෙනම අරමුණක් සහිතවයි:**

ඒ ගැන සොයන්න මට බලතල තිබුණේ නැහැ

**පාස්කු දින ප්‍රහාරය ගැන සොයන ජනාධිපති කොමිසම**

**කොමිසම** - ඔබ ඔය කියන්නේ මෙරට රාජ්‍ය බුද්ධි සේවය ඊශ්‍රායලය, පලස්තීනය වැනි රටවල වෙන සිදුවීම් ගැන ඔබව දැනුවත් කළා. නමුත් අප්‍රේල් 21 බෝම්බ පුපුරනකල් විදෙස් බුද්ධි තොරතුරට අමතරව රාජ්‍ය බුද්ධි සේවය තමන්ගේ කියලා කිසිම තොරතුරු තහවුරු කර ගැනීමක් කරගත්තේ නැහැයි කියන එකද?

**සාක්ෂිකරු** - ඔව් ස්වාමිනි, විදෙස් බුද්ධි තොරතුරට අමතරව අපේ රාජ්‍ය බුද්ධි සේවය ප්‍රහාරයක් පිළිබඳ කිසිදු තොරතුරු තහවුරු කරගැනීමක් සිදුකළේ නැහැ

**කොමිසම** - ඔබ ඒ කියන්නේ අප්‍රේල් 4 විදෙස් බුද්ධි අංශයකින් පූර්ව දැනුම්වත් කිරීමක් සිදු නොවුණා නම්, මෙරට රාජ්‍ය බුද්ධි සේවය නොදැනම අප්‍රේල් 21 බෝම්බ පිපිරෙන්න තිබ්බා කියන එක ද?

**සාක්ෂිකරු-** ඔව් ස්වාමිනි, එහෙම වෙන්නත් තිබුණා. රාජ්‍ය බුද්ධි සේවය විදෙස් බුද්ධි තොරතුර අපට ලබා දුන්නා මිස එතනින් එහාට කිසිම දෙයක් කළේ නැහැ. අර්බුදකාරී දින 52ක ආණ්ඩු කාලයේ විතරක් නෙමේ, ඊට කලින් සිටම රාජ්‍ය බුද්ධි සේවය රාජකාරි කළේ වෙන අරමුණක් සහිතවයි. මට ඒ ගැන සොයන්න බලතල තිබුණේ නැහැ. රටේ ප්‍රමුඛතම බුද්ධි අංශය වෙලත් රාජ්‍ය බුද්ධි සේවය කළේ වෙනත් රටවල සිදු වුණු සිදුවීම් එක්ක මෙහෙත් වෙන්න පුළුවන් ප්‍රවණතාවක් තියෙනවා කියා පෙන්නපු එක විතරයි. ඊට අමතරව මේ සිද්ධිය සම්බන්ධයෙන් තමන්ගේම කියා නිශ්චිත තොරතුරක් ලබා දීමක්, නිගමන ඉදිරිපත් කිරීමක් හෝ උපදෙස් දීමක් රාජ්‍ය බුද්ධි සේවයෙන් කළේ නැහැ.

**ඡායාරූපය - රංජිත් අසංක**

## නව තනාපතිවරු ජනපති බැහැ දකිති



කොරියාව, ජර්මනිය, වතිකානය සහ ස්විට්සර්ලන්තය වෙනුවෙන් ශ්‍රී ලංකාවට අලුතින් පත්ව ආ තානාපතිවරු සිව් දෙනකු ජනාධිපති මන්දිරයේ දී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත සිය අක්ත පත්‍ර ඊයේ (30) බාර දීමෙන් අනතුරුව ජනාධිපතිවරයා ඔවුන් හා සුහද පිළිසඳරක යෙදී සිටි අයුරු.

# ප්‍රහාරය ගැන මාස 11කට පෙර දැනුම් දීමක් ලැබුණා

## පාස්කු කොමිසම හමුවේ පූජිත් කියයි

**සුභාෂිණී සේනානායක**

පාස්කු ප්‍රහාරය සිදු වීමට මාස 11කට පෙර ප්‍රහාරයක් එල්ල විය හැකි බව හා සහරාන් අත්අඩංගුවට ගන්නා ලෙස රාජ්‍ය බුද්ධි ප්‍රධානියා දැනුම් දී තිබූ බව හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා ඊයේ 30 පාස්කු කොමිසම හමුවේ පිළිගත්තේය.

සහරාන් හෂීම් ඇයි එම් මතවාදය අනුව කටයුතු කරන බවත් අනුගාමිකයන් අභිප්‍රේරණය කරන බවත් එමෙන්ම අවි ආයුධ අතට ගෙන සටන් කරන අය මුජයඩීන්වරුන් වශයෙන් සහ ජිහාදය අල්ලා දෙවියන් වෙත යන කෙටි මාර්ගයක් බවටත් සහරාන් ප්‍රකාශ කර තිබූ බව රාජ්‍ය බුද්ධි අංශ අනාවරණය කර තිබුණා නේදැයි රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ වරයා සිදු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් හිටපු පොලිස්පති වරයා ඒ බව පිළිගත්තේය.

අන්‍යාගමිකයන් ඝාතනය ජිහාදයක් බවට සහරාන් ප්‍රකාශ කර තිබූ බවත් ඔහුව වහාම අත්අඩංගුවට ගෙන සමාජගත කළ යුතු බව රාජ්‍ය බුද්ධි අංශ අනාවරණය කර තිබූ බවත් ජයසුන්දර මහතා පිළිගත් අතර එම වාර්තා ත්‍රස්ත විමර්ශන අංශයට යොමු කළ බවත් එහි ප්‍රගතිය වැඩිදුර වාර්තා කැපවූ බවත් කියා සිටියේය.

රාජ්‍ය බුද්ධි ප්‍රධානියා මේ තොරතුරු මීටත් වඩා හොඳින් සහ බහුමාධ්‍ය ඔස්සේ ආරක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනවා. එවිට නැවතත් මා තොරතුරු ඉදිරිපත් කළ යුතු නැහැ ඔහු තමයි තොරතුරු සම්පාදකයා බවත් හිටපු පොලිස්පති වරයා කොමිසම හමුවේ කියා සිටියේය

## ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින්

# ඉක්මනින් පාසල් ආරම්භ කරන්නැයි දරුවන් කළ ඉල්ලීම ඉටු කළා

## කොළඹ හින්දු විද්‍යාලයේ පැවති වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයදී අගමැති කියයි

කොවිඩ්-19 අභියෝගය හමුවේ හැකි ඉක්මණින් පාසල් ආරම්භ කරන්නැයි දරුවන් කළ ඉල්ලීම ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වෙමින් ඉටු කරදීමට හැකි වූ බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (30) කොළඹ හින්දු විද්‍යාලයේ පැවති වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයට එක් වෙමින් පැවසුවේය.

හින්දු විද්‍යාලයේ 2019 වසරේ අධ්‍යාපන හා විෂය සමගාමී කටයුතුවල දක්ෂතා දැක්වූ සිසු දරුවන්ට මෙහිදී අගමැතිවරයා අතින් ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කෙරිණි. 2019-හින්දු විද්‍යාලීය සඟරාව සහ සමරු තිළිණයක් විදුහල්පති ටී. පී. පරමේෂ්වරම් මහතා විසින් අගමැතිවරයාට පිළිගැන්වීය.

අගමැතිවරයා මෙහිදී වැඩිදුරටත් මෙසේද කීවේය.

මෙම විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවයටමට ආරාධනා කිරීම පිළිබඳව මම සතුටු වෙනවා.දෙමළ භාෂාවෙන් ඉගැන්වීම් කරන මෙම ජාතික පාසල රටට වැඩදායී යහපත් පුරවැසියන් බිහිකර තිබෙනවා. ඔවුන් අතර විශිෂ්ට අධ්‍යාපනඥයන් පවා සිටිනවා. මේ දරුවෝ හෙට රට භාර ගන්න අයයි. ඒ කියන්නේ රටේ අනාගත නායකයන්.

පිරිමි ළමයින් වෙනුවෙන් ආරම්භ කළ මෙම විද්‍යාලය දෙමළ හා ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම උගන්වන පාසලක්. සිසුන්ට නිවැරදි මඟපෙන්වීම පාසලක මූලික කාර්යභාරයක්. එක් පාසලක් විවෘත කරන විට බන්ධනාගාර දහස් ගණනක් වැසෙනවා කියලා කතාවකුත් අප අතර තියෙනවා. දරුවන් යහමගට යොමු කර ඔවුන්ගේ අනාගතය නිසිමගට ගැනීමේ විශාල වගකීමක් හා බැඳීමක් විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට තිබෙනවා. අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමුකිරීම වගේම ළමයින් විනයගරුක පුද්ගලයන් බවට පත්කිරීමත් පාසලේ වගකීමක්. මෙම විද්‍යාලය දරුවන්ගේ අධ්‍යාපනය වගේම විනය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වන බව මම දන්නවා. හොඳ අධ්‍යාපනයක් සහිත සිසුන් බිහිකිරීම හරහා රටේ ආර්ථිකය දියුණු කිරීමටත්, සමෘද්ධිමත් ජීවන පරිසරයක් නිර්මාණය කිරීමටත් රට සමෘද්ධිමත් කිරීමටත්, ජනතාවගේ ආකල්ප සකස් කිරීමත් පාසලෙන් සිදුවන සුවිශාල මෙහෙයක්. රටක් වෙනස් කිරීමට හැකි වන්නේ අධ්‍යාපනය මඟිනුයි. අධ්‍යාපනය කියන්නේ කිසිවකුට විනාශ කළ නොහැකි හා කාටවත් උදුරාගත නොහැකි ධනයක්. දරුවන්ට අධ්‍යාපනය ලබාදෙන සෑම ආයතනයක්ම කරන්නේ රට වෙනුවෙන් හොඳ පුරවැසියන් බිහිකිරීමයි. කොළඹ හින්දු විද්‍යාලයෙන් දරුවන්ට ලැබෙන්නෙත් ඒ වගේ විධිමත් අධ්‍යාපනයක්.

තිස් වසරක් අපිව පීඩාවට පත්කළ යුද්ධය අවසන් කරලා සාමය උදාකළාට පසුව රට වේගවත් සංවර්ධනයක් කරා ගෙන යෑමට අපේ රජයන් කටයුතු කළා. උතුරු නැගෙනහිර පළාත්වලට උතුරු වසන්තය, නැගෙනහිර උදාව වගේ ව්‍යාපෘති රාශියක් අපි ක්‍රියාත්මක කළා. අද ජනතාව අපව නැවත බලයට ගෙනැවිත් තිබෙනවා. ඒ කියන්නේ ජනතාව වෙනුවෙන් තවත් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන්න අපිට අවස්ථාව ලැබිලා තියෙනවා. අධ්‍යාපන කටයුතු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ඔසවා තැබීම සහ අපේ රටේ අධ්‍යාපන සංවර්ධනය ඊළඟ මට්ටමට ගෙනයෑම අපේ ඉලක්කයක්. අද කොවිඩ් - 19 ගෝලීය අභියෝගයක් බවට පත්ව තිබෙනවා. ජනතාවගේ සහයෝගයෙන් මේ අර්බුදය පාලනය කරගන්න අපිට හැකියාව ලැබුණා. මේ ගැටලු කිසිම අවස්ථාවක ඔබේ අධ්‍යාපනයට බලපෑමක් කර ගන්න එපා. කොරෝනා තත්ත්වය නිසා පාසල් නිවාඩු දී තිබුණු කාලයේ නව තාක්ෂණය ඔස්සේ දරුවන්ගේ හඬට කන් දෙන්න මට හැකියාව ලැබුණා. ඒ අවස්ථාවේදී දරුවන් ඉල්ලා සිටියේ හැකි ඉක්මනින් පාසල් කටයුතු ආරම්භ කරන ලෙසයි. මේ වෙද්දි සාර්ථකව තත්ත්වය පාලනය කරලා පාසල් කටයුතු ආරම්භ කරන්න අපිට හැකියාව ලැබුණා. පාසල් ආරම්භ කරන්න කලින් දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳවත් අපි වැඩි අවධානයක් යොමු කළා. අධ්‍යාපනයට වගේම ක්‍රීඩාවලටත් මේ දරුවෝ යොමු වෙන්න ඕනේ. ඔබ වගේම උතුරු නැගෙනහිර, කඳුරට ප්‍රදේශවල දරුවොත් ඉගෙනීම් කටයුතුවලට ඉතා උද්යෝගයෙන් සම්බන්ධ වෙනවා. අනාගතයේ රට භාර ගන්න නායකයන් විදියට ඔබ මේ රට සමෘද්ධිමත් කිරීමට අවබෝධයෙන් යුතුව කටයුතු කළ යුතුයි. ඒ වගේම මේ විද්‍යාලය අනෙකුත් පාසල්වලට ආදර්ශ පාසලක් විය යුතුයි.

මෙම අවස්ථාව සඳහා හින්දු පූජක රාමචන්ද්‍ර කුරුක්කල් බාබු ෂර්මා පූජකතුමා, අචාර්ය එස්. සන්දීර් පූජකතුමා සහ ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා, පාර්ලිමේන්තු මන්ත්‍රී, නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන්, හින්දු විදුහලේ විදුහල්පති ටී. පී. පරමේෂ්වරම් මහත්වරු, ගුරුභවතුන්, මවුපියන්, සිසු දරුවන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් එක්ව සිටියහ.

## දෙවන පාසල් වාරය 09 දා අවසන්

රජයේ පාසල් හා රජය අනුමත පෞද්ගලික පාසල්වල දෙවන පාසල් වාරය මේ මස 09 සිකුරාදා අවසන් වේ. ඒ අනුව දෙවැනි පාසල් වාර නිවාඩුව එදින සිට අරම්භ වේ.

තෙවැනි පාසල් වාරය සඳහා සියලු පාසල් නැවත ආරම්භ වන්නේ නොවැම්බර් 0සඳුදා ය.

## රටේ දළ ජාතික නිෂ්පාදනයට විශාල දායකත්වයක් ඉදිකිරීම් කර්මාන්තයෙන් ලැබෙනවා

### රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

**උපාලි කරුණාරත්න**

රටේ දළ ජාතික නිෂ්පාදනයට විශාල දායකත්වයක් දක්වන කර්මාන්තයක් ලෙස ඉදිකිරීම් කර්මාන්තය හැඳින්විය හැකි බව-ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පැවසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ පැවති ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ගේ උපදේශන රැස්වීමට පෙරේදා( 29) දින සහභාගි වෙමිනි.

රට නව සංවර්ධනයකට ගමන් කරන විට ඉදිකිරීම් ක්ෂේත්‍රය ඒ සඳහා සුවිශාල දායකත්වයක් ලබා දෙන බවද රටට අලුතින් එකතු වන භූමිය තුළ මෙන්ම, උතුරු නැගෙනහිර පළාත් වලද නව ඉදිකිරීම් රැසක් ඉදිරි කාලය තුළ සිදුවන බවද රාජ්‍ය ඇමැතිවරයා කීය.

ඉදිකිරීම් කර්මාන්තයේ ඵලදායිතාව මනාව කළමණාකරනය කිරීම උදෙසා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් මෙම උපදේශන රැස්වීම සංවිධානය කරන ලදී.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආරවුල් වියවුල් නිරාකරණය පිළිබඳ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම මෙන්ම උප කොන්ත්‍රාත්කරුවන්ගේ සහ මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා මූලාරම්භයක් ලබා ගැනීම මෙහි අරමුණ විය.

මෙම අවස්ථාවට ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කීර්ති රංජිත් අබේසිරිවර්ධන, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති මහාචාර්ය සොභාන් විජේසේකර යන මහත්වරු සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ බොහෝ පිරිසක් සහභාගි වූහ.

# පීඩාවට පත් සංචාරක හෝටල්වල විදුලි බිල ගෙවන්න සහන කාලයක්

## සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග



**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම හේතුවෙන් පීඩාවට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු හෝටල් හා වාසස්ථානවලට විදුලි බිල ගෙවීම සඳහා වසරක සහන කාලයක් ලබාදීමට අදාළ චක්‍රලේඛය නිකුත් කෙරේ

ඒ අනුව, සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් සහ වාසස්ථාන ඇතුළු ව්‍යාපාරික ස්ථානවලට මෙම වසරක සහන කාලය ලබාදෙන බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

සංචාරක අධිකාරියේ ලියාපදිංචි හෝටල් හා වාසස්ථාන සඳහා 2020 මාර්තු 01 වෙනිදා සිට අගෝස්තු 31 වන දින දක්වා සමුච්චිත විදුලි බිල්පත් 2020 සැප්තැම්බර් මස 01 වෙනිදා සිට බල පැවැත්වෙන පරිදි සමාන වාරික 12කින් ගෙවීමට අවස්ථාව සලසා තිබේ.

එම කාලය තුළ විදුලිය විසන්ධි කිරීමක් සිදු නොකරන ලෙස ද විදුලි බල මණ්ඩලය සිය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙත දැනුම් දී ඇති බව සංචාරක අමාත්‍යාංශය කියයි.

ඊට අදාළ උපදෙස් විදුලිබල මණ්ඩලය මඟින් සියලු ම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙත ලබා දී තිබේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත්වූවන්ට සහන සැලසීමේ රජයේ වැඩපිළිවෙළ යටතේ මෙම පියවර ගෙන ඇත.

මීට අදාළ කැබිනට් පත්‍රිකාව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ අතර ඊට අනුමැතිය හිමිවිය.

## කොළඹ මිලියන 181ක මාර්ග ව්‍යාපෘති අරඹයි



ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ රුපියල් මිලියන 181ක මාර්ග සංවර්ධන ව්‍යාපෘති 3ක් පෙරේදා (29) වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතාගේ සහ ග්‍රාමීය මාර්ග අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරිණි.

ඒ අනුව හෝමාගම ආසනයේ නඩුහේන නාවලමුල්ල, වැලිපිල්ලෑව මාර්ගය, පනාගොඩ - කොම්පයාහේන මාර්ගය සහ ලයනල් ජයසිංහ මාවත කාපට් අතුරා සංවර්ධනය කෙරේ. මෙම මාර්ග සවර්ධන ව්‍යාපෘති තුනෙහි සමස්ථ දුර කිලෝ මීටර් 7.2 කි.

# සහල් හිඟයක් පැවති යහපාලන කාලේ සතොසේ හාල් පෞද්ගලික අංශයට විකුණලා

## උසස් නිලධාරීන් දෙදෙනකු රිමාන්ඩ්

**සිරන්ජනි කුමාරි**

වෙළෙඳ හා අභ්‍යන්තර කටයුතු ඇමැතිවරයා ලෙස රිෂාඩ් බදුර්දීන් මහතා සිටි කාලයේ දී ඔරුගොඩවත්ත සතොස ගබඩාවේ කෝටි දෙකහාමාරකට අධික සහල් අතුරුදන් කිරීමේ චෝදනාව මත අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ ගබඩා පාලකවරුන් දෙදෙනා මේ මස 13 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් රජින්ද්‍ර ජයසූරිය මහත්මිය ඊයේ (30) නියෝග කළාය.

වර්ෂ 2017 හා 2018 කාල වකවානුවේ දි සහල් හිඟයක් පැවැති සමයේ මෙසේ සහල් අතුරුදන් කර පුද්ගලික ආයතන වෙත විකුණා ඇති බවත් මෙම ජාවාරමට සම්බන්ධ උසස් නිලධාරින් අත්අඩංගුවට ගැනීමට විමර්ශන පවත්වන බවට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණය හමුවේ සඳහන් කෙළේය.

පැය 72 කාලයක් රැඳවුම් නියෝග මත රඳවා ප්‍රශ්න කිරිමෙන් අනතුරුව සැකකරුවන් දෙදෙනා ඊයේ (30) අධිකරණය වෙත ඉදිරිපත් කර තිබිණ.

ඔරුගොඩවත්ත සතොස ගබඩාවේ පාලකවරුන් වෙන අබේපුස්ස පදිංචි වැලිකැකුලගේ නිහාල් වික්‍රමසිංහ හා බෙම්මුල්ල පදිංචි වැපොලපතිරනැහැලාගේ සුමිත් ලක්මන් කුමාර යන දෙදෙනා මෙසේ රක්ෂිත බන්ධනාගාරගත කෙරිණ.

නො 27 චොක්ෂොල්විදිය කොළඹ 2 ලිපිනයේ ඔරුගොඩවත්ත සතොස ගබඩාවේ සාමාන්‍යාධිකාරි විපුල කිත්සිරි සිල්වා යන අය විසින් 2018 වසරේ රිෂාඩ් බදුර්දීන් වෙළෙඳ හා වාණිජ කටයුතු අමාත්‍යවරයාව සිටි සමයේ සිය ගබඩාවේ කෝටි දෙකහමාරක සහල් කිලෝ 50 මිටි 8273ක් අතුරුදන් වූ බව පවසමින් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් කර තිබේ.

එම පැමිණිල්ලට අනුව 2018/2/26 සිට 2018 /12/24 දක්වා කාලයේ දී මෙම හාල් අතුරුදන් ව ඇති බවට අභ්‍යන්තර විගණන වාර්තා අනුව කරුනු අනාවරණය වි ඇති බවට සඳහන්ය.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කළ වාණිජ අපරාධ අංශය අපරාධමය වරදක් අනාවරණය වන බැවින් හා නැති වූ සහල් මහා භාණ්ඩාගාරික මුදල් මගින් රජය විසින් මිලදී ගත් නිසා එය පොදු දේපළ පනත යටතට ගැනෙන බවට කාන්තා ප්‍රධාන පොලිස් පරික්ෂක නිරෝශනි හේවාපතිරණ මහත්මිය අධිකරණය හමුවේ කරුණු සඳහන් කළාය.

රහස් පොලිස් නිලධාරින් අවේක්ෂණ රාජකාරියේ යොදවා ලේඛනමය සාක්කි අනුව මුල් අවස්ථාවේ මෙම හාල් බාහිර පාර්ශ්වය වෙත විකිණිමේ චෝදනාව මත ඔරුගොඩවත්ත සතොස ගබඩාවේ පාලකවරුන් දෙදෙනකු අත්අඩංගුවට ගත් බවට අධිකරණයට කරුණු වාර්තා කළේය.

මෙම සැකකරුවන් විසින් ගබඩාවේ ඇති සහල් රාත්‍රි 6න් පසු ලොරි 15 ක් වෙත නාටාම්වරයකුට රුපියල් 50000ක් බැගින් ලබා දි ලොරිවලට පටවා තිබේ. මෙම සහල් වෙළෙඳපොළේ ඇති මිලට අඩකට කළු කඩ මුදලාලිලාට අලෙවි කරන බවට තොරතුරු අනාවරණය වි තිබේ.

මෙම අපරාධය සඳහා ආධාර අනුබල දුන් විධායක නිලධාරින් හා උසස් අය අත්අඩංගුවට ගැනීම සඳහා විමර්ශන පවත්වන බවට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණය වෙත දැනුම් දුන්නේය.

පොදු දේපළ පනත හා ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 386,389 හා 403 යන වගන්ති යටතේ වරදවල් සිදු කර ඇති බවට රහස් පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කළේය.

සැකකරුවන් භාරයේ තිබි මෙම මුදල්වලින් මිලට ගත් බවට අනාවරණය වූ වාහනයක් යතුරුපැදියක් හා රත්රන් භාණ්ඩ රහස් පොලිසිය විසින් සොයා ගෙන ඇති බවට රහස් පොලිසිය අධිකරණයට දැන්විය.

## සිරකරුට හෙරොයින් ගෙනා යුවළ බුද්ධි අංශ අල්ලයි

**බුද්ධිකා ඉඹුලාන**

මැගසින් බන්ධනාගාරයේ සිටින සිරකරුවකු බැලීමට ආ යුවළක් එම සිරකරුට දීමට ගෙන ආ කලිසමක වාටියේ සඟවාගෙන ආ කුඩා හෙරොයින් පැකට් 08ක් බන්ධනාගාර බුද්ධි අංශ නිලධාරීන් විසින් ඊයේ (30) සොයාගෙන ඇත.

මෙම මත් කුඩු පැකට් කලිසමේ දෙපස පැති මැස්මේ අලවා සූක්ෂම ලෙස මසා එම සිරකරුට දීමට ගෙනැවිත් තිබේ.

බන්ධනාගාර බුද්ධි අංශ නිලධාරීන් විසින් කළ දැඩි සෝදිසිය නිසා මෙම මත් කුඩු පැකට් සොයා ගැනීමට හැකි වී ඇති අතර, අත්අඩංගුවට ගත් යුවළ සහ මත් කුඩු පැකට් බොරැල්ල පොලීසියට භාර දී ඇත.

## ලෝක ළමා දින සැමරුම් ජාතික උත්සවය අගමැති ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේදී හෙට

**සිතාරා සේනානි,**

අදට (01) යෙදී තිබෙන ලෝක ළමා දිනයට සමගාමීව සංවිධානය කෙරෙන ලෝක ළමා දින සැමරුම් ජාතික උත්සවය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සියලු ජනවර්ගවලට අයත් දරුවන් සමඟ එක්වී 'අපේ රට-අපේ දෑතින්' තේමාව මුල්කර ගනිමින් ඉතා උත්කර්ෂවත් අන්දමින් බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේදී හෙට (2) පැවැත්වෙන බව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහතා පවසයි.

මෙවර ළමා දින ජාතික උත්සවය කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පැවැත්වෙන බවත්, කොළඹ හා කළුතර දිස්ත්‍රික්ක නියෝජනය කරමින් පාසල් දරුවන් 350දෙනකු මේ සඳහා සහභාගී වීමට නියමිත බවත් ඇමැතිවරයා සඳහන් කරයි.

**එහිදී අදහස් දැක්වූ රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහතා,**

විශේෂයෙන් මේ රටේ නිර්මාණශීලී, ක්‍රියාශීලී, තර්කානුකූල දරුවකු නිර්මාණය කළ යුතු අවස්ථාව අද උදාවී තිබෙනවා. ඒ අභියෝගයට මුහුණ දෙන්න මමත්, රාජ්‍ය ලේකම්තුමිය ඇතුළු අපේ අපේ අමාත්‍යාංශයේ නිලධාරීනුත් කැපවී කටයුතු කරනවා. ඒ සඳහා සාම්ප්‍රදායික ලෝක ළමා දිනයෙන් මෑත්වී දරුවන්ට අපේකම මුල්කර ගෙන මෙවර ලෝක ළමා දිනය සැමරීමට කටයුතු යොදා තිබෙනවා. එහිදී අපි විශේෂයෙන් ම විශේෂ වැඩසටහන් කිහිපයකට දරුවන් ක්‍රියාකාරී මට්ටමින් සම්බන්ධ කර ගැනීමට කටයුතු කරනවා. අපේ දරුවන්ට අපේ කම දැනෙන විදිහට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න කාලය පැමිණ තිබෙනවා. අපේ රට, අපේ උරුමය, අපේ සෞඛ්‍ය, අපේ අධ්‍යාපනය වැනි මෙවැනි බොහෝ දේ අපේ දරුවන්ට ලබා දෙන්න අවශ්‍ය ම කාලය දැන් පැමිණ තිබෙනවා. ඒ නිසා අපේ රටේ දරුවන් දැනුමෙන්, කුලසතාවයෙන්, ආකල්පවලින් සන්නද්ධ කර නිර්මාණශීලී දක්ෂ දරුවෙක් මේ නිර්මාණය කිරීමේ අවශ්‍යතාව අමාත්‍යාංශයක් විදිහට අපේ අමාත්‍යාංශය හොඳින් තේරුම් ගෙන තිබෙනවා.

# ටෙනිසන් සෙල්ලමක් නෙමෙයි!

මෙරින්නගේ එඩ්වඩ් ටෙනිසන් කුරේ හෙවත් ශ්‍රී ලංකාවේ විකට රජාගේ වියෝව බුද්ධිමය සංවාදයකට අවකාශ සලසා ඇත. එය කලාව සම්බන්ධයෙන් ද ජීවිතය හා සමාජය සම්බන්ධයෙන් ද නව අර්ථකථන සපයන වේදිකාවක් වනු නිසැකය. මහාචාර්යවරයෙක්, කෝටිපති ව්‍යාපාරිකයෙක්, මාධ්‍යවේදීහු දෙදෙනෙක් හා ප්‍රකට පරිවර්තකයෙක් ද මගේ සංවාදයට එක් වූහ.

මහාචාර්යවරයා කියා සිටියේ, ටෙනිසන් නළුවකු නොව; සමාජ විශ්ලේෂකයකු වන බවය. ටෙනී නූතන සමාජය හොඳින් විවරණය කළ බව ඔහුගේ මතය විය. කෝටිපති ව්‍යාපාරිකයා පෙන්වා දුන්නේ හාස්‍යය මැවීම අතිශය දුෂ්කර කාර්යයක් වන අතර, ටෙනිසන් කුරේ එය මැනැවින් ඉටු කළ බවය. මාධ්‍යවේදීන්ගේ අදහස වූයේ සිංහල වේදිකාවේ හා සිනමාවේ එක්තරා ශෛලියක අවසානය ටෙනීගේ මරණයත් සමඟ සටහන් වී ඇති බවය. පරිවර්තකයාගේ අර්ථකථනයට අනුව ටෙනිසන් වනාහි ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රහසනය අපූරුවට ප්‍රති නිර්මාණය කළ කලාකරුවෙකි.

මහාචාර්යවරයාගේ ද පරිවර්තකයාගේ ද මතවාද කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම වටී. ටෙනිසන් විකට නළුවකු හැටියට ද විකට රජකු හැටියට ද පොදු සමාජය හඳුනාගෙන තිබේ. ඉන් ඔබ්බට ගිය සමාජීය වටිනාකමක් ඔහුට දෙන්නට පොදු සමාජයේ කිසිවකු කාරුණික වී නැත. මේ අනුව විකටයකු ලෙස ජීවිතයෙන් සමුගන්නට ටෙනිසන් කුරේට සිදු විය. ටෙනී සම්මානයක් ලබාගෙන ඇත්තේ එකම එක වරක් පමණි. ඔහු වරෙක කියා සිටියේ මෙරට විචාරකයන් සිංහල සිනමාව විනාශ කරන බවය. තව වරෙක කියා සිටියේ ජනතා සම්මානය මිස විචාරක සම්මානයෙන් තමන්ට වැඩක් නැති බවය.

සිංහල සිනමාවේ විකටයා එඩී ජයමාන්නගෙන් ආරම්භ වෙතැ'යි උප කල්පනය කළහොත් ඉනික්බිති ඩී.ආර්. නානායක්කාර, ජෝ අබේවික්‍රම, හියුගෝ ප්‍රනාන්දු, ක්‍රිස්ටි ලෙනාඩ්, ෆ්‍රෙඩී සිල්වා, ඇන්තනී සී. පෙරේරා, බී.එස්.පෙරේරා, විමල් කුමාර් ද කොස්තා, බන්දු සමරසිංහ වැනි අය විකටයා නියෝජනය කළහ. මේ සෑම නළුවකු තුළම පැවැති විශේෂත්වය වූයේ ස්වකීය අනන්‍යතාවක් සහිතව රංග කාර්යයෙහි යෙදීමය. කෙනකුගේ ශෛලිය තව කෙනකුගේ ශෛලියෙන් වෙනස්ය. ටෙනිසන් කුරේගේ ශෛලිය ද ඔහුට අනන්‍ය වූ එකකි. ඔහු ඒ හැරෙන්නට චින්තකයකු ලෙස ද රචකයකු ලෙස ද නිර්මාණකරුවකු ලෙස ද තම විෂය පථය පුළුල් කර ගත්තේය. ටෙනී හුදු විකට නළුවකු පමණක් නොවන්නේ ඒ නිසාය.

ටෙනීගේ චින්තන පරාසය ප්‍රකට කරන අදහසක් පුවත්පතකින් උපුටා ගන්නට කැමැත්තෙමි. ඔහු එහිලා මෙසේ සඳහන් කරයි.

"සියල්ල සිද්ධ වන්නේ උපතේදී අපට ලැබෙන සැලැස්ම අනුවය. එය දෛවය නැතහොත් අපට උරුම මෝස්තරය ලෙස හැඳින්විය හැකිය. කෙනකු තව කෙනකුට පහර දෙන්නේ ද අනෙකා බඩ කට පුරා ගුටි කන්නේ ද ඉහත කී සැලැස්මට හෙවත් මෝස්තරයට අනුවය."

ටෙනී ස්වකීය මතය ඔස්සේ තහවුරු කරන්නට වෑයම් කරන්නේ දෛවයට සියලු දෙනා යටත් බව නොවේ, ඔහු පෙන්වා දෙන්නේ පුද්ගල චරිතවල කුසලතාව උපත හා පැවැත්ම අනුව තීරණය වන බවය. පාලි ඇදුරන්ගේ නියමයට අනුව ප්‍රතිභාව යනු භවයෙන් - භවය රැගෙන එන්නකි. එබැවින් එය වාසනා ගුණය ලෙස හඳුන්වති. ටෙනී පෙළ ගස්වන මෝස්තරය හා සැලැසුම යන වචන දෙක මෙහි ලා ඉතා වැදගත්ය. ඔහු වචන භාවිත කර ඇත්තේ ඉතා පරිස්සමට යෝග්‍ය පරිදිය. හුදු විකට නළුවකුට මෙබඳු තෝරා ගැනීමක් තිබෙන්නට බැරිය.

ටෙනිසන් කුරේ යනු ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ සමාජ විශ්ලේෂණ කාර්ය භාරය ඉටු කළ නිර්මාණකරුවෙකි. ගුවන් විදුලිය, රූපවාහිනිය, වේදිකාව හා සිනමාව ඔහු තෝරාගත් මාධ්‍ය ක්ෂේත්‍ර වෙයි. ග්‍රන්ථ කර්තෘවරයකු වීමේ කැමැත්ත ඔහු තුළ පැවැතිය ද කාලය ඊට ඉඩ දී නැත. ටෙනී නවකතා රචනයට ප්‍රවේශ වූයේ නම්; ඔහු එම ක්ෂේත්‍රයෙහි සන්ධිස්ථානයක් ඇති කරන්නට ඉඩ තිබිණි. එහෙත් එය සිදු වූයේ නැත. ඔහුගේ සමස්ත නිර්මාණ ක්‍රියාවලිය නිරීක්ෂණය කරන කල ටෙනීගේ මෝස්තරයේ විශේෂ ලක්ෂණ හතරක් දකින්නට ලැබේ.

(I) ටෙනීගේ චරිත
(II) ටෙනීගේ නිරූපණ
(III) ටෙනීගේ වචන හරඹ
(IV) ටෙනීගේ සංකල්ප

ඔහුගේ කතාවල හා ඉදිරිපත් කිරීම්වල හැමවිටම හමු වන පොදු චරිත කිහිපයක් තිබේ. මහාචාර්යවරයා, දේශපාලකයා, වීරයා, මෝඩයා, පීඩිතයා ඒ අතර සිටිති. රටේ උගත් පරපුර ප්‍රායෝගික නැති බව ද ඔවුන් ළඟ ඇත්තේ හුදු න්‍යාය හා සංකල්ප පමණක් බව ද ටෙනී පෙන්වා දෙයි. ශ්‍රී ලාංකේය සමාජය නිරීක්ෂණය කරන කල ටෙනී කියන යථාව පැහැදිලි වෙයි. දේශපාලකයා අන්තිම දූෂිතය. ඔහු පොදු සමාජය මුළාවට පත් කරන්නේ ඇස් පනාපිටය. ටෙනී වීරයා සංකල්පය ඉදිරිපත් කරන්නේ වෙනස් ආකාරයකටය. වීරයා බිමට ඇද දමා ජෝකරයකු කරන්නට ටෙනී උත්සුක වෙයි. "වැඩ බැරි ටාසන්" ඊට කදිම නිදසුනකි. නූතන සමාජය විග්‍රහ කර ගත හැකි උපාය මාර්ගයක් ලෙස ද එය පවතී. ටෙනී ඕඩරය හෙවත් පිළිවෙළ වෙනස් කරයි. විකාර රූපී නාට්‍ය කලාවේ ද මේ ක්‍රමය පවතී. ජීවිතයේ සාමාන්‍ය පිළිවෙළ අහිමි වූ කල මිනිසාගේ සැබෑ ස්වරූපය මතුවන්නේ යැයි ඉයුජින් අයනෙස්කෝ වරක් කියා ඇත.

ටෙනීගේ මෝඩයා හා පීඩිතයා හුදු විඳවන්නෝ නොවෙති. ඔවුහු විඳවමින් ආස්වාදයක් ලබති; විඳවමින් සතුරාට පාඩමක් උගන්වති. මෙය ඉසාක් බෂෙවික් සිංගර් නම් ප්‍රබන්ධ කතා රචකයාගේ ක්‍රමයට සමානය. ඔහු මේ චරිත ඔස්සේ සමාජ ආකෘතිය හා එහි යථාව මැනැවින් නිරූපණය කරයි. ඒ අතර පීඩිතයාට තවදුරටත් ජීවත් වීම සඳහා උත්තේජකයක් සපයයි.

ටෙනිසන් කුරේගේ නිරූපණය ඔහුටම ආවේණික අනන්‍ය ලක්ෂණවලින් සමන්විතය. ඔහු ඕනෑම චරිතයකට ප්‍රවේශ වන්නේ ආයාසයකින් තොරවය. මගේ දැඟලිල්ලට ප්‍රේක්ෂකයා හිනා වෙනවා යැයි ටෙනී වරක් කියා තිබේ. ටෙනීගේ දැඟලිල්ල ද ස්වාභාවිකය. එය ඉබේ ගලා එයි. ඔහු විසින් එකිනෙක චරිත නිරූපණ සඳහා යොදාගනු ලබන ගමන් විලාස විවිධය. ඒවා නිරායාසයෙන් ටෙනී වෙත ගලා එන බවක් පෙනෙයි. ස්ටැනිස්ලාවුස්කි පෙන්වා දෙන සැහැල්ලු රංගනය ටෙනී තුළ ඇතැ'යි කිව හැකිය. ඔහුගේ වාචිකා'භිනය අතිශය ස්වාභාවිකය. දෙබස කියැවීමක් ටෙනී ළඟ නැත.

සාම්ප්‍රදායික නාට්‍ය කලාව තුළ වාචිකා'භිනය ලෙසින් දකින්නට ඇත්තේ දෙබස් කියැවීමකි. දෙබස් අමතක වන නළු - නිළියන්ට ප්‍රොම්ට්පේටර් විසින් ඒවා සිහිපත් කරවනු ලැබේ. ටෙනීට ප්‍රොම්ට්පේටර්ලා නැත. ඔහු ප්‍රේක්ෂකයාගේ ස්වාභාවයට හා චර්යා රටාවට අනුව දෙබස් වෙනස් කළ අවස්ථා තිබේ. ටෙනීගේ රංගනය හැමවිටම සප්‍රාණිකය. ටෙනී විකටයාගෙන් ඔබ්බට ගෙන යෑමට කිසිවකු උත්සාහ දරා නැත. ඔහුගේම චිත්‍රපට තුළ පවා විකටයාට ඇඳීමට ටෙනීට සිදු විය.

භාෂාවේ වචන භාවිතය සම්බන්ධයෙන් ටෙනිසන් සතු හැකියාව පුදුමාකාරය. ගුවන් විදුලි ඉදිරිපත් කිරීම් තුළදී එය කැපී පෙනෙයි. ඕනෑම විෂයයකට අයත් මාතෘකාවක් සම්බන්ධයෙන් වුව හැප්පීමකින් තොරව එක දිගට වචන ගලා ඒම ටෙනීගේ විශේෂ හැකියාවකි. භාෂාව පිළිබඳ විශේෂඥයන්ට පවා එම හැකියාව නැත. ඔහු වචන පිළිබඳ ඉදිරිපත් කරන විග්‍රහයන් ද පුදුමාකාරය. 'බඩුව' යනු කුණුහරුපයක් දැ'යි වරෙක ඔහු විමසා සිටියේය. 'බඩුව' යනු භාණ්ඩය බව ද මනුෂ්‍යයා භාණ්ඩයක් බවට පත් වන අවස්ථා ඇති බව ද කියා සිටි ටෙනිසන්, වචන නරක නැති බවත් ඇතැම් මිනිසුන්ගේ සිත් නරක බවත් අවධාරණය කළේය.

දළ ජාතික නිෂ්පාදනය, දළ ජාතික ආදායම වැනි යෙදුම්වලට අලුත් අර්ථකථන සැපයීමට ටෙනිසන් ඉදිරිපත් විය. දළ ජාතික ආදායම යනු හොර බිස්නස් එකක් බව ඔහු කියා සිටියේය. වන ඇතුන්ගේ දළ කපා ඒවා අලෙවිකොට ලබා ගන්නා ආදායම දළ ජාතික ආදායම ලෙස ඔහු හැඳින්වීය. මෙය හාස්‍යය මතු කිරීම සඳහා ඉදිරිපත් කළ විග්‍රහයක් බව සැබෑය. එහෙත් ඔහු ඒ සඳහා ඉදිරිපත් කරන තර්කය වැදගත්ය. ටෙනිසන්ගේ භාෂා හැකියාව සේම තර්කනයේ හැකියාව ද එයින් ඉස්මතු වෙයි. ලෝක ප්‍රකට බුද්ධිමතකු වන නොම් චොම්ස්කි ද වචන කෙරෙහි විශේෂාවධානය යොමු කරමින් ස්වකීය විග්‍රහ ඉදිරිපත් කර තිබේ.

ටෙනීගේම වචනවලින් කිවහොත් අද පවතින ලොකුම කොමඩිය දේශපාලනයයි. මෙය රට ගැන බැලුවත් ලෝකය ගැන බැලුවත් දක්නට ලැබෙන යථාව වෙයි. 'දේශපාලනය ප්‍රහසනයකි' යන්න ප්‍රකට සංකල්පයකි. කලාකරුවෝ මෙන් ම දේශපාලන විචාරකයෝ ද මෙය විවිධ දෘෂ්ටි කෝණවලින් විග්‍රහ කරති. ටෙනී ද සිය නිර්මාණවල සමස්ථාර්ථය ගොනු කළේ දේශපාලන ප්‍රහසනය වෙතය. ඔහුගේ සෑම නිර්මාණයකම අඩු - වැඩි වශයෙන් දේශපාලනය ගැබ් වී තිබේ. ටාසන්ගේ සහෝදරයා මේසන්ය. මේසන් යනු පෙදරේරුවෙකි. ටාසන් වීරයා බැවින් ඔහු ගමෙන් පැන ගොස් නගරය ආක්‍රමණය කොට රටේ අගමැති පදවියට පත් වෙයි. එහෙත් ටාසන්ට සිය පදවිය ඔරොත්තු දෙන්නේ නැත. එහි ඇති තතු වටහා ගන්නා ටාසන් දේශපාලනය ගැන කලකිරීමට පත් වෙයි. ඔහු තම සහෝදරයා වූ මේසන් කැඳවා ඔහුට අගමැති පදවිය ප්‍රදානය කරයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා බවට පත් වන්නේ මේසන් බාස් කෙනෙකි. සුබ හා යස කතාව යළි සිහිපත් වෙයි. දේශපාලනය හා රාජ්‍ය නායකත්වය හාස්‍යයට මෙන් ම විචාරයට හසු කරන එම සංකල්පය ඉතා වැදගත්ය.

ටෙනිසන්ගේ 'ටාසන් බාප්පා', 'කැප්ටන් ටෙනී' යන ගුවන් විදුලි වැඩසටහන් ද 'මහාචාර්ය ටෙනී' , 'ඉසිවර හොරණෑ' වැනි වැඩසටහන් ද ශ්‍රාවක - ප්‍රේක්ෂක ජනතාව අතර බෙහෙවින් ජනප්‍රිය වැඩසටහන් සේ හැඳින්විය හැකිය. මේ වැඩසටහන් සඳහා පාදක කර ගන්නේ එදිනෙදා සිදුවීම් හෙවත් කාලීන සිදුවීම්ය. ටෙනී ඒවා ඉදිරිපත් කරන්නේ ද ඒවා විවරණය කරන්නේ ද තාර්කික ලෙසය. හාස්‍යය එහි දෙවන කාරණයක් ලෙස පවතී. වැඩසටහන්වලින් පසුව ටෙනීගේ විවරණ හා යෙදුම් සමාජ භාවිතයක් ලෙස දැකගන්නට ලැබේ. ටෙනී හැමවිටම වෑයම් කළේ සමාජයේ පවත්නා සැබෑ තත්ත්වය තාර්කික පදනමක් මත විග්‍රහ කිරීමටය. එහෙත් එය කලා විචාරකයන්ගේ අවධානයට ලක් වූයේ නැත.

සරසවිය පුවත්පත 'ටෙනීගෙන් අහන්න' යනුවෙන් කොලමක් ඉදිරිපත් කළේ කලකට පෙරය. එම කොලම සඳහා ටෙනී දෙන පිළිතුරු අතිශය ආකර්ෂණීය වෙයි. එලෙසම පිළිතුරුවල යටි අරුතින් සමාජයේ සැබෑ තතු හෙළිදරව් වෙයි. පාඨකයකු වරක් මෙසේ ප්‍රශ්න කර තිබිණි. "කන්ද පාමුල ලක්ෂයකි. කන්ද මුදුනේ තරුණියකි. ගත යුත්තේ කුමක් ද? ටෙනීගේ පිළිතුර වන්නේ; 'හරි සිම්පල්නෙ මල්ලී. ලක්ෂය අතට ගන්නවා. කෙල්ල කරට ගන්නවා" යන්නය. මෙය හිතන්නට යමක් ඉතිරි කරන පිළිතුරකි. තරුණ පරම්පරාවේ දැක්ම ද ඊට ඇතුළත්ය. නූතන ශ්‍රී ලාංකේය සමාජය විග්‍රහ කරන ටෙනී එය 'ඩ්‍රැකියුලා සමාජයක්' ලෙස නම් කළේය. වෙළෙඳ ලෝකයට ආදේශ කළ හොත් ඒ කියමන සියයට සියයක්ම නිවැරැදිය. රුධිරය උරා බීමට සියල්ලෝම දත් විළිස්සාගෙන සිටිති. නව ලිබරල්වාදයේ ස්වභාවය විග්‍රහ කරන බුද්ධිමත්හු ද මීට සමාන අදහස් දක්වති. ටෙනී දක්වන අදහස්වල මතුපිට අර්ථය ඉතා සරලය. පහසුවෙන්ම වටහාගත හැකිය. එහෙත් ඒවායෙහි යටි අරුත් ගැඹුරුය; සංකීර්ණය. එය බුද්ධිමතුන් පෙන්වාදී නැත.


කලාව සම්බන්ධයෙන් ටෙනී දක්වන අදහස් ද සුමටය; ඉතා පැහැදිලිය. හාස්‍යය ගැන කරුණු දක්වන ටෙනී කියා සිටින්නේ එක් කෙනකු හඬන්නටත්, තව කෙනකු සිනා සෙන්නටත් කරන විහිළු ඇත්ත විහිළු නොවන බවය. ඇත්ත විහිළු තාර්කික බව ද ඒවායෙහි පෙරළා සිතන්න යමක් ඇති බව ද ටෙනී පෙන්වා දී ඇත. ගුවන් විදුලියේ හාස්‍යය මැවූ තුන්කට්ටුව ලෙස ප්‍රකට ඇනස්ලි - සැමුවෙල් - බර්ටි යන තිදෙනාගේ නිර්මාණවල ද එම තාර්කික බව තිබිණි. පොඩි මල්ලී - චූටි මල්ලී යන දෙදෙනාගේ ඉදිරිපත් කිරීම්වල ද එම තාර්කික බව පවතී.

ටෙනීට පහසුවෙන්ම දේශපාලනයට ප්‍රවේශ වීමේ හැකියාව තිබිණි. ඔහු මැතිවරණයකට ඉදිරිපත් වූයේ නම් නිසැක ලෙසම වාර්තාගත ඡන්ද ප්‍රමාණයක් ලබාගනු ඇත. එහෙත් ඔහු දේශපාලනය ප්‍රතික්ෂේප කළේය. ඒ වෙනුවට සිය නිර්මාණ ඔස්සේ දේශපාලනය හා දේශපාලකයා විචාරයට ලක් කළේය. ටෙනී දේශපාලකයන්ට හෝ ආණ්ඩුවලට හෝ පක්ෂග්‍රාහී වූයේ නැත. කඩේ යෑම කැත වැඩක් යැයි ටෙනී කියා ඇත. ඔහු පවතින ආණ්ඩුවලට එරෙහිව මතවාද ගොඩනගන්නට ගියේ නැත. පවතින ආණ්ඩු වර්ණනා කළේ ද නැත. කලාකරුවන් දේශපාලකයන්ට සමීප වී කලාවේ ආධිපත්‍යය ගැනීමට සූදානම් වන අවස්ථාවලදී ඔහු ඊට විරුද්ධ විය. වරෙක ඔහු කියා සිටියේ කලාකරුවන් ස්ට්‍රයික් කිරීමෙන් පලක් නැති බවය. එය අපූරු කියමනකි. ටෙනීගේ බොහෝ ප්‍රකාශවල ඇත්තේ සමාජ විශ්ලේෂණ යැයි කිව හැකිය. ඔහුගේ ප්‍රකාශ එකතු කොට ඒවාට විවරණ සැපයුව හොත් අලුත් සමාජ විද්‍යාවක් ඉගැන්විය හැකිය. එහෙත් එය කිසිවකුගේ අගය කිරීමකට ලක් වූයේ නැත. එය ටෙනිසන්ගේ වරදක් නොව; අපේ වරදකි.

**රන්ජන් අමරරත්න**



සිතුවම - ජානක ඉලුක්කුඹුර



## වැව් 5,000ක් ප්‍රතිසංස්කරණයෙන් පසු

# වාර්ෂිකව සියලු වැව් අලුත්වැඩියා කරනවා

### ▶ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පත්වීම් පිරිනමමින් ඇමැති චමල් කියයි

**චන්දිමා කරුණාරත්න**

වැව් 5,000ක් ප්‍රතිසංස්කරණය කිරීමේ පළමු පියවරින් පසු වසරින් වසර සියලු වැව්වල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතා පැවැසීය.

දීර්ඝ කාලයක සිට ජනතා ගැටලුවක්ව තිබූ ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය කිරීම මූලික කර ගනිමින් 'වාරි සෞභාග්‍යයා' විශේෂ වැඩසටහන දියත් කර තිබෙන බවත් ඒ මහතා පෙන්වා දුන්නේය.

ඒ මහතා මේ බව පැවැසුවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදී ඊයේ (30) සහකාර ඉංජිනේරුවරුන් සහ සහකාර තාක්ෂණ නිලධාරීන්ට පත්වීම් පිරිනැමීමේ අවස්ථාවට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද කීවේය.

නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ අධ්‍යාපනය ලබා, අද රටේ ජනතාව පිළිගත් ආයතනයක පත්වීම් ලැබී තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඉතාම පැරණි ඉතිහාසයක් තිබෙන දෙපාර්තමේන්තුවක්. ඉංග්‍රීසි පාලන යුගයේ සිට මේ දෙපාර්තමේන්තුව පැවත එනවා. ඒ කාලයේ ඉංජිනේරුවරු, මිනින්දෝරුවරු අපේ රටේ වැව් පද්ධතීන්, පැරණි වාරිමාර්ග යෝජනා ක්‍රම ගැන හොඳ අධ්‍යයනයක් කර තිබෙනවා. ඒ සම්බන්ධව පොත්පත් පවා තිබෙනවා.

ඒවාගේම දුෂ්කර ප්‍රදේශවල විශාල වාරි ව්‍යාපෘතිවල සේවය කළ නිලධාරීන් සිටිනවා. ඒ අයගෙන් අද පත්වීම් ලබන අයට අත්දැකීම් රාශියක් ලබාගන්න පුළුවන්. මෙය ශ්‍රී ලංකාව පුරාම ග්‍රාමීය ජනතාව සමඟ කටයුතු කරන්නත් අපේ රටේ තිබෙන සම්පත් හඳුනා ගන්න තිබෙන අවස්ථාවක්. කොළඹ සිටිමින් සේවය කරනවාට වඩා ගම්වලට ගිහින් ගම්වල ජනතාවගේ ප්‍රශ්න ගැන සොයා බලමින් අත්දැකීම් රැසක් ගන්න පුළුවන්.

රටට, ගොවිතැනට අවශ්‍ය කරන ප්‍රධාන කාර්යභාර්ය කරන්නේ වාරි මාර්ග දෙපාර්තමේන්තුවයි. වැව් ඉදිකරමින්, ඇළ වේලි හදමින්, ඉඩම් හඳුනා ගැනීම සහ ඉඩම් සකස් කිරීම ඇතුළු සියලු කටයුතු කරන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. ඒ අයට විශාල වගකීමක් පැවරෙනවා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් එතුමාගේ දැක්ම ඉදිරිපත් කර තිබෙනවා. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අපේ වැඩකටයුතු සිදු කරනවා. ඒ කටයුත්තේදී අපට ලොකු වගකීමක් තිබෙනවා. ඒ අතර දැනට පවතින විශාල වාරි ව්‍යාපෘති සම්බන්ධව කටයුතු කිරීමට තිබෙනවා. රටේ තිබුණු ප්‍රශ්නයක් විදිහට ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය කරන්න කියා ජනතාව ඉල්ලා සිටියා. ඒ නිසාම 'වාරි සෞභාග්‍යයා' විශේෂ වැඩසටහන හඳුන්වා දී ඒ කටයුතු කරගෙන යනවා. ඒ අනුව සියලු ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය කිරීම කරනවා.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ හඳුනාගත් සහ දැනට නඩත්තු කටයුතු කරමින් පවතින වැව් 48,000ක් පමණ පවතිනවා. මහවැලි අධිකාරිය යටතේ තවත් වැව් 400ක් පමණ තිබෙනවා.

ඊට අමතරවත් ගම්වල කුඩා වැව් තිබෙනවා. ඒවා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් හඳුන්වා දුන් පසු ඒවා ප්‍රාදේශීය ලේකම්වරු, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගනිමින් ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඉන් පළමු අවුරුද්දේ වැව් 5,000ක් ප්‍රතිසංස්කරණය කරන්න ඉලක්ක කර තිබෙනවා. ඒ අනුව අවුරුද්දෙන් අවුරුද්ද සියලු වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අමුණු ප්‍රතිසංස්කරණය කරන්න කියා ගොවි ජනතාව ඉල්ලා සිටිනවා. ඒ වෙනුවෙන්ද ඉදිරියේදී කටයුතු අරඹනවා.



## වසරකට වැඩි කාලයක් දිග්ගැස්සෙන

# උඩුමුල්ල-මාදිවෙල පාර දින 15ක් ඇතුළත හදන්න

### ▶ ඇමැති ජොන්ස්ටන්ගෙන් නිලධාරීන්ට උපදෙස්



ඇමැතිවරයා මාර්ගයේ වැඩකටයුතු නිරීක්ෂණය කරන අයුරු

**සුභාෂිණී සේනානායක**

වසරකට අධික කාලයක් තිස්සේ වැඩ නිම කිරීමට නොහැකි වූ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත්ව තිබූ උඩුමුල්ල සිට මාදිවෙල දක්වා වූ මාර්ගය දින 15ක් ඇතුළත ඉදිකරන ලෙස මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට උපදෙස් දී තිබේ.

මේ මාර්ගය භාවිත කරන මගී ජනතාවට සිදු වන අපහසුතාව සැලකිල්ලට ගනිමින් මන්දගාමීව සිදු වූ මේ මාර්ගයේ සංවර්ධන කටයුතු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ දැනුම්දීම පරිදි ඇමැතිවරයා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගෙන ඇත. දින 15ක් ඇතුළතදී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නිමකරන ලෙස ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා අදාළ කොන්ත්‍රාත්කරුවන්ට දැනුම් දී ඇති අතර, වැඩ ප්‍රමාද කරන කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ සොයා බලා ඔවුන්ට එරෙහිව කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දී තිබේ.

මේ මාර්ගයේ දුර කිලෝ මීටර් 1. 2ක් වන අතර, මංතීරු 2ක් යුතුව ලෝක බැංකුව හා ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන TCAMP ව්‍යාපෘතිය යටතේ මේ මාර්ගයේ වැඩ කටයුතු මීට වසරකට පෙර ආරම්භ කර ඇත. නුගේගොඩ නගරයට ඇතුළු වන විකල්ප මාර්ගයක් වන මේ මාර්ගයේ ඇති වාහන රථගාල, පදික වේදිකා සහ ඇවිදින මංතීරුව කඩිනමින් සංවර්ධනය කරනු ඇත.

## මූඩිස් ශ්‍රේණිගත කිරීම්වලින් ශ්‍රී ලංකාව පහළට වැටිලා

# මූල්‍ය ණය ගැනීමේදී මෙය දැඩිව බලපානවා

### ▶ පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න



**ශිවන්ති ප්‍රනාන්දු**

අන්තර්ජාතික මූඩිස් ආයතනයේ ශ්‍රේණිගත කිරීම්වලින් ශ්‍රී ලංකාව පහළ අගයකට යැම ඉදිරියේදී රටේ මූල්‍ය ණය ගැනීමේ ක්‍රියාවලියට බලපානු ඇති බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මහතා ඊයේ (30) පැවසීය.

සමගි ජන බලවේගයේ පක්ෂ කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමින් මන්ත්‍රීවරයා මේ බව පැවසූ අතර, වැඩිදුරටත් හෙතෙම මෙසේද කීය.

රත්මලානේදී විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාට ගල් පහර දී විපක්ෂයේ කටයුතු මැඬ පවත්වන්න හිතුවා නම් අපේ ප්‍රබල සමගි ජන බලවේගයේ කටයුතු මැඬ පවත්වන්න බැරි බව මම අවධාරණය කරන්න කැමතියි. ඒ පහර දුන් ගල් මුල්ගල හැටියට භාවිත කරලා ඒ ප්‍රදේශයේ ප්‍රජා ශාලාවක් ඉදි කරන්න කටයුතු කරන බවත් එතුමා එතනදී කිවුවා. සැප්තැම්බර් 28 වැනිදා මූඩිස් ශ්‍රේණිගත කිරීම්වලින් ශ්‍රී ලංකාව පහළට වැටී තිබෙනවා. දෙදහස් දහනවයේ නොවැම්බර් මැතිවරණයෙන් පස්සේ දෙසැම්බර් මාසයේ, 2020 අප්‍රේල් මාසයේ මීට පෙර අපි මේ ශ්‍රේණිගත කිරීම්වල පහළින් පෙන්නුම් කළා. නමුත් ශ්‍රේණි දෙකක් මෙසේ පහළට වැටුණේ පළමුවැනි වතාවට. මේ ශ්‍රේණිගත කිරීමට 2005දී අපේ රට ඇතුළු වුණායින් පස්සේ අඩුම ශ්‍රේණිගත කිරීම වුණේ මේ වතාවේයි. මේකෙන් අපි අසමත්, අසාර්ථක රාජ්‍ය ගණයට වැටෙනවා. මේ වෙද්දි ශ්‍රී ලංකාව අප්‍රිකාවේ ඇන්ගෝලාව, කොන්ගෝ, මාලි රාජ්‍ය අතරට වැටී තිබෙනවා. මේකෙන් අර්ථ දැක්වෙන්නේ රටේ මූල්‍ය පාලනයේ දුර්වලකමයි. රටේ ආදායම තුනෙන් 01ක් මේ වෙද්දී අඩු වෙලා තියෙනවා. රජය මේ ගැන දත්ත සඟවාගෙන සිටින නිසා හරියට මේ ගැන කියන්න අපිට බෑ. අපේ රට ණය අරගෙන තිබෙනවා, ඒකෙන් රටේ අවදානම පෙනෙනවා. මේක ඉදිරියේදී රටට තව ණය ගන්නකොට බලපානවා. රජයට ප්‍රතිපත්තියක් නැති බව මේකෙන් පේනවා. මේ තත්ත්වය නාවුක, ආනයන වගේම බැංකු ක්ෂේත්‍රයට බලපානවා. මේ සමාගම් ලෝකයේ හැම රටක්ම ශ්‍රේණිගත කරනවා. මේ ශ්‍රේණිගත කිරීමේදී රජය මේ වෙලාවේ අපිව කොන් කරනවා වගේ බොළඳ තර්කවලින් මිදෙන්න ඕනේ. මේකට ආණ්ඩුව මාර්ගයක් පෙන්වන්න ඕනේ. පාර්ලිමේන්තුවේදී රජයේ ආදායම, වියදම, ණය, විදේශ ප්‍රේෂණ ගැන ඇහුවට ඒවට අපිට පිළිතුරු දෙන්නේ නෑ. රට අවදානම්, භයානක තත්ත්වයකට තල්ලු වුණාම ආණ්ඩුව බොළඳ කතා කියමින් යනවා. හැමෝම දන්නවා බඩු භාණ්ඩ සේවා ගනුදෙනු තිබුණේ නෑ. රජයට මේකට පිළිතුරක් නෑ. හැමෝම දන්නවා කොරෝනා කාලේ භාණ්ඩ හා සේවා ගනුදෙනු තිබුණේ නෑ. රටේ ප්‍රේෂණයට ක්‍රම හතරයි තියෙන්නේ. පිටරට සේවකයන්ගෙන්, අපනයනවලින්, සංචාරක කර්මාන්තයෙන් මුදල් එනවා, සෘජු විදේශ ආයෝජනවලින් මුදල් එනවා. දැන් ඒවා රටට ලැබිලා නෑ. ආසියාතික රටවලින් ඉල්ලුම අඩු වෙලා තියෙනවා. ආනයන අඩු කිරීම ගැන ධන පැත්තකුත් තියෙනවා. මහ බැංකුවේ දත්ත අනුව හැම ආහාර ද්‍රව්‍යයක්ම සියයට 20ත් 75ත් අතර මිල ඉහළට ගිහින්. රැකියා ආදායම් අහිමි වෙලා, හුඟක් අයට වැටුප් අඩු වෙලා. රටේ වැඩි හරියක් කෘෂිකර්මය හරහා ආදායම් ලබනවා. එක ප්‍රදේශයකවත් පොහොර නෑ. සල්ලි දීලාවත් ගන්න වෙළෙඳපොළේ නෑ. රජයට පොහොර ටික දෙන්න බැරිද? ඒවට ගෙවන්න බැරි එක ප්‍රශ්නයක් වෙලා තියෙනවා. ආර්ථිකය ඉතා පහළ තැනකට ඇවිත් තියෙනවා.



## 20 වැනි සංශෝධනය ඉදිරි ගමනට හානියක්

### ▶ පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමන්

**මාධ්‍ය හමුවට සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමන් මහතා,**

විසි වැනි සංශෝධනයට සංශෝධන ගෙනාවා කියා නීතිපතිවරයා අධිකරණයට කිවුවා. ආණ්ඩුවට මේ විදිහට පසු බහින්න වෙලා තියෙන්නේ සමගි ජන බලවේගය සති කිහිපයක් මුළුල්ලේ කළ වැඩසටහන් නිසයි. නමුත්, මේවයේ ද්විත්ව පුරවැසිභාවය ගැන සංශෝධන නෑ. දේශප්‍රේමී සළු ඇඳගෙන ඉන්න කිහිප දෙනෙක් ආණ්ඩුවේ ඉන්නවා. දේශීයත්වයට මුල් තැන දෙනවයි කිවුවට 20 වැනි සංශෝධනය ගැන වචනයක්වත් ඒ අය කියන්නේ නෑ. විමල් වීරවංශ, වාසුදේව නානායක්කාර, ගම්මන්පිල තමයි මැතිවරණයට කලින් රටේ අධිරාජ්‍ය විරෝධී නායකයෙක් හදන්න ඕනේ කිවුවේ. නමුත්, අමෙරිකන් පුරවැසියකුට පාර්ලිමේන්තු යන්න පුළුවන් වීම ගැන මේ අය කියන්නේ නෑ. මේ අය කසාය බීපු ගොළුවෝ වගේ වෙලා. ආණ්ඩුවේ ඉඳගෙන විවේචන කරලා තමන්ගේ වරප්‍රසාද, ඇමැතිකම් අතාරින්න වෙන නිසා නිශ්ශබ්දව ඉන්නවා. මේ ඊනියා දේශප්‍රේමීන් හැමදාම විපක්ෂයේ ඉද්දී දේශප්‍රේමය ගැන කතා කළා. ආණ්ඩුවේ ඉද්දී තමන්ගේ තනතුරු වෙනුවෙන් නිහඬව ඉන්නවා. ජේ. ආර්. ජයවර්ධන ව්‍යවස්ථාව ගේද්දී හඬ නැගූ අය, දැන් ආණ්ඩුවේ ඉන්න වාමාංශිකයන්, කළු කොඩි දැම්ම අය, සටන් කරපු අය එවැනි සංශෝධනය වර්තමාන ජනාධිපතිවරයා ගේනකොට ඒ ගැන දෙබිඩි ප්‍රතිපත්තියක් ගේනවා. මේ 20 වැනි සංශෝධනය ඉතා භයානකයි. ඒක ඉදිරි ගමනට හානියක්. මේ අසීමිත බලයෙන් අධිකරණය, පොලීසිය, රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය යට කරන්න ලැබෙනවා. මේ ඒකාධිපති ගමන නැවත හරවන්න වෙනවා. ඒ කියන්නේ අර රූපවාහිනී නාට්‍යයක් තිබුණා, ඒ වගේ සුදු ඇඳගෙන කළු ඇවිදින් කියලා. සුදු ඇඳගෙන කළු ඇඳගෙන තමයි මේ ආණ්ඩුව එන්නේ.

සමගි ජන බලවේගයේ මහ ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුමබණ්ඩාර මහතාද මාධ්‍ය හමුවට සහභාගි විය.



# 13 බලාත්මක කරන්නැයි කීම ඉන්දියාව ශ්‍රී ලංකාවට කළ අනිසි බලපෑමක්

### ▶ 'යුතුකම' සංවිධානයේ සභාපති ගෙවිඳු කුමාරතුංග

**අමෝදා ජයමහ**

දහතුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කර දෙමළ ජනතාවගේ අභිලාෂයන් ඉටු කිරීමට කටයුතු කරන ලෙස ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතා විසින් අගමැති මහින්ද රාජපක්ෂ මහතාට කර තිබෙන ඉල්ලීම ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට කරන ලද අනිසි බලපෑමක් බව යුතුකම සංවිධානයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග මහතා පැවසුවේය.

සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ ඊයේ (29) පැවති මාධ්‍ය හමුවක දී මන්ත්‍රීවරයා මේ බව කීවේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක් වූ මන්ත්‍රීවරයා,

ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතා විසින් එක්සත් ශ්‍රී ලංකාවක් තුළ දෙමළ ජනතාවගේ අභිලාෂයන් ඉටු කරන්නේය. යන කරුණ මත දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කර ක්‍රියාත්මක කරන ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතා හට කළ ඉල්ලීමට ප්‍රතිචාරයක් ලෙස ඊට එකඟ නොවී සියලු ජනයාගේ අභිලාෂයන් ඉටු කිරීමට රජයක් ලෙස වගකීම් සහගත ලෙස කටයුතු කරන බවට මහින්ද රාජපක්ෂ මහතා, නරේන්ද්‍ර මෝදි මහතා හට පවසා තිබෙනවා. මැතිවරණය හරහා ජනතාවට අප දුන් පොරොන්දුවක් ලෙස නව ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එන බව පැවසුවා. ඒ අනුව යුතුකම සංවිධානය ලෙස අලුත් ව්‍යවස්ථා සංශෝධනයක් නව රජයේ ප්‍රධාන වගකීමක් ලෙස ඉක්මනින් ඉදිරිපත් කරන ලෙස අප ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියා. ඒ අනුව මේ වන විට විසි වැනි ව්‍යවස්ථා සංශෝධනයක් නිර්මාණය වෙමින් පවතිනවා. ජනතාවගේ අභිලාෂයන් ඉටු කිරීම මූලික කර ගනිමින්, ජාත්‍යන්තර බලපෑම්වලට යටත් නොවී මේ සංශෝධනය සැකසී තිබෙනවා. අපේ රට තුළ දිගින් දිගටම පැවතියේ ඒකීය රාජ්‍ය ව්‍යුහයක්. අදටත් පවතින ව්‍යවස්ථාව තුළ ඇත්තේ ඒකීය රාජ්‍ය ව්‍යුහයක්. විදේශීය රාජ්‍ය නායකයකු විසින් අපේ රටේ රාජ්‍ය ව්‍යුහය සම්බන්ධයෙන් අනිසි මැදිහත්වීම් නොකළ යුතුයි. අපේ රටේ ජනතාවගේ අභිලාෂයන් මූලික කරගෙන කටයුතු කිරීමට ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම වෙනුවට වෙනත් රටක රාජ්‍ය නායකයකුගේ අභිලාෂයන් ඉටු කිරීමට කටයුතු නොකළ යුතුයි.

## අලුත් ව්‍යවස්ථාවක් ගෙන ඒම ආණ්ඩුවේ ප්‍රධාන වගකීමක්

# රටේ නීති රීති සැකසිය යුත්තේ පුළුල් සාකච්ඡාවකින් පසුවයි

### ▶ සමඟි ජන බලවේගයේ ජාතික සංවිධායක තිස්ස අත්තනායක



**අනුර ප්‍රේමලාල්**

රටේ නීති රීති සකස් විය යුත්තේ ජනතාව වෙනුවෙන් බැවින් ඒවා පුළුල් සාකච්ඡාවකින් පසුව සිදු විය යුතු බව පාර්ලිමේන්තු මන්ත්‍රී සමගි ජනබලවේගයේ ජාතික සංවිධායක තිස්ස අත්තනායක මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඉකුත් (28) කොළඹ 07, මහජන පුස්තකාලයේ පැවැති ලංකා ජනතා පක්ෂය සංවිධාන කර තිබූ ආණ්ඩුවේ විසි වැනි ව්‍යවස්ථා සංශෝධනය ජනතාවාදීද? මැයෙන් පැවැති සම්මන්ත්‍රණයට එක්වෙමින්ය. එහිදී වැඩිදුරටත් කතා කළ ජාතික සංවිධායකවරයා මෙසේද කීය.

ව්‍යවස්ථාවක්, නීතියක් සම්පාදනය විය යුත්තේ කා වෙනුවෙන්ද එය රටේ පාලනය තාවකාලිකව භාර ගන්නා අයගේ අවශ්‍යතාවට නොව ජනතාවගේ අවශ්‍යතාවටයි. මෙය ජනාධිපති හෝ ආණ්ඩුවක් නිසා නොව ජනතාව වෙනුවෙන් බව මම සියයට සියයක් විශ්වාස කරනවා. මෙහිදී පිරිසක් සිටිනවා මේ සංශෝධනය කළ යුතුමයි කියලා කියන. නොකළ යුතුමයි කියලා කියන පිරිසකුත් සිටින අතර, මෙහි මැද මාවතේ සිටින විශාල පිරිසක් ද සිටිනවා. ඒ අය දැනුවත් කිරීම සඳහා ලංකා ජනතා පක්ෂය මේ ගන්නා උත්සාහය සියලු දෙනාගේ ඇගයීමට ලක්විය යුතුයි. ඒ වෙනුවෙන් සංවිධානය කර තිබෙන මේ සම්මන්ත්‍රණය වැදගත්. 19 වැනි සංශෝධනයට මමත් අත උස්සපු කෙනෙක්. මෙහිදී 19 වැනි සංශෝධනය අංග සම්පූර්ණ එකක් කියලා මම කියන්න යන්නේ නෑ. එය සම්පූර්ණයෙන්ම විසිකරලා දමන්න පුළුවන් එකකුත් නොවේ. එහි යම් ආකාරයක ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් තිබුණා. එහි තිබුණු මානුෂික මුහුණුවර විසිවැනි සංශෝධනයෙන් විසි කරලා දමන්න ගත් උත්සාහයක් බව මින් පෙනෙනවා. ඒ නිසා අද විසි වැනි සංශෝධනය වුවමනාද නැද්ද කියලා කතිකාවක් ඇති වෙලා තියෙනවා.

මේ අවස්ථාවේ කළ යුත්තේ ව්‍යවස්ථා සම්පාදනය හෝ ව්‍යවස්ථා සංශෝධනයක් නොවේ. මේ අවස්ථාවේදී ලෝක ආර්ථික අර්බුදයක් තිබෙන අතර, එය අපිටත් තදබල ලෙස බලපානවා. අපේ රැකියා අහිමිවෙලා තියෙනවා. ආදායම් මාර්ග අඩුවෙලා තියෙනවා. මේක කාටවත් පුද්ගලිකව ඇඟිල්ල දිගු කිරීමක් නොවේ. ඒ සමගම ජීවන වියදම වැඩි වෙනවා. මේ නිසා බරපතළ ලෙස ආර්ථික පසුබෑමක් තියෙනවා. ඒ නිසා අපි කඩිනමින් පිළිතුරු සෙවිය යුත්තේ කුමකටද. එබැවින් කඩිනමින් පිළිතුරු සෙවිය යුත්තේ මේවාට බව කිව යුතුයි. ඒ අනුව ප්‍රමුඛතාව දිය යුතු දෙයට මේ ආණ්ඩුව ප්‍රමුඛත්වයක් ලබාදී නැතැයි මට සිතෙනවා.



## 20 ගෙන ඒමේ මූලික අරමුණ 19 තිබෙන දෝෂ ඉවත් කිරීමයි

### ▶ පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ ප්‍රේමනාත් සී. දොළවත්ත

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ ප්‍රේමනාත් සී. දොළවත්ත මහතා-**

ඇතැමුන් දේශපාලන පක්ෂ වැඩියි කියලා චෝදනා නගන එක ප්‍රජාතන්ත්‍ර විරෝධියි. දේශපාලන පක්ෂ බිහි විය යුතුයි. එහෙම හිතුවා නම් අද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බිහිවන්නෙත් නැහැ. ජනතාව ලබාදෙන මේ බලය සදාකාලික නැති බව සෑම දේශපාලනඥයකුම දැන ගත යුතුයි.

විස්ස ගැන දැන් නොයෙකුත් කතා අපිට ඇසෙනවා. සෑම දෙයක්ම සියයට සියයක් හොඳත් නැහැ. සියයට සියයක් නරකත් නැහැ. මාධ්‍ය ගත්තත් සියයට සියයක් ස්වාධීනද? නැහැ. ඒ නිසා සාපේක්ෂව වඩා හොඳ දේ ගැන බලන්න ඕනේ. පැවැති මහා මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ 2/3ක බලයක් ලැබුවා. ඉදිරියටත් ජනතාවාදීව කටයුතු කළොත් මේ බලය පවත්වාගෙන යා හැකියි. අද සමගි ජනබලවේගය විසි වැනි සංශෝධනය වැරැද්දක් ලෙසමයි දකින්නේ. එහි කියන තරම් වැරැද්දක් නැහැ. මේ ගැන සාකච්ඡා කරලා සංශෝධන කරලා තමයි අවසානයේ සම්මත වෙන්නේ අපිට හදිසියක් නැහැ. විස්ස ගෙන ඒමේ මූලික අරමුණ තමයි දහනවයේ දෝෂ හා ප්‍රායෝගික නොවන කරුණු ඉවත් කිරීම. එ. ජා. ප. යට මේ තරම් අන්ත පරාජයක් හිමි වෙයි කියලා කවුරුත් හිතුවද. 19 ප්‍රතික්ෂේප කරන කොට ජනතාවගේ අවශ්‍යතාව කුමක්ද කියලා බලන්න ඕනේ. අපි විශ්වාස කරන්නේ ජනතාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි. තිබෙන ව්‍යවස්ථාවට දැන් පැලැස්තර දහනවයක් දමා තියෙනවා. ඒ නිසා පුළුල් සන්දර්භයක්, සාකච්ඡාවක් තුළ තමයි මේක සිදුවන්නේ. ඒක ඉතා ඉක්මනට වෙන්නේ නැහැ. අගමැති මහින්ද රාජපක්ෂ මහතා සහ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සිටිද්දී සකස් කරන ව්‍යවස්ථාවකට අපි කැමැති වෙනවා. විපක්ෂය කිවුවට විස්ස ඕපපාතික නැහැ. ඡන්ද බලය උතුම් වුවත් 19 තුළ ජනාධිපතිට වසර හතරහමාරක් යනතුරු පාර්ලිමේන්තුව විසුරුවන්න බැහැ.

මෙහිදී ප්‍රගතිශීලී ජනතා සේවක පක්ෂයේ නායක ඉන්දික සූරියආරච්චි මහතා ද අදහස් දැක්වීය. මේ අවස්ථාවට ලංකා ජනතා පක්ෂයේ සභාපතිනි නීතිඥ සුමනා ආරියදාස මහත්මිය, ප්‍රධාන ලේකම් අජිත් ජයසුන්දර ඇතුළු එම පක්ෂයේ නිලධාරීන් පිරිසක් එක්ව සිටියහ.



අධ්‍යාත්මිකව පිරිපුන් ප්‍රඥාසම්පන්න ජන සමාජයක් උදෙසා

# 'අමා දම් සිසිලස'

## ධර්ම දේශනා මාලාව



අතීත ශ්‍රී ලාංකික වැසියන් කොතරම් වැඩ රාජකාරිවල නිතර වුව ද ඔවුන් කෙසේ හෝ ආගමික කටයුතුවල නියැළීමට කාලය වෙන් කර ගත්හ. එහෙත් වර්තමානයේ පවතින අධි තරඟකාරී සමාජ ක්‍රමය තුළ දී මිනිසුන්ට ආගමික කටයුතුවලට කාලය වෙන් කර ගැනීම අසීරු කටයුත්තක් වී තිබේ. ඒ බව මනාව අවබෝධ කර ගනිමින් අධ්‍යාත්මිකව පිරිපුන් ශ්‍රද්ධාසම්පන්න දැහැමි ජන සමාජයක් ස්ථාපිත කිරීම අරමුණු කර ගෙන ගරු මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයා අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව හඳුන්වා දී තිබේ.

මෙවර වප් මාසයේ, අධි වප් පුර පසළොස්වක පොහොය දිනයේදී අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාවේ 202 වැන්න බෙලිහුල්ඔය සීල සමාහිත ආරණ්‍ය සේනාසනවාසී ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද, ශාස්ත්‍රපති, කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත බලංගොඩ රාධ ස්වාමීන්වහන්සේ පවත්වති. අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාවේ වැදගත්කම පිළිබඳ කැලණිය රජමහා විහාරස්ථානයේ විහාරාධිපති, මහාචාර්ය, අති ගෞරවාර්හ, කොල්ලුපිටියේ මහින්ද සංඝ රක්ඛිත හිමි, මාතර හිත්තැටිය රාජමහා විහාරාධිපති මාතර, හම්බන්තර දෙදිසාවේ ප්‍රධාන සංඝනායක, ශාස්ත්‍රපති, පූජ්‍ය අග්‍රහැරේ කස්සප හිමි සහ අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාවන් ශ්‍රවණය කිරීමට පැමිණෙන ගිහියකු වන ලෝක බෞද්ධ මහා සම්මේලනයේ, ශ්‍රී ලංකා මධ්‍යස්ථානයේ සභාපති, ආචාර්ය සුදත් දේවපුර මහතාගේ අදහස් ඇසුරින් සකස් කළ සටහනක් මෙසේ ය.



## කැලණිය රජමහා විහාරස්ථානයේ විහාරාධිපති, මහාචාර්ය, අති ගෞරවාර්හ, කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත

**වත්කම්වලින් මිනිසුන් කොතරම් ඉහළ ස්ථරයක සිටිය ද ඔවුන් ගුණ ධර්මවලින් පෝෂණය විය යුතු ය. එසේ නැතිනම් දුර්ලභව හිමි කර ගත් මනුෂ්‍ය ආත්මයෙන් ඵලක් නැත. තරඟකාරී සමාජය හමුවේ මිනිසුන් උසස් තත්ත්වයන්ට යෑමට උත්සාහ කරද්දී ඔවුන්ගේ අධ්‍යාත්මය කඩා බිඳ වැටී යාමට පුළුවන. එසේ සිදු නොකර ගනිමින් ධර්මයේ තිබෙන උතුම් බව අවබෝධ කර ගෙන ධාර්මිකව ජීවත් වීමට උත්සාහ කිරීම වඩාත් අගනේ ය. ධර්ම දේශනා වැඩසටහන් මඟින් වර්තමාන සමාජයේ සිදු වන බොහෝමයක් ගැටලුකාරී තත්ත්වයන්ට නිසි විසඳුම් ලබා ගැනීමට පුළුවන.**

### ප්‍රඥාසම්පන්න ජන සමාජයකට යොමු කිරීමක්

අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව යනු ශ්‍රී ලාංකීය ජනතාවට හිමි වී තිබෙන දුර්ලභ අවස්ථාවකි. ශ්‍රී ලංකාවේ වාසය කරන උගත්, දහම් දැනුමින් පරිපූර්ණ වූ භික්ෂූන් වහන්සේ විසින් පවත්වන මේ ධර්ම දේශනා මාලාවන් තුළින් ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රඥාව දියුණු කර ගැනීමට හැකියාව ලැබේ. සැබවින්ම මේ ධර්ම දේශනා මාලාව මඟින් ශ්‍රී ලංකාව තුළ ප්‍රඥා සම්පන්න දැහැමි ජන සමාජයක් ස්ථාපිත කිරීමට උර දෙනු ලබයි. සමාජයේ පවතින ගැටලුකාරී තත්ත්වයන්ට හේතු සාධක වන කාරණා, කාලීන ගැටලු සහ එම ගැටලුකාරී තත්ත්වයන් විසඳ ගැනීමට මනස සකස් විය යුතු අන්දම, චර්යා රටාවන් ධර්මයට අනුකූලව වෙනස් විය යුතු අන්දම මේ ධර්ම දේශනා තුළින් ජනතාවට පෙන්වා දෙනු ලබයි. ඒ තුළින් වැරදි චර්යා රටාවන් අනුගමනය කළ මිනිසුන් ධර්මයට අනුගත මිනිසුන් කිරීමත්, ධර්මයට අනුගතව සිටි මිනිසුන් තව තවත් ධාර්මික කිරීමටත් අනුබලයක් සැපයේ.

ධර්මය සත්නිවේදනය වූ කලී උතුම් වූ පුන්‍යකර්මයකි. ධර්මය සත්නිවේදනය කිරීම සෑම පුද්ගලයකුටම සිදු කළ නොහැකි කාර්යයකි. ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ සංකල්පයකට අනුව ආරම්භ කළ අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව තුළින් ද මුළු ශ්‍රී ලාංකික ජනතාවට ධර්මයට ශ්‍රවණය කිරීමට ඉඩ හසර විවර කර දීම සැබවින්ම පාලකයකු විසින් සිදු කරන වචනවලින් කියා නිම කළ නොහැකි විශිෂ්ට කාර්යයකි. රටක මිනිසුන් කොතරම් ආර්ථික මට්ටමින් උසස් තත්ත්වයකට පත් වුවත් ඔවුන් ගුණ ධර්මවලින් පිරිහී සිටිනම් ඒ රට යහපත් රටක් වන්නේ නැත. ඒ පිළිබඳව අවධානය යොමු කරමින් ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ අනුදැනුමින් ආරම්භ කළ අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව වූ කලී රටකට අත්‍යවශ්‍යම වූ අගනා කටයුත්තකි.

### මිනිසුන්ගේ අධ්‍යාත්මික සංවර්ධනයට අත්වැලක්

රටේ ජීවත්වන මිනිසුන්ගේ සමාජ තත්ත්වය, ආර්ථික තත්ත්වය දියුණු කිරීම පමණක් නොව ඔවුන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය ගැන සිතීම ද වඩාත් යහපත් කරුණකි. තරඟකාරී සමාජයක් තුළ ආත්මාර්ථකාමී හැඟීමෙන් තමන්ගේ දියුණුව ගැන පමණක් සිතා කටයුතු කරන මිනිසුන්ගේ අධ්‍යාත්මික තත්ත්වය උසස් කිරීම ද මෙවැනි ධර්ම දේශනා මාලාවන් තුළින් සිදු කරනු ලබයි. දහම් දැනුමින් පිරිපුන් වූ විට මිනිසුන් වැරදි කාර්යයන්හි නියැළීමට මැලි වේ. නිරන්තරයෙන් ධර්මය සන්නිවේදනය කරන විට තමන් වටහා ගත් ධර්ම කාරණා අනෙක් පුද්ගලයන් සමඟ හුවමාරු කර ගැනීමට උත්සාහ කරයි. මේ ධර්ම දේශනා මාලාවන් මඟින් මිනිසුන් ඔවුනොවුන් විසින් සිදු කරන වැරදි ක්‍රියාකාරකම්, ඔවුනොවුන් විසින් ම හඳුනා ගෙන ස්වකීය හික්මීම පෙරදැරි කර ගනිමින් තමන්ගේ ජීවිත ධාර්මිකව සාර්ථක කර ගැනීමට උත්සාහ ගනී.

ධර්ම දේශනා ශ්‍රවණය කිරීමෙන් ධර්මය තුළින් සත්‍ය වශයෙන්ම පෙන්වා දෙන්නේ කුමක් ද? යන්න මැනවින් අවබෝධ කර ගැනීමට මිනිසුන් නිතැතින්ම යොමු වේ. මෙතෙක් කල් තමන් ගත කරපු ජීවිතය කුමක් ද? ඒ තුළින් සත්‍ය වශයෙන්ම ජීවිතයේ අනිත්‍ය බව අවබෝධ කර ගැනීමට හැකි වුණා ද? කියා මිනිසුන්ට අවබෝධ වේ. අද වන විට උදෑසන රාජකාරී ගොස් හෙම්බත් වී නිවෙස්වලට පැමිණෙන මිනිසුන්ට විහාරස්ථානයකට ගොස් ආගමික වතාවත්වල නියැළීමට කාලය නැති වී තිබේ. ඒ තරමටම මිනිසුන් අධ්‍යාත්මිකව සිතා බලා කටයුතු නොකර ලෞකික ජීවිතවලට අනුගත වී තිබේ. ඒ නිසා අවම වශයෙන් පොහොය දිනයකදීවත් ධර්මය ශ්‍රවණය කිරීමට කාලය වෙන් කර ගැනීමට සිතීම සැබවින්ම අගය කළ යුත්තකි. මිනිසුන් එලෙස සිතීමට යොමු කිරීම ද මහත් පිනකි.

### දිගුකාලීනව කළ යුතු ධාර්මික කටයුත්තක්

ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා, අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව අරම්භ කළ මුල් අවදියේ සිට මේ දක්වාම නොනවත්වාම මේ ධර්ම දේශනා මාලාව පවත්වන ලදී. රටේ ප්‍රධානියකු මෙවැනි වූ ධාර්මික කටයුත්තක් සිදු කිරීම තුළින් රටේ ජනතාවට ධාර්මිකව ජීවත්වීමට අවශ්‍ය පූර්වාදර්ශය සපයා දී තිබේ. ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා රට සංවර්ධනය කිරීම පිළිබඳව පමණක් සිතා කටයුතු කිරීම වෙනුවට මිනිසුන්ගේ සිත් සතන් දහමින් පෝෂණය කිරීමේ කාර්යභාර්යට හවුල්කරුවකු වී තිබීම අනෙක් රටවල පාලකයන්ට ද ආදර්ශයකි. ධර්මය මූලික කරගත් දිවි පෙවතක් තුළින් මිනිසුන්ට මුළු ජීවිත කාලය තුළදීම සැබෑ සතුටින්, සාමකාමීව ජීවත් වීමට හැකියාව ලැබේ.

ධර්මය ශ්‍රවණය කිරීමට පුරුදු වී ධර්මයට අනුගතව තමන්ගේ ජීවිතය වෙනස් කර ගතහොත් මෙලොව පමණක් නොව පරලොව ද සුගතිගාමී කර ගත හැකි ය. මිනිස් ආත්මයක් හිමි කර ගැනීම දුර්ලභය. හිමි කර ගත් මිනිස් ආත්මය, ධර්මය තුළින් ඵලදායී කර ගැනීම ද අවබෝධයෙන් කළ යුතු ය. හිත පාලනය කර ගැනීමට නොහැකි වීම නිසා සමාජය තුළ විවිධ මත ගැටුම් ඇති වේ. ඇතැම් අවස්ථාවලදී එවැනි ගැටලුකාරී තත්ත්වයන් තුළින් මිනිස් ජීවිත පවා විනාශ වේ. අමා දම් සිසිලස වැනි ධර්ම දේශනා මාලාවන් තුළින් සිදු කරනු ලබන්නේ ද මිනිසුන්ට ධර්මාවබෝධය ලබා දී ඔවුන්ව වැරදි ක්‍රියාවලින් මුදවා ගැනීමට උත්සාහ කිරීම ය. එනිසා මෙවැනි ධර්ම දේශනා මාලාවන් නොනවත්වා පවත්වා ගෙන යාම වඩාත් යහපත් වේ. මිනිස් ගුණ ධර්ම අමතක කර දමා දියුණුව පමණක් සිතන මිනිසුන් සිටින සමාජයක වටිනාකමක් නොමැත. සාරධර්මවලින් පිරිපුන් ජනතාවක් සිටී නම් ඒ රට මුළු ලෝකයක් ඉදිරියේදී වුව ද ගෞරවයට පාත්‍ර වේ.





## "ශීලාචාර ජන සමාජයක් නිර්මාණය කරන්න හොඳ මාර්ගයක"

– අග්‍රහැරේ කස්සප හිමි –



## "මිනිසුන්ව අධ්‍යාත්මිකව දියුණු කරන්න අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව විශාල රුකුලක් වෙනවා"

– කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි –







## ලෝක බෞද්ධ මහා සම්මේලනයේ, ශ්‍රී ලංකා මධ්‍යස්ථානයේ සභාපති, ආචාර්ය සුදත් දේවපුර මහතා

**රටේ ප්‍රධානීන් ධාර්මික වන විට ඒ අනුව යමින් මහජනතාව ද ධාර්මික වේ. පාලකයන්ගේ ධාර්මිකකම වචනවලට පමණක් සීමා නොකර ප්‍රායෝගිකව පෙන්වා දීම තුළින් ද රටේ පාලකවයන් පිළිබඳව මහජනතාව තුළ පවතින විශ්වාසය වැඩි වේ. එම විශ්වාසය තුළින් වැරදි ක්‍රියාවලින් තොර සදාචාරසම්පන්න ජන සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය පසුබිම සකස් කර ගත හැකි ය.**

### කාලෝචිත උතුම් කටයුත්තක්

අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව යනු කාලෝචිත වූ උතුම් කටයුත්තකි. මාගේ සිත තුළ ධර්මයට තිබෙන ලැදියාව මෙන් ම ශ්‍රද්ධාව හේතුකර ගෙන මේ ධර්ම දේශනා මාලාවන්ට සම්බන්ධ වීමට මා තීරණය කළෙමි.

හිටපු ජනාධිපති, වර්තමාන අගමැතිතුමන් වන මහින්ද රාජපක්ෂ මැතිතුමා යනු ආගම දහමට ලැදි ශ්‍රද්ධාසම්පන්න රාජ්‍ය පාලකයෙකි. එතුමා රටේ සංවර්ධනය උදෙසා තමන් විසින් ඉටු කළ යුතු කටයුතුවලට අමතරව රටේ මිනිසුන්ගේ සිත් සතන් ධර්මයට අනුගත කිරීමට ද මහත් පරිශ්‍රමයක් දරයි. ඒ බව එතුමාගේ සංකල්පයකට අනුව ආරම්භ කළ අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාවන් තුළින් හඳුනා ගත හැකි ය. සෑම පොහොය දිනකදීම සමාජයට යහපත් පණිවිඩයක් ගෙන දෙමින් පවත්වන මේ ධර්ම දේශනා වැඩසටහන සඳහා ලංකාවේ විවිධ ප්‍රදේශවල මිනිසුන් සහභාගී වේ. ඒ තරමටම මේ ධාර්මානුකූල කටයුත්තට සහභාගී වීමට මිනිසුන් පුරුදු වී තිබේ.

මේ ධර්ම දේශනා තුළින් ශ්‍රවණය කරන දහම් කරුණු මඟින් මිනිසුන්ට තමන්ගේ වැරදි අඩුපාඩු හදා ගෙන යහපත් ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදා කර ගත හැකි ය. වර්තමාන මිනිසුන් ආගම දහමින් ඈත් වනවාට වඩා ආගම දහමට ලැදිව කටයුතු කරන බව මා හට වැටහී තිබේ. බොහෝ මිනිසුන් පව් කිරීමට බියක් දක්වයි. කුමන හෝ වැරැද්දක් සිදු කර ඒ දෙය කිරීමෙන් අයහපත් ප්‍රතිඵල ගෙන දේ යන්න බොහෝ පුද්ගලයන්ගේ මනසට කාවැදී තිබීමෙන් බොහෝ මිනිසුන් වැරදි ක්‍රියා කිරීමට මැලි කමක් දක්වයි. සියලු දේ අනිත්‍යයි, ජීවත් වී සිටින කාලය තුළ කිසිවකුට කරදරයක් නොකර, සාමාකාමීව ජීවත්වීම වඩාත් යහපත් බව වර්තමානයේ බොහෝ මිනිසුන් අවබෝධ කර ගෙන සිටීම සතුටට කරුණකි.

### ජීවිත ධර්මානුකූල කර ගන්න අවස්ථාවක්

රටේ සාමාන්‍ය පුද්ගලයකු මෙවන් වූ ධාර්මික කටයුතු කරනවාට වඩා රටේ ප්‍රධාන බලධරයකු වන අගමැතිතුමා විසින් මෙවන් වූ ආගමික කටයුත්තක් කිරීමට මූලික වීම සැබවින්ම ප්‍රශංසනීය වේ. මා ලෝක බෞද්ධ මහා සම්මේලනයේ, ශ්‍රී ලංකා මධ්‍යස්ථානයේ සභාපති වශයෙන් කටයුතු කරන නිසාවෙන් මා බොහෝ පිරිසක් දැන හඳුනන්නෙමි. මාගේ ආයතනයේ කටයුතු කරන සේවකයන්ට මෙන් ම මා දැන හඳුනා ගත් පුද්ගලයන්ට ද මා අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාවට සහභාගී වීම වඩාත් යහපත් බව දන්වා ඇත. මාගේ අනුදැනුම මත බොහෝ පුද්ගලයන් මේ වන විට මේ ධර්ම දේශනා මාලාවට සහභාගී වීමට පෙළඹී තිබේ. යම් පුද්ගලයකු ධර්මයට අනුගත වී ඒ ධර්මය තුළ පවතින උතුම් බව තමන් වටා සිටින පුද්ගලයන්ට සන්නිවේදනය කිරීම වඩාත් යහපත් කටයුත්තකි. ඒ තුළින් මුළු මහත් සමාජයම ගුණ ධර්මවලින් පිරිපුන් ශ්‍රද්ධාසම්පන්න මිනිසුන් බහුල වශයෙන් ජීවත් වන සමාජයක් බවට පරිවර්තනය කළ හැකි ය. මේ ධර්ම දේශනා මාලාවන් තුළින් සෑම පොහොය දිනකදීම මිනිසුන්ට තමන්ගේ ජීවිත ධාර්මිකව වෙනස් කර ගන්නට අවශ්‍ය කරුණු වටහා දෙනු ලබයි. සෑම පොහොය දිනකදීම මේ ධර්ම දේශනා මාලාවන්ට සම්බන්ධ වන පුද්ගලයන්ට නිරායාසයෙන්ම තමන්ගේ ජීවිත ධර්මානුකූලව වෙනස් කර ගැනීමට අවශ්‍ය අනුබලය ලැබීම සැබවින්ම ආශ්චර්යකි. ඒ නිසා තමන්ට හැකි සෑම අවස්ථාවකදීම මේ ධර්ම දේශනා මාලාවන්ට සහභාගී වීමට හෝ රූපවාහිනී මාධ්‍ය තුළින් මේ ධර්ම දේශනාවන් ශ්‍රවණය කිරීම වඩාත් යහපත් කටයුත්තකි.

උපදේශකත්වය :
ශාස්ත්‍රපති පූජ්‍ය එගොඩඋයනේ ඤාණවිමල හිමි
ගරු අග්‍රාමාත්‍ය, ආගමික කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ ලේකම්

ඡායාරූප - අග්‍රාමාත්‍ය මාධ්‍ය ඒකකය

දැන්වීම් අතිරේක අංශය
☎: 0112 429 339, 0777 270 076
සම්බන්ධීකරණය - ප්‍රේමදාස රුද්‍රිගු
සංස්කරණය - අනූෂා ගුරුසිංහ
පිටු සැකසුම - එච්.ඩී.සී. කුමාරසිරි
LAKE HOUSE

අධ්‍යාත්මිකව පිරිපුන් ප්‍රඥසම්පන්න ජන සමාජයක් උදෙසා

# ‘අමා දම් සිසිලස’

## ධර්ම දේශනා මාලාව



මෙවර ධර්ම දේශනාව පවත්වනු ලබන්නේ

**බෙලිහුල්ඔය සීල සමාහිත ආරණ්‍ය සේනාසනවාසී ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද, ශාස්ත්‍රපති කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත බලංගොඩ රාධ හිමි විසිනි**



## මාතර හිත්තැටිය රාජමහාවිහාරාධිපති මාතර, හම්බන්තර දෙදිසාවේ ප්‍රධාන සංඝනායක, ශාස්ත්‍රපති, පූජ්‍ය අග්‍රහැරේ කස්සප හිමි

**ජීවිතයේ පවතින අනිත්‍යබව අවබෝධ කර ගැනීම උදෙසා බුදු දහම තුළින් අගනා උපදේශ සපයනු ලබයි. උපන්දා සිට මිය යන තෙක්ම විවිධ බැඳීම්වලින් සිර වී ජීවත් වුවත් කවදා හෝ දිනක සෑම පුද්ගලයකුටම මිය යාමට සිදු වේ. ඒ ලෝක ධර්මතාවයි. කොතරම් මිල මුදල්, සැප සම්පත්වලින් ආඩ්‍ය වී ජීවත් වුව ද අවසානයේ දී සෑම පුද්ගලයකුටම ඒ සියල්ල අහිමි වේ. එහෙත් වර්තමානයේදී බොහෝමයක් මිනිසුන් වැරදි ක්‍රියාකාරකම්වල නියැළෙන්නේ සදාකාලික ජීවිතයක් උරුම වුවන් විලසිනි. එවැනි මිනිසුන්ට ධර්ම දේශනා මාලාවන් තුළින් තමන්ගේ ජීවිත යහපත් කර ගත හැකි ය.**

### තරඟකාරී සමාජයට කරන යහපතක්

වර්තමානයේ පවතින තරගකාරී සමාජ ක්‍රමය තුළදී බොහෝ මිනිසුන් ආගම දහමින් ඈත්ව යමින් සිටී. ආගම දහමට අනුගත වීමට වඩා මිනිසුන් තමන්ගේ බලාපොරොත්තු කෙසේ හෝ ඉටු කර ගැනීමේ අභිලාෂයෙන් ඇඩි අසහනයෙන් කටයුතු කරයි. එවැනි අසහනකාරී කාල වකවානුවක සෑම මාසයකම පොහොය දිනයේදී පවත්වනු ලබන අමා දම් සිසිලස ධර්ම දේශනය මිනිස් ජීවිතවලට මහත් අස්වැසිල්ලක් සපයනු ලබයි. එදිනෙදා රාජකාරිවලින් හෙම්බත් වී සිටින මිනිසුන්ට විහාරස්ථානයකට ගොස් ආගමික වතාවත්වල නියැළීමට පවා කාලය වෙන් කිරීම ගැටලුවක්ව පවතී. එවැනි වාතාවරණයක් තුළ රටේ රාජ්‍ය නායකයකු ලෙසින් තමන්ගේ නිල කාර්යාලය, නිල නිවස තුළ සෑම පොහොය දිනකදීම මිනිසුන් ඒකරාශී කරගෙන ධර්ම දේශනා මාලාවන් පැවැත්වීම සැබවින්ම ශ්‍රේෂ්ඨ කටයුත්තකි. අමා දම් සිසිලස ධර්ම දේශනාව තුළින් මුළු ශ්‍රී ලාංකීක ජනතාවටම පූර්වාදර්ශයක් සපයනු ලබයි.

මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කිරීමෙන් පසුව පළමුවෙන්ම දේවානම්පියතිස්ස රජතුමාට ධර්මය දේශනා කරනු ලැබුවේ ය. මිහිඳු මහ රහතන් වහන්සේ දේශනා කළ ධර්මය මැනවින් අවබෝධ කර ගැනීමෙන් පසුව දේවානම්පියතිස්ස රජතුමාව අනුගමනය කිරීමට මහජනතාව පෙළඹුනි. ධර්මය හොඳින් අවබෝධ කර ගත් දේවානම්පියතිස්ස රජතුමා යම් නියෝගයක් කළ විට එය පිළිගත්ත මිනිසුන් යොමු විය. රජතුමා කරන කියන දෙය නිවැරදියි. ඒ දේවල් සිදු කළහොත් රටට යහපතක් වෙයි යන්න මිනිසුන්ට අවබෝධ විය. ඒ නිසා ශ්‍රී ලංකාවේ බුදු දහම ස්ථාපිත කළ දිනයේ සිට අද දක්වාම ධාර්මිකව කටයුතු කරන රාජ්‍ය පාලකයා කරන කියන දේවලට අවනත වීමට මිනිසුන් පුරුදු විය. ඒ ආකාරයෙන්ම අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව පැවැත්වීමේ සංකල්පය හඳුන්වා දුන් ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා සිදු කරන ධාර්මික කටයුතු සඳහා මිනිසුන් අවංක සිතින් දායක වීම සැබවින්ම ප්‍රශංසනීය වේ.

### ජීවිත ධාර්මිකව වෙනස් කර ගන්න රුකුලක්

බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දී රාජ්‍ය පාලනය කළ ධාර්මික පාලකයකු වශයෙන් ජනාධිපති ධූර කාලයේදී මෙන්ම වර්තමානයේ අගමැති ධූර කාලයේ දී මහින්ද රාජපක්ෂ මැතිතුමා සිදු කරන කාර්යයභාර්ය අපේ රටේ පාලනාධිකාරියට සහ ජනතාවට ආදර්ශයක් මෙන් ම විදෙස් රටවල පාලනාධිකාරියට මෙන්ම ජනතාවට ද ආදර්ශයක් සපයනු ලබයි. සෑම පොහොය දිනයකදීම පවත්වන අමා දම් සිසිලස ධර්ම දේශනා මඟින් රටේ ජනතාවගේ ජීවිත ධාර්මිකව සාර්ථක කර ගැනීමට මනා රුකුලක් ලබා දේ. එය රාජ්‍ය නායකයකු වශයෙන් සිදු කරන ප්‍රශංසනීය වැදගත් කටයුත්තකි. අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව එදා මිහිඳු මහ රහතන් වහන්සේගේ සංකල්පය සහ දේවානම්පියතිස්ස රජතුමා අනුගමනය කළ ධාර්මික ප්‍රතිපත්තිය ජීවමාන කරනු ලබයි.

වර්තමාන සමාජයේ මිනිසුන් ගුණධර්මවලින් පිරිහී, ආගම දහමින් ඈත් වී, සාරධර්මවලින් මිදී ජීවත් වීමට හුරු වී ඇත. පාසල් දරුවන් පවා මවුපියන්ට, ගුරුවරුන්ට ඇහුම්කන් නොදී තමන්ගේ හිතු මනාපයට කටයුතු කිරීමට ගොස් තමන්ගේ ජීවිතය නිකරුණේ නාස්ති කර ගැනීමට යොමුව තිබේ. කුඩා කාලයේ සිටම දරුවන්, වැඩිහිටියන් කරන්න එපා කියන දෑ කිරීමට යොමු වීම සැබවින්ම අභාග්‍යසම්පන්න ය. සෑම පොහොය දිනකම උදෑසන කාලයේදී පවත්වනු ලබන අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව රූපවාහිනිය ඔස්සේ විකාශනය කරන නිසාවෙන් දරුවන්ට සහ වැඩිටියන්ට එකට සිටිමින් ශ්‍රවණය කිරීමට හැකියාව පැවැතීම වඩාත් යහපත් වේ. මෙවන් වූ උතුම් ක්‍රියාවන්ට මහජනතාව නැඹුරු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතියේ සාඩම්බරත්වය මුළු ලෝකය ඉදිරියට ගෙන යාමට හැකි වේ.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් රටේ සිදු වන මත්ද්‍රව්‍ය ජාවාරම්, දූෂණ, වංචා සොයා බලා අදාළ පාර්ශවයන්ට නිසි දඬුවම් ලබා දීම තුළින් ද සිදු කරනු ලබන්නේ රට ධාර්මික කිරීම ය. දැහැමි සමාජයක් ස්ථාපිත කිරීමේ අරමුණින් ජාති, කුල භේදයකින් තොරව සෑම පුද්ගලයෙක්ම එකාවන්ව සිතා වැරදි වැඩවලින් මිදී තමන්ගේ ජීවිත ධාර්මිකව යහපත් කර ගතහොත් මේ දේශය යළිත් අතීතයේ පැවති ආකාරයෙන් ශුද්ධ භූමියක් බවට පත් කළ හැකි වේ.

### ශිලාචාර සමාජයකට මඟක්

බහුවිධ ආගම් සහ ජාතීන් වෙසෙන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ සෑම පුද්ගලයෙක්ම එකිනෙකාට ආදරය, ගෞරවය, කරුණාව දක්වාලිය යුතු ය. එකම වගේ ලේ, ඇස්, නහරවලින් ඉපදුණු පුද්ගලයන් වශයෙන් ජාති, කුල සහ ආගම් භේදවලින් සිත් සතන් අපිරිසිදු කර ගෙන කටුයුතු නොකළ යුතු ය. සෑම ආගමිකයෙක්ම එකිනෙකාට උදව් උපකාර කර ගෙන මනා සංහිඳියාවකින් යුතුව ජීවත්විය යුතු ය. අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාව ජාති, කුල සහ ආගම් භේදයකින් තොරව සෑම දෙනකුටම ශ්‍රවණය කර තමන්ගේ ජීවිතවල පවතින අඩුපාඩු සකස් කර ගැනීමට ලැබෙන අවස්ථාවකි. ඉපදෙන සෑම පුද්ගලයකුම කවදා හෝ දිනක මරණයට පත් වන බවත්, මරණයට පත් වන තෙක් කිසිවකුට කරදරයක් නැතිව ජීවත් වීම යහපත් බවත් සෑම පුද්ගලයකුම සිතෙහි තබා ගත යුතු ය.

අතීත ශ්‍රී ලාංකික සමාජය වර්තමානයේ තරම් ප්‍රචණ්ඩකාරී නොවිණි. එහෙත් නූතන මිනිසුන් ආත්මාර්ථකාමීත්වය පෙරදැරිව ශීලාචාරකම අමතක කර දමා ජීවත්වීමට හුරු වී තිබීම සැබවින්ම කනගාටුවට කරුණකි. සෑම පොහොය දිනයකදීම පවත්වනු ලබන අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාවන් තුළින් පෙන්වා දෙන දහම් පණිවිඩ තුළින් ශ්‍රී ලංකාවේ සමස්ථ පුරවැසියන්ට තමන්ගේ ජීවිත ආලෝකමත් කර ගැනීමට ඉතා අගනා අවස්ථාවක් ලැබේ.

සටහන
**මදාරා මුදලිගේ**




වර්ෂ 2020ක් වූ ඔක්තෝම්බර් මස 01 වැනිදා බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# භික්ෂූන් වහන්සේ ගුරු සේවයට පිවිසීම කාලීන අවශ්‍යතාවක්



## අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස්

භික්ෂූන් වහන්සේ ගුරු සේවයට පිවිසීම කාලීන අවශ්‍යතාවයක් බව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා, සංවර්ධන නිලධාරී සේවයේ යොදවා සිටි භික්ෂූන් වහන්සේ හා සිල්මාතාවන් ඇතුළු 35 දෙනකු වෙත ගුරු පත්වීම් ලබාදීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පරිශ්‍රයේ ඊයේ (30) පැවැති උත්සවයකදී පැවැසීය.

නීති දැඩි කිරීමෙන් පමණක් සමාජයක් සංවර්ධනය කළ නොහැකි බවත්, සමාජයේ ආකල්පමය වෙනසක් ඇතිකිරීම සඳහා කුඩා කල සිට ම පෙර පාසල්, දහම්පාසල්, පිරිවෙන් ඇතුළු ආයතන හරහා කටයුතු කළ යුතු බවත් ඇමැතිවරයා එහිදී සඳහන් කළේය.

සංවර්ධන නිලධාරී සේවයේ නියුතු උපාධිධාරී භික්ෂූන් වහන්සේලා ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළත් කරගැනීමට අදාළව නිකුත් කරන ලද 2020-01-03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, උපාධිධාරී භික්ෂූන් වහන්සේ සහ සිල් මාතාවන් ඇතුළු 35 දෙනෙකු වෙත මෙසේ ගුරු පත්වීම් ප්‍රදානය කැරිණි. මෙහි පළමු අදියර යටතේ භික්ෂූන්වහන්සේලා විසි නමක් වෙත ජුනි 01 දින ගුරු පත්වීම් ලබා දුන් අතර, ඊයේ ක්‍රියාත්මක වූයේ එහි දෙවැනි අදියර යි.

සිසුන් වෙත විෂය දැනුම ලබාදීමෙන් පමණක් අධ්‍යාපන පද්ධතියෙන් පරිපූර්ණ මිනිසුන් ගොඩනැංවිය නොහැකි බවද, රටේ අනන්‍යතාව, සංස්කෘතිය පිළිබඳ විශ්වාසයක් ගොඩනැඟිය හැකි පරපුරක් බිහිකිරීමේ වගකීම ගුරු පරපුරට පැවරෙන බවද, ළමා මනස සංවර්ධනය කිරීම කුඩා කල සිට ම පෙරපාසල්, දහම් පාසල්, පිරිවෙන් ඇතුළු අනෙකුත් අධ්‍යාපන ආයතන හරහා සිදුකළ යුතු බවද අධ්‍යාපන අමාත්‍යවරයා එහිදී සඳහන් කළේය.

මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් රාජ්‍ය අමාත්‍යාංශ හතරක් සහිත ව විශාල කාර්යභාරයක් පැවරී ඇති අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ භික්ෂූන් වහන්සේ වෙත ගුරුපත්වීම් ලබාදීමට ලැබීම සතුටට කරුණක් බවත්, රටේ අධ්‍යාපන පද්ධතියෙන් රොබෝවරුන් තනනු වෙනුවට සිරිත්- විරිත් හඳුනන, සංස්කෘතියට ආදරය කරන සංවේදී මිනිසුන් ගොඩනගන්නට භික්ෂූන්වහන්සේ ප්‍රමුඛ ආගමික සංස්ථාවට සැබෑ දායකත්වයක් ලබා දිය හැකි බවත් අධ්‍යාපන අමාත්‍යවරයා තවදුරටත් පැවසීය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කේ.කපිල සී. කේ. පෙරේරා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහත්වරු ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ආයතන) අනුෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මිය ද ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# සියලු දෙනා පිළිගන්නා ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒම රජයේ වගකීමක්



## අස්ගිරි පාර්ශ්වයේ ප්‍රධාන ලේඛකාධිකාරී මැදගම ධම්මානන්ද හිමි

**අසේල කුරුළුවංශ**

පාට පක්ෂ භේදයක් නොමැතිව ජනතාවගේත් විරුද්ධ පක්ෂවලත් අදහස්වලට කන්දී රටට ගැළපෙන පොදුවේ සැම දෙනාටම පිළිගන්නා ආකාරයේ ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම රජයේ වගකීම බව අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ප්‍රධාන ලේඛකාධිකාරී මැදගම ධම්මානන්ද හිමියෝ පවසති.

විසිවන සංශෝධනය සම්බන්ධයෙන් නොයෙක් විවේචන එල්ල වුවත් එහි සාධනීය ලක්ෂණ රැසක් තිබෙන බවද උන්වහන්සේ කීහ.

ලේඛකාධිකාරී නාහිමියෝ එසේ පැවසුවේ සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ සාමාජික පිරිසක් සමග හිටපු කථානායක කරු ජයසූරිය මහතා උන්වහන්සේ බැහැදැක ආශිර්වාද ගත් අවස්ථාවේදීය.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ ධම්මානන්ද නාහිමියෝ මෙසේද කීහ. විවිධ කාල වකවානුවල දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් විවිධ අදහස් පළ වුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විෂය සංශෝධන ඇති වුණා. මහා සංඝරත්නය වශයෙන් අපේ බලාපොරොත්තුවත් මේ අවස්ථාවේ සියලු දෙනාගේම අදහස් උදහස් අරගෙන ඒවා සමාලෝචනය කරමින් රටට කාලීනව ගැළපෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමයි. ජනතාව ඉල්ලා සිටියෙත් ඒ දේම තමයි. ඒ අනුව තමයි 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් යම් කිසි කතා බහක් ඇති වුණේ.

අප දන්න තරමින් මේ වන විට ඉදිරිපත්ව තිබෙන සංශෝධනයේ යම් කිසි සාධනීය ලක්ෂණ තිබෙනවා. අප දන්නවා රාජ්‍ය පාලනය කළ ඇත්තෝ යම් යම් අවස්ථාවල තමන්ට වාසිදායක වන ආකාරයට අවස්ථානුකූලව සංශෝධන ඉදිරිපත් කිරීමට කටයුතු කළා. අප ඒවා දැක්කා. අපත් ඒවා නොදන්නවා නොවෙයි. එනිසා නව සංශෝධන ගෙනෙන විට මහජනතාවගේ අදහස් අරගෙන ඒවා සමාලෝචනය කිරීමෙන් උකහා ගැනීමෙන් තමයි ඒ කටයුතු කළයුතු වෙන්නේ.

ඉන් අනතුරුව මේ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇති කෙටුම්පතට අමතරව අග්‍රාමාත්‍යවරයා විසින් ස්ථාපිත කළ කමිටුවට ඒවා යොමු කොට සමාලෝචනය කළ යුතුයි. දැන් අමාත්‍ය මණ්ඩලය වැඩියි කියන එක ගැන කතා බහ වෙනවා. ඒ එක්කම පසුගිය කාලයේ පැවති රජයන් පක්ෂයක් දෙකක් සම්බන්ධ කරගෙන ජාතික ආණ්ඩු කියලා ඇමති මණ්ඩලය තමන්ට ඕන විදියට වැඩි කර ගත්තා. කොයි කවුරු රාජ්‍ය පාලනය කරද්දී අවස්ථානුකූලව තමන්ට අවශ්‍ය ආකාරයට අවශ්‍ය දෙය කරගත්තා. ඒ නිසා අප මෙතනදි රජයෙන් බලාපොරොත්තු වෙන්නේ පාට පක්ෂ භේදයක් නැතිව ජනතාවගේ අදහස්, විරුද්ධ පක්ෂවල අදහස් පිළිබඳවත් අවධානය යොමු කරමින් රටට ගැළපෙන පොදුවේ සැම දෙනාටම ගැළපෙන විදියේ ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමයි.

පවතින ව්‍යවස්ථාව හා පසුගිය කාලයේ ඇති කරගත් මහජන අදහස් හා ලබාගත් කරුණු කාරණා අදාළ කමිටු මගින් සාකච්ඡා වූ කරුණු කාරණා ඒකරාශී කරගෙන ඉතා ඉක්මනින් කඩිනමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට අවශ්‍ය පසුබිම දැන් නිර්මාණය වී තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මූලාශ්‍ර දැන් නිර්මාණය වී තිබෙනවා. එවැනි නව රටට ගැළපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කාලීනව අවශ්‍යයි කියන මතයේ අප ඉන්නවා. එබැවින් කළ යුත්තේ කඩිනමින් රටට ගැළපෙන නව ව්‍යවස්ථාවකට යාමයි.

දැන් මේ කතිකා වෙන්නේ පවතින 19 වන ව්‍යවස්ථාව අහෝසි කොට 20 වන ව්‍යවස්ථාවකට යාම පිළිබඳවයි. ඉදිරිපත් කොට ඇති කෙටුම්පතේ යම් සාධනීය ලක්ෂණ තිබෙනවා නම් ඒවා රඳවා ගෙන උදාහරණයක් වශයෙන් ද්විත්ව පුරවැසිභාවය වැනි දේ සමාලෝචනය විය යුතුයි. ව්‍යවස්ථාවක් යනු මේ වන විට රට පාලනය කරන පිරිසට පමණක් සීමා විය යුතු දෙයක් නෙවෙයි. අනාගතයේ මේ රට කවුරු පාලනය කරයිද කියන්න අප දන්නේ නෑ. ඒ නිසා ඒවැනි දෑ පිළිබඳ නිසි අවධානය යොමු කර ගෙන තමයි ව්‍යවස්ථාවක් නිර්මාණය විය යුත්තේ. 20 ව්‍යවස්ථා කමිටුව සම්පාදනය කොට තිබෙන කෙටුම්පතෙහි ඇතැම් යම් යහපත් ලක්ෂණ අප දකිනවා. පාර්ලිමේන්තුව විසිරවීම වැනි දෑ සම්බන්ධයෙන් අප පසුගිය සමයේ හේතු කාරණා දුටුවා. පවතින ව්‍යවස්ථාව සමාලෝචනය කිරීමේදී ඒකෙ දෙපැත්තක් තිබෙනවා. පසුගිය කාල පරිච්ඡේදය තුළ රටේ නායකත්වයන් එකමුතුව තීරණ නොගැනීමේ ප්‍රතිඵල තමයි අප අත්වින්දේ. එම තත්ත්වය රටේ ජාතික ආරක්ෂාවට පවා තර්ජනයක් වූ බව අප කවුරුත් පිළිගත යුතු කාරණයක්. එවැනි දෑ පිළිබඳ විශේෂයෙන් සලකා බලා නව සංශෝධන සිදු විය යුතුයි. මේ අවස්ථාවේ අපේ රටට ගැළපෙන අලුත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ස්ථාපිත කර ගැනීම තමයි මහා සංඝරත්නය වශයෙන් අපේ අදහස වන්නේ.

# සිල් රෙදි නඩුවේදී ලලිත් වීරතුංගට අනුෂ පැල්පිටට සාධාරණය ඉටු වුණේ නෑ

## නීතිඥ කාංචන රත්වත්තේ

**නෙල්කා මැදගෙදර**

සිල් රෙදි බෙදා දීමේ ව්‍යාපෘතිය සඳහා මුදල් රෙගුලාසි සහ වෙනත් නීතිමය ප්‍රතිපාදන අනුව මුදල් ලබාදෙමින් කටයුතු කළ හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග සහ විදුලි සංදේශ නියාමන කොමිසමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට යන මහත්වරුන්ට මහාධිකරණයේදී සාධාරණ නඩු විභාගයක් ලැබුණේ නැතැයි නීතිඥ කාංචන රත්වත්තේ මහතා ඊයේ (30) අභියාචනාධිකරණයේදී කීය.

එම මහාධිකරණ නඩු තීන්දුවට එරෙහිව ගොනු කළ අභියාචන පෙත්සම් සම්බන්ධ පිළිතුරු දේශනය සිදුකරමින් නීතිඥ රත්වත්තේ මහතා මේ බව කීය.

2016 ජනාධිපතිවරණ සමයේදී සිල් රෙදි බෙදා දීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමට අයත් රුපියල් මිලියන 600 ක් වැය කිරීමෙන් රජයේ මුදල් වංක සාපරාධී පරිහරණය කළ බවට නීතිපතිවරයා විසින් මහාධිකරණය හමුවෙහි නඩු පවරා තිබිණි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමෙහි අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මෙහි පළමු විත්තිකරු ලෙස ද එම කොමිසමෙහි සභාපති හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග දෙවන විත්තිකරු ලෙස ද නම් කර සිටියහ.

මෙම නඩු විභාගයෙහි මුල් කොටස එක් විනිසුරුවරයකු හමුවෙහි ද දෙවන කොටස තවත් විනිසුරුවරයකු හමුවෙහි ද විභාගයට ගැනිණි. එහි තීන්දුව ප්‍රකාශ කළ මහාධිකරණ විනිසුරු ගිහාන් කුලතුංග මහතා විත්තිකරුවන් චෝදනාවන්ට වැරදිකරු බවට තීරණය කර වසර තුනක සිර දඬුවම් නියම කළේය. ඊට අමතරව මිලියන 500 ක දඩ මුදලක් සහ වන්දි මුදලක් ද නියම කෙරිණි.

එකී දඬුවම් නියම කළ මහාධිකරණ තීන්දුව බල රහිත කරන ලෙස ඉල්ලා මෙම පෙත්සම් ඉදිරිපත් කරන ලදී.

විදුලි සංදේශ නියාමන කොමිසමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මහතා මෙහි පළමු විත්තිකාර අභියාචකද එම කොමිසමෙහි සභාපති, හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා මෙහි දෙවන විත්තිකාර අභියාචක ද වේ.

පෙත්සම්කාර පාර්ශ්වයන්ගේ සහ නීතිපතිවරයාගේ කරුණු දැක්වීම් මීට පෙර අවසන් කරන ලදී. දෙවන විත්තිකාර අභියාචක වෙනුවෙන් කළ පිළිතුරු දේශන ද අවසන් කරන ලදී.

කුමුදුනී වික්‍රමසිංහ, දේවිකා අබේරත්න යන අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල හමුවෙහි මෙම අභියාචන පෙත්සම් නැවත කරුණු දැක්වීම සඳහා ඊයේ (30) කැඳවූ අවස්ථාවේදී නීතිඥ කාංචන රත්වත්තේ මහතා පළමු විත්තිකාර අභියාචක වෙනුවෙන් පිළිතුරු දේශනය පවත්වමින් මෙසේ කීය.

විශේෂ මූලාරම්භන අරමුදල් යටතේ වැය කිරීමට 2012 සඳහා මිලියන 800 ක මුදලක් ද 2013, 2014, 2015 යන වසර සඳහා මිලියන 1000 බැගින් අය වැයෙන් වෙන්කර පාර්ලිමේන්තුවෙන් සම්මත කර තිබුණා. සියලු ගනුදෙනු සිදු වූයේ ඊට අනුකූලවයි.

මෙම මුදල් පාර්ලිමේන්තුවෙන් අනුමත කර තිබූ නිසා එය ඕනෑම කටයුත්තකට වෙන් කිරීමට කිසිදු බාධාවක් නැහැ. නැවත එයට පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතු නැහැ.

සාක්කි විභාගයේදී මේ බව පැහැදිලි කෙරුණා. විශේෂ මූලාරම්භන ව්‍යාපෘති සඳහා වන මුදල් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවත් 2014 දී මෙය පාර්ලිමේන්තුවේ 3/2 ක බහුතරයෙන් සම්මත වූ බවත් සඳහන් වුණා.

සිල් රෙදි බෙදා දීම ඔක්තෝබර් මාසයේ හදිසියේ හඳුන්වා දුන් ව්‍යාපෘතියක් නොවේ. එම වසරේ (2014) මාර්තු මාසයේ සිට ඒ සඳහා ක්‍රියාත්මක වෙමින් පැවතියා. පොහෝ දිනවල සිල් ගන්නා උවැසි උවැසියන්ට සිල් රෙදි ලබාදීමට ජනාධිපතිවරයා විසින් උපදෙස් ලබා දී තිබුණා.

ඒ අනුව වෙන් කළ මුදල් ප්‍රමාණවත් නොවීම සහ අක් මුදල් ලබා ගැනීමේ අසීරුතා පවතින බවටත් ගණකාධිකාරිවරයා දක්වා තිබෙනවා. එම මුදල් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ටී.ආර්. සී. වලින් මෙම මුදල් ලබා ගන්නා බවට දෙවන විත්තිකාර අභියාචක ලිඛිත සටහන් තබා තිබෙනවා.

2010 ජනවාරි මස 16 දින මීට පෙර ජනාධිපතිවරණය පැවැත්වුණා. නීතියට අනුව ඊළඟ ජනාධිපතිවරණය පැවැත්විය යුත්තේ 2016 වසරේදීයි. එහෙත් ජනාධිපතිවරණය කලින් පවත්වන බවත් විදුලි සංදේශ නියාමන කොමිසමේ අධ්‍යක්ෂවරයා දැන සිටියේ නැහැ. ජනාධිපති ලේකම්වරයා සිල් රෙදි ව්‍යාපෘතියට මුදල් වෙන් කරන ලෙස ඉල්ලා සිටියේ ජනාධිපතිවරණය පැවැත්විය යුතු කාලයට බොහෝ කලකට පෙරයි. එම දැනුම් දීම මත මණ්ඩල පත්‍රිකාවක් සකසා අනිත් කොමසාරිස්වරු වෙත යැවීමට කටයුතු කළා. ඔක්තෝබර් 30 වන විට දුරකථන මඟින් මුදල් තිබේ ද යන්න විමසා බැලුවා.

කොමිසන් පත්‍රිකාවක් ඔක්තෝබර් 30 ඉදිරිපත් කරන විටත් ජනාධිපතිවරණය පැවැත්වෙන දිනය පිළිබඳව විත්තිකාර අභියාචක දැන සිටියේ නැහැ.

මැතිවරණ කොමිසම විසින් ජනාධිපතිවරණය ප්‍රකාශ කළ ගැසට් නිවේදනය ප්‍රසිද්ධ වුණේ නොවැම්බර් 21 වැනිදායි.

විනිසුරු දේවිකා අබේරත්න ඔබ පෙන්වීමට යන්නෙ මෙම තීරණ ජනාධිපතිවරණයට පෙර ගත් බව ද?

නීතිඥවරයා - ඔව්. මෙම රෙදි මිලදී ගැනීමට තීරණය කළේ බොහෝ කලකට පෙරයි. මෙම සම්පූර්ණ ක්‍රියාවලිය ආරම්භ වූයේ මාර්තු මාසයේදීයි.

මහාධිකරණ නඩු තීන්දුව පදනම්ව ඇත්තේ මුදල් රෙගුලාසි සහ ක්‍රියාත්මක කළ ක්‍රියා පටිපාටියයි. මෙම නඩු තීන්දුව දීමේ දී විනිසුරුවරයා "මුදල් රෙගුලාසි" වරදවා වටහා ගෙන තිබෙනවා.

ආයතන සංග්‍රහය අනුව ජනාධිපති කාර්යාල සේවකයන් රාජ්‍ය නිලධාරීන් ලෙස සැලකිය නොහැකියි. ඒ අනුව ජනාධිපති ලේකම් හෝ එම කාර්යාලයේ ගණකාධිකාරිවරයා රාජ්‍ය නිලධාරීන් ගණයට වැටෙන්නෙ නැහැ.

මුදල් රෙගුලාසි අනුව රාජ්‍ය නිලධාරියකු තමන්ට පැවරෙන කටයුතු "නැත" යන්න පැවසීමකින් තොරව ඉටුකිරීමට ඕනෑතරම් විකල්ප අවස්ථා තිබෙනවා. වසර මැද ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති නම් විකල්ප ක්‍රමවලින් මුදල් ලබාගැනීම සාමාන්‍ය තත්ත්වයක්. ජනතාවට රුපියල් පන්දහස බැගින් දීමේදී පාර්ලිමේන්තුවෙන් සම්මත කළ මුදල් නැත යන්න කියමින් පසු ගිය කාලයේ කිසිදු රාජ්‍ය නිලධාරියකු එම මුදල් ගෙවීම පැහැර හැරියේ නැහැ.

නඩු විභාගයේ දී දෙවන විත්තිකරුව අනුකම්පා විරහිතව ප්‍රශ්න කළා. මුදල් රෙගුලාසි පිළිබඳව සියල්ල දැන සිටිය යුතුය යන පදනමේ සිට එම ප්‍රශ්න කිරීම් කර තිබෙනවා. මෙම ගනුදෙනුවට අදාළ සියලු කරුණු ලිඛිතව තිබෙනවා. මේ පිළිබඳව ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරිවරයා දුන් සාක්කි සම්පූර්ණයෙන් නොසලකා හැරීමට මහාධිකරණ විනිසුරුවරයා කටයුතු කළා. එසේ කරමින් සාක්කිකරු යම් ලැදියාවකින් සාක්කි දුන් බවට තීරණය කර තිබෙනවා.

මුදල් රෙගුලාසි පනත අනුව යම් ගනුදෙනුවක් බලධාරින් විසින් වාචික අනුමැතිය දී අනුමත කර ඇත්නම් පසුව ඊට ලිඛිත අනුමැතිය ගත හැකියි. එනම් ලිඛිත අනුමැතියකට යටත්ව වාචික අනුමැතිය ගත හැකියි. එදිනෙදා කටයුතු පහසු කර ගැනීමටයි එවැනි ප්‍රතිපාදනයක් නිලධාරීන් වෙනුවෙන් යොදා ඇත්තේ. එහෙත් මහාධිකරණ විනිසුරුවරයා එම මුදල් රෙගුලාසි අනුමැතිය වැරදි ලෙස වටහා ගෙන තීන්දුව ප්‍රකාශ කර තිබෙනවා.

එසේම ගෙවුනු වසරක හෝ ඉදිරි වසරේ මුදල් ලබාගෙන මුදල් වර්ෂයක කටයුතු සඳහා වැය කළ හැකියි. ඒ සඳහා වන විධිවිධාන මුදල් රෙගුලාසිවල ඇතුළත්.

අක් මුදල් ලබාගැනීම යනු විශේෂ ව්‍යාපෘති සඳහා වෙන් කළ මුදල් ලබා ගැනීමයි. එහිදී එම මුදල් වෙන් කරන කාර්යය පිළිබඳ සියලු තොරතුරු ලබාදීමෙන් පසුව අදාළ මුදල භාණ්ඩාගාරයෙන් ලබාගැනීම සිදු කරනවා. එහෙත් ඇතැම් විශේෂ කරුණු සඳහා මුදල් විශේෂයෙන් වෙන් කළ විට ඒවා වැය කිරීමට අදාළ විධි විධාන මුදල් රෙගුලාසිවල සඳහන්.

පළමු විත්තිකරුට එරෙහිව ඇත්තේ මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීම නොවෙයි. විදුලි සංදේශ නියාමන කොමිෂන් පනත උල්ලංඝනය කිරීමයි. විදුලි සංදේශ කණුවක් කඩා දැමීම යනාදියත් එම පනතෙහි සඳහන්. එම පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීම පිළිගත නොහැකියි.

සිල් රෙදි ව්‍යාපෘතියට මුදල් වෙන් කළේ පළමුවන දෙවන විත්තිකරුවන්ගෙ තනි තීරණ මත නොවෙයි එය සාමූහික තීරණයක්. සෙසු කොමසාරිස්වරුන්ගේ එකගතාවය ද ඒ සඳහා ලැබුණා.

ඇමැතිවරයාගේ උපදෙස් දෙවන විත්තිකරු හරහා පළමු වැනි විත්තිකරු වෙත ලැබුණා. විදුලි සංදේශ නියාමන කොමිසමේ පනත 66 වගන්තිය අනුව ඇමැතිවරයාට වරින් වර නියෝග නිකුත් කළ හැකියි. ඒ අනුවයි එම මුදල් වෙන් කිරීමට අදාළව ලිපි ලියා ඇත්තේ.

ජනාධිපති ලේකම්වරයා පළමු විත්තිකරුට ලිඛිතව දන්වා තිබුණා පන්සල්වල සිල් රෙදි බෙදා දීමට අවශ්‍ය මිලියන 600ක් ටී.ආර්. සී. එකෙන් ගැනීමට තීරණය කළ බව. එය සලකා බැලීමක් හෝ නොතකා සිටිය හැකි දෙයක් නොවෙයි. ජනාධිපති ලේකම්වරයාගේ සාමාන්‍ය ලිපිවල ස්වරූපය විධානාත්මකයි. එම විධානය අනුව කටයුතු කළ යුතුයි.

විදුලි සංදේශ නියාමන කොමිසමේ සභාපතිවරයා පත් කරන්නේ ඇමැතිවරයා විසින්. එහෙත් පසුව කරනු ලබන ලිඛිත උපදෙස් හා දැන්වීම් විධාන සියල්ල කරන්නේ ජනාධිපති ලේකම්වරයා විසින්.

මුදල් අවභාවිතය යන්න ද මහාධිකරණ විනිසුරුවරයා වැරදි ලෙස වටහා ගෙන තිබෙනවා.

මෙම මුදල් වෙන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණා. එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හෝ ඊට විරුද්ධ වූයේ නැහැ. එය සාමූහික තීරණයක්. වාචික අනුමැතිය තිබූ බවට සාක්කි තිබුණා.

මෙම විත්තිකාර අභියාචකයන්ට එරෙහි නඩුව විනිසුරු කුසලා වීරවර්ධන හමුවේ කැඳවූවා. ඇය ස්ථානමාරු වීම නිසා විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාතිලක හමුවේ මෙය කැඳවූවත් ඔහුගේ විශ්‍රාම ගැනීමට මාස 3කට පෙර මෙම නඩුව වෙනත් විනිසුරුවරයකු වෙත යොමු වුණා. මෙම නඩුව විභාග වෙමින් තිබූ අධිකරණයේ නොව වෙනත් අධිකරණයකට යොමුවීම පුදුම සහගතයි.

මෙම නඩු විභාගයේදී විනිසුරුවරයා සාධාරණ නඩු විභාගයක් විත්තිකරුවන්ට ලබා දී නැහැ.

පළමු විත්තිකාර අභියාචක විදුලි සංදේශ නියාමන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වීමට පෙර රජයේ තනතුරු කිහිපයක් දරා තිබෙනවා. පවතින නීති හා රෙගුලාසි වලට අනුව ඔහු මෙහිදී කටයුතු කර තිබෙනවා.

මහාධිකරණ නඩුව විභාග කළ මහාධිකරණ විනිසුරුවරයා විශේෂ ජනාධිපති කොමිසමක සාමාජිකයකුව සිටියා. මෙම විත්තිකරුවන් සාක්කි දීම සඳහා ඊට කැඳවා තිබෙනවා. 'දේශපාලන සංස්කෘතිය' යන්න මහාධිකරණ තීන්දුවට ලැබී ඇත්තේ එහි ආභාෂයෙන්. කිසිදු අවස්ථාවක දේශපාලන සංස්කෘතිය යන්න නඩු විභාගයේදී ප්‍රකාශ වූයේ නැහැ. නීතිය වැරදි ලෙස වටහා ගනිමින් මහාධිකරණ විනිසුරුවරයා මෙම තීන්දුව ලබා දී තිබෙනවා.

විත්තිකාර අභියාචකයන්ගේ දේශන අවසන් කරන ලදී.

මෙම පිළිතුරු දේශනයේදී මතු වූ කරුණු කිහිපයක් පිළිබඳව පැහැදිලි කිරීම් සිදු කිරීමට අවශ්‍ය බැවින් ඒ සඳහා අවසර ලබා දෙන ලෙස නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

ඒ සඳහා අවසර දුන් අධිකරණය එම කරුණු දැක්වීම ඔක්තෝබර් 06 වැනිදා සිදු කරන ලෙස දන්වා සිටියේය. ජනාධිපති නීතිඥවරුන් වන ෆයිස් මුස්තාපා සහ ෂවීන්ද්‍ර ප්‍රනාන්දු යන මහත්වරු සමග ශාන්ත ජයවර්ධන, කීර්ති තිලකරත්න යන නීතිවේදීහු දෙවන විත්තිකාර අභියාචක වන ලලිත් වීරතුංග මහතා වෙනුවෙන් පෙනී සිටියහ.

කාංචන රත්වත්තේ, ජනක රණතුංග සහ අමානි පිලපිටිය යන නීතිඥවරු පළමුවන විත්තිකාර අභියාචක වන අනුෂ පැල්පිට මහතා වෙනුවෙන් පෙනී සිටියහ.

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තුසිත් මුදලිගේ මහතා සහ රජයේ නීතිඥ චතුරි විජේසිංහ නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටියහ.

# 20 වගන්ති කිහිපයකින් ජනතා පරමාධිපත්‍යය උල්ලංඝනය වනවා

## 20ට එරෙහි පෙත්සම්කරුවන්ගේ නීතිඥයෝ කියති

**කුමුදු හෙට්ටිආරච්චි**
**නෙල්කා මැදගෙදර**

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතෙහි ඇතුළත් වගන්ති කිහිපයක් මඟින් ජනතා පරමාධිපත්‍යය හා සෛවරීභාවය උල්ලංඝනය වන බවට එම පනත් කෙටුම්පතට එරෙහිව ඉදිරිපත් කළ පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු ඊයේ (30) ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා සිටියහ.

එම පනත් කෙටුම්පතට අභියෝග කළ පෙත්සම් 39 වැඩිදුර විභාගය සඳහා ඊයේ (30) දෙවන දිනට කැඳවූ අවස්ථාවේදී නීතිඥවරු මේ බව සඳහන් කළහ.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත අධිකරණ ඇමැතිවරයා විසින් ඉකුත් 22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බැවින් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකින් සහ ජනමත විචාරණයකින් සම්මත කළ යුතු බවට ප්‍රකාශ කරන ලෙස ඉල්ලා විශේෂ පෙත්සම් 39ක් විවිධ සිවිල් සංවිධාන සහ පුද්ගලයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබුණි.

එම පනත් කෙටුම්පතට පක්ෂව අතරමැදි පාර්ශව පෙත්සම් 7ක් ඉදිරිපත් කර තිබිණි.

එම පෙත්සම් සම්බන්ධ මූලික කරුණු දැක්වීම් ඉකුත් 29 වැනිදා සිදු කෙරුණි.

අගවිනිසුරු ජයන්ත ජයසූරිය, බුවනෙක අලුවිහාරේ, සිසිර ද ආබෲ, ප්‍රියන්ත ජයවර්ධන, විජිත් මලල්ගොඩ යන පංච පුද්ගල විනිසුරු මඬුල්ල හමුවෙහි මෙම පෙත්සම් දෙවැනි දිනට ඊයේ (30) කැඳවන ලදී.

එහිදී සෙසු පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ක්‍රිෂ්මාල් වර්ණසූරිය මහතා සඳහන් කළේ මෙරට ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සඳහන් වන බවය. ජනතාවගේ විධායක බලය විධායක ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කරන අතර, එය ජනාධිපති ධුරය දරන්නාගේ අභිලාෂයන් නොව ජනතාවගේ අභිලාෂයන් අනුව ක්‍රියාත්මක විය යුතු බව හෙතෙම කීය.

එසේම ද්විත්ව පුරවැසියකුට මෙරට පාර්ලිමේන්තුවට පත්වීමට පෙර ජනාධිපති ලෙස පත්වීමට අවස්ථාව දීම භයානක ප්‍රතිඵල ඇති කරනු ඇති බව ඒ මහතා කීය. එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව ද ඔහු සඳහන් කෙළේය.

පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි පුලස්ති හේවාමාන්න, විරාන්කොරයා, ගෙහාන් ගුණතිලක නුවන් බෝපගේ යන නීතිවේදීහු මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානයන්ට පටහැනි බව පෙන්වා දුන්හ.

මෙමගින් පාර්ලිමේන්තුවේ බලයට සෘජුවම අභියෝගයක් එල්ලවන බව ද ජනතාවගේ පරමාධිපත්‍ය බලය උල්ලංඝනය වීමක් සිදුවන බව ද ඔවුහු පෙන්වා දුන්හ.

පනත් කෙටුමපතක ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව විමර්ශනය කිරීමට අධිකරණය සතුව තිබූ කාලය දින 14 සිට 7 තෙක් අඩු කිරීමක් කර ඇතැයි ද ඔවුහු කියා සිටියහ.

විදේශිකයකුට ශ්‍රී ලාංකීක පාර්ලිමේන්තුවට පැමිණීමට අවශ්‍ය යැයි සිතූ විටක ඒ සඳහා අවසර දීමක් මෙහිදී සිදුවන අතර, එය විදේශිකයකුට ශ්‍රී ලංකා ජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීමට අවස්ථාව දීමක් බව නීතිඥවරු පෙන්වා දුන්හ.

කාරක සභා අවස්ථාවේදී යෝජිත පනත් කෙටුම්පතට ගෙන එන සංශෝධන පිළිබඳව ජනතාවට අවබෝධයක් නැති බවත්, ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම සහ එය ගැසට් මඟින් ප්‍රසිද්ධ නොකිරීම ජනතාවගේ අයිතීන් උල්ලංඝනය කිරීමක් බව ඔවුහු කීහ.

එබැවින් මෙය අනිවාර්යයෙන්ම ජනමත විචාරණයකට යොමු කළ යුතු බවට තීරණය කරන ලෙස මෙම නීතිඥවරු අධිකරණයෙන් ඉල්ලා සිටියහ.

පෙත්සම් පිළිබඳ වැඩිදුර කරුණු සලකා බැලීම 02 වන සිකුරාදාට කල් තැබිණි.

# 'ලැම්බෝගිනි සුපර් ටෝකියෝ 2020'ට යන්න මාලගමුවට අවසර

**කුමුදු හෙට්ටිආරච්චි**

මෝටර් රථ ධාවන ශූර ඩිලන්ත මාලගමුව මහතාට ප්‍රංශය ඇතුළු විදෙස් රටවල් කිහිපයක පැවැත්වෙන 'ලැම්බෝගිනි සුපර් ටෝකියෝ 2020' තරගාවලියට සහභාගිවීම සඳහා විදෙස්ගතවීමට කොළඹ මහාධිකරණ විනිසුරු ධම්මික ගනේපොල මහතා ඊයේ (30) අවසර ලබා දුන්නේය.

ලබන මස 10 වැනිදා සිට නොවැම්බර් මස 15 වැනිදා දක්වා පැවැත්වෙන මෙම තරගාවලියේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වන කණ්ඩායමේ නායකත්වය දරන ඩිලන්ත මාලගමුව මහතාට විදෙස්ගත වන්නේ නම් පෙර අධිකරණය දැනුවත් කරන ලෙසට කොන්දේසියක් පනවා ඇති බැවින් ඒ අනුව ඔහුට විදෙස්ගත වීම සඳහා අධිකරණයෙන් මෙම ඉල්ලීම සිදු කරන බව නීතිඥ ජීවන්ත ජයතිලක මහතා කළ කරුණු දැක්වීම සලකා බැලූ විනිසුරුවරයා එම අවසරය ලබා දුන්නේය.

ඩිලන්ත මාලගමුව මහතා ඇතුළු විත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව කොළඹ මහාධිකරණයේ වන නඩුව ලබන 19 වැනිදා කැඳවන අවස්ථාවේදී ඔහුට අධිකරණය හමුවේ පෙනී නොසිටීමේ අවසරය ද ලබා දුන් විනිසුරුවරයා, ඔහු නැවත ලංකාවට පැමිණෙනතෙක් ඔහු වෙනුවෙන් පෙනී සිටීමේ අවසරය ද නීතිඥවරයාට ලබා දුන්නේය.

සුපිරි නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට ජපන් ජාතිකයකුගෙන් ලබාගත් ඇමරිකානු ඩොලර් ලක්ෂ හයක මුදලක් ගිවිසගත් අයුරින් නැවත නොගෙවීම ඇතුළු අධිචෝදනා යටතේ ඥානදීපන් සිවජෝති, ඩිලන්ත මාලගමුව හා විජිත බණ්ඩාර රණරාජා යන විත්තිකරුවන් තිදෙනාට එරෙහිව නීතිපතිවරයා මෙම නඩුව පවරා ඇත.



Out Of The Box

# ටින් මාළු ආනයනය අත්හිටුවන්නැයි ධීවරයෝ ඉල්ලති

- දළ දේශීය නිෂ්පාදනයට මත්ස්‍ය කර්මාන්තයෙන් 1% දායකත්වයක්
- මත්ස්‍ය ආනයනයට වසරකට ඇමරිකන් ඩොලර් මිලියන 500ක්
- මත්ස්‍ය කර්මාන්තයේ යැපෙන්නෝ මිලියන 2ක්
- ටින් මාළු සඳහා දකුණු මුහුදේ ඇති තරමට මාළු

ශ්‍රී ලංකාවට හිමි මුහුදු තීරයේ විශාලත්වය වර්ග කිලෝ මීටර් 20,000ක් පුරා පැතිරී ගිය කිලෝමීටර් 22ක පළලින් යුතු ප්‍රදේශයකි. දකුණු අර්ධ ගෝලයේ ද කෙලවර තෙක් වෙනත් රටකට අයත් නොවන නිසා ඒ විසල් සාගර ප්‍රදේශය තුළ ජාත්‍යන්තර ගිවිසුම් ප්‍රකාරව කිලෝ මීටර් 200 ගැඹුර තෙක් මුහුදු ප්‍රදේශයක ධීවර කටයුතු කිරීමේ හැකියාව අප සතුය.

වසරකට කරවල, උම්බලකඩ ,මාළු සහ ටින්මාළු ආනයනය සඳහා අමෙරිකානු ඩොලර් මිලියන 500ක් වැය වීමට ඉඩක් තිබිය නොහැක. අනෙක් කරුණ වන්නේ වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදනයට මත්ස්‍ය කර්මාන්තයේ දායකත්වය 1%ක් තරම් අගයක පැවතීමයි.

මෙරට සාගර සම්පත වන සාලයා, හුරුල්ලා, සුරාපරව් වැනි කුඩා මාළුන් බහුල වශයයන් ජීවත් වෙන්නේ වෙරළ ආසන්න ගල්පර සමීපයේයි. ගැඹුරු දියඹේ විශාල දැල්, බහු දින යාත්‍රා ආදියේ ආධාරයෙන් කෙලවල්ලා, බල, පරා,කොප්පරා. තලපත් වැනි විශාල මසුන් ඇල්ලීම සිදු කරයි. ටින් මාළු සඳහා ගන්නා ලින්නා වැඩි වශයෙන් නෙළාගන්නේ මෙරට දකුණු දිග වෙරළ තීරයෙනි. හික්කඩුව, ගාල්ල, කුඩාවැල්ල, මාතර ආදී ප්‍රදේශ ටින් මාළු කර්මාන්තය සඳහා මාළු ලබාදෙන ප්‍රමුඛතම ප්‍රදේශයි.

මත්ස්‍ය අපනයනය සීමා කිරීමෙන් මෙරට ධීවර කර්මාන්තය ශක්තිමත් කළ හැක. ඒ සඳහා කෙටිකාලීන මෙන්ම දිගුකාලීන වැඩපිළිවෙළකට අනුගත විය යුතු බවට පසුගිය මස ජනාධිපතිවරයා සහ මත්ස්‍යය කර්මාන්තය පිළිබඳ කර්මාන්ත කරුවන් හා අනුබද්ධ ආයතන ප්‍රධානීන් අතර පැවති සාකච්ඡාවේදී තීරණය කෙරිණි. මේ සාකච්ඡාවන්ගේ ප්‍රතිඵලයක් ලැබෙනතුරු ධීවර ජනතාව මෙන්ම කර්මාන්තකරුවෝද නොඉවසිලිමත්ව සිටිති.

පසුගිය දිනෙක දකුණු පළාතේ ධීවර වරායන් කිහිපයක සංචාරය කරමින් ධීවරයන් මෙන්ම මේ කර්මාන්තයට සම්බන්ධ පුද්ගලයන් හමුවී දිනමිණ ව්‍යාපාරික අංශයේ අපි මේ පිළිබඳ අදහස් විමසීමු.

" මගේ නම ඩී. වී. ක්‍රිෂාන්. මම කුඩාවැල්ල ධීවර වරායේ බෝට්ටුවලින් මාළු මිලදී ගැනීමයි කරන්නේ. මම සේවය කරන්නේ ටෙස් ලංකා ආයතනයේ නිලධාරියකු විදිහට. දකුණු පළාතේ ධීවර වරායන් කිහිපයකින්ම අපි ලින්නා මසුන් මිලදී ගන්නවා. දිනකට 300 KGක් පමණ අපි මිලදී ගැනීම කරනවා. මාළු අස්වැන්න නෙළාගෙන පැමිණෙන විට ඒවා අංක එක, අංක දෙක, අංක තුන වශයෙන් කාණ්ඩ කරනවා. ඊට හේතුව මාළු අස්වැන්න නෙළාගෙන දින කිහිපයක් තිස්සේ පැමිණෙන අතරතුර ඒවාගේ තත්ත්වය වෙනස් වීමයි. තත්ත්වයෙන් ඉහළ පළමු කාණ්ඩය කොළඹ මාළු කඩේට හෝ ධීවර සංස්ථාව සඳහා අලෙවි වෙනවා. දෙවැනි මට්ටම බොහෝදුරට අලෙවි වුණේ කරෝල සහ උම්බලකඩ සඳහායි. නමුත් සැමන් ටින් කර්මාන්තය ආරම්භ වීමෙන් පසුව මේ දෙවැනි මට්ටමේ මාළු සඳහා හොඳ ඉල්ලුමක් ඇති වුණා.මේ හේතුවෙන් මේ පළාතේ ධීවරයෝ දහස් ගණනක් ජීවත් වෙනවා. මොකද මේ අයගේ මාළුවල වටිනාකමට සරිලන මිලක් ලැබෙන්නේ අපගේ මෙන්ම තවත් කර්මාන්ත ශාලා කිහිපයක් විසින්ම මිලදී ගැනීම් කරන නිසයි. ටින් මාළු නිෂ්පාදනයේදී මාළු පමණක් නොවෙයි. ටින්, ලේබල්, ලුණු මෙන්ම සැකසීමේ කාර්ය, බෙදාහැරීම මේ සියලු දේවල් සිදුවෙන්නේ රට තුළයි. ඒ නිසා මාළුවලට මිලක් ලැබීම පමණක් නොවෙයි. මේ හේතුවෙන් තවත් විශාල පිරිසකගේ ජීවන මාර්ගය සකස් වෙලා තිබෙනවා. මම මේ මාළු මිලදී ගැනීමේ නිලධාරියකු විදිහට කටයුතු කරන්නේ ටින් මාළු කර්මාන්ත ශාලාවටයි. මේ දකුණු පළාතේ මම වගේ වැඩ කරන තව බොහෝ දෙනෙක් ඉන්නවා. මේ කර්මාන්තය තවදුරටත් දියුණු කළ හැකි නම් තවත් දහස් ගණනකට රැකියා ලැබේවි. නමුත් ගැටලුව වෙන්නේ රටේ තිබෙන ටින් මාළු පරිභෝජනයට සමාන නිෂ්පාදනයක් අපේ කර්මාන්ත ශාලාවලින් කළ හැකි වුවත් පිටරටින් ටින් මාළු ගෙන්වීම නිසා නිෂ්පාදනය සීමා කිරීමට සිදුවීමයි. ධීවර ජනතාවට හොඳ මිලක් ලබාදීම, ධීවර කර්මාන්තය දියුණු කිරීම වගේම ටින් මාළු කර්මාන්තයට අනුබද්ධව තවත් රැකියා බිහි කිරීමට නම් ටින්මාළු පිටරටින් ගෙන්වීම හැකිතාක් සීමා කළ යුතුයි. "



කුමාර

හොඳහිත

ආර්. විජේසූරිය

ඩී.වී. ක්‍රිෂාන්

" කවිඳු" යාත්‍රාවේ නියාමක කුමාර මහතා අප සමග මෙසේ සිය අදහස් දැක්වීය. " ධීවර යාත්‍රාවල නියාමකවරයකු විදිහටයි මම සේවය කරන්නේ වසර 30ක පමණ කාලයක් මම කරන්නේ මේ රස්සාව. දකුණේ වුණත් ඒ ඒ ධීවර වරායන්ගේ සම්ප්‍රදායන් එකිනෙකට වෙනස්. දින හත දින දාහතර වැනි කාල මුහුදේ ගත කරමින් අපි මාළු අස්වැන්න නෙළීම කරනවා. මෙහෙම යන විට දින ගණනක් මුහුදේ ගත කිරීමට අවශ්‍ය සියලු ආහාරපාන, අමුද්‍රව්‍ය අරගෙනයි යන්නේ. අස්වැන්න නෙළා ගැනීම හැමදාමත් එකවගේ වෙන්නෑ. සමහර දවස්වලට ගෙනියන අයිස් ප්‍රමාණය මදි වෙනවා ලැබෙන මාළු ප්‍රමාණයට. මෙහෙම දවස්වලට තමයි මාළු තැලීම්, පොඩිවීම් වෙන්නේ. එහෙම වුණාම මිලක් ගැනීමට අසීරු වෙනවා. බෝනස් දිරිදීමනා, විශ්‍රාම වැටුප් නැති රස්සාවක්. තුන්තිස් පැයක් සීතලේ. ගිනි රස්නේ මුහුද මැද අපි කරන්නේ. රට ඇතුළේ මේ කර්මාන්තයට හොඳ තත්ත්වයක් හැදෙනව නම් අපි හැමෝටම හොඳයි. "

"හොඳ හිත" නමින් ධීවර යාත්‍රා කිහිපයකම හිමිකරුවෙකු අපහා අදහස් බෙදා ගත්තා ගාල්ල සහ හික්කඩුව ප්‍රදේශයේ ලින්නා මාළු මිලදී ගන්නන් අතර ප්‍රමුඛයෙකු ලෙසයි ඔහු කටයුතු කරන්නේ. හෙතෙම සැමන් කර්මාන්ත ශාලා වෙත මාළු ලබාදෙන්නකු ලෙසත් කටයුතු කරයි. ඔහු දැක්වූ අදහස් මෙසේයි. " ටින්මාළු කෑමට කැමැත්තක් දක්වන්නේ ධනවත් අය නෙවෙයි. එදා වේල උපයා ගන්නා සාමාන්‍ය මිනිස්සු. පිටරටින් ගේන මාස ගණන් පරණ මාළු වෙනුවට අපේ ටින්මාළු කෑන් මිලදී ගැනීමට අවස්ථාව ලැබෙනව නම් ඒ අයට ලැබෙන්නේ ඉතාමත් අලුත්ම මාළු.අපේ ටින්මාළු මිලදී ගන්නා සෑම අවස්ථාවකම ඒ සමග තවත් විශාල පිරිසකට ජීත්වීමේ අවස්ථාව උදාවෙනවා. හික්කඩුවේ පමණක් ධීවර කර්මාන්තයත් සමග ජීවත්වෙන පවුල් 2,000 ක් පමණ සිටිනවා. ධීවර යාත්‍රාවල කුලී පදනමින් සේවය කරන අය සිට දැල් වියන, කූඩ වියන අයිස් සැපයීම ආදී වශයෙන් මේ කර්මාන්තය වටා ගොඩනැගුන අමතර ව්‍යාපාර තවත් කොතෙකුත් තිබෙනවා.මේ කාගේත් ජීවිකාව හොඳවීමට නම් මාළු අලෙවිය යහපත් විය යුතුයි. මාළු වශයෙන් මෙරටට ගෙන්වන දේවල් අතර වැඩි වියදමක් යන්නේ ටින්මාළු සඳහායි. අප ආණ්ඩුවෙන් ඉල්ලන්නේ ටින් මාළු ගෙන්වීම ටික කලකට හෝ අත්හිටුවා මේ කර්මාන්තය දියුණු කිරීමට මැදිහත්වන ලෙසයි. මේ කර්මාන්තයේ නිරත තායිලන්තය, මැලේසියාව වැනි රටවල්වලට අයත් මුහුදු සීමාවන්ගේ මාළු වගා කිරීම් කරමින් විශාල මාළු අස්වැන්නක් ලබාගන්නවා. එවැනි තාක්ෂණික දැනුම මෙන්ම පහසුකම් ලැබේ නම් තවදුරටත් මේ කර්මාන්තය දියුණු කළ හැකියි. හික්කඩුව වගේම දොඩංදූව ධීවර වරායත් වසර දහස් ගණනක ඉතිහාසයක් ඇති ධීවර වරායන්. ජාඩි කර්මාන්තය මෙරටට හඳුන්වා දුන්නේ දොඩංදූවේ ධීවර වැසියන්. මේ නිසා ධීවර කර්මාන්තය ගැන අපිට තිබෙන්නේ අනාදිමත් කාලෙක සිට එන බැඳීමක්. නමුත් ඒ දැනුමෙන් නිසි ප්‍රයෝජන ලැබෙන්නේ රටක් විදිහට මත්ස්‍ය සම්පතෙන් ලැබෙන ආදායම ඉහළ ගියොත් විතරයි. ටින් මාළු අපනයනය කළ හැකි මට්ටමට මේ කර්මාන්තය දියුණු කළ හැකි නම් කර්මාන්තයට සම්බන්ධ විශාල පිරිසකට සෙතක් අත්වේවි. අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්නේ ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් කරන ලෙසයි."

ආර් විජේසූරිය මහතා ධීවර යාත්‍රා වෙතින් මාළු මිලදීගෙන සැමන් කර්මාන්ත ශාලා වෙත මාළු සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කරයි. "සැමන් කර්මාන්ත ශාලා වෙත ලින්නා මාළු සැපයීම අපගේ මූලික ආදායම් මාර්ගයයි. කුඩාවැල්ල ධීවර වරායේ මාවැනි ව්‍යපාරිකයින් තවත් දස දෙනෙකු පමණ මාළු මිලදී ගැනීම කරනවා. ටින් මාළු කර්මාන්තය සඳහා අවශ්‍ය මාළු වැඩි වශයෙන් හමුවෙන්නේ දකුණු මුහුදෙන් ඒ නිසා මේ ප්‍රදේශයේ ජනජීවිතයට මේ කර්මාන්තය ඉතාමත් වැදගත් ටින් මාළු සීමා කරත් ඇතැම් අවස්ථාවල ටින් කිරීම සඳහා මාළු ආනයනය කිරීමත් සිදුවෙනවා.අපි කියන්නේ මේ දෙකම නතරකළ යුතු බවයි."

**සටහන බුද්ධිකා බ්‍රාහ්මණගේ**
**ඡායාරූප- විමල් කරුණාරත්න**

# ලෝටස් ප්‍රවර්ධනයේ ජයග්‍රාහකයන්ට තරු පන්තියේ නිවාඩුවක්

ශ්‍රී ලාංකීය පාරිභෝගික විශ්වාසය ඉහළින්ම දිනා ගනිමින් ලෝටස් ටයර් නිෂ්පාදනය කර බෙදා හරින සැම්සන් රබර් කර්මාන්ත ආයතනය විසින් සිය වටිනා වෙළෙඳසල් හිමියන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අගයමින් තරු පන්තියේ දේශීය සංචාරයක් පසුගියදා සංවිධාන කරන ලදී. එහිදී ලෝටස් ටයර් වෙළෙඳසල් හිමියන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරු පන්තියේ හෝටලයක් වන RIU - Ahungalle හෝටලයේ දෙදිනක් නිදහසේ සහ විනෝදයෙන් ගත කිරීමට අවස්ථාව ලැබුණි. කොවිඩ් 19 වසංගතය සමඟ බොහෝ ආයතන වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු තාවකාලිකව නවත්වා ඇති කාලයක ලෝටස් ටයර් ආයතනය මේ වැඩසටහන පැවැත්වීම වෙළෙඳසල් හිමියන්ගේ ප්‍රසාදයට ලක් විය. පසුගිය වසරේදී වෙළෙඳ ඉලක්ක සම්පූර්ණ කළ වෙළෙඳසල් හිමියන් වෙනුවෙන් සංවිධාන කළ වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහනේ වාසනාවන්ත ජයග්‍රාහකයන්ට මේ අගනා අවස්ථාව හිමි විය. මේ අවස්ථාවට සැම්සන් රබර් කර්මාන්ත ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙන්ම ලෝටස් ටයර් විකුණුම් සහ අලෙවිකරණ කණ්ඩායම සහභාගි වූහ.

" අපගේ සාර්ථකත්වයට නිරන්තරයෙන් සහාය වන වෙළෙඳසල් හිමියන් සමඟ ලෝටස් ටයර් ආයතනයට ඇත්තේ ඉතා හොඳ සබඳතාවක්. මේ වැඩසටහන අප පවත්වන්නේ ඉලක්ක සම්පූර්ණ කිරීමට එහා ගොසින් එම සබඳතාව ශක්තිමත් කිරීමේ අරමුණින් සැම්සන් රබර් කර්මාන්ත ආයතනයේ අධ්‍යක්ෂ කාවින්ද රාජපක්ෂ මහතා පැවසීය. "නියම මිලට... නියම දුරක්..." යන තේමාව ඔස්සේ දිවයින පුරා සිටින පාරිභෝගිකයන්ට සමීප වන ලෝටස් ටයර් දශක ගණනාවක සිට කතා බහට ලක්වූ ටයර් වෙළෙඳ නාමයක් වන අතර, ගෙවන මුදලට උපරිම සාධාරණයක් ඉටු කරමින් පාරිභෝගිකයාගේ ආරක්ෂාව තහවුරු කරන ගුණාත්මකභාවයෙන් ඉහළ ලෝටස් ටයර් නිෂ්පාදන පෙළ බයිසිකල් ටයර් සහ ටියුබ්, මෝටර් සයිකල් ටයර් සහ ටියුබ්, ත්‍රී වීලර් ටයර් සහ ටියුබ් ආදී නිෂ්පාදන පෙළකින් සමන්විතය.



# වයඹ සරසවියේ නව උපකුලපති
## ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ



ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ මුදලිගේ මහතා එම විශ්වවිද්‍යාලයේ නව උපකුලපති ධුරයෙන් පිදුම් ලැබීය. සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් හා සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වන මොහු පරිපාලන ක්ෂේත්‍රයේ විශිෂ්ටයකු ලෙස 2013දී සණස නායක විශ්ව ප්‍රසාදිනී ආචාර්ය පී. ඒ. කිරිවන්දෙණිය මහතාගේ ආරාධනාවකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට එක් විය.

1994දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් පළමු පෙළ සාමර්ථයක් සහිතව කෘෂිකර්ම උපාධිය ලබා ඉන් පසු කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කළේය. කැනඩාවේ ගවෙල්ෆ් සරසවියෙන් ආහාර හා කෘෂි ආර්ථික ව්‍යාපාර පිළිබඳ ආචාර්ය උපාධිය ලබා අමෙරිකා එක්සත් ජනපදයේ මැසචුසෙට්ස් සරසවියේ සහ ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියේ මහාචාර්යවරයකු ලෙස සේවය කරන අතර, මෙරට අධ්‍යාපන අමාත්‍යාංශයේ තත්ත්ව සහතික කිරීමේ උපදේශකවරයකු ලෙසද සේවය කරයි. එක්සත් රාජධානියේ මාණ්ඩලික හා අධ්‍යාපන සංවර්ධන සංගමය (SFSEDA) ඔහුට ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වයක් පිරිනමා ඇත. ශ්‍රී ලංකා පාරිසරික වෘත්තිකයන්ගේ ආයතනය පිරිනමන"වරලත් පාරිසරික වෘත්තික" සහ අමෙරිකා එක්සත් ජනපදයේ සංවර්ධන සංවිධාන සඳහා ව්‍යාපෘති කළමනාකරණය පිරිනමන"සහතිකලත් සංවර්ධන ව්‍යාපෘති කළමනාකරු" යන සාමජිකත්වයන්ද ලැබූ මෙතුමා ජාතික හා ජාත්‍යන්තර සංවිධාන 17ක ගෞරවණීය යාවජීව සාමාජිකත්වය උසුළයි.

# බජාජ් ජෙනුයින් පාර්ට්ස් අලෙවි මධ්‍යස්ථානයක් මදුරන්කුලියට



බජාජ් ජෙනුයින් පාර්ට්ස් නවතම අලෙවි මධ්‍යස්ථානය ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි මදුරන්කුලිය ප්‍රාදේශීය කාර්යාලයේ දී 2020 සැප්තැම්බර් මස 17 වන දින විවෘත වේ. පුත්තලම සහ මදුරන්කුලිය අවට බජාජ් මෝටර් සයිකල්, ත්‍රිරෝද රථ සහ කියුට් රථ හිමිකරුවන්ට අවශ්‍ය ජෙනුයින් පාර්ට්ස් නව අලෙවි මධ්‍යස්ථානය හරහා පහසුවෙන් මිලදී ගැනීමේ අවස්ථාව උදාවේ.එසේම 20වැනිදා දක්වා මදුරන්කුලිය ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් පරිශ්‍රය තුළ විශේෂ ප්‍රවර්ධන වැඩසටහනක්ද පැවැත්වේ. මේ ප්‍රවර්ධන වැඩසටහනට සහභාගී වන පාරිභෝගිකයන්ට සියලු බජාජ් ජෙනුයින් පාර්ට්ස් සඳහා 10%ක වට්ටමක්ද, තෝරාගත් ජෙනුයින් පාර්ට්ස්වලට 50%ක වට්ටමක්ද හිමිවේ.

තවද සියලු බජාජ් වාහන සඳහා නොමිලේ වායුවිමෝචන සහ තත්ත්ව පරීක්ෂාවක් හිමි වන අතර, රු- 2,500ට වඩා වැඩි ජෙනුයින් පාර්ට්ස් මිලදී ගන්නා පාරිභෝගිකයන්ට නොමිලේ බොඩි වොෂ් එකක් ලබා ගත හැකිය. එසේම බජාජ් ත්‍රීවීලර් සඳහා ග්‍රීස් ගැසීම මේ දිනවලදී නොමිලේ සිදුකරවා ගත හැකිය. ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අනුබද්ධිත රියසක්වල ශාඛා හරහා පාරිභෝගිකයන් හට තම වාහනය විකිණීමට, හුවමාරු කිරීමට මෙන්ම ලියාපදිංචි ත්‍රිරෝද රථයක් හෝ මෝටර් සයිකලයක් මිලදී ගැනීමේ පහසුකම්ද සලසා ඇත.

එසේම මේ ස්ථානයේම ඇසට්ලයින් ලීසිං වෙතින් ඔබ මිලදී ගන්නා වාහනයට මූල්‍ය පහසුකම් ලබාගැනීම සිදුකර ගත හැකිය. තවද පාරිභෝගිකයාගේ පහසුව වඩාත් තහවුරු කරමින් විකුණන වාහනවලට එවලේම මුදල් ලබාදෙන අතර, මිලදී ගන්නා වාහන සඳහා රක්ෂණ පහසුකම්ද එකම වහලක් යටින් ලබා දීමේ පහසුකම් සලසා ඇත.

# සඳැස් ඕරා මධ්‍යස්ථානයෙන් විශ්ව ශක්ති ප්‍රතිකාර



රේකී, ප්‍රාණික්, කොස්මික්, ඇංගලිකන් සහ ජෝරේ යනුවෙන් විශ්ව ශක්ති ප්‍රතිකාර රැසක් ලොව පවතී. අපට වැළඳෙන බොහෝ රෝග පීඩා විශේෂයෙන් බෝ නොවන රෝග විශ්ව ශක්තිය හරහා සුව කර ගත හැකිය. බත්තරමුල්ල, කුරුණෑගල සහ ගම්පහ පිහිටි සඳැස් ඕරා සහ ස්වභාවික ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත පැමිණ නවීනතම 3D ඕරා යන්ත්‍රයකින් ඔබේ ඕරාව පරීක්ෂා කර විශ්ව ශක්ති ප්‍රතිකාර ලබා ගත හැකිය. ප්‍රවීණ ජ්‍යොතිර්වේදී, රේකී මාස්ටර්, අධ්‍යාත්මික ප්‍රතිකාර උපදේශක කේ. ඒ. යූ. සරත්චන්ද්‍ර මහතා මෙය මෙහෙයවයි. මනස, ආත්මය සහ ශරීරය යන ත්‍රිත්වයටම විශ්ව ශක්තිය ඔස්සේ ප්‍රතිකාර කරන බැවින් භෞතික රෝග පමණක් නොව මානසික හා ආත්මීය වශයෙන් වැළඳෙන රෝග මේ හරහා සුව කර ගත හැකි වීම සුවිශේෂය. මේ ක්‍රම අතරින් රේකී ප්‍රතිකාරයට ලැබෙන්නේ විශේෂ තත්ත්වයකි. මිනිස් සිරුරේ පිහිටා ඇති චක්‍ර හත වන මූලාධාර, ස්වාධිශ්ඨාන, මණිපුර, අනහත, විශුද්ධි, ආඥා සහ සහශ්‍රා චක්‍ර රේකී ප්‍රතිකාර මගින් පිරිසිදු කර බලගන්වයි. මේ චක්‍ර හත මගින් සිරුරේ පිහිටා ඇති අන්තරාසර්ග ග්‍රන්ථි හතක් පාලනය කර, ඊට අදාළ ඉන්ද්‍රියයන් වන මොළය, හෘදය වස්තුව, පෙනහළු, ආමාශය, අග්න්‍යාශය, වකුගඩු, අක්මා, ලිංගේන්ද්‍රිය, අස්ථි පද්ධතිය හා ස්නායු පද්ධතිය පාලනය කරයි. රේකී ප්‍රතිකාර තුළින් රෝග පීඩා දුරු කිරීම පමණක් නොව ශරීරයේ ප්‍රතිශක්තිකරණයද වර්ධනය කළ හැකිය. එසේ ඇති වන ප්‍රතිශක්තිය තුළින් බෝ වන රෝග, විශේෂයෙන් වෛරස් රෝග නොවැළඳී සිටීමේ හැකියාව පවතී. සුව කළ නොහැකි යැයි සැළකෙන දියවැඩියාව, ආතරයිටීස්, හෘද රෝග හා මානසික රෝග රේකී ප්‍රතිකාර මගින් නිට්ටාවට සුව කර ගත හැකි වීමද සුවිශේෂය. ඉරුවාරදය, කොන්දේ අමාරුව, හන්දි වේදනාව වැනි පීඩාකාරී වේදනාවන්ද මෙමගින් සමනය කර ගැනීමේ හැකියාව පවතී.

# 2028 ඔලිම්පික් පදක්කම් සටනට ක්‍රීඩක ක්‍රීඩිකාවන් සෙවීමේ මෙහෙයුමක්

**නිරෝෂාන් ප්‍රියංකර**



අමෙරිකාවේ ලොස්ඇන්ජලීස්හිදී 2028 වසරේ පැවැත්වෙන ඔලිම්පික් ක්‍රීඩා උලෙළ ඉලක්ක කරමින් මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීමේ වැඩසටහනක් දියත් කිරීමට තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය සූදානම් වෙයි.

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මේ වැඩසටහන මෙහෙයවයි.

ක්‍රීඩාවේ සංවර්ධනය තුළින් ශ්‍රී ලංකාව ආසියාවේ අභිමානය බවට පත් කිරීමේ දැක්ම ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය වන අන්තර්ජාතික ජයග්‍රහණ අත් කර ගැනීමට නම් ක්‍රීඩකයන් හඳුනාගෙන ඔවුන් සංවර්ධනය කළ යුතු වේ.

ඒ අනුව ක්‍රීඩා සහ අධ්‍යාපන අමාත්‍යාංශ එක්ව නියමු ව්‍යාපෘතියක් ලෙස මේ වැඩසටහන දියත් කරන අතර, එමඟින් සහජ ක්‍රීඩා දක්ෂතා ඇති පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන ඔවුන්ගේ දක්ෂතා වර්ධනය කර ජාතික හා අන්තර්ජාතික තලයේ ජයග්‍රහණ අත් කර ගැනීමේ පරමාර්ථයෙන් මේ කටයුතු සිදු කෙරෙනු ඇත.

අන්තර්ජාතික ජයග්‍රහණ සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ විද්‍යාත්මක ක්‍රමවේදය වන්නේ මෙලෙස ක්‍රීඩකයන් හඳුනා ගැනීම බැවින් ඔවුන් සොයා ගැනීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව 'රෝඩ් ටු ඔලිම්පික්' ලෙස වැඩ සටහනක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබේ.

මේ සඳහා අවුරුදු 12 වයස් කාණ්ඩයේ පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොදා ගන්නා අතර, ඒ අනුව දිස්ත්‍රික් 22ක පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1100ක් තෝරා ගැනීමට නියමිතය. එහිදී එක් අධ්‍යාපන කලාපයකින් ක්‍රීඩකයන් 25ක් සහ ක්‍රීඩිකාවන් 25ක් ලෙස අධ්‍යාපන කලාප 22කින් මේ 1100 දෙනා තෝරා ගැනෙනු ඇත.

මේ වැඩ සටහන ආරම්භ කරමින් හෙට (2) පස්වරු 2.00කට පාදුක්ක, සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලයේදී ප්‍රධාන උත්සවය පැවැත්වෙන අතර, ඊට සමගාමීව පාසල් 11ක එම වේලාවටම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මේ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප ක්‍රීඩා අධ්‍යක්ෂ, තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පාසල්වල විදුහල්පතිවරු, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන නිලධාරීහු, තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ හා ඔවුන්ගේ දෙමව්පියෝ සහභාගි වෙති.

මිනුවන්ගොඩ ඩී.එස්. සේනානායක විද්‍යාලය, මතුගම සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මධ්‍ය මහ විද්‍යාලය, වැලිමඩ මහ උස්වැව මධ්‍ය විද්‍යාලය, දෙණියාය මධ්‍ය විද්‍යාලය, හම්බන්තොට විහාරගල මධ්‍ය විද්‍යාලය, මන්නාරම මඩු ජෝසප් වාස් විද්‍යාලය, මහව විජයබා මහා විද්‍යාලය, පුත්තලම මහ උස්වැව මධ්‍ය විද්‍යාලය, කටුගස්තොට නුගවෙල ජාතික පාසල, හැටන් අඹගමුව මධ්‍ය විද්‍යාලය සහ දෙහිඕවිට රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයේදීත් මේ වැඩ සටහන හෙට (2) පැවැත්වීමට නියමිතය.

කන්තලේ අග්‍රබෝධි ජාතික පාසලේදී 5 වැනිදාත්, තණමල්විල මධ්‍ය විද්‍යාලය, ගලෙන්බිඳුණුවැව මධ්‍ය විද්‍යාලය, උඩුගම නාගොඩ රාජකීය විද්‍යාලය සහ යාපනය සාන්ත අන්තෝනි විද්‍යාලයේදී 6වැනිදාත් මේ වැඩසටහන පැවැත්වෙන අතර, 7 වැනිදා දෙණියාය විජිත මධ්‍ය විද්‍යාලයේදී සහ 8 වැනිදා නාඋල ශ්‍රී නාග ජාතික පාසලේදී වැඩසටහන පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

# එල්පීඑල් යළි කල් යයි



රජයේ සෞඛ්‍ය නීතිරෙගුලාසිවලට අනුකූලව නිරෝධායනය වීමට ප්‍රමාණවත් කාලසීමාවක් ලබාදීම සඳහා ලංකා ප්‍රිමියර් ලීග් (එල්පීඑල්) තරගාවලිය නොවැම්බර් 21 වැනිදා දක්වා කල් දැමීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තීරණය කර ඇත.

මීට පෙර නොවැම්බර් 14 වැනිදාට දින නියම වී තිබූ මේ තරගාවලියට සහභාගි වන විදෙස් ක්‍රීඩකයන්ට මෙරට සෞඛ්‍ය රෙගුලාසි අනුව නිරෝධානය වීමට අවශ්‍ය දින 14ක කාලයක් ලබාදීම ඊට හේතු වී තිබේ.

එල්පීඑල් තරගාවලියට ක්‍රීඩා කිරීමට නියමිත බොහෝ විදෙස් ක්‍රීඩකයන් මේ වන විට ඉන්දීය ප්‍රිමියර් ලීග් තරගාවලියට සහභාගි වෙමින් සිටින අතර, ඔවුන්ට එල්පීඑල් තරගාවලියට සහභාගි වීමට පෙර නිරෝධායනය වීමට අවශ්‍ය දින ගණන ප්‍රමාණවත් නොවන බැවින් මේ තීරණය ගත් බව නිවේදනයක් නිකුත් කරමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පවසයි.

අයිපීඑල් තරගාවලිය නොවැම්බර් මස 10 වැනිදා දක්වා පැවැත්වෙන බැවින් එල්පීඑල් තරගාවලියට සහභාගි වන විදෙස් ක්‍රීඩකයන්ට ඊට පෙර නිරෝධානය වීමට ප්‍රමාණවත් කාලසීමාවක් ලබාදීමට තීරණය කළ බවට එල්පීඑල් තරගාවලියේ අධ්‍යක්ෂ රවීන් වික්‍රමරත්න මහතා කළ ප්‍රකාශයක් ද එම නිවේදනයට ඇතුළත් වෙයි.

ඒ අනුව අද (ඔක්තෝබර් 1) පැවැත්වීමට නියමිතව තිබූ එල්පීඑල් තරගාවලියේ ක්‍රීඩක වෙන්දේසිය ද කල් දැමීමට තීරණය විය. එම ක්‍රීඩක වෙන්දේසිය ඔක්තෝබර් මස 9 වැනිදා පැවැත්වෙන බවද ක්‍රිකට් ආයතනයේ නිවේදනයේ සඳහන් වේ.

කණ්ඩායම් 5ක් තරග වදින එල්පීඑල් තරගාවලිය සඳහා එක් කණ්ඩායමට විදෙස් ක්‍රීඩකයන් උපරිම වශයෙන් 6 දෙනකු ඇතුළත් කර ගැනීමට අවස්ථාව ලැබී තිබේ.

මේ අතර, ගෝලීය කොවිඩ් වසංගතය සැලකිල්ලට ගනිමින් බංග්ලාදේශ පිලේ ශ්‍රී ලංකා සංචාරය අවලංගු කිරීමත් සමඟ බංග්ලාදේශ ක්‍රීඩකයන් එල්පීඑල් තරගාවලියට ද සහභාගි නොවනු ඇතැයි එරට ක්‍රිකට් ප්‍රධානී පෙරේදා ප්‍රකාශ කර තිබිණි. එම කාලය තුළ බංග්ලාදේශයේ දේශීය ක්‍රිකට් තරගාවලියක් ද පැවැත්වෙන බව කියා සිටි එරට ක්‍රිකට් ප්‍රධානී නස්මුල් හසන් සිය ක්‍රීඩකයන්ට ඒ සඳහා අවශ්‍ය විරුද්ධත්වයක් නොමැති බවට ලබා දෙන සහතිකය ද (NOC) ලබා නොදෙන බව ප්‍රකාශ කර ඇත.

## උතුරුමැද පළාත් කරාතේ තරග 3-4 දිනවල

**වෝල්ටර් දයාරත්න**
**අනුරාධපුර දිසා විශේෂ**

හතළිස්හය වැනි ජාතික මහා ක්‍රීඩා උලෙළට සමගාමීව උතුරුමැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සංවිධාන කරන උතුරුමැද පළාත් කරාතේ දෝ මහා තරගාවලිය මේ මස 3 සහ 4 දෙදින අනුරාධපුර ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

පොලොන්නරු දිස්ත්‍රික් තරග 3 වැනිදාත් 4දා අනුරාධපුර දිස්ත්‍රික් තරගත් පැවැත්වේ. එහි ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් පළාත් තරගාවලියට සුදුසුකම් ලබන අතර, එම තරග ජයගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමස්ත ලංකා ජාතික තරගාවලියට සුදුසුකම් ලබන බව අනුරාධපුර දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි එස්.ටී.ජේ.සී. පෙරේරා මහතා 'දිනමිණ'ට පැවැසීය.

## ධර්මදූත හොකී 3දා

**සොරණාතොට සමූහ**

බදුල්ල ධර්මදූත විදුහල් හොකී කණ්ඩායම් අතර, පවත්වන සුහද හොකී තරගාවලිය මේ මස 3 වැනිදා බදුල්ල පාපන්දු ක්‍රීඩාංගණයේදී පැවත්වේ.

# සුපර් ලීග් පාපන්දු තරගාවලිය රටේ ජාතික අවශ්‍යතාවක්

## ● පාපන්දු ලේකම්

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මෙහෙයවන 'සුපර් ලීග්' පාපන්දු තරගාවලිය මෙරට පාපන්දු ක්‍රීඩාව දියුණු කිරීම උදෙසා ප්‍රමුඛ අවශ්‍යතාවක් බව පාපන්දු ලේකම් ජස්වර් උමාර් මහතා පවසයි. එළැඹෙන නොවැම්බර් මාසයේ සිට ආරම්භ වන තරගාවලියට ක්‍රීඩා සමාජ 10ක් මේ වන විට තෝරා ගෙන ඇති බව ඒ මහතා පැවැසීය. එම ක්‍රීඩා සමාජ සියල්ල ස්වාධීන සමාගම් ලෙස වෘත්තීමය වශයෙන් ලියාපදිංචි කර තිබීම විශේෂත්වයකි.

එබැවින් සුපර් ලීග් සංකල්පය යටතේ පාපන්දු ක්‍රීඩකයන් 300ට අධික ප්‍රමාණයකට පූර්ව කාලීන වැටුප් ලබන රැකියාවක් ලෙස තරගාවලිය නිර්මාණය වී ඇතැයි පාපන්දු ලේකම්වරයා පැවැසීය. එයට අමතරව පුහුණුකරුවන්ට කළමණාකරුවන්ට සහ අනෙකුත් නිලධාරීන්ට වසර පුරා ආදයමක් හිමි වන රැකියා වෙළෙඳපොලක් ද ක්‍රීඩාව හරහා නිර්මාණය වී තිබේ. මේ හේතුවෙන් සුපර් ලීග් තරගාවලිය පාපන්දු ක්‍රීඩාවේ දියුණුවට මෙන්ම රට පුරා ව්‍යවසායකයන් රාශියකට නව අවස්ථා ගණනාවක් විවෘත කරදීමට සමත් වනු ඇත.

ක්‍රීඩකයන් හා ක්‍රීඩා කළමනාකතාරීත්වයට අමතරව ආහාරපාන සපයන්නන්, ක්‍රීඩා උපකරණ සපයන්නන්, ප්‍රවාහන පහසුකම් සපයන්නන් හා සිදු වීම් කළමනාකරණය කරන්නන් යන ව්‍යවසායක ක්ෂේත්‍රවලට නව තෝතැන්නක් සුපර් ලීග් තරගාවලියෙන් විවෘත වී හමාරය. වෘත්තීමය මාධ්‍යවේදීන්ට හා ක්‍රීඩා මාධ්‍යවේදීන් ලෙස ක්‍රීඩා ක්ෂේත්‍රයේ සිටින්නන්ට මේ තරගාවලියෙන් නව මානයක් සලසා දී තිබේ. තරගාවලියේ මූලික කටයුතු ආරම්භයත් සමඟ දක්ෂ ක්‍රීඩකයන්ට සහ ඔවුන්ගේ පුහුණුකරුවන්ට සිව් දෙසින් ඉතා උසස් මට්ටමේ ඉල්ලුමක් හා වටිනාකමක් හිමි වී ඇති බව දැනගන්නට ලැබීම සම්මේලනයක් ලෙස සතුටට කරුණක් බව ද පාපන්දු ලේකම්වරයා පැවැසීය. දක්ෂ ක්‍රීඩකයන් තම කණ්ඩායමට එකතු කර ගැනීම සඳහා ක්‍රීඩා සංගම් ඉතා උනන්දුවෙන් හා උද්යෝගයෙන් කටයුතු කරමින් තරගකාරී රටාවකට පිවිස සිටී.

සමස්තයක් ලෙස ගත් කළ ශ්‍රී ලාංකේය ක්‍රීඩා ඉතිහාසයේ මෙතෙක් නොදුටු අන්දමේ ක්‍රීඩකයන්ට සහ පුහුණුකරුවන්ට ඉතා ඉහළ වටිනාකමක් සුපර් ලීග් පාපන්දු තරගාවලියෙන් ලැබී ඇති බව ජස්වර් උමාර් මහතා පවසා සිටී. මේ නව තරගාවලිය ගමේ පාපන්දු ක්‍රීඩාවේ නව පරිච්ඡේදයකට ප්‍රවේශයක් බව ඒ මහතාගේ විශ්වාසය වී තිබේ. මාස 7ක් පුරා තරග 90කින් යුත් සුපර් ලීග් තරගාවලිය ක්‍රීඩා ලෝලීන්ට පමණක් නොව කාන්තා පිරිමි හා පවුලේ සියල්ලන්ටම සති අන්තයේ නව විනෝදාත්මක සැණකෙළියක් වන බව ඒ මහතා පවසයි. මේ තරගාවලිය අන්තර්ජාලය හා රූපවාහිනී නාලිකා තුළින් නරඹන්නට ඉඩ සැලැස්වීම උදෙසා පාපන්දු සම්මේලනය කටයුතු කරන බැවින් ආකර්ශනීය තරගමාලාවක් මෙරට පාපන්දු ලෝලීන්ට දැකගත හැකි වනු ඇත.



රිෂාඩ් ඛාන්

# හයිද්‍රාබාද් පිලට පළමු ජය

දහතුන් වැනි අයිපීඑල් ක්‍රිකට් තරගාවලියේ සිය පළමු ජයග්‍රහණය වාර්තා කිරීමට සන්රයිසස් හයිද්‍රාබාද් ක්‍රීඩකයෝ සමත් වෙති.

තරගාවලියේ 11 වැනි තරගයෙන් හයිද්‍රාබාද් පිල හමුවේ දිල්ලි කැපිටල්ස් පිල ලකුණු 15කින් පරාජයට පත් විය. දිල්ලි පිලට මෙවර තරගාවලියේ අත් වූ පළමු පරාජය මෙය බැවින් තරගාවලියේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණේ සිට දෙවැනි ස්ථානය දක්වා පහත බැසීමට ද සිදු විය.

අබුඩාබිහිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් හයිද්‍රාබාද් පිල කඩුලු 4ක් දැවී ලකුණු 162ක් රැස් කළ අතර, එම ඉලක්කය හමුවේ දිල්ලි පිලට ඕවර 20 තුළදී රැස් කළ හැකි කඩුලු 7කට ලකුණු 147ක් පමණි.

ශිකර් ධවාන් ලකුණු 34ක් රැස් කරමින් දිල්ලි ඉනිමේ වැඩිම ලකුණුලාභියා විය. රිෂාබ් පාන්ට් ලකුණු 28ක් සහ සිම්රන් හෙට්මයර් ලකුණු 21ක් ඉනිමට එක් කළ අතර, සෙසු පිතිකරුවන්ට ලකුණු 20 සීමාව පසු කිරීමට හයිද්‍රාබාද් පන්දු යවන්නන්ගෙන් ඉඩක් නොලැබිණි.

දක්ෂ පන්දු යැවීමක නිරත වූ රිෂාඩ් ඛාන් ලකුණු 14කට කඩුලු 3ක් දවා ගනිමින් තරගයේ වීරයා සම්මානය දිනා ගත්තේය. බුවනේෂ්වර් කඩුලු 2ක් බිඳ දැමීය. හයිද්‍රාබාද් ඉනිමට සාර්ථක ආරම්භයක් දුන් නායක ඩේවිඩ් වෝනර් සහ ජොනී බෙයාර්ස්ටෝව් පළමු කඩුල්ලට ලකුණු 77ක් එක් කළහ. වෝනර් හතරේ පහර 3ක් සහ හයේ පහර 2ක් සමඟ පන්දු 33කින් ලකුණු 45ක් සහ බෙයාර්ස්ටෝව් පන්දු 48කින් ලකුණු 53ක් ඉනිමට එක් කළහ. වේගවත් ඉනිමක් දියත් කළ කේන් විලියම්සන් හතරේ පහර 5ක් සමඟින් ලකුණු 41ක් රැස් කළේ පන්දු 26කි. පන්දු යැවීමේදී කගීසෝ රබාඩා සහ අමිත් මිෂ්රා කඩුලු 2 බැගින් දවා ගත්හ.

## සැහැල්ලු පන්දු ක්‍රිකට් 4 දා හාලිඇළදී

**සොරණාතොට සමූහ**

හාලිඇළ බෝගහමඩිත්ත ශ්‍රී යුත් සුභසාධක සමිතියේ 7 වැනි සංවත්සරය නිමිත්තෙන් සංවිධාන කරන සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය මේ මස 4 වැනිදා හාලිඇළ ඩෙන්සිල් කොබ්බෑකඩුව ක්‍රීඩාංගණයේදී පැවත්වේ.

# අඩු පහසුකම් සහිත පාසල් 12කට සිලෝන් ක්‍රිකට් පදනමෙන් ක්‍රීඩා භාණ්ඩ



මෙරට පාසල් ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් දක්වන සිලෝන් ක්‍රිකට් පදනම අඩු පහසුකම් සහිත පාසල් සඳහා ක්‍රිකට් භාණ්ඩ හා ක්‍රීඩා ඇඳුම් බෙදාදීමේ වැඩසටහන යටතේ පසුගියදා ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් තවත් පාසල් 12කට ක්‍රිකට් භාණ්ඩ බෙදාදීම සිදු කෙරිණි. ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේ පැවැති එම වැඩසටහනට ශ්‍රී ලංකා ක්‍රිකට් නායක දිමුත් කරුණාරත්න, හිටපු ක්‍රිකට් ක්‍රීඩක නුවන් කුලසේකර සහ චාමර කපුගෙදර සමඟ සිලෝන් ක්‍රිකට් පදනමේ නියෝජිත මහත්වරු ද සහභාගි වූහ.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

## 42 වන ඔබ්සවර් - මොබිටෙල්

### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ........................

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: ........................

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : ........................

ඔබේ නම : ........................

ලිපිනය : ........................

ජංගම දුරකථන අංකය : ........................

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**


**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-10-03 **අංකය** 30




2020 ඔක්තෝබර් 01 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# කරමඩ අරියතිස්ස නාහිමිගේ 13 වන ගුණ සමරුව





සංවර්ධනය කර ඇති විහාරස්ථානය



*(ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ ජ්‍යෙෂ්ඨ සංඝ සභික, ගෙලිඔය කරමඩ ශ්‍රී සද්ධාතිස්ස පිරිවෙනේ හිටපු පරිවේණාධිපති කරමඩ අරියතිස්ස නාහිමිගේ 13 වැනි ගුණ සමරුව සහ ගෙලිඔය කරමඩ ශ්‍රී සද්ධාතිස්ස මහා පිරිවෙනේ 2020 කඨින චීවර පින්කම නිමිත්තෙනි.)*

සැරියුත් මුගලන් පෙළපතින් පෝෂණය වූ බුදුදහම අද වනතුරු පවතින්නේ සුපේෂල ශික්ෂාකාමී මහා සඟරුවන නිසාය. ඒ අනුව යමින් සිරි ලක බුදු සසුන බැබළවූ මහනුවර ගෙලිඔය ශ්‍රී සද්ධාතිස්ස විද්‍යාප්‍රදී පරිවේණාධිපති, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝ කරමඩ අරියතිස්ස මහා නාහිමියෝ 1949 මාර්තු මස පළමු වැනිදා පැවිදි දිවියට ඇතුළු වූහ. පසුව උන් වහන්සේ මූලික බණ දහම් හදාරා වයස අවුරුදු 20 වන විට ධර්ම ශාස්ත්‍ර අධ්‍යාපනය ලබා 1954දී උතුම් වූ අධිශීල සංඛ්‍යාත උපසම්පදා ලබා ගත්හ.

විහාරස්ථානය ආගමික මධ්‍යස්ථානයක් පමණක් නොව අධ්‍යාපනය ලබා දෙන මධ්‍යස්ථානයක් බවට පත් කර 'අරලිය' ළදරු පාසල, ශ්‍රී සුචරිත දහම් පාසල ආරම්භ කරන ලදි. 1982දී කරමඩ සද්ධාතිස්ස විද්‍යාප්‍රදීප පිරිවෙන ආරම්භ කර ගිහි පැවිදි විශාල පිරිසකට එයින් සෙත සලසා දෙන ලදි.

ග්‍රාමෝදය මණ්ඩල සභාපති ලෙස දුගී ජනතාව වෙනුවෙන් මංමාවත් ඉදිකිරීම, ඇළවේලි තැනීම, පාඨශාලා ආරෝග්‍ය ශාලා ඉදිකිරීම, නිවාස ඉදිකිරීම, රැකියා ලබාදීම වැනි සංවර්ධන කටයුතු රැසක් ඉටු කළ උන් වහන්සේ විහාරස්ථාන 05ක් සංවර්ධනය කර සසුනට හිමිවරුන් 20 නමක් දායාද කර 2007 ඔක්තෝබර් මස 01 වැනිදා අපවත් වූහ.

උන් වහන්සේගේ අපවත් වීමෙන් පසු ප්‍රඥාරතන මහා විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිව සිටි ශ්‍රී වේළුවනාරාමාධිපති, උඩුනුවර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ගලහා සිරි ශාන්ත නාහිමි එම හිඩැස පිරවීමට අප්‍රමාණ වෙහෙසක් ගත් බව නොරහසකි.

**සටහන හා ඡායාරූප**
**ගඟඉහළ සමූහ - ජගත් ජනප්‍රිය**



'ජනප්‍රබුදු' පෙර පාසල



ශාසනික අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන ජගත් නිරෝෂ යාපා වෙද මහතා

**අද (01) - පසළොස්වක පෝදා**
**ධර්ම දේශනය සහ ආලෝක පූජා**

**04 වැනිදා - දවස පුරා ලේ දන් දීමේ මහා පින්කම**

**08 වැනිදා - කඨින චීවරය පෙරහරකින් විහාරස්ථානයට වැඩමවීම**
**දහවල් මහා සංඝ රත්නය වෙනුවෙන් දානමය පින්කම**



ගලහා සිරි ශාන්ත නාහිමි

කපිල සෝමරත්න - පාණදුර සමූහ

# පිහි ඇනුමක් සිදු කර මරණ දඬුවම් ලැබූ වින්තිකරු අල්ලයි



මිනිස් ඝාතනයක් බෙල්ලන්විලදී සිදු කිරීම සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයෙන් මරණ දණ්ඩනය නියම වීමෙන් පසුව සැඟවී සිටි වින්තිකරුවකු 29-09-2020 දින මොරොන්තුඩුව පොලීසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

ක්‍රිෂාන් පෙරේරා නමැති (44) මෙම පුද්ගලයාට මරණ දඬුවම කොළඹ මහාධිකරණයෙන් නියම වී ඇත්තේ දැනට මාස කිහිපයකට පෙරය ඔහු වරදකරු වී ඇත්තේ බෙල්ලන්විලදී දේවගේ සුරංග කුමාර නමැත්තාට වර්ෂ 2010දී පිහියකින් ඇන මරා දැමීම සම්බන්ධයෙන් මෙම නඩු කොළඹ මහාධිකරණය විසින් විභාග කර ඇත්තේ මෙම වින්තිකරු නොමැතිවය. ඔහු අධිකරණ නඩු විභාගයට නොපැමිණ රියැදුරකු වශයෙන් සේවය කරමින් සිටියදී කොළඹ මහාධිකරණය විසින් නඩුව විභාග කර නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරමින් අධිචෝදනාවට වරදකරු කර ඔහු මරණ දඬුවම නියම කර ඇත.

අනතුරුව ඔහු මොරොන්තුඩු ප්‍රදේශයේ සැරිසරමින් සිටියදී මොරොන්තුඩුව පොලීසියේ නිලධාරීන් විසින් සැකපිට අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී ඉහත සඳහන් කරුණ අනාවරණය විය. සැකකරු පාණදුර අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

පී.පී.පී. සුගතදාස - තිහගොඩ සමූහ





# ධම්මසේන හිමියෝ 16 වැනි නිවෙසත් අසරණ පවුලකට බාර දෙති

මාතර කෝට්ටේගොඩ බෙලිවත්ත ශ්‍රී සුධර්මාශ්‍රමාධිපති ශාස්ත්‍රපති බුද්ධියාගම ධම්මසේන හිමිගේ ඉල්ලීම පරිදි එතෙර පදිංචි ශ්‍රී ලාංකිකයකුගේ ධන පරිත්‍යාගයෙන් බුත්තල ඔක්කම්පිටිය නිමාලි රේණුකා මහත්මිය ඇතුළු දූවරුන් 3ක් සිටින, පියා නැති අසරණ පවුල වෙත නිවෙසක් සාදා පරිත්‍යාග කිරීමේ පින්කමක් සිදු කෙරිණි. මෙම නිවෙස බුද්ධියාගම ධම්මසේන හිමිගේ මූලිකත්වයෙන් සාදා දුන් 16 වැනි නිවෙසයි. පීටර් ලේන් මහතාට මොක් සුව පතා ස්විඩනයේ පදිංචි බිරිය හිමාලි ලේන් මහත්මිය ඇතුළු දරු පවුලේ සැමගේ දායකත්වයෙන් මෙම නිවෙස සාදා පරිත්‍යාග කෙරිණි.

සෝමරත්න පොත්දෙණිය - මීගහතැන්න සමූහ

# මෝල්කාව - කෙළින්කන්ද පාර සංවර්ධනය වෙයි



දශක හතරක පමණ කාලයක සිට සංවර්ධනය නොවුණු පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෝල්කාව - කෙළින්කන්ද මාර්ගය සංවර්ධනය කිරීමේ පොරොන්දුව ඉටු කරමින් පසුගියදා (18) සංවර්ධන කටයුතු ආරම්භ විය.

පාලින්දනුවර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ මෝල්කාව, මාකෙළිය හරහා කෙළින්කන්ද දක්වා මාර්ගය සංවර්ධනය කර දෙන බවට පසුගිය මැතිවරණයේදී වරාය හා නාවික අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මහතා ප්‍රදේශයේ ජනතාවට දුන් පොරොන්දු ඉටු කරමින් මෝල්කාවේ සිට කිලෝමීටර් 13.2ක දුර ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට නියමිතය. මේ සඳහා රජය වැය කරන මුදල රුපියල් මිලියන 204.86කි.

මාර්ග සංවර්ධන අධිකාරිය පසුගියදා මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ කළ අවස්ථාවට බස්නාහිර හිටපු පළාත් සභා මන්ත්‍රී රෝහණ අබේගුණවර්ධන මහතාද සහභාගි විය. කෙළින්කන්ද, පොල්වත්තහේන, යාල මැඩිය සහ වලකඩ ඇතුළු ගම්මාන රැසක ජනතාවට මෙමගින් සෙත සැලසෙන බව ප්‍රදේශයේ ජනතාව කියති.

කොස්ගුලන, මාකෙළිය, පොල්වත්හේන, කෙළින් කන්ද යාලමැඩිය ඇතුළු ගම්මාන ගණනාවක ජනතාවට පාසල් දරුවන්ට මෙමගින් ප්‍රවාහන පහසුව ලැබෙන බව ප්‍රදේශවාසීහු කියති. මාකෙළිය ඇල්ල සංචාරක නැරඹුම් මධ්‍යස්ථාන වෙත පැමිණෙන සංචාරකයන්ට ද මේ හරහා විශාල පහසුකමක් ලැබෙන බව ප්‍රදේශවාසීහු පවසති.

රූපිකා කේ. බණ්ඩාර - කුරුවිට සමූහ

# කුරුගඟෙන් එගොඩ වූ පහුර ගංවතුරට ගසාගෙන ගිහින්

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උතුරු එක්නැළිගොඩ හා දෙවිපහළ වසම් යා කරන කුරුගඟේ මැදවල තොටුපළෙන් එගාඩමෙගොඩ ගිය උණ ලී පහුර ගංවතුරට ගසාගෙන යෑම නිසා ගම්වැසියෝ කබලෙන් ළිපට වැටී සිටිති. මෙසේ යන එන මං නැතිව සිටින ගම්වැසියන් විකල්ප මාර්ගයක් යොදාගන්නේ නම් සැතපුම් ගණනක් දුර යායුතු බැවින් තවකාලිකව උණ ලී කීපයක් ගැටගසා පහුරක් සාදාගෙන අවදානම් ගමනක යෙදෙයි. තවත් අයෙක් දියේ පීනා ගඟ තරණය කරති. මෙම වසම් දෙකට අයත් උතුරු එක්නැලිගොඩ, පන්නම, කන්දඋඩ, දෙවිපහළ, හේන්යාය, පුවක්වත්ත ප්‍රධාන කොටගත් ගම්මානවල වැසියන් මෙම ස්ථානයට අඩු තරමේ කම්බි පාලමක් හෝ ලබාදෙන ලෙස ඉල්ලීම් කරන්නේ දිගුකලක සිටය. පාසල් දරුවන්ද මෙම අවදානම් ගමනේ කොටස්කරුවන්ය. ඔවුන්ගේ පොත්පත්, පාසල් උපකරණ ගංදියේ ගසාගෙන ගිය වාර අනන්ත බව ප්‍රදේශවාසීහු සඳහන් කරති. මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ කුරුවිට ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා පැවසුවේ මෙවැනි අදහසකි.

"මෙතැන පාලමක් අත්‍යවශ්‍ය තැනක්. දැනට වසර දහයකට පමණ පෙර මෙම ස්ථානය මැනගෙනත් ගියා. ඊට පස්සෙ දැනට වසර තුනකට පමණ පෙරත් නිලධාරීන් පැමිණ ගඟ මැන්නා. එම නිලධාරීන් කිව්වේ දැනට සවිකිරීමට තිබෙන පාලම් දිගින් අඩු නිසා මෙම ස්ථානයට සවි කළ නොහැකි බවයි. පවත්මන් රජයෙන් සිදු කරන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ හෝ මෙම ස්ථානයට පාලමක් ඉදිකර දෙන ලෙස ජනතාව ඉල්ලා සිටිනවා. මෙය කෘෂිකාර්මික මාර්ගයක්ද වන බැවින් සුළු ගොවිතැන් කටයුතුවලට වුවමනා පොහොර හා උපකරණද රැගෙන යන්නේ මෙතැනින්. විහාරස්ථානයේ කඨින පින්කම දිනයට කඨින චීවරය රැගත් පෙරහර යන්නේද මෙතැනින්. එක් අවස්ථාවක අනතුරකට ලක් වීමට ගොස් බේරුණේ අනූනවයෙන්. කුඩා දරුවන්ද අවදානම නොසලකා පහුර පදිනවා."

# බුද්ධයාය ඇළ සංවර්ධනයට කියා පොල් ගස් 1,500ක් ගලවලා

මින්නේරිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් හිඟුරක්ගොඩ බුද්ධයායේ ඇළ මාර්ගයක් සංවර්ධනය කිරීමට යැයි පවසමින් පොල් ගස් 1,500ක් පමණ ගලවා විනාශ කර දමමින් සිටින බව බුද්ධයාය පැරකුම් ගොවි සංවිධානයේ ගොවීහු කියති.

මේ පිළිබඳ අදහස් දක්වමින් හිඟුරක්ගොඩ බුද්ධයාය ඩී-5 ඇළ මාර්ගයේ පැරකුම් ගොවි සංවිධානයේ නියෝජිත එම්.ජී. ලොකු බණ්ඩා මෙසේ අදහස් පළ කර සිටියේය.

'මේක හෙන ගහන අපරාධයක් මේ වාරිමාර්ග නිලධාරීන් කරන්නේ. ඇළ මාර්ගයක් සංවර්ධනය කරන්න ඕනි මුලින්. නමුත් දැන් කරන්නේ මුල සහ අග ඉතුරු කරලා මැදින් පටන් අරන් තමයි මේ අපේ ඇළ ඉවුරේ තියෙන පොල් ගස් 1500, 2000ක් විතර විනාශ කරන්න හදන්නේ. මේ වන කොට මාගේ පොල් ගස් 100ක් විතර ගලවා විනාශ කරලා ඉවරයි. ඒ වාගේම අනිත් අයගෙත් පොල් ගස් මේ වන විට 200ක් විතර ගලවලා දලා ඉවරයි. තව බැකෝ 4ක් දාලා පොල් ගස් 1500 - 2000ක් විතර ගලවමින් තියෙන්නේ. ඇයි දෙයියනේ මුන්ට පෙන්නේ නැද්ද පොල් ගෙඩිය මැනලා දෙන තත්ත්වයට පත් වුණේ පොල් හිඟ නිසා කියලා. කරන සංවර්ධනයක් කරන්න පොල් ගස් ටික කපන්නේ නැතුව. අපි සිරිපාල ගම්ලත් ඇමැතිතුමාත් හමු වුණා ගිහිල්ලා එත් වැඩක් වුණේ නෑ. මුළු හිඟුරක්ගොඩටම පොල් දෙන්න පුළුවන් පොල් ගස් ටික තමයි මේ වාරිමාර්ග එකේ හරක් ටික ගලවලා විසි කරලා දානනේ. දෙයියනේ මේවා බලන් ඉන්න බෑ. වහ ටිකක් කාලා මැරෙන්න හිතෙනවා.

ටී.එල්.ඒ.පී. හේමපාල - නාගොඩ සමූහ

# ජලභීතිකා මාරයා පාසල් සිසුවකු බිලි ගනී

ජලභීතිකා රෝගය වැළඳීමෙන් මාපලගම ප්‍රදේශයේ පාසල් සිසුවකු මියගොස් ඇත. මෙසේ මියගොස් ඇත්තේ වයස අවුරුදු 13ක් පමණ වන කුඹුරුහේන ප්‍රදේශයේ පදිංචිව සිටි ජී. ගවේෂ් නෙත්සර නමැති පාසල් සිසුවෙකි. මෙම සිසුවා පාපැදියකින් උපකාර පන්ති යමින් සිටියදී බල්ලකු සපා කා ඇති බව මවුපියන්ට පවසා ඇත.

ගාමිණී බී. දිසානායක - හාරිස්පත්තුව මධ්‍යම විශේෂ

# මත්ද්‍රව්‍ය ළඟ තබාගත් සැක තිදෙනකුට නඩු

පසුගියදා කටුගස්තොට පොලිස් බල ප්‍රදේශය තුළදී හෙරොයින් ළඟ තබාගත් සැකකරුවන් දෙදෙනකු සහ ගංජා ළඟ තබාගත් සැකකරුවකු අදාළ නඩුභාණ්ඩ සමඟ අත්අඩංගුවට ගෙන මෙම සැකකරුවන් තිදෙනාට එරෙහිව මහනුවර ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා තිබිණි.

මොවුන් වැරදිකරුවන් කිරීමෙන් අධිකරණය රු 20,000 අයකර දීමට සමත්වී ඇත.

මෙම හෙරොයින් ළඟ තබාගැනීමේ වරදට එක් සැකකරුවකු රණවන ප්‍රදේශයේදීත්, අනික් සැකකරු කලුගල ප්‍රදේශයේදීත් අත්අඩංගුවට ගෙන ඇති අතර මොවුන් දෙදෙනාට එක් අයකුට රු. 7,500 බැගින් දඩ නියම කර ඇත. ගංජා ළඟ තබාගත් සැකකරු බොලේගොඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහුට රු. 5,000 දඩ මුදලක් ගෙවීමට නියෝග කර ඇත. මෙම සාර්ථක වැටලීම් කටුගස්තොට පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක උවේන්ද්‍රසිරි සහ දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න යන මහත්වරුන් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් සමඟ සිදුකර ඇත.

# දිසත
දිනමිණ
දස අත ම එක තැන





■ සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ-සමූහ මහානාම විතානගේ - මල්වාන සමූහ

## සපුගස්කන්ද සෝභිත විද්‍යාලයට වසර 155ක් පිරීම නිමිත්තෙන් පරිත්‍රාණ ධර්ම දේශනාවක්



සපුගස්කන්ද සෝභිත විද්‍යාලයට වසර 155ක් පිරීම නිමිත්තෙන් හා මෙවර පහ වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින සිසු දරුවන්ට ආශීර්වාද පතා සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් පසුගියදා (27) විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. විදුහල්පති තිලකරත්න ලියනගේ මහතාගේ උපදේශකත්වයෙන් ගුරු මණ්ඩලය, පාසල් සංවර්ධන සමිතිය හා ශාන්ති සංවිධානය විසින් මෙම පින්කම සංවිධාන කර තිබිණි. මහා සංඝ රත්නය පෙරටු කරගනිමින් විදුහල්පති තුමන් විසින් සධාතුක ධාතු කරඬුව වැඩමවූ අයුරු හා සිසු දරුවන් පිරිත් පින්කමට සහභාගි වූ අයුරු.

■ මහානාම විතානගේ මල්වාන සමූහ

## හෙරොයින් ජාවාරමේ යෙදුණු කතක් අත්අඩංගුවට

හෙරොයින් ජාවාරමේ යෙදුණ 23 හැවිරිදි තරුණ කාන්තාවක් සපුගස්කන්ද පොලීසිය මගින් 27 වැනිදා දහවල් පමුණුවිල , රණවිරු මාවත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන තිබේ. මේ අවස්ථාවේ එම කාන්තාව ළඟ තිබී හෙරොයින් ග්‍රෑම් එකයි මිලි ග්‍රෑම් හාරසීයක් ද පොලිස් භාරයට ගෙන ඇත.

දෙකටන, පැලහැල ප්‍රදේශයේ පදිංචි එම කාන්තාව පමුණුවිල, රණවිරු මාවත ප්‍රදේශයේ නේවාසිකාගාරයක නවාතැන් ගෙන මෙම ජාවාරම සිදු කර තිබෙන බවට ද අනාවරණය විය.

■ බී.එම්.විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## නොසැලකිල්ලෙන් රිය පදවා පියකුට සහ දියණියකට මරු කැඳවූ දොස්තර රිමාන්ඩ්

අපරික්ෂාකාරී අන්දමින් රිය පදවා ත්‍රිරෝද රථයක ගමන්කළ දියණියකට හා පියකුට මරු කැඳවීමේ සිද්ධියට අනුරාධපුර ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී පොලිස් රථවාහන අංශය මගින් සැකපිට අත්අඩංගුවටගත් අනුරාධපුර ශික්ෂණ රෝහලේ සේවයේ නියුතු වෛද්‍යවරයා (30දා) දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකරන ලෙස අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු එන්.ටී.හේමන්ත පුෂ්පකුමාර මහතා (27දා) නියෝග කළේය.

මෙසේ රක්ෂිත බන්ධනාගාරගත කෙරුණේ අංක 21/45/ඒ/3 විජය මාවත ඉසුරුපුර ලිපිනයේ පදිංචි වෛද්‍ය පුංචිහේවාගේ අසංක ප්‍රේමසිරි සේනානායක (37) යන අයයි. සැකකාර වෛද්‍යවරයා අනතුරෙන් තුවාල ලබා රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටියදී රෝහලට ගිය විනිසුරු වරයා ඔහුව රක්ෂිත බන්ධනාගාරගත කිරිමට නියෝග කළ අතර ඔහුට බන්ධනාගාර රැකවල් යටතේ ප්‍රතිකාර කරන ලෙස අනුරාධපුර බන්ධනාගාරයේ අධිකාරිවරයාට නියෝග කළේය.

අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ අනුරාධපුර ශ්‍රාවස්තිපුර හංදියට මදක් නුදුරෙන් (27දා) අලුයම වෛද්‍යවරයා ඇතුළු පවුලේ උදවිය ගමන්කළ මෝටර් රථය ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි කාන්තාවක් පැදවූ ත්‍රීරෝද රථයේ ගැටීමෙන් සිදුවූ අනතුරෙන් දෙදෙනකු ජීවිතක්ෂයට පත්වී තවත් දෙදෙනකු බරපතළ තුවාල ලැබිය.

■ ඩබ්ලිව්.පී. ධර්මසේන - මාතර සමූහ

## මරණ දඬුවම නියමව සිටියදී හිරෙන් පැන්න පුද්ගලයෙක්

# වසර 4කට පසු දෙවිනුවරදී අල්ලයි

මරණීය දණ්ඩනය නියමවී සිටියදී බන්ධනාගාර නිලධාරින්ගෙන් මිදී පලාගොස් සිටි සිරකරුවකු වසර 4කට පසුව මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇත. පසුගිය 27 වැනි දින දෙවිනුවරදී මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ දෙවිනුවර පට්ටියහේන පදිංචි ඩබ්ලිව්.එච්. ටිරාන් බාරත නැමති 43 හැවිරිදි අයෙකි. 1998 වර්ෂයේදී දෙවිනුවර ලංකා බැංකුව අසලදී ගිනි අවියකින් වෙඩිතබා ඩබ්ලිව්. කේ.එච්.අමරසේන නැමති අයකු ඝාතනය කිරීමේ චෝදනාව යටතේ මෙම පුද්ගලයා ඇතුළු තිදෙනකුට පවරා තිබූ මිනිමැරුම් නඩුවේ චෝදනා ඔප්පුවීම නිසා 2012- 05 - 31 වැනි දින මහාධිකරණය විසින් තිදෙනාටම මරණීය දණ්ඩනය නියම කර තිබිණි.

මොවුන් මෙම දඬුවමෙන් පසු වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිට ඇති අතර මෙම ටිරාන් බාරත නමැති මෙම සිරකරුට වැළඳුණු අක්ෂි රෝගයක් සඳහා කොළඹ රෝහලක ප්‍රතිකාර ලබමින් සිටියදි 2016 - 09 - 16 - වන දින බන්ධනාගාර නිලධාරින්ගෙන් මිදී පලාගොස් සැඟවී තිබිණි. මොහු මෙම කාලය තුළ වෙස්වළාගෙන නුවරඑළිය, තංගල්ල, යන ප්‍රදේශවල රුපියල් 15000 ක් වැනි මාසික වේතනයකට හෝටල්වල සේවය කර ඇති අතර එම කාලය තුළ ඔහුගේ අනන්‍යතාව හෙළි කර නැත. මොහු හම්බන්තොට ප්‍රදේශයේ කැලයකට වී වගා කටයුතු කරමින් කාලය ගතකොට ඇති අතර ඔහු පසුගිය දිනක ඇළකට ගොස් ඇඟ පත සෝදන අවස්ථාවේ එම ප්‍රදේශයේ දී කඳවුරක හමුදා නිලධාරීන්ට ඇහැ ගැටීමත් සමග ඔහු වසර 4කට පසුව දෙවිනුවර නිවෙසට පැමිණි දින කිහිපයක් තිස්සේ සැඟවී සිට ඇත.

මෙම අවස්ථාවේ පොලිස් සැරයන් 55868 තුෂාර මහතාට ලැබුණු තොරතුරක්මත පසුගිය 27 වැනි දින රාත්‍රි 11.15 ට පමණ පොලිස් නිලධාරීන් මොහුගේ නිවෙස වටලා සිරකරු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.දකුණු පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රෝහාන් සිල්වා, මාතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චන්දන හේරත්, මාතර පොලිස් අධිකාරී (1) විජේවර්ධන, යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජේ. ඒ. සමන් මහතාගේ මෙහෙය වීමෙන් උ.පො. ප. ජේ. පතිරත්න, උ. පො.පා. ගමගේ, පො.සැ. 15314 සමන්ත කුමාර, පො. සැ. 52590 සමන්ත, පො.සැ. 28492 දසනායක,. පො.සැ. 27904 කළුතොට, පො.සැ. 55868 තුෂාර , පො.සැ. 63341 කරඳගොඩ, පො.කො. 91712 සඳරුවන්, පෙ.කො. 93683 රත්නායක, පො.කො.රි. 14562 සම්පත් යන නිලධාරින් මෙම වැටලීම සිදුකර ඇත.



■ ආර්. රාජමන්ත්‍රී - වැලිමඩ සමූහ

## පටක රෝපණ තාක්ෂණයෙන් වගා කළ බීජ අර්තාපල් අස්වැන්න සාරයි

අර්තාපල් ගොවීන්ට උසස් ගුණාත්මක බීජ අර්තාපල් අඩු මිලකට ලබාදීමේ අටියෙන් ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බණ්ඩාරවෙල පර්යේෂණ මධ්‍යස්ථානය හා සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය එක්ව පටක රෝපණ තාක්ෂණය භාවිතා කර නිෂ්පාදනය කළ බිජ අර්තාපල් වගා කළ කැප්පෙටිපොළ වක්කඩ හීන්න ගොවීන් තම අස්වනු ගැලවීම මේ දිනවල සිදු කෙරේ.

වගා කන්නයෙන් කන්නයට විදේශ බිජ අර්තාපල් මිල ඉහළ යෑම ගුණාත්මක බවින් අඩුවීම මත අස්වනු ප්‍රමාණය අවම වීම යන කාරනා මත අර්තාපල් ගොවීන් මුහුණ දී සිටි ගැටලුව විසඳාලීමේ අටියෙන් රසායනාගාර තුළ නව පටක රෝපණ තාක්ෂණය භාවිතා කරමින් පෙර මූලික බීජ අර්තාපල් නිෂ්පාදනය කර ඇත. ඌවපළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදිත (ჱ 01) බීජ අර්තාපල් අලයක් රුපියල් හයක මුදලකට ගොවීන්ට අලෙවි කරන බව පැවසේ. එසේ ගොවීන් ලබා ගන්නා බිජ අර්තාපල් තම වගාභූමිවල ප්‍රවර්ධනය කරනු ලබයි.

එසේ ගොවීන් විසින් කැප්පෙටිපොළ වක්කඩ හින්න වගාබිම්වල ප්‍රවර්ධනය කරමින් වගාකරන ලද දේශීය බීජ අර්තාපල් එකට දොළහක ඉහළ මට්ටමක අස්වැන්නක් පැවති බවත් බීජ අර්තාපල් හොන්ඩරයක් (කිලෝ 50) වගාකිරිමට රුපියල් 15000 පමණ මුදලක් වැයවී ඇතැයිද නමුත් විදෙස් බිජ අර්තාපල් හොණ්ඩරයක් (කිලෝ 50) වගාකිරිමට රුපියල් 25000ට වඩා වැඩි මුදලක් වැය වන බවත් අර්තාපල් ගොවීහු පවසති. ඒ අනුව උසස් ගුණාත්මක දේශීය බීජ අර්තාපල් වගා කිරීමෙන් ඉහළ අස්වැන්නක් ලැබීම හා වියදම අඩුවීම යන කාරණා මත තම ආදායම ඉහළ මට්ටමක පවතින බව ගොවීහු පවසති.



■ හැටන් මධ්‍යම විශේෂ

## මාර්ගයට කඩා වැටුණ ගල් පර්වතය කඩා ඉවත් කරයි

හැටන් කොළඹ ප්‍රධාන මාර්ගයේ ගිනිගත්හේන රම්පාදෙණිය ප්‍රදේශයේ මාර්ගයට කඩා වැටුණ ගල් පර්වතය කඩා ඉවත් කර මාර්ගය යථා තත්වයට පත් කිරීමට පියවර ගෙන ඇත.

24 වැනි දින උදෑසන 7.00ට පමණ මෙම ගල් පර්වතය මාර්ගයට කඩා වැටීමත් සමග එම මාර්ගයේ රථ වාහන ධාවනය මුළුමනින්ම ඇන හිටින ලදී. මෙම ගල් පර්වතය කඩා වැටීමත් සමග ගිනිගත්හේන පොලීසිය ලක්ෂපාන හා හැටන් කොමර්ෂල් යුද හමුදා කඳවුරුවල හට පිරිස් මාර්ග සංවර්ධන අධිකාරියේ පිරිස්ද සමග එක්ව ගල් වෙඩි දමා ගල කඩා ඉවත් කර මෙම මාර්ගය යථා තත්වයන්ට පත් කිරීමට පියවර ගන්නා ලදී.

මෙම ගල් පර්වතය කඩා වැටීමත් සමග හැටන් කොළඹ මාර්ගය අවහිර වීමෙන් 24 වැනි දින උදෑසන සිට එම මාර්ගයේ ධාවනය කරනු ලබන රථ වාහන දියගල නෝර්ටන්, කලුගල හරහා ධාවනය කරවීමට පියවර ගෙන තිබිණි.

■ පෝද්දල සමූහ

## දිළිඳු පවුල්වලට සනීපාරක්ෂක පහසුකම්

බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සනීපාරක්ෂක පහසුකම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැලසීමට පියවර ගෙන ඇත.

ඒ අනුව මෙම වැඩපිළිවෙළ යටතේ සනීපාරක්ෂක ඒකක පනස් නවයක් ඉදිකර දීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව බෝපේ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් ප්‍රභාෂි විදානපතිරණ මහත්මිය පැවසුවාය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තෝරාගත් පවුල් වෙනුවෙන් මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කොට ඇති අතර දැනටමත් මෙහි මූලික වැඩ කටයුතු සිදුකරගෙන යන බවත් ප්‍රාදේශීය ලේකම් වරිය පැවසුවාය.

■ සේන වේරගම - කලවාන සමූහ

## දෙල්ගොඩ රක්ෂිතයෙන් වෙනිවැල් සහ කොකුම්පොතු කැපූ පුද්ගලයෙක් අත්අඩංගුවට

දෙල්ගොඩ සංරක්ෂිත වනාන්තරයට අනවසරයෙන් ඇතුළු වී වෙනිවැල්ගැට හා කොකුම්පොතු කපා රැගෙන එමින් සිටි පුද්ගලයකු කලවාන අඩවි වන කාර්යාලය මගින් අත්අඩංගුවට ගෙන කලවාන මහේස්ත්‍රාත් අධිකරණයට 23 වැනිදා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් පනස් තුන්දස් දෙසිය පනහක ( 53250) දඩ මුදලක් ගෙවන ලෙස කලවාන මහෙස්ත්‍රාත් දූලාන් වීරවර්ධන මහතා විසින් නියෝග කරනු ලැබිය. මෙයට පෙරද අවස්ථා කිහිපයකදීම සැකකරු කොකුම් පොතු සමග අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර දඩ නියම වූ පුද්ගලයකු බව කලවාන අඩවි වන කාර්යාලය ප්‍රකාශ කළේය. කලවාන අඩවි වන කාර්යාලයේ අඩවි වන නිලධාරී එම්.පී කුමාරනායක මහාතාගේ උපදෙස් මත අඩවි වන නිලධාරීන් මෙම වැටලීම් සිදු කර කොකුම්පොතු හා වෙනිවැල්ගැට සමග සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

■ ගාල්ල දිස්ත්‍රික් සංචාරක ධම්දාස සිරිවර්ධන

## මඟීන් අව්වට වේළෙන වැස්සට තෙමෙන බස් හෝල්ට් එකක්



අම්බලන්ගොඩ ලංකාවේ සුප්‍රසිද්ධ නගරයකි. විවිධ ප්‍රදේශවලින් පැමිණෙන ජනතාව, ප්‍රධාන පාසල් කීපයක පාසල් දරු දැරියන් ඇතුළු දස දහස් ගණනක් ගැවසෙන මෙම නගරයේ අම්බලන්ගොඩ සිට බටපොළ දෙසට යන කුලරත්න පාරේ රොසෙත් රෝහල අසල ඇති බස් නැවතුම රෝහලට යන එන රෝගීන් මෙන්ම තිලකපුර, බටපොළ දෙසට යන මඟීන් ධර්මශෝක දරු දැරියන් ඇතුළු විශාල පිරිසක් රැඳී සිටින බස් නැවතුම්පොළයි.

කුඩා ඉඩ ප්‍රමාණයක වහල සඳහා ටකරමක් යොදා ආවරණ රහිතව සකසා ඇති මෙහි මඟීන්ට ඉඳ ගැනීමට දිරා ගිය වැස්සට තෙත බරිත වන බංකු කැබැල්ලක් තබා ඇත.

අම්බලන්ගොඩින් ඈත ප්‍රදේශවල සිය ගණනින් මනරම් බස් නැවතුම් පළවල් ඉදිකර ඇති හිටපු මහාමාත්‍යවරයාගේ ඇස මේ දෙස යොමු නොවීම මෙන්ම කිසිවකු මේ සඳහා එතුමා නොපෙලඹවීම පුදුමයක් බව පවසන ජනතාව පෙන්වා දෙන්නේ මේ වන විට පාර්ලිමේන්තුවට යවා ඇති හිටපු මහ ඇමැති තුමාට මෙය කජ්ජක් නොවන බවය.

■ නාඋල සමූහ

## වකුගඩු රෝගයට නොමිලේ ප්‍රතිකාර කළ යුතු බවට මහජන අස්සන් ලබාගනිති




මාරන්තික වකුගඩු රෝගය සඳහා රෝහල් වලින් නොමිලේ ප්‍රතිකාර දිය යුතු බවට රජයට බලකරමින් මහජනතාවගෙන් අස්සන් ලබාගැනීමේ ව්‍යාපාරයක් පසුගිය දා (26) නාඋල නගරයේ දී පැවැත්විණි.

අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බලමණ්ඩලය, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලහා හා වකුගඩු රෝග මර්දන ව්‍යාපාරය මෙම වැඩ සටහන සංවිධාන කර තිබිණි.

පැවති සහ පවත්නා කිසිදු රජයකට වකුගඩු රෝගයට නිශ්චිත හේතුවක් පවා සොයා ගැනීමට නොහැකි වීම කණගාටුවට කරුණක් බව මෙහිදී මාධ්‍ය වෙත අදහස් දැක්වූ අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බල මණ්ඩලයේ කැඳවුම්කරු ගල්වැව සිරිධම්ම හිමියෝ කියා සිටියහ.

එයට ප්‍රධාන හේතුව ලංකාවේ පොහොර හා කෘෂි රසායන ගෙන්වන සමාජගම් සමග රජයන් සමීපව කටයුතු කිරිම බව ද උන්වහන්සේ සඳහන් කළහ.

මේ වන විට වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර පවා රෝහල්වල නොමැති තත්ත්වයක් දක්නට ලැබෙන බව කියා සිටි පූජ්‍ය ගල්වැව සිරිදම්ම හිමියෝ අවධාරණය කර සිටියේ මේ සඳහා සටන් කිරීමට සිය සංවිධාන ජනතාවට නායකත්වය සපයන බවයි.



# උප දිසාපතිවරයකු වූ බැද්දේගමේ ලෙනාර්ඩ් වෘකයා

අප රටේ බොහෝ ජනයා ලෙනාඩ් වුල්ෆ් හඳුනන්නේ, ගැමි ජීවිතයේ අතිශයින් දුක්බර පැතිකඩ තාත්විකව නිරූපණය කෙරෙන, 'බැද්දේගම' නවකතාවේ කතුවරයා වශයෙනි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප දිසාපති වශයෙන් ඔහු අපක්ෂපාතීව හා අදීනව සිය රාජකාරිය ඉටු කිරීමේ ප්‍රතිඵලය වූයේ, පාලක පක්ෂයේ මෙන් ම දූෂිත නිලධාරීන්ගේ ද ව්‍යාජ චෝදනාවලට ලක් වීමය. ඒ පිළිබඳ කනස්සල්ලෙන් හා කලකිරීමෙන් පසු වූ අවංක මෙන්ම මානව දයාවෙන් යුත් පාලකයෙකු වූ ඔහු, නිවාඩුව ගත කිරීමට පෙරළා සියරට ගිය ගමනේදීම, තම රැකියාවට සමු දුන්නේය.

පෙරදිග සිවිල් සේවා විභාගයෙන් සමත්ව 1904 වසරේදී ලංකාවට සපැත් වුල්ෆ්, මුලින්ම අනුයුක්ත කරන ලද්දේ යාපනය කච්චේරියටය. එහිදී අතිරේක රේගු අයකැමි, අතිරේක පොලිස් මහේස්ත්‍රාත් වැනි තනතුරු දැරීමෙන් අනතුරුව, 1970 දී ඔහු දිසාපතිවරයාගේ කාර්යාල සහකාර තනතුරට උසස් වීමක් ලැබීය. එම වසරේදීම මධ්‍යම පළාතේ දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තනතුරට මාරු කරන ලදුව, ඔහු මඳ කලක් එහි සේවය කළේය. ඔහුගේ කාර්යශූරත්වයත්, බුද්ධි මහිමයත් ගැන පැහැදීමට පත් යටත්විජිත භාර ලේකම්වරයා වූ ශ්‍රීමත් හියු ක්ලිෆර්ඩ්, 1908 වසරේ අගෝස්තු මසදී හම්බන්තොට දිස්ත්‍රික්කය භාර උප දිසාපතිවරයා වශයෙන් පත් කරන ලද්දේ, උසස්වීමක් ලෙසටය. එම දිස්ත්‍රික්කයේ පරිපාලන, අධිකරණ සහ ආදායම් පාලනය යන අංශ භාර ප්‍රමුඛ රාජ්‍ය නිලධාරියා වශයෙන් 1911 මැයි මස දක්වා කෙටි කාලය ඔහු තම නිලයේ රාජකාරි ඉටු කර ඇත්තේ, අසාමාන්‍ය ආකාරයේ කාර්යශූරත්වයක් හා කැපවීමක් විදහාපාමිනි.

වුල්ෆ් තම රාජකාරිය ඉටු කිරීමේදී පළ කර ඇති දක්ෂතාව මෙන්ම, අපක්ෂපාතිත්වය හා අවංකභාවය මැනවින් ප්‍රකට වන්නේ, ඔහුගේ දින පොතේ තබා ඇති සටහන් මඟිනි.

1808 වසරේදී ශ්‍රීමත් තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ නියමයකට අනුව යටත්විජිත පාලනයේ ඉහළ තනතුරු දැරූ සෑම නිලධාරියකු විසින්ම, තමා ඒ දිනයේ ඉටු කළ රාජකාරිය විස්තර කෙරෙන දින පොතක් පවත්වාගෙන යා යුතු විය.

එම නියමය පරිදි වුල්ෆ් විසින් පවත්වාගෙන ගිය දින පොතේ දැක්වෙන සටහන් විමසීමේදී ස්ඵුට වන්නේ, ඔහුගේ සමකාලීන බොහෝ නිලධාරීන්ට වඩා විවෘතව හා අදීනව සිය අදහස් පළ කර ඇති බවය. ඇතැම්විට ඔහු තම උසස් නිලධාරීන්ගේ හා යටත්විජිත පාලනයේ අඩු ලුහුඬුකම් පවා පළ කිරීමට එඩිතර වී තිබේ. එහෙත් බොහෝ රාජ්‍ය නිලධාරින්ගේ ප්‍රතිපත්තිය වී තිබුණේ, පාලකයන්ගේ නියම එලෙසම පිළිපදිමින්ද, පාලිතයන්ට සිදු වන අසාධාරණකම් නොතකා හරිමින්ද, පාලකයන්ගේ සිත් දිනාගෙන තමාගේ වෘත්තීය ජීවිතයේ අනාගත අභිවෘද්ධිය ගැන සිතා කටයුතු කිරීමටය.

වුල්ෆ්ට එබඳු පටු, ආත්මාර්ථකාමී හැඟීමක් අහලකවත් නොතිබිණි. වුල්ෆ්ගේ මේ අපූර්ව චරිත ස්වභාවය අවබෝධ කරගත හැකි වන්නේ, ඔහු හැදුණු වැඩුණු පවුල් පසුබිම හා ඔහුගේ අධ්‍යාපන පසුබිම විමසා බැලීමෙනි. ලෙනාඩ් වුල්ෆ් එංගලන්තවාසියකු වුවද, පාරම්පරිකව පැවැත එන ඉංග්‍රීසි ජාතිකයෙක් නොවීය. ඔහුගේ මුතුන්මිත්තෝ දහනව වැනි සියවසේ මුල් භාගයේ, රුසියාව ආදී වෙනත් රටවලින් එංගලන්තයට සංක්‍රමණය වී, එරට සිය වාසභූමි කරගත් යුදෙව් ජාතිකයෝ වූහ. එකී යුදෙව්වන් සහජ බුද්ධිමත් බව අතින් මෙන්ම, කාර්යශූරත්වය අතින්ද නම් දරා සිටි වෙනම ජන කොටසකි.

එසේම, වුල්ෆ් තම උසස් අධ්‍යාපනය ලද කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයද ඔහුගේ ලිබරල්වාදී චින්තනය හැඩ ගැස්වීමෙහිලා මහත් බලපෑමක් කර තිබේ. එය බ්‍රිතාන්‍ය වාසීන්ගේ සාම්ප්‍රදායකත්වයට සහ සංරක්ෂණවාදී (Conservative) චින්තනයට බරව තිබූ, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයී සම්ප්‍රදායට වඩා වෙනස් වූවකි. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයීය සම්ප්‍රදාය නැඹුරුව තිබුණේ, ලිබරල් මතවාදී චින්තනය ඔස්සේ සමාජයේ ප්‍රගමනයට ඉවහල් වන නව මං සෙවීම කෙරෙහිය. ඉහත සමයේදී කාල් මාක්ස්, සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් බඳු විප්ලවීය මතවාද බිහි කළ නව ධාරාවේ චින්තකයන්ට තෝතැන්නක්ව පැවැති කේම්බ්‍රිජ් සරසවියේ වුල්ෆ්ගේ සමකාලීන සගයන් වූයේ ලිට්න් ස්ටාර්ක්, ජෝන් මේනාර්ඩ්, කේන්ස්, ඊ.එම්. ෆෝස්ටර්, බර්ට්‍රන්ඩ් රසල් වැනි කීර්තිමත් විද්වතුන්ය. ඔවුන් එක්ව බිහි කළ 'බ්ලූම්බරි විද්වත් කවය', නිදහස් චින්තනයේ දොර කවුළු විවර කිරීමෙහිලා ඉටු කළේ මහත් මෙහෙවරකි.

එබඳු සමාජ පසුබිමකින් සහ චින්තන හැඩ ගැස්මකින් පැවතෙන්නකු වූ වුල්ෆ්ගේ පිළිවෙත, ඉහතදී හම්බන්තොට දිසාව පාලනය කළ උප දිසාපතිවරුන්ට වඩා වෙනස් මඟක් ගැනීම පුදුමයක් නොවේ. ලංකාවේ ගිනිකොන දෙසට වන්නට පිහිටි හම්බන්තොට දිස්ත්‍රික්කය හැඳින්වුණේ අති දුෂ්කරම ප්‍රදේශයක් වශයෙනි. එහි පාලනය කෙරුණේ හම්බන්තොට ස්ථානගතව සිටි උප දිසාපතිවරයා මඟිනි. ඔහුට වග කිව යුතු, ඊට ඉහළින් සිටි නිලධාරියා වූයේ, ගාල්ලේ මහ දිසාපතිවරයාය. බටහිර ගිරුවාපත්තුව, නැගෙනහිර ගිරුවාපත්තුව සහ මාගම්පත්තුව යනුවෙන් දිස්ත්‍රික්කය පරිපාලන ඒකක තුනකට බෙදා තිබුණි. ඒ සෑම එකක් ම පැවැතියේ මුදලිවරයෙකුගේ පාලනය යටතේය. ඔහුට පහළින් මුහන්දිරම්, විදානෙආරච්චි, වෙල්විදානෙ ආදි වශයෙන් විවිධ මට්ටම්වල රාජකාරි භාරව සිටි නිලධාරීහු පිරිසක් වූහ. පත්තු තුන අතරින් අනේකවිධ දුෂ්කරතා සහ ගැහැට මැද අන්ත දිළිඳු බවින් පසු වූ ජනයා විසුවේ මාගම්පත්තුවේය. වුල්ෆ්ගේ බැද්දේගම නවකතාවට පසුබිම වී ඇත්තේ, රුදුරු වන සතුන් අරක්ගත්, වන ගහනයට යටව තිබූ ඒ ජනශූන්‍ය පෙදෙස තුළ සිරව සිටිමින්, අන්ත දුඃඛිත ජීවිතයක් ගත කළ ජනයා පිළිබඳ පැතිකඩකි.



එවකට හම්බන්තොට පැවැති පැල්පතක්

වුල්ෆ්ට සිදු වූයේ මෙබඳු අති දුෂ්කර දිස්ත්‍රික්කයක පරිපාලනයට කර ගැසීමටය. එහි දේශගුණය බෙහෙවින් කර්කශ වූ අතර, වනය මැදින් වැටී තිබූ මංමාවත්වල තත්ත්වය පැවැතියේ ඉතා අසතුටුදායක තත්ත්වයෙනි. එහෙයින්, රාජකාරි කටයුතු සඳහා ඈත ගම් දනව්වලට යෑමට ඔහුට සිදු වූයේ අසුපිටින් සහ බයිසිකලයෙනි. එහි බොහෝ පෙදෙස්වල ජනයා උග්‍ර ජල හිඟයෙන් හා නියඟයෙන් මෙන්ම, මැලේරියාව හා පරංගි වැනි වසංගතවලින්ද නිරතුරුව පීඩා වින්දාහ. ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය, වී ගොවිතැන කේන්ද්‍ර කරගත් කෘෂිකර්මය වුවද, වැව් බොහොමයක් නටබුන්ව ගොස් තිබූ අතර, වාරිමාර්ගවල තත්ත්වය බෙහෙවින් අසතුටුදායක විය. මාගම්පත්තුවේ වැසියනට දිවි ගැටගසා ගැනීමට තිබූ එක ම මාර්ගය හේන් ගොවිතැනය. ඔවුන් හේන් වගාව කළේ රජය සතු ලඳු කැලෑ කපා, හෙළිකොට, ගිනි තබා, බිම් සකසා ගැනීමෙනි. එහෙත් රජය ඊට එරෙහිව නිර්දය ලෙස දැඩි තහංචි පනවා තිබූ හෙයින්, ජනයා පත්ව සිටියේ අන්ත දුඃඛිත තත්ත්වයකටය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුහුදුබඩ ප්‍රදේශය දිගටම ලුණු ලේවාය පැතිර තිබිණි. ලුණු නිෂ්පාදනය රජයට ආදායම ගෙන දෙන ප්‍රධාන කර්මාන්තයක් විය. එය අධීක්ෂණය කරමින් රජයට ආදායම් උපදවා දීමද, ඔහු පිට පැවරුණු ප්‍රධාන වගකීමකි. ඒ හැරුණු විට නිල සංචාරවලදී තුරු සෙවණක් යට සංචාරක උසාවි පවත්වා, තත් ප්‍රදේශයේ නඩු විභාග කිරීමේ වගකීම පැවරී තිබුණේ ඔහුටය.

වුල්ෆ් නීතිය අකුරටම පිළිපදින දැඩි ගතිපැවතුම්වලින් යුත් නිලධාරියකු ලෙස ප්‍රකටව සිටියද, ඔහු තුළ සැඟව පැවැති මානව දයාව හෙළි කරන නිදසුන් ගණනාවක්ම ඔහුගේ දින පොත අප හමුවේ තබයි. ගැමියන්ට තම දිවි රැක ගැනීමට තිබූ එකම මාර්ගය වූ හේන් වගාවට එරෙහිව රජය පනවා තිබූ දැඩි නීති, තමාව මහත් අපහසුතාවට පත් කළ බව, ඔහුගේ සටහන් කිහිපයකින්ම පැහැදිලි වේ.

"... බොහෝ ගම් පිළිබඳ සැලකීමේදී පෙනී යන්නේ එක්කෝ ගම අභාවයට යා යුතු බවය; එසේ නොවන්නට නම් හේන් කිරීමට අවසර දිය යුතුය" (දින පොත 1909, ජූලි 21).

"උතුරු වලකඩවල වටිනාකමක් නැති මෙම කැළෑවල් හේන් කිරීම පිණිස ගැමියන්ට ලබා දුනහොත් මිස, තම ගම්වල ඔවුනට යැපීමට දෙයක් ඇත්තේ නැත." (දින පොත, 1909 ජූලි 25).

"මාගම්පත්තුවේ ජනයා පදිංචි කරවීමෙන් පසුව පවා ඔවුනට හේන් අවශ්‍ය වන්නේය යන මතය මම දිගටම දැරුවෙමි" (දින පොත, 1910 පෙබරවාරි 16).

"... එබැවින් මේ ගම්වල හේන් කිරීමට ඉඩදීම නවතා දැමීමට මට සිදු වූ නමුදු මා එසේ කළේ සෑහෙන පැකිළීමක් තොරව නොවේ" (දින පොත, 1910 අගෝස්තු 14).

රජයේ ප්‍රතිපත්තියට අනුගත නොවෙමින්, හේන් කිරීම පිළිබඳ ඔහු ගැමියනට දැක්වූ බුරුල හේතුවෙන්, වරෙක ගාලු දිසාපති ලුෂින්ටන්ගේ උදහසට පවා ලක් වීමට ඔහුට සිදු විය. (දින පොත, 1909, නොවැම්බර් 17) ගැමියන්ගේ අවංක දුක් ගැනවිලි, අඳෝනා කෙරෙහි වුල්ෆ් යහපත් ප්‍රතිචාර දක්වා ඇත්තේ, සංවේදී පාලකයකුගේ ලක්ෂණ විදහා පාමිනි. වරක් පල්ලෙමලලදී ඇඟ බදු ගෙවීම වෙනුවට හිලව් වශයෙන් වැවක් තැනීමේ යෙදී සිටි ගැමියන් පිරිසක් ඔහු හමුවේ නැඟූ අඳෝනාව වූයේ, නියඟය නිසා පොළොව ගල්ව ගොස් ඇති හෙයින්, සෑරීමට අපහසු බවය. එය සත්‍යයක් බව වටහාගත් ඔහු, ඒ කාරිය පසුවට කිරීමට ඔවුනට අවසර දුන්නේ, ඔවුන් කෙරෙහි පහළ වූ අනුකම්පාවෙනි. (දින පොත, 1909 ජූලි 03).

අන්ත දුගී ජනයාගෙන් මාර්ග බද්ද අය කිරීමේ ඇති අසාධාරණත්වය දුටු ඔහු, ඒ ගැන තම නොසතුට සටහන් කර තැබීමට පසුබට වූයේ නැත. මාර්ගය නිරතුරුව භාවිත කරන, යමක් කමක් ඇති අයගෙන් මිස, ඉඳහිට මාර්ගය භාවිත කරන දිළින්දන්ගෙන් එය අය කිරීම නොදැරිය හැකි බරක් ඔවුන් පිට පැටවීමක් බව ඔහුගේ මතය විය. (දින පොත 1910 ජූලි 10) බැද්දේ වැවේදී ඔහු මැලේරියාවෙන් අසාධ්‍යව හුන් දරුවකු රෝහලට යැවීමට කටයුතු යෙදීමෙන් හෙළි වන්නේ, ඔහු තුළ පැවැති අනුන්ගේ දුකෙහිදී සසල වීම පිළිබඳ ලක්ෂණයයි. (දින පොත, 1911 ජනවාරි 13)

සාධාරණය හා යුක්තිය ඉටු කිරීමට අවශ්‍ය වූ තැනදී එය ඉටු කිරීමට වුල්ෆ් නොපැකිළව ඉදිරිපත් වුව ද, ගැමියන්ට හිරිහැර කරමින්, ඔවුන් සූරාකමින් හා තම සේවය පැහැර හරිමින් දූෂිත ආකාරයෙන් කටයුතු කිරීමට ඇබ්බැහිව සිටි, තමා යටතේ සේවය කරන නිලධාරීන්ට නම්, ඔහුගෙන් කිසි විටෙකත් අනුකම්පාවක්, බුරුලක් ලැබුණේ නැත. වරෙක ඔහුට නැගෙනහිර ගිරුවාපත්තුවේ මුදලිවරයා ගැන දිසාපතිවරයාට පැමිණිලි කිරීමට සිදු වූයේ, දිගින් දිගටම සේවය පැහැර හැරීම හේතුවෙනි. එසේම, ගැමියනට ඉටු විය යුතු සේවය මඟ හරිමින්, දූෂිත ලෙස කටයුතු කරන මුලාදෑනීන්ටද ඔහුගෙන් සමාවක් ලැබුණේ නැත. (දින පොත 1909 ජනවාරි 18)

එබඳු අකාර්යක්ෂම නිලධාරීන් ගැන බෙහෙවින් කලකිරීමට පත්ව සිටි ඔහු වරක් යෝජනා කර සිටියේ, මුලාදෑනියකු පත් කිරීම ගැන නිර්දේශ කිරීමට තමාට අවස්ථාවක් ලදහොත්, තමා ඒ සඳහා ගැහැනියක නිර්දේශ කරන බවය. (දින පොත, 1909, මාර්තු 28) එතරම් ඈත කාලයකදී ඔහු කළ ඒ ප්‍රකාශය කොතරම් දූරදර්ශී එකක්ද යන්න, මෙකල සිටින කාන්තා ග්‍රාම නිලධාරිනියන් සංඛ්‍යාව විමසා බැලීමෙන් ස්ඵුට වනු ඇත.

වුල්ෆ්, ඒ අයුරින් වැඩ තහනමට සහ සේවයෙන් පහ කිරීමට පියවර ගනු ලැබූ දූෂිත හා අකාර්යක්ෂම නිලධාරීන්, ඇතැම් විටෙක උප දිසාපතිවරයාට එරෙහිව විවිධ චෝදනා නඟමින්, දිසාපතිවරයාට පෙත්සම් යැවූ බැව් සඳහන්ය. ඇතැමකු ඔහුගේ යුදෙව් ජාතික ප්‍රභවය පවා ඒ සඳහා උපයෝගී කරගෙන ඇත. වුල්ෆ්ගේ දූෂණ විරෝධී ක්‍රියා නිසා උදහසට පත් තවත් පිරිසක් වූයේ, ලුණු ප්‍රවාහනයේ යෙදුණු ගැල්කරුවන්ය. 1911 මාර්තු 16 වැනිදා හියු ක්ලිෆර්ඩ් ආණ්ඩුකාරවරයා එම ප්‍රදේශයේ නිල සංචාරයක් සඳහා පැමිණි අවස්ථාවේ, එම ගැල්කරුවෝ ඔවුන්ගේ ගමන් මාර්ගය හරස් කර, වුල්ෆ්ට එරෙහිව පෙත්සමක් ඉදිරිපත් කිරීමට තරම් ප්‍රගල්භ වූහ. වුල්ෆ් තම රාජකාරිය ඉටු කිරීමේදී, ජාතිය, කුලය හෝ වාර්ගිකත්වය ගැන තැකීමක් කළ බවක් නොදැක්වෙන අවස්ථාද විරල නොවේ.

යාල වනෝද්‍යානයේ භාරකරු වූ එන්ගල්බ්‍රෙක්ට එරෙහිව, ඔහුට දාව තමාට උපන් දරුවාට වන්දි ඉල්ලා ඉදිරිපත් වූයේ හැඩ රුවැති ගැමි ළඳකි. බොහෝ අය අපේක්ෂා කළේ වුල්ෆ් තම දඩයම් සහකරු වූ එන්ගල්බ්‍රෙක්ට වාසි වන අයුරින් තීන්දුව දෙනු ඇති බවය. එහෙත්, දරුවාගේ සමේ පැහැය සැලකිල්ලට ගනිමින් ඔහු තීන්දුව ලබා දුන්නේ, ගැහැනියට වාසි වන ආකාරයටය. අවාරයේදී නීති විරෝධී ලෙස මුවකු දඩයම් කළ යුරෝපීය ජාතික වැවිලිකරුවකු පළ කළ දැඩි විරෝධය නොතකා, ඔහුට දඩයක් නියම කිරීමෙන්ද වුල්ෆ්ගේ අපක්ෂපාතීත්වය තව දුරටත් තහවුරුවේ. (දින පොත 1909 ජූනි 08)

වුල්ෆ්ගේ සමයේ එම දිස්ත්‍රික්කය තුළ භයානක අන්දමින් පැතිර යමින් තිබූ ගවකුර රෝග වසංගතය පාලනය කිරීමේදී, ඔහු අනුගමනය කළ විවිධ උපක්‍රම හා ඔහු ලද සාර්ථකත්වය, ඔහුගේ පරිපාලන හැකියාවට කදිම නිදසුනකි. ප්‍රවාහන කටයුතුවලට මෙන්ම, කෘෂිකාර්මික කටයුතුවලටද අත්‍යවශ්‍ය කළ එළ ගවයන් සහ මී ගවයන් කුර රෝගය වැළඳී රංචු පිටින් මියැදෙන්නට වීම, ඔහු මුහුණ දුන් බරපතළ ප්‍රශ්නයකි. එම වසංගතය මැඩ පැවැත්වීම පිණිස ඔහු ගත් ක්‍රියාමාර්ග වූයේ, ගව එන්නත සහ රෝගී ගවයන් වෙඩි තබා මරා දැමීමත්, නීරෝගී ගවයන් කොටු කර වෙන් කර තැබීමත්ය. මෙහිදී ඔහු ගත් වැදගත් ක්‍රියාමාර්ගය වූයේ, එන්නත වෙනුවෙන් ගැමියන් රුපියල බැගින් ගෙවීමට මැළි වූ විට, එය නොමිලයේ ලබා දීමට ගත් පියවරයි. (දින පොත 1909 පෙබරවාරි 22)

ප්‍රදේශයේ ජනයාගේ ජීවනාලිය කෘෂිකර්මය වූ හෙයින්, එහි දියුණුව පිළිබඳ සොයා බලා කටයුතු කිරීමද ඔහු සතු වගකීමක් විය. ඒ සඳහා ඔහුගේ සහායට වාරිමාර්ග ඉංජිනේරුවරුන්, වෙල්විදානෙවරුන් ඇතුළු නිලධාරීහු පිරිසක් වූහ. දිස්ත්‍රික්කයේ සෑම අස්සක් මුල්ලක් පුරාම විසිර තිබූ වාරිමාර්ග යෝජනා ක්‍රම, නටබුන් වැව්, ඇළ මාර්ග පිරික්සා බලා, ඒවා වැඩි දියුණු කිරීමට දුෂ්කර මාර්ග ඔස්සේ යෑමට ඔහුට සිදු ව තිබුණේ පා ගමනින් ය. සීසාන නඟුල සහ ගොයම් මඬින යන්ත්‍රය එම දිස්ත්‍රික්කයට හඳුන්වා දී ඇත්තේද ඔහු ය.

ප්‍රදේශයේ අධ්‍යාපනය දියුණු කරලීමටද ඔහු දක්වා ඇත්තේ ඉන් පෙර සිටි කිසිම උප දිසාපතිවරයකු නොදැක්වූ ආකාරයේ උනන්දුවකි. අධ්‍යාපනය සහ සාක්ෂරතාව අතින් දිස්ත්‍රික්කය එවකට පැවතී ඇත්තේ, ඉතා පසුගාමී තත්ත්වයකය. පාසල් තිබී ඇත්තේද ප්‍රධාන ගම් කිහිපයක පමණකි. අධ්‍යාපනයේ වටිනාකම මැනවින් පසක් කරගෙන සිටි කේම්බ්‍රිජ් විද්වතකු වූ ඔහු, තම පළාත තුළ අධ්‍යාපනයේ ආලෝක ධාරාව විහිදුවාලීමට දරා ඇති අප්‍රතිහත ප්‍රයත්නය, ඔහුගේ දින සටහන්වලින් මැනවින් ස්ඵුට වේ. තිබෙන පාසල් වැඩි දියුණු කරලීමෙන්ද, කැලෑබද පෙදෙස්වල පවා අලුතින් පාසල් ඇරඹීමෙන් පමණක් නොව, තම නිල සංචාර අතරතුර පාසල්වලට ගොස් පාසල් පරීක්ෂකවරයකුගේ භූමිකාවට අවතීර්ණවී, ඒවායේ අඩුපාඩු සොයා බැලීමෙන්ද, අධ්‍යාපනයේ දියුණුවට ඔහු දක්වා ඇත්තේ පුදුමාකාර උනන්දුවකි.

කෙසේ වුවද, තම කොන්ද කෙළින් තබා ගනිමින් ඍජුව රාජකාරිය කළ අවංක නිලධාරියකු වූ ලෙනාඩ් වුල්ෆ්, ඔහුගේ ඉහළ නිලධාරීන්ගේ හෝ යටත් විජිත පාලනයේ හෝ ප්‍රසාදයට පාත්‍ර වූ බවක් නොපෙනේ. ඔහු තම ආසන්නතම ඉහළ නිලධාරියා වූ ගාලු දිසාපතිවර ලුෂින්ටන් සමඟ ගැටුම් හා මතභේදවලට පැටලී ඇත්තේ වරක්, දෙවරක් නොවේ. ලේවායවලදී ලුණු කිරා බැලීමේ ක්‍රමයක් හඳුන්වා දීමට වුල්ෆ් උත්සාහ දැරුවේ, එහිදී සිදු කෙරෙන වංචා සහ අපතේ යෑම් වළකාලීමේ අරමුණින් වුවද, ඊට දිසාපතිවරයාගේ අනුමැතිය ලැබුණේ නැත. එය ඔහුට ඇති කළේ කලකිරීමකි. (දින පොත, 1909, මාර්තු 18)

තවත් විටෙක දිසාපතිවරයා ඔහුට එරෙහිව නඟා තිබූ චෝදනාව වූයේ, හේන් කිරීම සඳහා ගැමියන් උනන්දු කරවන බව පවසමිනි. (දින පොත, 1909 නොවැම්බර් 17) මාර්ග සංවර්ධනය සඳහා පවරා ගන්නා ලද ඉඩමකට දිසාපතිවරයා නොවටිනා ගණනක් ගෙවීමට නිර්දේශ කිරීම සම්බන්ධයෙන්ද ඔහු එම ජ්‍යෙෂ්ඨ නිලධාරියා සමඟ මත ගැටුමක් ඇති කර ගත්තේය. ලුෂින්ටන් දිසාපතිවරයා වුල්ෆ්ගේ ක්‍රියා කලාපයට එරෙහිව යටත් විජිත ලේකම් කාර්යාලයට පැමිණිලි කර තිබූ බව පෙනී යන්නේ, එහි නිලධාරියකු වූ ෆ්‍රෙඩ්‍රික් බොව්ස් විසින් ඔහුට අවවාදාත්මක ලිපියක් එවා තිබීමෙනි. ඉන් අවවාද කර තිබුණේ, තමාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වූ දිසාපතිවරයා සමඟ මත ගැටුම් ඇති කර නොගන්නා ලෙසටය. එසේම, යටත්විජිත භාර ලේකම්වරයා වූ ඒ.එස්. ගැල්බ්‍රොයිස් ඔහුට අවවාද කරමින් දන්වා සිටියේ, දින පොතේ සටහන් මඟින් ඉහළ නිලධාරින් පිළිබඳ අදහස් දැක්වීමේදී, ශික්ෂණයෙන් යුතුව එය කරන ලෙසටය. එයට මුල් වී තිබුණේ රජයට පවරා ගන්නා ලද ඉඩමට දිසාපතිවරයා කළ ගෙවීම සම්බන්ධයෙන්, ඔහු පළ කර තිබූ අදහස්වල විවේචනාත්මක ස්වරයයි. ඒ ආකාරයේ සිදුවීම් හා අප්‍රසන්න මත ගැටුම් නිසා, මේ රටෙහි සිවිල් සේවයේ තව දුරටත් නිරතව සිටීමෙන් තමාගේ අනාගතය පවතින්නේ අවිනිශ්චිත තත්ත්වයක බැව් ඔහුට හැඟී ගියේය.

වාර්ෂික නිවාඩුවෙන් පසු පෙරළා පැමිණි විට, තමා කොළඹ සුරාබදු කාර්යාලයට අනුයුක්ත කරනු ඇතැයි යන දූසමාන ආරංචියක්ද ඔහුගේ කනට වැටී තිබුණි. එම කරුණ ඔහුට වඩාත් තහවුරු වූයේ, නිවාඩු යෑමට ඔන්න මෙන්න කියා තිබියදී, ගාල්ලේ පැවැති සුරාබදු සම්මේලනයට සහභාගි විය යුතු යැයි දන්වා තිබීම නිසාය.

ගැටුම් හා බාධක මැද තෙවසරකට ආසන්න කාලයක් හම්බන්තොට දිසාවේ උප දිසාපතිවරයා ලෙස කැපවීමෙන් සේවය කළ ලෙනාඩ් වුල්ෆ්, සිය රට බලා ගියේ යටත්විජිත පාලනය ගැන කිසියම් කලකිරීමකින් හා දෙගෙඩියාවකින් යුතුවය. එහිදී තම පැරණි පෙම්වතිය මෙන්ම, සුප්‍රකට නවකතාකාරියකද වූ වර්ජිනියා වුල්ෆ් සමඟ විවාහ වූ ඔහු, තම කාලය දේශපාලන හා ශාස්ත්‍රීය කටයුතුවලට මෙන්ම, ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපාරය කෙරෙහිද කැප කරන්නට විය. බ්‍රිතාන්‍යයේ කම්කරු පක්ෂයට බැඳුණු ඔහු, එහි අන්තර්ජාතික සහ යටත්විජිත ගැටලු පිළිබඳ කමිටුවේ සාමාජිකයකු ලෙසද කටයුතු කර ඇත. රජනගේ උපන් දිනය නිමිත්තෙන් 1966 දී තමාට පිරිනැමුණු නම්බු නාමය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමෙන් පිළිබිඹු කෙරෙන්නේ, ඔහු තුළ පැවැති උග්‍ර අධිරාජ්‍ය විරෝධී හැඟීමය.

**චන්ද්‍ර ශ්‍රී රණසිංහ**





1960 දී සංචාරයකට එක් වූ ලෙනාර්ඩ් වුල්ෆ්

> **වුල්ෆ්, නීතිය අකුරටම පිළිපදින දැඩි ගතිපැවතුම්වලින් යුත් නිලධාරියකු ලෙස ප්‍රකටව සිටියද, ඔහු තුළ සැඟව පැවැති මානව දයාව හෙළි කරන නිදසුන් ගණනාවක්ම ඔහුගේ දින පොත අප හමුවේ තබයි. ගැමියන්ට තම දිවි රැක ගැනීමට තිබූ එකම මාර්ගය වූ හේන් වගාවට එරෙහිව රජය පනවා තිබූ දැඩි නීති, තමාව මහත් අපහසුතාවට පත් කළ බව, ඔහුගේ සටහන් කිහිපයකින්ම පැහැදිලි වේ.**



# රාජ ආඥාවයි! මී ගහක් කැපුවොත් දඬුවම මරණය



රටක වෘක්ෂලතාදිය ඇති වන්නේ එහි දේශගුණය, පස ආදි භූගෝලීය සාධක මුල් කරගෙනය. ඒ වෘක්ෂලතාදිය අනුව, එක්තරා ප්‍රමාණයකට ඒ රටේ ඉතිහාසය හැඩගැසෙන බව කිව යුතුය. මනුෂ්‍ය වාසයන් ඇති වී තිබෙන්නේ මිනිසාගේ පැවැත්ම සඳහා ඉවහල් වන වෘක්ෂලතාදිය පහසුවෙන් වගා කළ හැකි ප්‍රදේශවලය. මිනිසා වෘක්ෂලතාදිය කෙරෙහි මුලින්ම සැලකිල්ල දැක්වූයේ, ආහාර වස්ත්‍ර සහ නිවාසස්ථාන සඳහා ඒවා ප්‍රයෝජනවත් බව පෙනුණු හෙයිනි. පසුව ශාක විශේෂ කීපයක ඖෂධීය ගුණ, අත්හදාබැලීම්වලින් සොයාගෙන තිබේ. පුරාතන වෛද්‍යවරු දිවයිනේ සියලු බෙහෙත් පැළෑටිවල විස්තර දැක්වීමට උත්සාහ කළහ. මිනිසා අවට ඇති මල් ගස්වල සහ මල් පඳුරුවල සුන්දරත්වයත්, සුගන්ධයත්, ඔහුගේ සෞන්දර්ය හැඟීම දියුණු වීමට ඉවහල් විය. මෙවන් ශාක අතරින් මී ගසට ලැබෙන්නේ ප්‍රධාන තැනකි. මෙහි උද්භිද විද්‍යාත්මක නාමය වන්නේ Madhuca Longifolia යන්නයි. මී ගස ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම මෙන් වැවෙන ශාකයක් ලෙස සඳහන් කළ හැකිය. දැනට මී ගස පිළිබඳ කෙරී ඇති පර්යේෂණ අනුව, මෙහි වර්ග හතක් ඇති බව සොයා ගෙන තිබේ.

මී ගසේ කඳ මීටර් 20 ක් පමණ උස්වේ. ළපටි, නොමේරූ කොළ බූව සහිත රතු පැහැයෙනුත්, මේරූ කොළ, ළා කොළ පැහැයෙනුත් යුක්තවේ. මී මල් ජූනි, ජූලි මාසයන්හි හට ගන්නා අතර, ඒවා කහ වර්ණයෙන් යුක්ත වෙයි. වවුලන්, මී මල් හා මී ගෙඩි අනුභව කර මී ගස යටට වසුරු දැමූ පසුව, එහි පොහොර නිෂ්පාදනය වෙයි. මේ නිසා, ඉන්දීය පර්යේෂක කණ්ඩායමකගේ අදහස වන්නේ, මී ගස යනු පොහොර උපදවන වස්තුවක් බවයි. මී ඇට ආහාරයට ගත් වවුලන් හෙළන වසුරු, කුඩා ගිනි පෙට්ටි පියනක් පමණ වූ ප්‍රමාණයක යූරියා කිලෝ 3ක පමණ රසායනික සංඝටක අඩංගුවේ. එමෙන්ම වවුල් වසුරුවල කිසිම බැර ලෝහයක් අඩංගු නොවේ. එම නිසා පසෙහි සාරවත්භාවයක් ඇති වන බව විද්‍යාඥයන්ගේ අදහසයි. මීට අමතරව මී ගසේ සෑම කොටසක්ම ඖෂධීය ගුණයකින් යුක්තවේ. මී ගස් වගා කිරීමෙන් පාංශු ඛාදනය වළක්වා ගත හැකිය. එම නිසා පැරණි වැව්වල වෑ කඳු අසල මී වෘක්ෂ වගා කර තිබෙනු දක්නට ලැබේ.

ලංකාවේ පැරණි පරිසරය රක්ෂණය කිරීමෙහි උනන්දු වූ සෑම පාලකයකුම මී ගස ආරක්ෂා කිරීමෙහිලා කටයුතු කළහ. පැරණි ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සපයන සාහිත්‍ය මූලාශ්‍රය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් මී ගස පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හැකිය.

දේවානම්පියතිස්ස රජතුමා රටවැසියන්ට පණවා තිබූ අණපනත් අතර වෘක්ෂලතාදිය කැපීම තහනම් කර තිබුණි. ඒ අතරින් එක ගසක් වන්නේ මී ගසයි. කවුරුන් හෝ මී ගසක් කපා අසු වුවහොත්, දඬුවම වූයේ මරණීය දණ්ඩනයයි. මී ගසක් කැපීමට කිසිම හේතුවක් ඉදිරිපත් කිරීමට ඉඩක් ලැබුණේ නැත. නිවෙසකට මී අත්තක් පහත් වී තිබුණත්, එම අත්ත නොකපා වෙනත් ස්ථානයකින් නිවෙසක් තනා ගැනීමට රජතුමා ඉඩහසර ලබා දුන් බව සඳහන්වේ. අතීතයේ විසූ ජනයා, තම කටයුතු සඳහා මී ශාකය බොහෝ සෙයින් උපයෝගී කරගත් බව වංසකථා මඟින් පෙනේ. මහාවිහාර සීමා සලකුණු කරන අවස්ථාවේ දී මී ශාකය උපයෝගී කරගත් බව පළමුවෙන්ම තොරතුරු හමු වේ. එය 'කුදුමීරුක' ලෙස මහාවංසයේ සඳහන්වේ. පාලි මහාවංසයෙහි දී ඛුජ්ජමධූලක්ඛ ලෙස එය දක්වා තිබේ. කාවන්තිස්ස රජු මංගල මහා චෛත්‍යය කරවා, එහි විහාරයක්ද කරවා, එම විහාරයේ සීමා ලකුණු කිරීමේ දී එක් මාඉමක් ලෙස කුක්කුලසීව නම් උපාසකයාගේ ගමේ මී ගස සමීපයේ වූ ගොඩැල්ල ගෙන ඇති බව, සිංහල ධාතුවංසයේ සඳහන්වේ. මී ශාකය අතීත ජනතාව අතර බොහෝ ජනප්‍රිය වීම නිසා, මෙලෙස මායිම් ලකුණු කිරීම සඳහා යොදා ගත් බව සිතිය හැකිය. සංඝතිස්ස රජු හා මුගලන් සෙනෙවි අතර ඇති වූ සටනේ දී, සංඝතිස්ස රජුගේ ඇතා මී ගස් සෙවණකට ගොස් ඇති අතර, එම ගසෙහි අත්තක වැදීමෙන් ඇතාගේ සේසත බිම වැටී ඇති බව මහාවංසයේ දෙවැනි කොටසේ දී දක්වයි. මේ විස්තරයෙන් පෙනී යන්නේ, පැරණි ශ්‍රී ලංකාවේ මී ගස ස්වාභාවිකවම විශාල වශයෙන් හටගත් බවයි. මේ යුගයේ දී, මී ගස නොකැපිය යුතු අවස්ථා ඇති බව පුරාවිද්‍යා මූලාශ්‍රය වන සෙල්ලිපි මඟින් පෙන්වා දෙයි. ක්‍රි. ව. 10වැනි ශත වර්ෂයට අයත් උදාමහායාගේ පුලියම්කුලම් පුවරු ලිපියට අනුව, එක්තරා විහාරයකට පවරා දුන් ගම්බිම්හි මී ගස් කැපීම, රාජකුලිකයන්ට තහනම් කර තිබේ. "රදොලන් වැදැ තලන් මීවන් නොකපනු ඉසා" යනුවෙන් දැක්වෙන්නේ මී ගස් කැපීම තහනම් කර ඇති ආකාරයයි. යම් කිසිවකු එසේ කළ හොත්, මහයාගේ කාර්යාලයේ නිලධාරීන් විසින් සංසිඳවිය යුතු බව ද සඳහන් වේ.

මිහින්තලේ පුවරු ලිපියට අනුව, විහාර භූමියට අයත් තල, මී ආදී ශාක එල හට ගන්නා ශාක ප්‍රධානීන්ගේ අවසරය නොමැතිව කැපිය නොහැකිය. මේ ඉඩම් උකස් කර විකිණීමෙන් ද වැළකිය යුතු බවත්, එසේ කළ හොත් ඔවුන් රටින් නෙරපා හැරිය යුතු බවටත් නියෝග කර තිබේ. හතර වැනි කාශ්‍යප රජතුමා විසින් සෑගිරියෙහි විසූ බුද්ධමිත්‍ර භික්ෂුවට, මී ගස් වත්තක් සහ සියඹලා වත්තක් පූජා කිරීමක් පිළිබඳ බුද්ධන්නේහෙල ස්ථම්භ ලිපියෙන් තොරතුරු හෙළි වේ. තුන්වැනි කාශ්‍යප විසින් මිහින්තලාවට කරනු ලැබූ ඉඩම් ප්‍රදානයක දී, එහි ඇති මී ගස් සහ සියඹලා ගස් නොකපන ලෙසට අණ කර තිබේ. එසේ කැපුවහොත්, ඔවුන්ගෙන් දඩ අය කර ගත යුතු බව එම ශිලා ලිපිය සඳහන් කරයි. මේ තොරතුරු අනුව පෙනී යන්නේ, මේ ශාකය මායිම්ව පමණක් යොදා නොගත් අතර, විශාල ආර්ථික වටිනාකමක් ද හිමිකර ගත් බවයි. මේ අනුව පරිසරයේ ඉතා වැදගත් අංගයක් වන වන සම්පත ආරක්ෂා කිරීම පිළිබඳ අතීත පාලකයන් තම අවධානය යොමු කළ අතර, ඒ අතරින් මී ගසට ප්‍රධාන තැනක් හිමි වූ බව පෙනී යයි. ඒ නිසා, මී ගස වනාන්තරයක පරිසරාත්මක වටිනාකමකින් මෙන්ම, ආර්ථික වටිනාකමකින් ද යුක්ත වුණි. ගස් කැපීම, නීතිරීති මඟින් පාලනය කිරීමෙන්, ශාක සම්පත සංරක්ෂණය කිරීමට ගත් පියවර ශිලා ලේඛනවල වාර්තාවේ. සීගිරි ගලේ වැඩුණු යම් යම් ගස් කැපීම කිසිවකු විසින් හෝ කළ නොයුතු බවට තහනම් කරමින් පනවන ලද නියෝග, මිහින්තලේ කුලුනු ලිපියෙහි සඳහන් වේ. මෙහි සඳහන් වන වෘක්ෂ අතර, මී ගස් ද සඳහන් වේ. රාජ්‍ය නීතිය මඟින්, වන සම්පත සංරක්ෂණයෙහිලා දක්වන ලද අවධානය මෙයින් සනාථවේ.

වනාන්තරයක ඇති ශාක සම්පත් සතු ඖෂධීය, දැවමය හා අලංකරණය ආදි ශාකමය වශයෙන් ඇති වටිනාකම පිළිබඳ මනා අවබෝධයක්, පැරණි රාජ්‍ය පාලකයන් සතුව තිබූ බැව් ඉහත විස්තරයෙන් පැහැදිලි වෙයි. එසේ ආරක්ෂිත ගස්වැල් අතර මී ගසට ප්‍රධාන ස්ථානයක් හිමි වී තිබුණු බව පෙනී යයි. ඒ, එහි ආර්ථික වටිනාකමක් මෙන්ම, ඖෂධීය වටිනාකමක් ඔවුන් දැන සිටි බැවිනි.

**"මිහින්තලේ පුවරු ලිපියට අනුව, විහාර භූමියට අයත් තල, මී ආදී එල හට ගන්නා ශාක, ප්‍රධානීන්ගේ අවසරය නොමැතිව කැපිය නොහැකිය. මේ ඉඩම් උකස් කර විකිණීමෙන් ද වැළකිය යුතු බවත්, එසේ කළ හොත් ඔවුන් රටින් නෙරපා හැරිය යුතු බවටත් නියෝග කර තිබේ. හතර වැනි කාශ්‍යප රජතුමා විසින් සෑගිරියෙහි විසූ බුද්ධමිත්‍ර භික්ෂුවට, මී ගස් වත්තක් සහ සියඹලා වත්තක් පූජා කිරීමක් පිළිබඳ බුද්ධන්නේහෙල ස්ථම්භ ලිපියෙන් තොරතුරු හෙළි වේ. තුන්වැනි කාශ්‍යප විසින් මිහින්තලාවට කරනු ලැබූ ඉඩම් ප්‍රදානයක දී, එහි ඇති මී ගස් සහ සියඹලා ගස් නොකපන ලෙසට අණ කර තිබේ."**

මී ගසෙන් තෙල් ලබාගෙන, ජනතාවගේ ප්‍රයෝජනයට ගත් බව වංසකථාවල සඳහන් වේ. ඒ අනුව, දුටුගැමුණු රජු ලෝවාමහාප්‍රාසාදය කරවන අවස්ථාවේ දී සතර වාහල් දොර මී තෙල් පිරවූ සැලි සිය දහස් ගණනක් හා තවත් බොහෝ දේ ජනතාවගේ සේවයට චේතන ලෙස තැබ්බවූ බව, සිංහල ථූපවංසයේ සඳහන් වේ. භාතිකාභය රජු රුවන්මැලි සෑ මළුවෙහි පූජා පවත්වන ලද අවස්ථාවෙහි දී, පහන් දැල්වීම සඳහා එක් තෙල් වර්ගයක් ලෙස මී තෙල් යොදා ගත් බව මහාවංසයේ සඳහන් වේ. පාලි මහාවංසයෙහි දී මේ තෙල් දක්වා ඇත්තේ, 'මධූකතෙලම්හි' ලෙසය. භාතිකාභය රජු මී තෙල් යෙදූ පහන් රුවන්මැලි සෑයට පූජා කළ බව, දීපවංසය සඳහන් කරයි. ථූපවංසය දක්වන්නේ, මේ රජු දාගැබ් මළුවේ සත් දවසක් මී තෙල් පූජා පැවැත් වූ බවය. සාමාන්‍යයෙන් මී තෙල් ලබා ගන්නේ මී ඇටවලිනි. මෙයින් පෙනී යන්නේ, පැරණි ශ්‍රී ලංකාවේ ජනතාව තම තෙල් අවශ්‍යතාව සඳහා මී ගස උපයෝගී කරගත් බවය. එමෙන්ම මොවුන්, පොල් තෙල්වලට හුරු වීමට ප්‍රථම, මී ශාකයෙන් ලබා ගන්නා තෙල් එදිනෙදා කටයුතුවලට යොදා ගත් බව මේ තොරතුරු අනුව අනුමාන කළ හැකිය.

රටක, ප්‍රදේශයක, ගමක සීමාවක් දැක්වීමේ දී, කඩින් කඩ, තැනින් තැන ඇති පහසුවෙන් හඳුනා ගත හැකි ස්වාභාවිකව පිහිටි ඇළ දොළ සහ ගහ කොළ, ගල් පර්වත, කඳු බෑවුම් වැනි සීමා හෝ සීමා ලකුණු ලෙස ගිනීමට විවිධ ස්වාභාවික අමුද්‍රව්‍ය ගෙන තිබේ. මී ගසත් එසේ මායිම් ලකුණු කිරීමට ගත් වෘක්ෂයක් ලෙස සඳහන් කිරීමට පුළුවන. මේ ශාකය මායිම් ලෙස යොදා ගත් බව කිරිබත් වෙහෙර ටැම් ලිපියෙන් ද තොරතුරු හමු වේ. මෙය ක්‍රි. ව. 898 සිට 914 දක්වා රාජ්‍ය කළ හතර වැනි කාශ්‍යප රජතුමා විසින් පිහිටුවන ලද ලිපියකි. එහි "බමුණ් තුම්රබ් බෙහෙද් ගෙට් දුන් උතුර් මෙ ගිරිවත්තට් පැදුම් දෙසෙන් වෙහෙර් වත්ත හිම් කොට් ඉසා දකුණ් දෙසෙන් මී ගස හිම්කොට් ඉසා පැළෑ දෙසෙන් ගැල්මග හිම්කොට් ඉසා උතුරු දෙසෙන් සංබඩා බැද්ද හිම් කොට් ඉසා මෙ සතර් සීමායෙන් ඇතුළත් වූ වත්තට" යනුවෙනි. මේ අනුව මෙහි සඳහන් වන ඉඩමේ දකුණු සීමාව වන්නේ මී ගසයි.

ක්‍රි. ව. 1484 සිට 1508 දක්වා රාජ්‍ය කළ අටවැනි වීර පරාක්‍රමබාහුගේ ඔරුවල සන්නසෙහි ද මී ගස පිළිබඳ සඳහන් වේ. අතුරුගිරිය ගම ප්‍රදානය කිරීමෙහි දී එහි සීමාවන් දක්වන විට උතුරු දිශාවෙන් පිහිටි මී ගස පිළිබඳව සඳහන් වේ. ගම් සීමා දැක්වීමෙහි දී ස්වභාවික ඇළ දොළ ගස් කොළන් ආදිය ඒ සඳහා උපයෝගී කරගත් ආකාරය මෙම සන්නස් පත්‍රයෙන් පැහැදිලි වෙයි. මී ගසට වැදගත් තැනක් හිමි වූ බව එයින් ද පෙනීයයි. හතර කොරළේ විත්තිය හා ග්‍රාම නාම විස්තරය නමැති කඩඉම් පොතෙහි, ග්‍රාම නාම ඇති වූ සැටි විස්තර කර තිබේ. නිදසුන් ලෙස රණබෙරේ යුද්ධෙට ගැසූ නිසා රංගල්ල කියා ද, වතුර නැති පුහු ඇළ නිසා පුස්සැල්ල කියා ද, කුරු කොස් ගස් ඇති නිසා කුරුකොහොතැන්න කියා ද, දෙමට වනයක් ඇති හෙයින් දෙමටවල කියා ද, මීගස් ඇති පිටියක් නිසා මීපිටිය කියා ද සඳහන්වේ. මේ අනුව මී ගස්වලින් අනූන වනාන්තර ද ස්ථාපිත වී තිබූ බව පෙනී යයි. එමෙන්ම, කාව්‍යශේඛරයෙන් ද, ලංකාවේ මී ගස්වලින් යුක්ත වනාන්තර පිහිටා තිබූ බව පෙනීයයි.

මලිති ය බොන මීවන පුප් මීවන
පිපිතුගු වන මීවන වන මීවන
හගිනුදුරන මීව වන වන මීවන
රනසුනුවැකි මීවන බිල මීවන

මෙයින් අදහස් වන්නේ, විවිධ පක්ෂීන් විසින් මී මල්වල රොන් උරා බොන ලද බවයි. එමෙන්ම, මී වනයන්ගෙන් ගැවසී ගත් බවයි. මීට අමතරව පූජාවලිය, බුත්සරණ, විසුද්ධිමාර්ග සන්නය, ජාතක අටුවා ගැටපදය, උපාසකජනාලංකාරය, කඞ්ඛාවිතරණී, වෙසතුරුදා සන්නේ, ධර්මප්‍රදීපිකාව, මහාබෝධිවංස ග්‍රන්ථපද විවරණය, පැරකුම්බා සිරිත සහ 16වැනි ශත වර්ෂයෙහි රචිත යෝගරත්නාකරය වැනි බෞද්ධ ග්‍රන්ථ සහ ආයුර්වේද ග්‍රන්ථවල මී අරටු, මී ඇට, මී ගස්, මී තැලි, මී තෙල්, මී පනු, මී මල්, මී මුරුවට, මී ගස හා එහි අනෙකුත් කොටස් පිළිබඳ තොරතුරු ලබා දෙයි. මෙහි දී මී තැලි යනුවෙන් අදහස් වන්නේ, මී ගෙඩියෙහි කටුවෙහි පලුව යන්නයි. එමෙන්ම, මී පනු යනු මී ගෙඩිවලින් මිරිකා සෑදූ බීමකි. මී මුරුවට යනු මී ඇටවලින් තනා ගන්නා පුන්නක්කු ලෙස සඳහන්වේ.

මී ගසෙන් ලබා ගන්නා විවිධ අමුද්‍රව්‍ය යොදා ගෙන විවිධ විවිධ රෝගවලට ප්‍රතිකාර කරන අන්දම, යෝගරත්නාකරයෙහි සඳහන්වේ. මෙහි චිකිත්සා පනස් හයක් පිළිබඳ සඳහන් වේ. එහි අක්ෂි රෝග චිකිත්සාවෙහි මී අරටුව ආශ්‍රිතව ඇසට කරන ප්‍රතිකාරයක් පිළිබඳ දැක්වේ.

සිඳු ලූණු මැසි දෑ බුළුලොඳ මී හර ද
වෙන වෙන රැගෙන මී පැණි සමඟ ගෑස ඳ
අර්ජුන සමඟ වණ සුක්ලය නසා සෙ ද
සෙත කරවයි යෙති නිසැකින් ඇස පැහැ ද

මෙහි සඳහන් වන්නේ මී අරටුව යොදාගෙන මී පැණිත් සමඟ මිශ්‍ර කරමින් කරන ප්‍රතිකාරයකි. මීට අමතරව විවිධ රෝග සඳහා මී තෙල් ඇතුළු මී ගසේ විවිධ ද්‍රව්‍ය යොදාගෙන කරන ප්‍රතිකාර යෝගරත්නාකරයෙහි සඳහන්වේ. ඉහත සඳහන් කරුණු අනුව දිවයිනේ ශාක පද්ධතියේ ඉතා සුවිශේෂී ස්ථානයක් මී ගසට හිමි වූ බව පෙනෙයි. වනජීවීන් සඳහා භූමියේ කොටසක් වෙන් කර පවත්වාගෙන යෑම අතීතයේ සිටම, ප්‍රගුණ කරන ලද බවට සාක්ෂි ඇත. රුක් රෝපණය පාරිසරික වශයෙන් ස්වාභාවික පැවැත්ම පරිසරයේ ඇති කිරීමට බෙහෙවින් වැදගත් වේ. ස්වාභාවික වනාන්තරයකින් සිදුව සංරක්ෂණය පූර්ණ වශයෙන් දියුණු කළ ගෙවත්තක් වශයෙන් ද සිදු කිරීමට අවස්ථාව ලැබේ. මේ අනුව මී පැළ ද වගා කරන්නට අතීත පාලකයන් පියවර ගන්නට ඇත. එසේ වගා කරන ලද වෘක්ෂ අතර, මී ගසට සුවිශේෂී ස්ථානයක් ලබා දෙන්නට ඇත. එයට හේතුව වන්නට ඇත්තේ, මී ගස ඖෂධීය ගුණය අතින් මෙන්ම පිරිසුදු වාතය ලබාදෙන මහඟු සම්පතක් මෙන්ම, පරිසරය සංරක්ෂණය කරන මහාර්ඝ වෘක්ෂයක් වූ බැවිනි.

**මහාචාර්ය එන්. ඒ. විමලසේන**
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

'කටාරම' ගැන ඔබේ අදහස් අපට කියන්න
කටාරම සංස්කරණය - ඉරෝෂිණී දීපිකා
'කටාරම' දිනමිණ, ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
katarama@lakehouse.lk

දිනමිණ The Dinamina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

**වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය**

**සීමාසහිත ලංකා සීනි සමාගම**

## ටෙන්ඩර් දැන්වීමයි

**සීමාසහිත ලංකා සීනි සමාගම පැල්වත්ත ඒකකයට පහත සදහන් කාර්යයන් සදහා කඩිනමින් අශ්වබල 75 හෝ ඉහල ට්‍රැක්ටර් රථ සැපයිය හැකි සැපයුම්කරුවන් අවශ්‍යව ඇත.**

01. පස පෙරළීම (ploughing) : Rs. 15,190.00 හෙක්ටර්යාර එකකට

02. කැට පොඩි කිරිම - 2 වරක් (Harrowing) : Rs. 13,890.00 හෙක්ටර්යාර එකකට

03. කාණු ගැසීම - Forrowing : Rs. 6,550.00 හෙක්ටර්යාර එකකට

ඉහත කාර්යන් සිදු කිරිමට බලාපොරොත්තු වනුයේ නම් 2020.10.12 දිනට ප්‍රථම දැනුම් දිමට කටයුතු කරන්න හා වෙනත් තොරතුරු දැනගැනිම සදහා විමසන්න.

මිලදී ගැනිම් කළමණාකරු / දුරකථන අංකය - 072 231 5714

ඉඩම් සංවර්ධන කළමණාකරු / දුරකථන අංකය -070 586 7288

ප්‍රධාන මෙහෙයුම් නිළධාරි,
ලංකා සිනි සමාගම,
පැල්වත්ත.

---

**සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම - පැල්වත්ත ඒකකය**

## ප්‍රසම්පාදන දැන්වීම

ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකය විසින් වැසිදිය පොකුණු ඉදිකිරීම සඳහා **2020.10.01 දින පෙරවරු 09.00 සිට 2020.10.15 වන දින පස්වරු 2.30 දක්වා** මුද්‍රා තබන ලද ලංසුපත් ICTAD / CIDA ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ හා බුත්තල බල ප්‍රදේශය තුළ ලියාපදිංචි අනුමත සමිති මගින් ලංසුපත් භාරගනු ලැබේ. නියමිත පරිදි සකස් කරන ලද මුද්‍රා තබන ලද ලංසුපත් ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ලංකා සීනි සමාගම, පැල්වත්ත ඒකකය වෙත අතින් ගෙනැවිත් භාරදෙන ලෙස හෝ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ ලියාපදිංචි තැපැලෙන් එවීම සිදු කළ යුතුය.

| අංකය | විස්තර | ආපසු නොගෙවනු ලබන ගාස්තු (රු.) | ලංසු ඇපකර වටිනාකම (රු.) |
|---|---|---|---|
| 01 | සිංහ පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 4,686.00 |
| 02 | පිඹුර පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 10,703.00 |
| 03 | බේසම් පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 7,098.11 |
| 04 | දේව පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 16,943.72 |
| 05 | බුබුල පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 6,809.44 |
| 06 | වීර පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 3,370.44 |
| 07 | පෙම් කුඩා වැව වැසිදිය පොකුණ | 2,000/= | 8,815.40 |
| 08 | නුගේ පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 4,730.30 |
| 09 | නිකකැටිය ආර පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 21,558.92 |
| 10 | දං පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 5,052.85 |
| 11 | ගල් පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 3,754.91 |
| 12 | බොල්හිඳ පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 10,994.06 |
| 13 | අක්කර දෙක පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 8,239.77 |
| 14 | රත්න පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 10,229.87 |
| 15 | කුට්ගේ පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 10,371.24 |
| 16 | සුදුවැලි පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 9,684.00 |
| 17 | මේගහ පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 6,481.75 |
| 18 | ඉදි පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 7,660.62 |
| 19 | ඕලු පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 10,703.00 |
| 20 | රදු පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 10,279.50 |
| 21 | කුඩා රදු පොකුණ වැසිදිය පොකුණ | 2,000/= | 10,239.90 |
| 22 | මැණික් වැව වැසිදිය පොකුණ | 2,000/= | 7,748.00 |
| 23 | කොළණී වැව වැසිදිය පොකුණ | 2,000/= | 12,779.03 |
| 24 | වේරරත්න වැව වැසිදිය පොකුණ | 2,000/= | 9,685.92 |
| 25 | වැලිකට්ට වැසිදිය පොකුණ | 2,000/= | 21,558.99 |
| 26 | වාඩිය වැසිදිය පොකුණ | 2,000/= | 7,935.64 |
| 27 | පොරමඩුල්ල වැසිදිය පොකුණ | 2,000/= | 10,343.05 |
| 28 | මට්ටවාඩිය වැසිදිය පොකුණ | 2,000/= | 11,610.25 |
| 29 | හොල්මන්ගල වැසිදිය පොකුණ | 2,000/= | 11,908.73 |
| 30 | මංකඩ වැසිදිය පොකුණ | 2,000/= | 10,507.22 |

ලංසු කොන්දේසි හා ඊට අදාළ සියලු විස්තර ඇතුළත් ලංසු පෝරම **2020.10.01 වන දින පෙරවරු 9.00 සිට 2020.10.15 වන දින පස්වරු 2.30 දක්වා** වූ කාලය තුළ සී/ස ලංකා සීනි සමාගම, පැල්වත්ත ඒකකය මගින් ලබාගත හැකිය.

ලංසුපත් බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන ව්‍යාපෘතියේ නම සඳහන් කළ යුතුය. 2020.10.15 දින පස්වරු 3.00 ට ප්‍රසම්පාදන කමිටුව රැස්වී ලංසුපත් විවෘත කරන අතර, ලංසු විවෘත කිරීමේ අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහු වෙනුවෙන් ලිඛිත බලය පවරනු ලබන නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර **දුරකථන අංක** 071-7858449 ඩී. එම්. ආර්. එම්. දිසානායක මහතා (සිවිල් ඉංජිනේරු) අමතා ලබාගත හැකිය.

**ප්‍රධාන මෙහෙයුම් නිලධාරී,**
**ලංකා සීනි සමාගම,**
**පැල්වත්ත ඒකකය,බුත්තල.**
**සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම - බුත්තල**

---

**ශ්‍රී ලංකා ජාතික රෝහල - කොළඹ 10**

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021 වර්ෂය

**2021 වර්ෂය සඳහා පහත සඳහන් ද්‍රව්‍යයන් සහ සේවාවන් සැපයීම පිණිස නිෂ්පාදකයින්, ලියාපදිංචි සමුපකාර සමිති, සංස්ථා ඇතුළු රජයේ ආයතන, ග්‍රාමෝදය මණ්ඩල සහ පිළිගත් වාණිජ ආයතන සහ පුද්ගලයින්ගෙන් මෙම රෝහල යටතේ ලියාපදිංචි වීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

02. සියලුම අයදුම්පත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ 10, යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරය වම්පස ඉහළ කෙළවරේ **"2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

### (අ) ද්‍රව්‍ය සැපයීම

1. පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, පරිගණක ජාලගත කිරීමේ උපාංග සහ ඒ ආශ්‍රිත උපාංග.
2. ලී, වානේ සහ MDF නිෂ්පාදිත ගෘහ උපකරණ හා කාර්යාලීය උපකරණ.
3. බෙඩ් සයිඩ් ලොකර්, ඕවර් බෙඩ් ටේබල්, රෝද පුටු, රෝගී ඇඳන්, සේලයින් ස්ටෑන්ඩ් සහ සියලුම ට්‍රොලි වර්ග ඇතුළු රෝහල් උපකරණ.
4. රබර් මිශ්‍රිත කොහු මෙට්ට, ආර්පිෆෝම් මෙට්ට, ට්‍රොලි මෙට්ට ඇතුළු සියලුම මෙට්ට වර්ග.
5. ඇලුමිනියම් සාස්පාන් ඇතුළු සියලුම ඇලුමිනියම් හා ලෝහ නිෂ්පාදන
6. යකඩ සහ ගැල්වනයිස් වලින් සෑදු කුණු ගෙන යන කරත්ත, කුණු ගෙන යන බාල්දි ආදී නිෂ්පාදන.
7. සියලුම වර්ගයේ ටයර් සහ ටියුබ්.
8. විදුලි කේතල, විදුලි බොයිලේරු, කේතල එලිමන්ට්, බොයිලේරු එලිමන්ට්, තාපක දඟර (හොට් ප්ලේට්) ඇතුළු විදුලි උපකරණ.
9. ශීතකරණ.
10. සේවක මුළුතැන්ගෙයට සහ ප්‍රධාන මුළුතැන්ගෙයට අවශ්‍ය ගෑස් ලිප් සැපයීම සහ සවිකිරීම.
11. විකලාංග ගබඩාවට අවශ්‍ය සියලුම අමුද්‍රව්‍ය.
12. තියුණු උපකරණ දැමීම සඳහා බහලුම් හා සියලුම ප්ලාස්ටික් බහලුම්.
13. ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ.
14. බෙහෙත් කවර සැපයීම.
15. රාජකාරී නිල හැඳුනුම්පත් සැකසීම.
16. සියලුම වර්ගවල රෙදි, මැකින්ටොෂ් සහ රෙක්සින් වර්ග.
17. සියලුම වර්ගවල පිඟන් භාණ්ඩ
18. සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදිත සපත්තු සහ රබර් සෙරෙප්පු ආදිය.
19. රසායනාගාර සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා විකිරණ අංශය සඳහා අවශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය.
20. සියලුම වෛද්‍ය උපකරණ, ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා ඖෂධ වර්ග.
21. පැදුරු, ඉදල්, කොහු, ඉරටු, රෙදි මුසුන්, තිය බුරුසු, වැසිකිළි බුරුසු ආදී පිරිසිදු කිරීමේ උපකරණ.
22. සියලුම වර්ගවල සබන් හා පිරිසිදු කාරක ද්‍රව්‍යය
23. රෙදි මැසීමේ නූල්, නයිලෝන් නූල්, ඉලාස්ටික්, රෙෆ්ලට් ටේප්, ලිනන් ටේප් හා වානේ කෙඳි.
24. ලැකර්, වාර්නිෂ්, පොලිෂ්, බිම ඔප දමන ද්‍රව්‍ය, මෙතිලේටඩ් ස්ප්‍රිතු සහ වයින් ස්ප්‍රිතු ආශ්‍රිත නිෂ්පාදන.
25. සියලුම වර්ගවල වියළි බැටරි සහ නැවත ආරෝපණය කළ හැකි බැටරි (වෝට් 06,12,24)
26. තල මාරු කරන රේසර්, රේසර් බ්ලේඩ්, ගිනි පෙට්ටි, ඉටිපන්දම් සහ බර වැඩට භාවිතා කළ හැකි රබර් අත්වැසුම්.
27. යාන්ත්‍රිකව රෙදි සේදීම සඳහා භාවිත කරන රසායන ද්‍රව්‍ය (කුඩු හා දියර) සහ රෙදි සෝදන හා වියළන යන්ත්‍ර සඳහා යොදන වෙනත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය (පැඩින්, වැක්ස් ආදිය)
28. කසළ ඉවත් කිරීම සඳහා භාවිතා කරන පොලිතීන් කවර ඇතුළු පොලිතීන් නිෂ්පාදන.
29. සියලුම කෘමිනාශක වර්ග.
30. එල්.පී. ගෑස්, ගෑස් රෙගියුලේටර්, බර්නර් සහ ගෑස් නළ.
31. වායු සමීකරණ යන්ත්‍ර, කොම්ප්‍රෙෂර් ඇතුළු ආශ්‍රිත උපකරණ.
32. සීලිං විදුලි පංකා, බැහැරුම් පංකා ඇතුළු සියලු විදුලි පංකා වර්ග.
33. විදුලි මෝටර් වර්ග, වතුර පොම්ප සහ ආශ්‍රිත නිෂ්පාදන.
34. සියලුම වර්ගයේ බෙයාරිංග්ස් සහ යන්ත්‍ර සහ මෝටර් සඳහා අවශ්‍ය බෙල්ට් වර්ග.
35. විදුලි යාන්ත්‍රික හා වඩු වැඩ සඳහා අවශ්‍ය ආවුද හා උපකරණ.
36. වඩු කර්මාන්ත නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ලී දඬු හා ලෑලි වර්ග.
37. යතුරු තහඩු, සරනේරු, සොයිබ, ඇලුමිනියම් දෙර සරනේරු, රේලිං ඇණ, ඇතුළු හාඩ්වෙයාර් උපාංග.
38. සියලුම වර්ගවල ජලනළ උපාංග හා සනීපාරක්ෂක උපකරණ.
39. කැස්ටර් වීල් ඇතුළු ට්‍රොලි සඳහා අවශ්‍ය වන සියලුම රෝද වර්ග.
40. ඔක්සිජන්, සියලුම ඇසිටිලින් වර්ග පැස්සුම්කුරු. (විදුලි පැස්සුම්කරු ඇතුළුව)
41. සියලුම වර්ගයේ විදුලි බල්බ, විදුලි පේනු, ස්විච් වර්ග, වයර් ඇතුළු විදුලි තත් ඇදීම සඳහා අවශ්‍ය වන සියලුම විදුලි උපාංග.
42. බිත්ති සහ දැව ඇතුළු වානේ උපකරණ ඔපදැමීම සඳහා භාවිතා කරන තීන්ත වර්ග.
43. ගිනි නිවීමේ උපකරණ හා වායු සිලින්ඩර්.

### (ආ) සැපයිය යුතු සේවා

01. සියලුම වර්ගවල මහත මැෂින් අලුත්වැඩියාව.
02. සියලුම මුද්‍රණ කටයුතු.
03. සියලුම විකිරණ හා රසායනාගාර පරීක්ෂණ කටයුතු.
04. EO. Gas ජීවානුහරණ කිරීමේ කටයුතු (Ethylene Oxide)
05. හිමිකම් නොපාන මළ සිරුරු ඉවත් කිරීම.
06. රෝහල් රෙදිපිළි මැසීම. (රෝහල විසින් සපයනු ලබන රෙදිපිළි)
07. ශල්‍යාගාර, රසායනාගාර, විකිරණ අංශය, භෞත චිකිත්සක අංශය ඇතුළු රෝහල තුළ භාවිතා කරන සියලුම වෛද්‍ය හා ශල්‍ය උපකරණ අලුත්වැඩියාව.
08. අභ්‍යන්තර දුරකථන සේවාවන්, ඉදිකිරීමේ සේවා හා නඩත්තු කටයුතු.
09. ගෑස් ලිප්/ ඔක්සිජන් උපකරණ අලුත්වැඩියාව, සේවා කිරීම හා නඩත්තු.
10. පරිගණක, රූපවාහිනී, මල්ටිමීඩියා යන්ත්‍ර අලුත්වැඩියාව.
11. වෛද්‍ය වායු පද්ධතිය සේවා හා නඩත්තුව.
12. රබර් මුද්‍රා සහ පොලිමර් මුද්‍රා සෑදීම.
13. ප්ලාස්ටික් හා ක්ලැඩින් නාම පුවරු සපයා සවි කිරීම.
14. මහජන ඇමතුම් පද්ධති සපයා සවි කිරීම හා අලුත්වැඩියා කිරීම.
15. CCTV පද්ධති සපයා සවි කිරීම හා අලුත්වැඩියා කටයුතු.
16. Counter Numbering Display සපයා සවිකිරීම හා අලුත්වැඩියාව.
17. විදුලි ලොන්ඩ්‍රියේ යන්ත්‍ර අලුත්වැඩියාව, සේවා කිරීම් හා වාෂ්ප බොයිලේරු සේවාව කිරීම හා නඩත්තුව.
18. වාහන අලුත්වැඩියා කිරීම. (විදුලි පද්ධති අලුත්වැඩියාව හා කුෂන් කිරීම ඇතුළුව)
19. පුටු විවීම, තීන්ත ගෑම, පොලිෂ් කිරීම, කුෂන් කිරීම, රෙක්ෂින් කිරීම හා ෆෝමිකා ගැසීම.
20. ශීතකරණ අලුත්වැඩියා කිරීම
21. සියලුම විදුලි මෝටර්, ට්‍රාන්ස් ෆෝමර්, විදුලි පංකා ආදිය අලුත්වැඩියා කිරීම.
22. ජල පොම්ප අලුත්වැඩියා හා නඩත්තු කටයුතු.
23. බත් පිසීමේ විදුලි බොයිලේරු, එළවළු ශුද්ධ කිරීමේ යන්ත්‍ර, විශාල ප්‍රමාණයේ උණු වතුර බොයිලේරු අලුත්වැඩියාව හා නඩත්තුව.
24. මෘත ශරීරාගාරයේ වායු සමන යන්ත්‍ර සහ මෘත ශරීර බහාලන ලාච්චු අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම.
25. කුලී පදනම මත මෝටර් රථ, වෑන් රථ, බස් රථ ආදිය සැපයීම.
26. උත්සව අවස්ථා සඳහා ආහාර පාන හා සේවා ආදිය සැපයීම.
27. කෘමි සතුන් මර්දන සේවාව. (වේයන්, ඇඳ මකුණන් ආදිය)
28. රෝහලේ අපහරණය කරන රබර් මිශ්‍රිත කොහු මෙට්ට, රෙදිපිළි, සෙරප්පු, සපත්තු ආදිය රැගෙන ගොස් පුළුස්සා විනාශ කිරීම.

03. ඒ ඒ ද්‍රව්‍යයන් සහ සේවා සඳහා පහත සඳහන් ආකෘති පත්‍රය අනුව වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. වෛද්‍ය සැපයීම් සම්බන්ධයෙන් සැපයුම්කාර සමාගමට විශේෂිත වූ අයිතම පිළිබඳ වර්ගීකරණයක් දැක්වීමට කටයුතු කළ යුතුය.
(උදා: Suturs, Mesh, Laparoscopy Instruments Orthopedic items Urology items)

### සැපයුම්කරුවන් ලියාපදිංචි වීමේ අයදුම්පත්‍රය

01. ව්‍යාපාරයේ නම හා ලිපිනය : ..................................
02. ලියාපදිංචි වීමට කැමති සැපයුම හෝ සේවාව සහ අයිතම අංකය : (එක් එක් සැපයුම් හෝ සේවාව සඳහා එක අයදුම්පත බැගින් ඉදිරිපත් කළ යුතුය.) ..................................
03. අයදුම්කරුගේ නම හා ලිපිනය : ..................................
04. ව්‍යාපාරයේ ලියාපදිංචි කිරීමේ අංකය සහ දිනය : ..................................
(ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණන්න)
05. වැට් අංකය : ..................................
06. දුරකථන අංකයන් හා ෆැක්ස් අංකයන් : ..................................
07. 2019 වසර තුළ මෙබඳු සේවා සපයා තිබේද ?: ..................................
08. මෙම ආයතනයට ණය පහසුකම් සැපයීමේ කොන්දේසි : ..................................
09. ලදුපත් අංකය සහ දිනය : ..................................

..................................
අධ්‍යක්ෂ / කළමනාකරු

දිනය : .............

තවද ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 1,000/= ක් වෙන් වෙන්ව එක් එක් භාණ්ඩ හෝ සේවාවන් සඳහා ගෙවිය යුතුය. ඉහත ගෙවීම් මෙම කාර්යාලයේදී මුදලින් ගෙවා රිසිට්පත් වල ඡායාපිටපත් අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. චෙක්පත් වලින් ගෙවීම් හෝ මුදල් ඇණවුම් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ. ලියාපදිංචි එක් එක් කාර්යය සඳහා වෙන්වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. (මේ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කළ යුතුය)

04. සැපයුම් සහ සේවාවන් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ ප්‍රමුඛතාවය දෙනු ලැබුවද, ලියාපදිංචි නොවූ අනිකුත් පිළිගත් සැපයුම්කරුවන්ගෙන් ද මිල ගණන් කැඳවීමේ අයිතිය රෝහල සතුය. නියමිත ප්‍රමිතීන් සහ ආදර්ශවලට අනුව භාණ්ඩ හා සේවා සැපයීම් නොකරන සැපයීම්කරුවන්ගේ නම් සහ ගිවිසුම් ප්‍රකාර සැපයුම් සහ සේවාවන් නොකරන අයවලුන්ගේ නම් ද ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් ඉවත් කිරීමට ක්‍රියා කරනු ලැබේ.

05. සියලුම අයදුම්පත් 2020.10.30 දින තෙක් භාරගනු ලැබේ. එදිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. කිසිම හේතුවක් නොදන්වා අයදුම්පත් භාර ගැනීමේ / ප්‍රතික්ෂේප කිරීමේ බලය කොළඹ 10, ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සතුව ඇති බව සලකන්න.

**වෛද්‍ය ඩබ්ලිව්. කේ. වික්‍රමසිංහ,**
**නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා ජාතික රෝහල,**
**කොළඹ 10.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලි පාරිභෝගිකයිනට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන්හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයිනට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථාතත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.**

**ලංකා විදුලිබල මණ්ඩලයේ වයඹ පළාත තුළ අත්‍යවශය නඩත්තු කටයුතු වෙනුවෙන් පහත දක්වා ඇති ප්‍රදේවලට සපයනු ලබන විදුලිය 2020 ඔක්තෝබර් මාසය තුළදී පහත දක්වා ඇති දිනවල අදාළ කාලසීමාව තුළදී අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ.**
**සැලසුම් කරන ඇති කාලයට ප්‍රථම අදාළ නඩත්තු කටයුතු නිමවේ නම්, අත්හිටවූ විදුලිය වහාම සපයනු ලැබේ.**

# වයඹ පළාත - 2020 ඔක්තෝබර්

## කුලියාපිටිය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### කුලියාපිටිය පා. සේ. ම.

**2020 ඔක්තෝබර් 03** **09.00-17.00**

කෝන්ගහගෙදර, කෝන්ගහගෙදර කොහු මෝල, තුම්මෝදර, කෝලන්කා කොයාර් ප්‍රොඩක්ට්, ලේපොලොව දෙලන, යාය හේනෙගෙදර, කිරින්දව නව, කිරින්දව 1, කිරින්දව යාය වත්ත, කරන්තිප්පල ගොඩයාය, ඇඹවපලුගස්හන්දිය, ගොපල්ලව, ගොපල්ලව - ගිනිමන්දව, ෆයිබර් ඉන්ඩස්ට්‍රීස්, කබලෑව, කනත්තව, ගයියාල ඇඹවල, ඇපලදෙනිය, ජේ.බී. කොයාර්, ශ්‍රීපාලි, ඇපලදෙනිය 2, දන්ලන්ද, ගුරුතිප්පලඇපලදෙනිය 1, ගොමුගොමුව 3, පහළ ගොමුගොමුව, මැදිවත්ත, නින්දවෙලගොමුගොමුව පාර, නින්දවෙල 2, නින්දවෙල 1, සරණතිස්ස මාවත, සණස බැංකුව බෝධිමුල්ල, කරගහගෙදර, දීගල්ල තෙල් මෝල, දීගල්ල සණස, දීගල්ල විද්‍යාලයල, ලිග්නොසෙල්, හේලීස් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්, බේබිලැන්ඩ්, කරගහගෙදර බිගින්හිල් සේල්, එෆ්.ජී.එම්ග ලංකා, ගොමුගොමුව 2, නිමල්සිරි තෙල් මෝල, ඉහළ එලතලව, බෝගොඩ එගොඩ එලතලව, පහළ එලතලව, කෝන්මැන්ඩිය එලතලව 2, කඹුරාපොල උපපොල.

**2020 ඔක්තෝබර් 12, 16, 19, 23** **08.30-16.30**

ඉහළ ඇන්නරුව, හේනෙගෙදර නව, තිවි ඇන්තනීස් ෆාම්, රවී බ්‍රීඩර්ස් ෆාම්.

**2020 ඔක්තෝබර් 16** **08.30-16.30**

කිතලව, ටේස්ට් බිස්කට්, කෝල් ටෙක් ඉන්ඩස්ට්‍රීස්, හන්නෝව හිත්තරගම 2, කුඹුක්කොටුව වත්ත, වහුමුව, රතව, බැම්මිණිගල්ල හිත්තරගම, බැම්මිණිගල්ල සීයාවල, ආරියරත්න හාල් මෝල, , ජයලත් හාල් මෝල, ආර්.පී. නිසංසලා, අනුක්කනේ.

**2020 ඔක්තෝබර් 17** **08.00-17.00**

දණ්ඩගමුව, ඩබ්.ආර්.කේ. තෙල් මෝල, මාහිම්පිටිය, හපුගම්මන තලහිටිමුල්ල, සෙරන්ඩිපෝල් නව, අලලුව, මඩකුඹුරුමුල්ල, මඩකුඹුරුමුල්ල නව, තලහිටිමුල්ල ප්‍රයිම් ලෑන්ඩ්ස්, වල්පිටගම, ස්පියර් ඉන්ටර්නැෂනල්.

**2020 ඔක්තෝබර් 17 , 18** **08.30-17.00**

හග්ගමුව, ගලහිටියාව නව, රත්මලේ වත්ත වෙන්දේසි ඉඩම, ගිරාකැතිකුඹුර, පහළ ඉගුරුවත්ත නව, මදුරා වත්ත, පහළ ඉගුරුවත්ත දියදෙර.

**2020 ඔක්තෝබර් 18** **09.00-17.00**

උඩුබද්දවවෝටර් වර්ක්ස්, , කහදෙනිගම පන්සල, උඩුබද්දව පේශකම්හල, උඩුබද්දව, දෙමටවල, කේ.එම්.කේ. ඇනිමල් ෆීඩ්ස්, කුමාරි තෙල් මෝල, මල්පොකුණ වත්ත, ගල්පොකුණ වත්ත, වීරඹුව, වීරඹුව පන්සල, විලපොල පරනගම, පල්ලෙවෙල, පල්ලෙවෙල කොහු මෝල, සීටී, කුරුදෑල්පොත, කනදුල්ල, කනදුල්ල පන්සල, මීගහකොටුව, තිස්ස මාවත, සිරිමාලි, අධ්‍යාපන කාර්යාලය, එම්.ඒ.ඩී.එස්. දිල්රුක්, සිටි පැලස්, වෙළඳ සංකීර්ණය, ආනන්ද මාවත නව, ආනන්ද මාවත, නගරය, එස්.එම්.මායාදුන්න, මහජන බැංකුව, ඒඑස්බී, සරත් ගොඩනැගිල්ල, මාදම්පේ පාර, සීඅයිබී, සම්පත් බැංකුව, ජී.ආර්. එන්.එන්. සේනරත්, කදුරුගස්හේන.

**2020 ඔක්තෝබර් 19** **08.30-17.00**

වීරඹුව, වීරඹුව පන්සල.

### පඬුවස්නුවර පා. සේ. ම.

**2020 ඔක්තෝබර් 02** **08.30-17.00**

ගොඩයාය, ගුරුගොඩ, ඉහළ කෝන්කඩවල, කොරකහපොකුණ.

**2020 ඔක්තෝබර් 03** **08.30-17.00**

නිතලව දළුපොත, වෙලන්කැලේ, වලකඩ හන්දිය, ඉහළ කොස්වත්ත, මෝලෙකඩේ, කැකිරිමඩිත්ත හන්දිය, තාරණ උඩවෙල, උඩවෙල පාසල, දිවුල්ගස් අංග, ගුරුඑවෙල, මාදුපිටිය, වල්ලව, නිකවත්ත, හමන්නාපහුව, කුරුඳුපොත, කදුරුගහමුල, කෝන්කඩවල, උස්වැව, ගනේගොඩ, පිහිඹිය, නාගොල්ලාගොඩ, අඹගහගෙදර, ගනේගොඩ පාර, හබවැව, බරම්පොල, හන්තිහව, බුළුගහඅගාර, රත්මලේ, මැල්වත්ත, ඇහැටුමුල්ල, ගල්කන්ද, රිට්ටාදෙනිය, මුණිහිරිගම, ගිරාතලාන, දිද්දෙනිය, දිවුල්වැව, හුන්නෙලෙම්බුව, කරවිලහේන, වඩුමුන්න, කොරවැව, මාහොලව, උදගම, විතියගම, පල්ලේගම, මිරිස්හේන, දම්පිටිය පල්ලේගම, හිරිපොකුණ, හිඳකටුව, කොස්ගම, වීරපොකුණ, ඉහළ කිනියම, මාතෙලෙම්බුව, වෙලන්ගොල්ල, කොස්ගහගොඩ, ගොඩයාය, ප්‍රසන්නගම, බ්‍රාහ්මණයාගම, කොස්හේනාගාර, තිසෝගම, සියඹලාවැව, ගැටුලාව, පුවක්ගහකඩවල, පුවක්වැටිය.

**2020 ඔක්තෝබර් 04** **08.30-17.00**

| බෙදාහැරීම් අංශය 3 (ඌව) | DGM(UVA)/ CE(Com)/C4/ 2K20/003<br>විදුලි කණු ගබඩා කිරීම සඳහා බදුල්ල, හාලිඇල හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අවට්න් ඉඩමක් බදු පදනම මත ලබාගැනීම. | 2020 ඔක්තෝබර් මස 14 වැනිදා | පළාත් මිලදී ගැනීම් කමිටුව (ඌව) | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල.<br>දු.ක : 0552222474 | - | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. | - | NCB |
| බෙදාහැරීම් අංශ 4 (දකුණු පළාත) | SP/CE(DM)/T/2020/04<br>බෙදාහැරීම් හා නඩත්තු (දකුණු පළාත) කාර්යාලයේ වැඩ කණ්ඩායමක් සඳහා තංගල්ල ප්‍රදේශයෙන් ව. අ. 1200 කට නොඅඩු ගොඩනැගිල්ලක් සහිත ක්‍රේන් ලොරියක් සහ සැහැල්ලු වාහන කිහිපයක් නවතා තැබිය හැකි හා ඒ සඳහා මාර්ග පහසුකම් සහිත ජලය, විදුලිය හා ආරක්ෂිත තාප්ප හෝ වැටවල් වලින් සමන්විත ස්ථානයක් කුලියට ගැනීමට අවශ්‍යව ඇත. | 2020 ඔක්තෝබර් 15 දින ප.ව. 02.00 | දකුණු පළාත් සපයා ගැනීම් කමිටුව | ප්‍රධාන ඉංජිනේරු - බෙදා:නඩත්තු (ද.ප.) කාර්යාලය, ලං.වි.ම., 187/3,බණ්ඩාරනායක පෙදෙස, ගාල්ල<br>දුර. හා ෆැක්ස් අංකය: 091-2230802 | | | ප්‍රධාන ඉංජිනේරු - බෙදා:නඩත්තු (ද.ප.) කාර්යාලය, ලං.වි.ම., 187/3, බණ්ඩාරනායක පෙදෙස, ගාල්ල | ප්‍රධාන ඉංජිනේරු - බෙදා:නඩත්තු (ද.ප.) කාර්යාලය, ලං.වි.ම., 187/3, බණ්ඩාරනායක පෙදෙස, ගාල්ල | අදාළ නොවේ. | NCB |

ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් සපයාගැනීම් කමිටුවේ සභාපති විසින් හැකියාවැති සැපයුම්කරුවන් වෙතින්, ජාත්‍යන්තර / ජාතික තරගකාරී ලංසු ඉදිරිපත් කිරීමේ පදනම මත මුද්‍ර, තබන ලද ලංසු කැඳවන අතර,එම ලංසු ඉදිරිපත් කළ යුත්තේ ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් මිලදී ගන්නා ලද ලංසු පොත් පමණක් උපයෝගී කරගෙනය.

අපේක්ෂිත ලංසු ඉදිරිපත් කරන්නන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පමණක් ලංසු පොත් නිකුත් කරනු ලැබේ. අවශ්‍ය වූ විටක ඔවුන් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුකූලව ලියාපදිංචි විය යුතුය.

ලංසු භාර ගන්නා අවසාන දිනයට කලින් දින දක්වා සෑම ලංසු පොතක් වෙනුවෙන්ම ඉහත 6 වන තීරුවේ සඳහන් මුදල ගෙවා ලංකා විදුලිබල මණ්ඩලයේ අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මගින් 0900 පැය සිට 1500 පැය දක්වා සාමාන්‍ය වැඩ කරන දිනයන් තුළ මිලදී ගත හැක. මේ සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී නමින් ලියන ලද බැංකු අණකරයක් මගින් හෝ මුදල් මගින් හෝ ගෙවිය හැක.

විදේශීය තානාපති කාර්යාල /වෙළඳ කොමිෂන්වලට, ලංසු පොත්වල තොරතුරු පිටපත් ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී නොමිලේ ලබා ගත හැක. එමෙන්ම ලංසු පොත් අපේක්ෂිත ලංසු ඉදිරිපත් කරන්නන් හා ඔවුන්ගේ නියෝජිතයින්ට අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කළ හැක.

ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔවුන්ගේ අනුමැතිය ලත් නියෝජිතයින් ඉදිරිපිටදී ඉහත තීරු අංක 9 හි සඳහන් ස්ථානයන්හිදී ලංසු භාරගැනීම අවසන් කරන වේලාවේදීම, එසේ ඉදිරිපත් කරන ලද සියලුම ලංසු විවෘත කරනු ලබන අතර, ප්‍රමාදව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මීට අදාළ සියලු විස්තර හා පැහැදිලි කිරීම් විමසිය යුත්තේ ලංසු පොත් නිකුත් කරනු ලබන ලංකා විදුලිබල මණ්ඩලයේ අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන ඉංජිනේරු වෙතිනි.

✷ ICB - **අන්තර්ජාතික තරගකාරී ලංසු**, NCB - **දේශීය තරගකාරී ලංසු**

**සාමාන්‍යාධිකාරී**

ටෙන්ඩර් අයිතමයන් සඳහා අදාළ තොරතුරු පිටපත් **www.ceb.lk** නිල වෙබ් අඩවියෙන් භාගත කරගැනීමට හැකිය.

**ලංකා විදුලිබල මණ්ඩලය**

**இலங்கை மின்சார சபை**

**CEYLON ELECTRICITY BOARD**

2020 ඔක්තෝබර් 01 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ **රේඩියෝ ගුරුවරයා**

අංක 14 II පත්‍රය පැය. 01 මිනිත්තු 15

**2020 වසරේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් ඉදිරිපත් කරන රේඩියෝ ගුරුවරයා වැඩසටහන් මාලාව ඇසුරින් සකස් කරන ලද පෙර පුහුණු ප්‍රශ්න පත්‍රය**

**01. මේ ඡේදය කියවන්න. ඉන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරා ලියන්න.**

කටින් අල්ලාගෙන සිටි පාන් කැබැල්ලේ වූ කිරි රස ලේනාගේ දිවට දැනී ඇත. ඌ වරෙක පාන් කැබැල්ල දෙස කෙළින් ම බලමින්, එහි රසය විඳ ගනී. කැදර ලෙස එකවර ගිල දමනවා වෙනුවට ඌ මඳ වේලාවක් නාද කරමින් සතුට පළ කරයි. නැවතීමකින් තොරව සෙලවෙන උඳුපියල්ලක් තරම් වූ මුවපොඩිය ළං කරමින් පාන් කැබැල්ල ටිකෙන් ටික කටින් කඩාගෙන කයි.

(අහස පොළොවට ළං වෙලා - රංජිත් ධර්මසිරි)

- ❖ ලේනාගේ දිවට දැනී ඇත්තේ කුමක්ද? ..........
- ❖ ඌ සතුට පළ කරන්නේ කෙසේද? ..........
- ❖ ලේනාගේ මුව පොඩිය දක්වා ඇත්තේ කෙලෙස ද?..........
- ❖ ඒකවචන ක්‍රියා පද දෙකක් ඇත. ඒ මොනවාද? .......... ..........
- ❖ ටික යන අදහස ගෙනෙන සමාන පදය කුමක්ද?..........
- ❖ දීර්ඝ ඇදය යෙදී ඇති අකුරක් සොයා ලියන්න. ..........
- ❖ නීරස විරුද්ධ පදය සොයා ලියන්න. ..........

**02. පහත කවි සම්පූර්ණ කළ යුත්තේ වරහන් තුළ ඇති වචන යොදාගෙන ය.**

- ❖ ඉර බැස යයි .......... තරු බැබළෙයි රෑ අහසයි.
- ❖ සඳ හිනැහෙයි .......... තරු දිදුලයි. මට පුදුමයි
- ❖ තරු යායයි .......... රන් පාටයි හරිම හැඩයි
- ❖ සඳයි තරුයි .......... පුංචි සිතට ෂතුට නැගෙයි

(අඳුරු නැසෙයි / එළිය ගෙනෙයි / සඳ නැග එයි / මල් වාගෙයි)

**03. නිවැරදි අදහස ගෙනෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

- ❖ එක හුස්මට (යම් කිසි කාර්යයක් අවසන් වන තෙක් නොනවත්වා කිරීම / දැඩි සතුටකට පත්වීමේ දී)
- ❖ අනතුරක් නැර (ඉක්මණින් කියවා අවසන් කිරීම / කිසිවක් අත නොහැර කතා කිරීම හා ලිවීම)

**04. හිස්තැනට සුදුසු යුගල පදය යටින් ඉරක් අඳින්න.**

- ❖ අපි .......... පිරිසිදුව තබා ගනිමු. (කෙළි සෙල්ලම් / ගෙවල් දොරවල්)
- ❖ පාරේ .......... තදබදය වැඩිය (වතුපිටි / යාන වාහන)

**05. පහත වාක්‍යය නිවැදිව ගළපා ලියන්න.**

- ❖ ටික / දර / අපි / ගනිමු / ගෙට
..........
- ❖ අහසේ / පාවෙති / වළාකුළක් / මහ
..........

**06. සුදුසු විරාම ලකුණු යොදන්න.**

- ❖ හාල් කිලෝවක මිල කීය ද

**07. අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.**

- ❖ (ත්‍යාග ප්‍රධානය / ත්‍යාග ප්‍රදානය) ❖ (අළුයම / අලුයම)

**08. විරුද්ධ පදය ලියන්න.**

- ❖ ආදරය .......... ❖ පුහුණුව ..........

**09. ලියන භාෂාවට හරවන්න.**

- ❖ මං උදෙන් ම කුඹුරට ගියා ..........


**10. ප්‍රස්ථාව පිරුළ සම්පූර්ණ වීමට සුදුසු වචනය යටින් ඉරක් අඳින්න.**

- ❖ .......... රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ (කැකිල්ලේ / චෛතිය)
- ❖ මඬේ හිටවපු .......... වගේ (තොටිල්ල / ඉන්න)

**11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා සිංහල වචනය සිංහල අකුරෙන් ලියන්න.**

- ❖ Playground .......... ❖ Hospital ..........

**12. පහත රූප සඳහා ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරින් ලියන්න.**

 ..........  ..........

**13. පහත දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.**

- ❖ are/ we / Sri Lankans ..........
- ❖ Name/ is / my Sahan ..........

14. "පාට්සෝරු" සිංහලයට හරවා ලියන්න. ..........

15. "මෙහෙට එන්න" දෙමළින් කියන අයුරු සිංහල අකුරෙන් ලියන්න.
..........

16. අටදහස් දෙසීය දහ හතර ඉලක්කමෙන් ලියන්න. ..........

17. පහත කොටුවේ ඇති ඉලක්කම් තුන භාවිතා කරමින් 700 - 800 අතර සංඛ්‍යාවක් ලියන්න. | 6 7 9 | ..........

18. නිපුනි ළඟ බොත්තම් 97 ද, ගයනි ළඟ බොත්තම් 75 ද ඇත. ගයනිට වඩා නිපුනි ළඟ ඇති බොත්තම් ගණන කීයද? ..........

19. මා ළඟ මුද්දර 450 ඇත. තාත්තා මට තව මුද්දර 385 දුන්නේ ය. දැන් මා ළඟ ඇති මුද්දර ගණන කීයද? ..........

20. මීටරයක සෙන්ටිමීටර සියයකි. ඒ අනුවපහත හිස්තැන් පුරවන්න.


- ❖ 8 m 60 cm = .......... ❖ 3m 25cm = ..........

21. පහත රූපවල 1/2 අඳුරු කරන්න.

❖ ❖



22. පහතින් දක්වා ඇති සංඛ්‍යා ගණක රාමුවේ සටහන් කරන්න.




23. ටොෆි 408 ක් බෝතල් දෙකකට සමානව දමන ලදී. එක් බෝතලයකට දැමූ ටොෆි ගණන කීයද? ..........

24. රුපියලකට සත කීයද? ..........

25. කොළ පැහැයෙන් යුත් ඉලක්කම් හතරකින් යුත් නෝට්ටුව කුමක්ද?
රුපියල් ..........


26. පහත ඝනවස්තුවල නම් ලියන්න.




.......... ..........

27. පහතින් දැක්වෙන්නේ එක්තරා පාසලක සරඹ සංදර්ශනය සඳහා සිසුන් පිරිසක් භාවිතා කරන ලද තොප්පි පිළිබඳ තොරතුරු ය. එය ප්‍රස්තාරයේ දක්වන්න.


| පාට | ප්‍රමාණය |
|---|---|
| රතු | 5 |
| නිල් | 8 |
| කහ | 4 |
| සුදු | 3 |




28. පහත ඉත්තේ ඇති මල් ගණන රෝම සංඛ්‍යාවෙන් ලියන්න.



29. පහත සටහනේ ඉතිරි දිශා නම් කරන්න.





**❖ 30 සිට 59 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

30. සුදු කමිසයක් හා සුදු කලිසමක් ඇඳ අත් හා පා ආවරණ මෙන්ම හෙල්මටයක් පැළඳ ක්‍රීඩාවේ යෙදෙන්නේ,
1) ක්‍රිකට් ක්‍රීඩකයා 2) පාපන්දු ක්‍රීඩකයා
3) හොකී ක්‍රීඩකයා

31. වීදුරු බඳුන් අතැතිව දිවීම,
1) ආරක්ෂිත ක්‍රියාවකි 2) අනාරක්ෂිත ක්‍රියාවකි
3) සාධාරණ ක්‍රියාවකි


32. පහත දැක්වෙන්නේ බණ්ඩක්කා කරලකි. ඒ පිළිබඳව නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) කොළ පාටය - වැලක සෑදෙයි
2) කහ පාටය - ගසක සෑදෙයි
3) කොළ පාටය - ගසක සෑදෙයි






33.  මේ රූපයේ සිටින්නේ මීයෙකි. උගෙන් බෝවන රෝගයකි,
1) සෙම්ප්‍රතිශ්‍යාව 2) දියවැඩියාව
3) මහාමාරිය

34. මී පැණි සහ දඩමස් ආහාරයට ගැනීමට ආසා කරන ජන වර්ගය වනුයේ,
1) ඉංගී්‍රසීන් ය. 2) බර්ගර් ජාතිකයන් ය.
3) ආදිවාසීන් ය.

35. පලතුරු වර්ග ඉදවීම සඳහා යොදා ගන්නා අහිතකර රසායන ද්‍රව්‍යයකි,
1) අජිනමොටෝ 2) සීනි 3) කාබයිට්

36.  මේ ආගමික සංකේතය අයත් ආගම වන්නේ,
1) හින්දු 2) ඉස්ලාම්
3) කතෝලික

37. හෙළයේ මහා ගත්කතුවරයා යන විරුදාවලිය ලැබූ තැනැත්තා වනුයේ,

1)  2)  3) 

38. ආහාර කල්තබා ගැනීම පුරාණයේ (අතීතයේ) යොදා ගත් ක්‍රමයක් නොවන්නේ,
1) දුම් ගැසීම 2) වැලියට සැඟවීම
3) ශීතකරණයේ තැබීම

39. බෞද්ධ ධර්මය ලිය වී ඇති ධර්ම ග්‍රන්ථය වනුයේ,
1) ත්‍රිපිටකය 2) ධර්ම ප්‍රදීපිකාව
3) ජාතික කතා පොත් වහන්සේ



ii පිටුවට

i පිටුවෙන්

40. සිත් පහන් කිරීමේ ක්‍රියාවලියේ පළමුවන අවස්ථාව වනුයේ,
1) මානසික ලිහිල් බව 2) අධිෂ්ඨානය
3) ශාරීරික ලිහිල් බව

41. පහත ආහාර අතරින් නොගත යුතු යැයි කියවෙන ආහාර වර්ගයකි,
1) නිවඩු හාලේ බත් 2) කරවිල
3) තෙල් බේරෙන බැදපු ජාති

42. ජාතික ගීය රචනා කළේ කවරෙකු විසින් ද?
1) එස් මහින්ද හිමි 2) එස්.එම්. සෙනෙවිරත්න මහතා
3) ආනන්ද සමරකෝන් මහතා

43. අපේ ජාතික සත්වයා වනුයේ,
1) 
2) 
3) 

44. ''රන් දැකිත ගෙන නිති සැරසෙනවා'' මෙය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයට ද?
1) පතල් කවි 2) පාරු කවි 3) ගොයම් කවි

45. රාජ්‍ය ලාංඡනයේ කඩුවක් අතින් ගත් පලාපෙති වටය මැද සිටින සිංහයා ගෙන් දැක්වෙන්නේ,
1) සිංහල ජාතිය 2) ලක්වැසියන්ගේ එඩිතර බව
3) රට හා විනයගරුක ජනතාව



46. ශ්‍රී ලාංකික පුරුවිසයන විසින් සමරනු ලබන ජාතික උත්සවයකි,
1) වෙසක් උත්සවය 2) නත්තල් උත්සවය
3) නිදහස් උත්සවය


47. පහත උපකරණ අතරින් කුඹලා විසින් පරිහරණය කරනු ලබන උපකරණය
1) 
2) 
3) 

48. ඇළදොළවල ජීවත්වන මාළුවෙකි,
1) තල්මසා 2) මෝරා 3) කාවයියා

49. ඇඟිලි හැඩයේ ශාක පත්‍රයට උදාහරණයකි,
1) කෙසෙල් 2) අඹ 3) දෙල්

50. මුදුන් මුල නොමැති ශාකයකි,
1) පේර 2) දෙළුම් 3) කිතුල්

51. වෛද්‍යවරයෙකු ලෙස හඳුනා ගැනීම සඳහා සිය රථයේ ඉදිරිපස අලවා ඇති ලාංඡනය කුමක්ද?
1) 
2) 
3) 

52. ශාක පත්‍ර ආහාරයට ගන්නා සතෙකු නොවේ,
1) 
2) 
3) 

53. එරබදු මල් පිපෙන කාලය වනුයේ,
1) ජනවාරි 2) අප්‍රේල් 3) දෙසැම්බර්

54. සිංහල ඉතිහාසය ලිය වී ඇති ග්‍රන්ථය,
1) ගුත්තිලය 2) ජාතක කතා පොත
3) මහාවංසය

55. ගොවියාගේ හතුරෙකි,
1) ගැඩවිලා 2) මී මැස්සා 3) ගොළුබෙල්ලා

56. පාංශු ජීවීන් (පසෙහි ජීවත්වන) වර්ගයට අයත් වේ.
1) වඳුරා 2) ගැඩවිලා 3) ගොළුබෙල්ලා

57. ශාකයක් නිතර ම හිරු එළිය දෙසට ම ගමන් කරයි. මේ ප්‍රකාශය,
1) හරිය 2) වැරදි ය 3) ටිකක් හරිය

58. ගී කියන මාළුන් සිටිනවා යැයි කියවෙන්නේ,
1) පුත්තලමේ 2) මන්නාරමේ 3) මඩකලපුවේ

59. ''මගේ රට සුන්දරය'' යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. වාක්‍යයක වචන පහක්වත් තිබිය යුතුය.

❖ ...........................................................................
...........................................................................
❖ ...........................................................................
...........................................................................
❖ ...........................................................................
...........................................................................

---

**ඊයේ (30) පත්‍රයේ පළ වූ පළමුවැනි ප්‍රශ්න පත්‍රයේ ඉතිරි කොටස**

37. මල්වල හොඳ සුවඳ මිස පාටක් කොහිද?
ඒවා මොළොක් බව තේරෙනවා මට ද?
එළියක් කියා මොනවත් හෙම තියෙනව ද?
ඇයි අම්මේ මට තේරුම් ගන්නට බැරි මොකක්ද?

මේ කවියේ ප්‍රශ්න අයත් දරුවා ළඟ තිබිය හැකි දුබලතාව කුමක්ද?
1) කන් ඇසීම 2) ඇස් නොපෙනීම
3) ගඳ සුවඳ නොදැනීම

38. ගීතා, නීතාට අක්කා කියයි. නීතා සීතාට කතා කරන්නේ නංගී කියාය. මේ අනුව මෙහි වැඩිමල් තැනැත්තිය ලෙස අපට සිතිය හැක්කේ,
1) සීතා ය 2) ගීතා ය 3) නීතා ය

39. නිවසක් අසළ පේළියට ජාතික කොඩි සිටුවා ඇත. නිවස ඉදිරිපිට අලංකාර ලෙස කුඩාරම් ඉදිකර පුටු ද තබා ඇත. මල් ගසා සරසන ලද සුදු පැහැති කාරයක් ද ඒ අසලම ඇත. සතුටින් එහි ජනයා සිටිති. ජයමංගල ගාථා ද ඇසේ එහි ඇත්තේ,
1) පිරිත් දේශනයකි 2) මංගල උත්සවයකි
3) සංගීත සාදයකි

40. තපස් රකිනවා - කෙතේ ඉන්නවා
මාළු සොයනවා - කියන්න මගේ නම
1) පිළිහුඩුවා 2) කොකා 3) කිඹුලා

---

**රේඩියෝ ගුරුවරයා ආචාර්ය මණ්ඩලය** - ප්‍රියන්ත කේ ගීගනගේ මහතා - කොළඹ ආනන්ද විද්‍යාලය, ශ්‍යාමලී ප්‍රියංගිකා කුමානායක මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, සුභානි පල්ලෙවෙල මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, ගයනි දේවරාජ මිය - කොළඹ ලුම්බිණි විද්‍යාලය, මංජුල උස්හෙට්ටි මහතා - ප්‍රාථමික පුහුණු (විද්‍යාපීඨ) සහ ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්ව විද්‍යාලය),

රේඩියෝ ගුරුවරයා සෑම බදාදා සහ බ්‍රහස්පතින්දා දිනකම ප.ව. 4.00 – 5.30 දක්වා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ස්වදේශීය සේවය සහ විදුල ළමා ගුවන්විදුලියෙන් (තරංග මාලා 91.7 FM / 91.9 FM) ප්‍රචාරය වන අතර වැඩසටහනට අදාළ ප්‍රශ්න පත්‍රය සෑම බදාදා සහ බ්‍රහස්පතින්දාවකම දිනමිණ සමග ඔබට ලබා ගත හැකිය.නිෂ්පාදනය - සුමනා අබේසිංහ සහ සුභානි වැලිවිට

---

# මඩකලපුව ධීවරයන්ට සහන දෙන්න

## ඇමැති ඩග්ලස් දේවානන්දාගෙන් උපදෙස්

**බුද්ධිකා ඉඹුලාන**

මත්ස්‍ය සම්පත් අහිමි වීම නිසා ආර්ථික වශයෙන් අපහසුතාවයට පත් මඩකළපුව ධීවර කාර්මිකයන්ට සහන සලසන්නැයි ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා අමාත්‍යංශ නිළධාරින්ට උපදෙස් ලබා දී ඇත.

ධීවර අමාත්‍යංශයේ පැවති මහජන හමුවට පැමිණි මඩකළපුව නාවලඩි ග්‍රාමීය ධීවර සංගම් නියෝජිතයන් පිරිසක් තම ප්‍රදේශයේ මත්ස්‍ය කර්මාන්තයට ඇතිවී තිබෙන තර්ජන මෙන්ම ප්‍රදේශයේ වාසය කරන පවුල් විශාල ප්‍රමානයකගේ ජීවනෝපායට තර්ජනයක් වී ඇති බව පෙන්වා දීමෙන් පසු ඇමැතිවරයා මෙම උපදෙස් ලබා දී තිබේ.

මඩකළපු දිස්ත්‍රික්කය පුරා සිදුකරන නිති විරෝධි ධීවර කර්මාන්තය හා මඩකළපු වැවේ සිදුවන මත්ස්‍ය වඳවීම හේතුකොටගෙන ඒ ආශ්‍රිතව කර්මාන්තයේ යෙදෙන පවුල් 11000 කට පමණ ආර්ථික වශයෙන් දැඩි බලපෑම් එල්ලවී ඇතිබව නියෝජිත පිරිසඇමැතිවරයාට පෙන්වාදුන් අතර ඔවුන්ගේ ආර්ථිකයට යම් පිටුවහලක් වන ලෙසද ඉල්ලා ඇත.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා එවකට ධිවර ඇමැතිවරයාව සිටින කාලයේ මඩකළපු වැව කොටස් වශයෙන් ගෙන මත්ස්‍ය සම්පත් මුදාහැරීම හා සංරක්ෂණය කරමින් ධිවර කර්මාන්තයට ඉඩ සලසා තිබුනද මේවන විට එම තත්ත්වයන් මග හැරි ධිවරයන්ට රිසිසේ දැල් භාවිතා කරමින් කර්මාන්තයේ යෙදීම නිසා මෙම තත්ත්වය උද්ගතව ඇතිබව නියෝජිත පිරිස ඇමැතිවරයාට පෙන්වා දුන්හ.

මඩකළපු මෝය ප්‍රදේශයේ දීර්ඝ කාලයක සිට වැලි ඉවත් නොකිරිම හේතුවෙන් මත්ස්‍ය ආයෝජනයට තර්ජනයක් වී ඇති බවදමෙමනියෝජිතයේ ඇමැතිවරයා හමුවේ පැවැසූහ.

ධිවර සංගම් නියෝජිතයන්ගේ ගැටලු පිළිබඳව අවධානය යොමු කළ ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා ධිවර දෙපාර්තමෙන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසන්න ගිනිගේ මහතාට උපදෙස් ලබා දෙමින් කියා සිටියේ මඩකළපුවේ අපහසු තාවයට පත්මෙම ධිවර කාර්මිකයන්ට අවශ්‍ය සහන ලබාදිමට කටයුතු කරන ලෙසත්, මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් තමන්ට ලබා දෙන ලෙසත්ය..

## පහන් තරුව



ප්‍රකට අධ්‍යාපනඥවරියක, විදුහල්පතිනියක, පෙළපොත් සම්පාදක වරියක සහ ගත්කතුවරියක ලෙස දශක පහකට අධික කලක් විශිෂ්ට මෙහෙවරක් ඉටු කළ කලා භූෂණ චන්ද්‍රලතා ලියනගේ මහත්මිය දැයෙන් සමුගෙන ඔක්තෝම්බර් පළවෙනිදට වසර 4 ක් සපිරෙයි.

තුන් තිස් පැයේ මට ඇහෙනා පිරිත් ස්වරය අම්මා
ලද පස් මලින් පුද දුන්නත් මදි පින්බර අම්මා
පෙහෙවස් අරන් නිවනට යන මතු බුදුවන අම්මා
තුසිතයේ ඉඳන් සෙත් පතනා සිරිදෙව් දුව අම්මා

මග නොමඟ පහදා දුන් පහන් තරුව අම්මා
සිත දෙවොලක් කරන් නිතින බුදු බන කියු අම්මා
වෙහෙර මහා දේවී විලස එඩි බල දුන් අම්මා
සඳ පහනකි ඔබ නිකැලැල් ලොව පුබුදන අම්මා

ගිරි සිරසට නැග තනියම පාමුල බැලූ අම්මා
මුදු හදකින් නෙතු කැල්මෙන් යුග අත් බැඳි අම්මා
දරු පිරිවර පණසේ රැකි මහ සයුරයි අම්මා
දුක් ගින්දර නිවනු කෙලෙස නැවත එන්න අම්මා

සහසක් දූ දරුවන් හට සිප් කිරි පෙවූ අම්මා
දන්කුඩ කා සුරස බොජුන් දන් දුන් මගෙ අම්මා
දිවි සරතැස නිවා ලන්න නුගසෙවණයි අම්මා
ඒ සෙවණේ යළි උපදිම් නිවන් දකින් අම්මා

**ශ්‍රීමත් ඉන්ද්‍රජිත් ලියනගේ**

# වසංගතය තුළ විදෙස් ශ්‍රමිකයන් සුරැකිය යුතුයි

## විදෙස් ශ්‍රමිකයන්ගේ හඬ එකමුතුව

**බුද්ධි කරුණාරත්න**

විදේශ රටවල් වල සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් රටට විදේශ විනිමය ගෙන ඒමට සිය ශ්‍රමය වැය කළත් ලොව පුරා පැතිරෙන කොරෝනා වසංගතය හේතුවෙන් ඉතාම දුක්ඛිත තත්ත්වයකට පත්වී සිටින ඔවුන්ට පිහිටක් වීම ආණ්ඩුවේ සහ පුරවැසියන්ගේ යුතුකම බව විදේශ ශ්‍රමිකයන්ගේ හඬ වෙනුවෙන් අදහස් ප්‍රකාශ කරන එම එකමුතුවේ මයිකල් ජෝකින් මහතා කීවේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ ශ්‍රමික සංක්‍රමන සහ වසංගත තත්ත්ව හමුවේ ජාතික සිවිල් සමාජ සහ වෘත්තීය සමිති උපදේශනය නමින් පසුගිය සැප්. 28 සහ 29 දෙදින තුළ කොළඹ දී පැවති සමුළුවට සහභාගී වෙමිණි.

රටේ ක්‍රියාකාරී මට්ටමේ පවතින වෘත්තීය සමිති සහ සිවිල් සංවිධාන 40කට අධික ප්‍රමාණයක් සහභාගී වූ මේ අවස්ථාවේදී ගත් තීරණ ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත ඉදිරිපත් කිරීමද එදින සිදු විය.

ජෝකින් මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙසේද කීවේය. මිලියන 1.8කට වැඩි විදේශගත ශ්‍රමිකයන් වර්ෂයකට අමෙරිකානු ඩොලර් බිලියන 8කට වැඩියෙන් මේ රටට එවනවා. මේ අය විපතට



පත්වී සිටින අවස්ථාවේ ඔවුන් බලා කියා ගැනීම අප සැමගේ යුතුකමක්.

විදේශගත ශ්‍රමිකයන් මේ රටේ විරැකියාව තුරන් කිරීමට උදව් වෙනවා. මෙතරම් පිරිසක් විදේශගතව රැකියා කිරීම නිසා ඒ අය සම්බන්ධ විරැකියා ප්‍රශ්නය විසඳෙනවා. ඒත් මේ රටේ පවතින කම්කරු නීති සහ රෙගුලාසි විදේශගත ශ්‍රමිකයන්ට අදාළ වන්නේ නැහැ. ඔවුන් අයිතිවාසිකම් අහිමි පිරිසක් ලෙස බොහෝ දුක් ගැහැට විඳිනවා. මේ ගැන කථා කිරීම වගේම ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අප කටයුතු කළ යුතුයි.

ඇතැම් මාධ්‍ය ආයතන විදේශ ශ්‍රමිකයන් සම්බන්ධ සිද්ධි වාර්තා කරන්නේ වැරදි ආකාරයටයි. සාමාන්‍ය කාලයේදී පවා දුක් ගැහැට විඳින විදේශගත ශ්‍රමිකයන් කොරෝනා වසංගත සමයේ ඉතාම දැඩි ලෙස දුක් කරදර වින්දා. බොහෝ අයට රැකියා අහිමි වුණා. වේතන අහිමි වුණා. සෞඛ්‍ය පහසුකම් සීමිත වුණා. ශාරීරික හා ලිංගික හිංසනයට ලක් වුණා. අධික තදබදය සහිත කඳවුරු වල ඔවුන් සිටින්නේ නිසි සෞඛ්‍ය පහසුකම් පවා නොමැතිවයි. ආපසු සිය රටට පැමිණීමට නොහැකිව ඉතාම සීමිත පහසුකම් යටතේ ඔවුන් දුක් විඳිනවා.

මෙම සම්මන්ත්‍රණයට වෘත්තීය සමිති, සිවිල් සංවිධාන, නීතිවේදීන්, මාධ්‍යවේදීන් සහ විදේශගතව රැකියා කළ නියෝජිතයන් රැසක් සහභාගී වූ අතර දෙදින පුරා පැවති වැඩමුළුව අවසානයේ එක්රැස්කරගත් වටිනා අදහස් හා යෝජනා විදෙස් රැකියා බලධාරීන් වෙත බාරදීමද සිදු විය.

ඡායාරූප - සාලිය රූපසිංහ

## කැබිනට් තීරණ

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි

### දීඝවාපිය ප්‍රතිසංස්කරණය හා සංරක්ෂණයට කැබිනට් අනුමැතිය

දීඝවාපී චෛත්‍යය කඩිනමින් ප්‍රතිසංස්කරණය හා සංරක්ෂණය කිරීම සඳහා වන අවශ්‍යතා ඉටු කර ගැනීමට අරමුදල් රැස් කිරීම සඳහා භාරකාර අරමුදලක් පිහිටුවීමටත් ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතාගේ සභාපතිත්වයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශ නියෝජනය වන පරිදි පත් කරන අනුකමිටුවක් හා ඒ සඳහා වන සහායක කමිටු මඟින් ජනාධිපති කාර්යසාධක බළකායේ අධීක්ෂණය යටතේ මෙම ප්‍රතිසංස්කරණ හා සංරක්ෂණ කටයුතු සිදු කරනු ලැබීමටත් කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

මීට අදාළ යෝජනාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

### කිරිඳි ඔය ජල පිරියම් යන්ත්‍රාගාරය වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය නිම කිරීමට අනුමැතිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද කිරිඳි ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පැරණි ජල පිරියම් යන්ත්‍රාගාරයේ වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමේ අපේක්ෂාවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පැවරීමටත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමටත් වූ යෝජනාවට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමිව තිබේ.

මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී එවකට නිවාස අමාත්‍යාංශය විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරනු ලැබ ඇත. එහෙත් මෙතෙක් එම ව්‍යාපෘතියේ කටයුතු නිම කර නොමැති අතර මේ වන විට සමස්ත ප්‍රගතිය සියයට 40ක් පමණ වේ. මෙම ඉදිකිරීම් කටයුතු සඳහා පැරණි පවිත්‍රාගාරයේ වර්තමාන ධාරිතාව සියයට 50කින් අඩු කර ඇති අතර, ඒ හේතුවෙන් ප්‍රදේශයේ ජනතාවට ප්‍රමාණවත් පරිදි ජලය ලබා ගැනීමට නොහැකි වීමෙන් ඔවුන් දැඩි අපහසුතාවට පත්ව ඇත. එබැවින් මෙම ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමේ අපේක්ෂාවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත පැවරීමටත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමටත් මෙමඟින් අපේක්ෂා කෙරේ.

### "One Health Poultry Hub" ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමකට කැබිනට් අනුමැතිය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එක්ව (සම සහභාගීත්වයෙන්) එක්සත් රාජධානියේ Royal Veterinary College සමඟ "One Health Poultry Hub" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීමට කැබිනට් අනුමැතිය හිමිව තිබේ.

මීට අදාළ යෝජනාව අධ්‍යාපන අමාත්‍ය ජී.එල්. පීරිස් මහතා විසින් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. එක්සත් රාජධානියේ Royal Veterinary College සමඟ පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එක්ව (සම සහභාගීත්වයෙන්) එක්සත් රාජධානියේ ගෝලීය අභියෝග සඳහා පර්යේෂණ අරමුදලෙහි මූල්‍ය දායකත්වය සහිතව "One Health Poultry Hub" යනුවෙන් පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනයේ වර්ධනයක් ඇති කිරීමත් දේශීය කුකුළු කර්මාන්තය අපනයන ක්ෂේත්‍රයට යොමු කිරීමේදී පැනනැඟෙන ගැටලු හඳුනාගෙන තාක්ෂණික හා මානව සම්පත් සංවර්ධනය මඟින් නිෂ්පාදන කටයුතු නිවැරදි මඟකට යොමු කිරීමත් මෙම පර්යේෂණ ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ. එක්සත් රාජධානියේ ගෝලීය අභියෝග සඳහා පර්යේෂණ අරමුදල විසින් මෙම ව්‍යාපෘතියට වසර 05ක කාලයක් සඳහා බ්‍රිතාන්‍ය පවුම් 700,000ක ප්‍රදානයක් ලබා දීමට එකඟතාව පළ කරනු ලැබ ඇත.

### රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල මුද්‍රණ කටයුතු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට දීමට අනුමැතිය

ස්වකීය අමාත්‍යාංශ යටතේ මුද්‍රණ ආයතන පවත්වාගෙන නොයන සියලු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල මුද්‍රණ අවශ්‍යතාවල වටිනාකමින් සියයට 25ක ප්‍රමාණයක් නොඉක්මවන පරිදි එම මුද්‍රණ කටයුතු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙතින් ඉටු කරවා ගැනීමට පියවර ගත යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණක් ගෙන තිබේ.

රජයේ ආයතන විසින් සිය මුද්‍රණ කටයුතු සඳහා වාර්ෂිකව විශාල මුදලක් දේශීය හා විදේශීය පෞද්ගලික ආයතන වෙත ගෙවනු ලබන බව පෙනී ගොස් ඇත. එම කරුණ සැලකිල්ලට ගෙන ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා ඉදිරිපත් කළ යෝජනාව අනුව අමාත්‍ය මණ්ඩලය විසින් මෙම තීරණය ගනු ලැබිණි.

### සහනාධාර ලෙස පරිසර හිතකාමී පොහොර ලබා දීමේ නියමු ව්‍යාපෘතියට අනුමැතිය

2020 යල කන්නයේ සිට කාබනික පොහොර සහනාධාර ලබා දීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් අත් කර ගත් සාර්ථකත්වය සැලකිල්ලට ගෙන, 2020/2021 මහ කන්නයේ දී හෙක්ටයාර 48,000ක පරිසර හිතකාමී පොහොර භාවිත කරමින් වී වගා කටයුතු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කළේය.

රසායනික පොහොර සහනාධාර වැඩසටහන යටතේ 2020 යල කන්නයේ සිට කාබනික පොහොර සහනාධාර ලබා දීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 250ක ප්‍රතිපාදන වෙන් කිරීමට 2020 පෙබරවාරි මස 20 වැනි දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය හිමි විය. ඒ අනුව දිස්ත්‍රික්ක 14ක හෙක්ටයාර 25,000ක පමණ කොම්පෝස්ට්, කාබනික දියර පොහොර සහ ජෛව පොහොර භාවිත කරමින් වී වගා කර ඇති අතර, එමඟින් රසායනික පොහොර භාවිතය සියයට 30 - 50ක ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකි වී ඇත.

### පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීමේ නීති කෙටුම්පත් සම්පාදනයට අනුමැතිය

පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතය, තොග රැස් කිරීම, නිෂ්පාදනය කිරීම සහ හුවමාරු කිරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතියට ශ්‍රී ලංකාව විසින් 2017 දෙසැම්බර් 13 දින අස්සන් කර ඇත. එම සම්මුතියේ 9 වැනි වගන්තියේ විධිවිධාන පරිදි අදාළ ක්‍රියාවන් වැළැක්වීම සහ මැඩලීම සඳහා දඬුවම් පැමිණවීම ඇතුළුව සුදුසු නෛතික, පරිපාලන සහ වෙනත් ක්‍රියාමාර්ග ඇතුළත්ව සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ව්‍යවස්ථා සම්පාදනය කිරීම ශ්‍රී ලංකාව සිදු කළ යුතු වේ.

ඒ අනුව, දැනටමත් නීති කෙටුම්පත් සම්පාදක සකසන ලද පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නීතිපතිවරයා ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ ද ඇතුළත් කරමින් එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට අධිකරණ ඇමැති අලි සබ්‍රි මහතා ඉදිරිපත් කළ යෝජනාවට ඇමැති මණ්ඩලය මෙසේ අනුමැතිය ලබා දුන්නේය.

### උතුරු මැද මහ ඇළ හා වයඹ මහ ඇළ ඉදිකිරීම් ප්‍රසම්පාදනයට කැබිනට් අනුමැතිය

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ අදියර - 1 ඉදිකිරීම් සහ අදියර - 2 ශක්‍යතා අධ්‍යයනය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇමෙරිකානු ඩොලර් මිලියන 675ක අරමුදල් සලසා දීමට එකඟ වී ඇත.

ඒ අනුව ව්‍යාපෘතියේ අදියර - 1 යටතේ කොන්ත්‍රාත් පැකේජ 17ක් ප්‍රදානය කිරීමට නියමිත අතර, ඉන් කොන්ත්‍රාත් පැකේජ 10ක් මේ වන විට ප්‍රදානය කර තිබේ. එම වැඩසටහන යටතේ උතුරු මැද මහ ඇළ හා වයඹ මහ ඇළ ඉදිකිරීමේ ප්‍රසම්පාදනයට අදාළව වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබේ.

එහිදී මහකිතුල පිවිසුම් උමඟ, මහකිතුල හා මහකිරුළ ගබඩා ජලාශ ඉදිකිරීම සහ මහකිතුල ජලාශයේ සිට මහකිරුළ ජලාශය දක්වා පෝෂක ඇළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති China CAMC Engineering Co. Ltd. සමඟ සාකච්ඡා සම්මුති මඟින් එකඟ වන මිල ගණන් මත එම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සූදානමින් සිටී.

උතුරු මැද පළාත හා උතුරු පළාතේ වවුනියා දිස්ත්‍රික්කය දක්වා වාරි හා පානීය ජලය සැපයීම සඳහා ඉදිකෙරෙන කිලෝමීටර 95.86ක් දිග උතුරු මැද මහ ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මින්නේරිය, ගිරිතලේ, හුරුළු සංරක්ෂිත වනාන්තර හා අභය භූමි හරහා ඉදිකිරීමට සැලසුම් කර ඇති කිලෝමීටර 28ක් දිග උමං මාර්ගයේ කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබෙන China State Construction Engineering Corporation Ltd. සමඟ සාකච්ඡා කර එකඟ වන මිල ගණන්වලට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පියවර ගැනීමට ද නියමිතය.

### යුක්තිය පසිඳලීමට විශේෂ ඒකකයක් අධිකරණ අමාත්‍යාංශයේ ස්ථාපනයට අනුමැතිය

අධිකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අධිකරණ අමාත්‍යාංශය යටතේ විශේෂ ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය හිමිව තිබේ.

2019 වර්ෂය අවසානයේ දී රටේ සියලුම අධිකරණවල අවසන් නොවූ නඩු 766 - 784ක් පැවති අතර, එම තත්ත්වයට කඩිනමින් පිළියම් යෙදීම අත්‍යවශ්‍ය කරුණක්ව තිබේ. නඩු ප්‍රමාදයන්ට හේතු වන ගැටලු විසඳීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, නීති ප්‍රතිසංස්කරණය, අධිකරණ ස්වයංක්‍රියකරණය හා ධාරිතා සංවර්ධනය යන සංරචක ඔස්සේ අවශ්‍ය පියවර ගත යුතු බව ද හඳුනාගෙන ඇත.

ඒ අනුව, අධිකරණ අමාත්‍ය අලි සබ්‍රි මහතා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන නීති ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ දායකත්වය ලබා ගනිමින් වසර 3ක කාලයක දී අධිකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අධිකරණ අමාත්‍යාංශය යටතේ විශේෂ ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය හිමි විය.

### අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය කිරීමට අනුමැතිය

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත තවදුරටත් සංශෝධනය කිරීමට සහ ඒ අනුව, ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීමට කැබිනට් අනුමැතිය ලැබී තිබේ.

අධිකරණ ඇමැති අලි සබ්‍රි මහතා මේ සම්බන්ධයෙන් වන යෝජනාව ඉදිරිපත් කර ඇත.

ඒ අනුව අධිකරණය වෙත සිරකරුවන් රැගෙන යෑමේදී මෑතක දී සිදු වූ අවාසනාවන්ත සහ ප්‍රචණ්ඩකාරී සිදුවීම් ඉදිරියේ දී වැළකෙන අයුරින් රක්ෂිත බන්ධනාගාරගත කිරීමට අදාළ නියෝග දීර්ඝ කිරීම සඳහා සැකකරුවන් හෝ චූදිත තැනැත්තන් මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට පැමිණවීමේ අවශ්‍යතාව ඉවත් කිරීමට මහෙස්ත්‍රාත්වරයාට බලය පැවරීම සඳහා මෙම පනත සංශෝධනය කිරීමට යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණ ද පාර්ලිමේන්තුවේ වාර අවසන් කිරීම හේතුවෙන් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී තිබේ.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය යටතේ පැන නැඟී ඇති නව ප්‍රවණතා ද සැලකිල්ලට ගෙන, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සම්බන්ධතා භාවිතයෙන් චූදිතයන්ට සහ සැකකරුවන්ට අධිකරණය ඉදිරියේ පෙනී සිටීම සඳහා පහසුකම් සැලසීමටත් වෙනත් නඩුවක අධිකරණ නියෝගයක් යටතේ දැනටමත් පුනරුත්ථාපනය වෙමින් පවතින චූදිතයන්ට සහ සැකකරුවන්ට ද එවැනි පහසුකම් සලසා දීමටත් හැකි වන පරිදි මෙවර කැබිනට් මණ්ඩල රැස්වීමේ දී ඊට අදාළ යෝජනාවට මෙසේ අනුමැතිය හිමි විය.

### මාස 8කට ඩීසල් ආනයනයට දිගුකාලීන කොන්ත්‍රාත්තු ප්‍රදානයට අනුමැතිය

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි 2020 ඔක්තෝබර් 15 වැනිදා සිට 2021 ජුනි 14 වැනිදා දක්වා මාස අටක කාලය සඳහා ඩීසල් වර්ග ආනයනය කිරීමේ දිගුකාලීන ප්‍රසම්පාදනයන් පිරිනැමීමට බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහතා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබේ.

ඒ අනුව උපරිම සල්පර් ප්‍රතිශතය 0.05ක් වන ඩීසල් බැරල් 1,365,000ක් සහ උපරිම සල්පර් ප්‍රතිශතය 0.001ක් වන ඩීසල් බැරල් 315,000ක් ප්‍රසම්පාදනය M/s Emirates National Oil Company, Singapore (ENOC) වෙත පිරිනැමීමටත් උපරිම සල්පර් ප්‍රතිශතය 0.05ක් වන ඩීසල් බැරල් 1,120,000ක් ප්‍රසම්පාදනය M/s Emirates National Oil Company, Singapore (ENOC) වෙත පිරිනැමීමටත් නියමිතය.

# ඉස්ලාම් අන්තවාදය ජාතික ආරක්ෂාවට බලපෑමක් බවට සැක හිතුණත් අවදානමක් බව වැටහුණේ නෑ

## හිටපු ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු සාක්ෂි දෙයි

සුභාෂිණී සේනානායක

ජාතික ආරක්ෂක කවුන්සිල රැස්වීමේ දී ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ කරුණු මඟින් ජාතික ආරක්ෂාවට බලපෑමක් එල්ල කරන බවට සැකයක් මතු වුවත් විශාල අවදානමක් පවතින බවට වැටහීමක් නොලැබුණු බව හිටපු ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතා පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම හමුවේ පසුගියදා (26) පැවසීය.

රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් අවස්ථා කිහිපයකදී ඉස්ලාම් අන්තවාදය ගැන ආරක්ෂක කවුන්සිලයට කරුණු ඉදිරිපත් කළ අතර, එමඟින් ජාතික ආරක්ෂාවට සිදු වන තර්ජනය කෙතරම් විශාල ද යන්න සිතා ගත නොහැකි වුවත් යම් කලබලයක් ඇති විය හැකි බවට හැඟීමක් ඇති වූ බව ඔහු කොමිසම හමුවේ කීය.

කොමිසම විසින් සිදු කරන ලද දැනුම් දීමකට අනුව පැමිණි හිටපු ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතා කොමිසම සිදු කළ විමසීම්වලට පිළිතුරු දෙමින් මෙම කරුණු කියා සිටියේය.

**කොමිසම:** රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා විසින් ආරක්ෂක කවුන්සිලයේ දී ඉස්ලාම් අන්තවාදය ගැන කතා කරනවා ඔබට මතකයක් තිබෙනවාද?

**සාක්ෂිකරු:** සිදුවීම් ගැන කතා කර තිබෙනවා අවස්ථා කිහිපයක දී.

**කොමිසම:** ජාතික ආරක්ෂාවට එයින් කුමන අන්දමේ බලපෑමක් තිබෙනවා ද යන්න කීමට හැකිද?

**සාක්ෂිකරු:** සමහර වෙලාවට පින්තූර පෙන්වනවා. අපට තේරෙනවා මොනවහරි දෙයක් වෙන්න යනවා කියලා. නමුත් එම ඉදිරිපත් කිරීම්වලින් ප්‍රහාරයක් වගේ දෙයක් ගැන අදහසක් ආවේ නැහැ.

ජාතික බුද්ධි සේවයේ අධ්‍යක්ෂ සහ යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ ඉස්ලාම් අන්තවාදය ගැන බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් කරුණු ඉදිරිපත් වූයේද යන්න පිළිබඳ සාක්ෂි මෙහෙය වූ රජයේ අධිනීතිඥවරයා විසින් නඟන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ඔස්ටින් ප්‍රනාන්දු මහතා පැවසුවේ ඉස්ලාම් අන්තවාදය ගැන පමණක් නොව, එල්.ටී.ටී.ඊ. සම්බන්ධයක් පවතින බවට වන තොරතුරු මෙන්ම දේශපාලනික වශයෙන් ජනතාව කුලප්පු වෙන ආකාරයේ සමාජගතව තිබෙන තොරතුරු ද ඔවුන් ඉදිරිපත් කරන බවයි.

එහිදී පුද්ගල ක්‍රියාකාරකම් ගැන හා එම පුද්ගලයන් හඳුනාගනිමින් විස්තර ඉදිරිපත් කිරීම සිදු වුණාද යන්න රජයේ අධිනීතිඥවරයා සක්ෂිකරුගෙන් ප්‍රශ්න කළේය.

එහිදී සාක්ෂිකරු වන ඔස්ටින් ප්‍රනාන්දු මහතා පැවසුවේ එය නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි අතර, තමන් ජනාධිපති ලේකම් ධුරය දරන සමය තුළ සහරාන් සම්බන්ධයෙන් බරපතළ ප්‍රශනයක් නොවුණු බවත් සහරාන් සම්බන්ධයෙන් නිශ්චිතව දැනගත්තේ ප්‍රහාරයෙන් පසුව බවත් ය.

**රජයේ අධිනීතිඥවරයා:** NTJ ක්‍රියාකාරකම් ගැන ආරක්ෂක කවුන්සිලයේ දී කතා වුණාද?

**සාක්ෂිකරු:** එය නිශ්චිතව කියන්න බැහැ.

**රජයේ අධිනීතිඥවරයා:** ඉස්ලාම් අන්තවාදය ගැන ආරක්ෂක කවුන්සිලයේ දී රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ විසින් කරුණු ඉදිරිපත් කරනු ලැබුවාද?

**සාක්ෂිකරු:** සමහර වෙලාවට සඳහන් වුණා. දැඩි ලෙස කතා වුණා කියා හිතෙන්නේ නැහැ.

**රජයේ අධිනීතිඥවරයා:** ඉස්ලාම් අන්තවාදී කටයුතු ගැන කියද්දී ජනාධිපති කියපු දේවල් ගැන මතකයක් තිබෙනවාද?

**සාක්ෂිකරු;** විශේෂ දෙයක් නැහැ. පරීක්ෂණ කරගෙන යන්න කියපු එක තමයි කිව්වේ.

**රජයේ අධි නීතිඥවරයා:** අගමැතිතුමා මොනවගේ තත්ත්වයකද හිටියේ?

**සාක්ෂිකරු:** ගොඩාක් වෙලාවට අහගෙන ඉන්නවා.

මේ අතර අගමැතිතුමා තමන් ජනාධිපති ලේකම්ව සිටි සමයේ පැවැති ආරක්ෂක කවුන්සිල රැස්වීම් සඳහා පැමිණි නමුත් සියලුම රැස්වීම්වලට පැමිණියාද යන්න මතකයක් නොමැති බවත් තමන් එම අවස්ථාවල ජනාධිපතිතුමාගේ කනට කර කුමක් හෝ කියා රැස්වීමෙන් යන බව ද ඔස්ටින් ප්‍රනාන්දු මහතා සඳහන් කළේය. පොලිස්පතිවරයා ද ආරක්ෂක කවුන්සිලයේ දී කරුණු දක්වන අතර, එම සාකච්ඡාවේ දී මතු වන කරුණු සම්බන්ධයෙන් කතා කරන බව ද ඔහු කියා සිටියේය. ඔහු තවදුරටත් කියා සිටියේ, හමුදා බුද්ධි අධ්‍යක්ෂවරයාගේ කරුණු දැක්වීම අඩුවෙන් සිදු වූ බවයි. ජනාධිපතිවරයා හා අගමැතිවරයා අතර පැවැති විරසකය සම්බන්ධයෙන් ද එහිදී කොමිසමේ අවධානය යොමු විය.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඔස්ටින් ප්‍රනාන්දු මහතා පැවසුවේ මුල් කාලයේ එවැනි ප්‍රශනයක් නොතිබුණු බවකි. රැස්වීමට ප්‍රථම ඔවුන් දෙදෙනා කතා කරන අතර රැස්වීමට පැමිණෙන්නේද එකටම බවත් එය මිනුම් දණ්ඩක් ලෙස ගතහොත් පුවත්පත් වාර්තා අසත්‍ය බවත් ප්‍රනාන්දු මහතා සඳහන් කළේය. මෙම තත්ත්වය මත 2018 ඔක්තෝබර් 28 වැනිදා ජනාධිපතිවරයා විසින් කරන ලද කතාව දෙස බැලුව හොත් අප දන්නා දේවලට වඩා දේවල් තිබී ඇති බව පෙනෙන්නේ යැයි ද හෙතෙම කියා සිටියේය.

"නමුත් දින 52න් පසු කැබිනට් පත් කිරීමේ දී විරසකය වැඩි බවක් පෙනේනෙන්ට තිබුණා." යනුවෙන් ද හිටපු ජනාධිපති ලේකම්වරයා ප්‍රකාශ කළේය.

**රජයේ අධිනීතිඥවරයා:** අවසානාත්මක තීන්දු තීරණ ගැනීමට ආරක්ෂක මණ්ඩලය මැළිකමක් දැක්වූවාද?

**සාක්ෂිකරු:** එහෙම කියන්න අමාරුයි. නමුත් සමහර කාරණා ගැන හොඳට කතා කරනවා.

**රජයේ අධිනීතිඥවරයා:** ආරක්ෂාවට හොඳ නැති දේවල් කියද්දී ජනාධිපති හා අගමැති මොන වගේ ප්‍රතිචාරද දැක්වූයේ?

**සාක්ෂිකරු:** තීරණ ගැනීමේදී දෙපළම ගැටුමක් පෙන්නුවේ නැහැ. තීරණ ගැනීමේදී දෙන්නම එකට හිටිය කියලා කියන්න පුළුවන්.

**රජයේ අධිනීතිඥවරයා:** ජනාධිපතිවරයා හා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා අතර හැසිරීම දැකලා තිබෙනවද?

**සාක්ෂිකරු:** ආරක්ෂක කවුන්සිලයේ දී තමයි මම දකින්නේ. වෙනත් අවස්ථාවක ජනාධිපති ලේකම් කාර්යාලයේ හෝ නිලන්ත ජයවර්ධන මහතා ඉන්නවා මම දැකලා නැහැ. වෙන විදිහකට සම්බන්ධකම් තිබෙන්න පුළුවන්. ඒක මම දන්නේ නැහැ.

**රජයේ අධිනීතිඥවරයා:** ජනාධිපති ආරක්ෂක ඇමැති ලෙස කටයුතු කරන විට ජනාධිපතිවරයා නොමැති අවස්ථාවල වැඩ බලන ආරක්ෂක අමාත්‍යවරයකු අවශ්‍යයි කියල හිතනවද?

**සාක්ෂිකරු:** අවශ්‍යයි. මං කියන්නේ මොනවා හරි කලබලයක් වුණොත් ක්‍රියාත්මක වෙන්න කෙනෙක් ඉන්න ඕනෑ. එය මගේ පෞද්ගලික මතය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් සඳහන් වෙනවා.

එමෙන්ම ආරක්ෂක කවුන්සිලයේ දී ගනු ලබන තීන්දු තීරණ ගැන යළි අවධානය යොමු වන්නේද යන්න පිළිබඳව ද සාක්ෂි මෙහෙය වූ රජයේ අධිනීතිඥවරයා සක්ෂිකරුගෙන් විමසුවේය. එහිදී ඔහු පැවසුවේ එලෙස යළි අවධානය යොමු කිරීමට නම මිනිට්ස් තබා ගත යුතු වන අතර, එවැනි වාර්තා සටහනක් ආරක්ෂක මණ්ඩල රැස්වීමේ දී තබා නොගන්නා බවයි. ආරක්ෂක මණ්ඩල රැස්වීම නිශ්චිත න්‍යාය පත්‍රයකට, නිශ්චිත වෙලාවක තැබීම අවශ්‍ය වුණත් අවාසනාවන්ත ලෙස එය සිදු නොවුණු බවත් ඉන්දියාව, ඇමෙරිකාව වැනි රටවල ස්වදේශ කටයුතු ඇමැති පවා ආරක්ෂක මණ්ඩල රැස්වීමේ සාමාජිකයෙක් වන අතර ලංකාවේ තත්ත්වය එසේ නොවන හෙයින් ආරක්ෂක මණ්ඩලයේ සිටිය යුතු නමුත් නොසිටින අය තොරතුරු සොය සොයා යා යුතුව තිබෙන බවත් ඔස්ටින් ප්‍රනාන්දු මහතා පැහැදිලි කළේය.

අවම වශයෙන් ශ්‍රී ලංකාව තුළ ආරක්ෂක මණ්ඩලය කැඳවීමට හෝ නිසි ක්‍රමවේදයක් නොමැති බව ඔහු කියා සිටියේය.

**රජයේ අධිනීතිඥවරයා:** ආරක්ෂාවට වඩා සංහිඳියාවට ප්‍රමුඛස්ථානයක් ලැබුණු බවට මෙම කොමිසමට සාක්ෂි ඉදිරිපත්ව තිබෙනවා. ඔබ එය විශ්වාස කරනවද?

**සාක්ෂිකරු:** ආරක්ෂාවට වඩා සංහිඳියාවට අවධානය යොමු වුණා කියන්න බැහැ. නමුත් වෙන කාලවලට වඩා සංහිඳියාවට ප්‍රමුඛස්ථානයක් ලැබුණා. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළත් ජනාධිපතිතුමාගේ කාර්යභාරය ජාතික සමගිය හා සංහිඳියාව ඇතුළත්ව තිබුණා.

අයිඑස්අයිඑස් සංවිධානය තහනම් කරන සාකච්ඡාවක් පැමිණියාද යන්න පිළිබඳව ද මෙහිදී සක්ෂිකරුගෙන් විමසුවේය.

"ලෝකය පුරා එම යෝජනාව ආවා. නමුත් ජාතික ආරක්ෂක කවුන්සිලයේ දී එවැනි දෙයක් කතා වුණේ නැහැ. ලෝකයටම අයිඑස්අයිඑස් වෙතින් සිදු වෙලා තිබෙන හානිය අනුව නම් එහෙම වෙන එක හොඳයි." යනුවෙන් ඔහු ඊට පිළිතුරු දුන්නේය.

ආරක්ෂක ලේකම් ධුරයට ආරක්ෂාව ගැන දැනුමක් තිබෙන තැනැත්තෙක් පත් විය යුතු බවට හැඟීමක් තිබෙනවාද යන්න පිළිබඳ සක්ෂිකරුගෙන් කළ විමසීමට පිළිතුරු දුන් ඔස්ටින් ප්‍රනාන්දු මහතා පැවසුවේ එයට එකඟ නොවන බවයි.

"ඉන්දියාව, චීනය, පාකිස්ථානය වගේ රටවල ආරක්ෂක ගැටුම් වැඩියි. නමුත් මම දන්නා තරමට එම ලේකම්වරු හමුදාවේ හිටපු අය නෙවෙයි. ලංකාව තුළ හිටපු ලේකම්ලා බහුතරයක් මගෙත් මිතුරන්. ඔවුන් හමුදාවේ සිටි නිලධාරීන් නොවෙයි. ඔවුන් සිවිල් පරිපාලකයන්. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විදිහට හමුදාවේ කෙනෙක් ඉන්න ඕනෑ නම් ධීවර කටයුතු අමාත්‍යාංශයට ධීවරයෙක් දාන්න වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයට ගොවියෙක් දාන්න වෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශයට කොන්දොස්තර කෙනෙක් දාන්න වෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහතා වුණත් ආරක්ෂක ලේකම්වරයා වෙලා යුද්ධය ජය ගත්තේ හමුදාවෙන් ඉවත් වී වසර 15කට පමණ පසුවයි. යුද්ධයක් දිනන්න ලේකම්වරයකුට හෝ හමුදාපතිවරයකුට තනිව බැහැ. කණ්ඩායමක් විදිහට තමයි ක්‍රියාත්මක වෙන්න ඕනේ. එහෙම ක්‍රියාත්මක වන ආකාරය තමා වැදගත් වෙන්නේ.

ඉතා වැදගත් ලිපියක් FNA යොදා පහළ නිලධාරීන්ට වගකීමට දැමීම ඉතා නුසුදුසු බව ද ඔස්ටින් ප්‍රනාන්දු මහතා පැවසුවේය. "ලියුමේ තිබෙන්නේ ඉතාම වැදගත් කාරණයක් නම් එයට කඩිනමින් ක්‍රියාත්මක වීමයි වැදගත් වෙන්නේ. අදාළ නිලධාරීන්ට කියා ඉක්මණින් ක්‍රියාත්මක වීමයි වැදගත් වෙන්නේ. කළමනාකරුවකු ලෙස එය කිරීමට හැකි වෙන්න ඕනෑ."

1978 සුළි සුළඟ එන විට තමන් පොලොන්නරුවේ දිසාපති ලෙස කටයුතු කරමින් සිටි අතර, එම පුවත් ලද සැණින් ජනතාව දැනුවත් කර ඔවුන් ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීමට නිලධාරීන් සමඟ එක්ව කටයුතු කළ බවත් ලියුමට FNA ගහල බලගෙන හිටියා නම් එදා සුළි සුළඟෙන් සිය ගණනක් මියයන බවත් ඔස්ටින් ප්‍රනාන්දු මහතා වැඩිදුරටත් සාක්ෂි දෙමින් කියා සිටියේය.

> නිලන්ත ආරක්ෂක කවුන්සිලයට තොරතුරු දුන්නත් සහරාන් ගැන දැනගත්තේ ප්‍රහාරයෙන් පස්සෙ

> තීරණ ගැනීමේදී ජනපති හා අගමැති ගැටුමක් පෙන්නුවේ නෑ

> පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බලන ජනාධිපති කොමිසම

> වැදගත් ලිපියක් FNA යොදා පහළ නිලධාරීන්ගේ වගකීමට දැමීම සුදුසු නෑ

> මාත් ලියුම්වලට FNA ගැහුවා නම් 1978 සුළි සුළඟිනුත් සිය ගාණක් මැරෙනවා

# මම පළාත් සභාවලට වගේම 13ට එරෙහි වූ පුද්ගලයෙක්

## එහෙව් මටම තමයි පළාත් සභා රාජ්‍ය ඇමැතිකම ලැබුණේ

### රාජ්‍ය ඇමැති රියද් අද්මිරාල් සරත් වීරසේකර






**උපාලි කරුණාරත්න**

තමා රාජද්‍රෝහීවුවත් දේශද්‍රෝහී නොවන බව පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය ඇමැති රියද් අද්මිරාල් සරත් වීරසේකර මහතා පැවසීය.

රාජ්‍ය ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේ පෙරේදා (29) තුම්මුල්ල ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ පැවැති 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය අවශ්‍යද? සම්මන්ත්‍රණයට සහභාගි වෙමිනි. සිංහල වීර විදහනය මගින් මෙය සංවිධාන කර තිබිණි. මේ අවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව පෙත්සමක් අත්සන් කිරීමද ආරම්භ කරන ලදී. රටට මේ වන විට දේශ හිතෛෂී පාලකයෙක් පත් වී සිටින බවද රාජ්‍ය ඇමැතිවරයා කීය.

වැඩිදුරටත් රාජ්‍ය ඇමැති සරත් වීරසේකර මහතා මෙසේද කීය.

මම පළාත් සභාවලට මෙන්ම 13 වැනි සංශෝධනයට එරෙහි වූ පුද්ගලයෙක්. එහෙව් මට තමයි පළාත් සභා රාජ්‍ය ඇමැතිකම ලැබුණේ. එම පත්වීම ලැබුණට පසු පැවැති ප්‍රථම මාධ්‍ය හමුවේදී පළාත් සභා පිළිබඳ මගේ ස්ථාවරය කුමක්දැයි ඇසූ විට මා පිළිතුරු ලබා දුන්නේ මගේ ස්ථාවරයේ කිසිදු වෙනසක් වී නොමැති බවයි.

දහතුනට සහ පළාත් සභාවලට අප විරුද්ධ වෙන්නේ යම් යම් තීරණ මත. මේ රට බෙදන්න,පෙඩරල් ක්‍රමයකට අප කැමැති නැහැ. 1987 වඩමාරච්චි මෙහෙයුමේදී ඩෙන්සිල් කොබ්බෑකඩුව සහ විජය විමරලරත්න මහත්වරුන්ගේ ඇස්වල තිබූ කඳුලු මා දුටුවා. මොකද, දින කීපයකින් එදා ප්‍රභාකරන් විනාශ කර යුද්ධය නවත්වන්න තිබුණා. එය කළානම් ත්‍රස්තවාදය නිම වෙන්න තිබුණා. නමුත් ඉන්දියාව අපට බලපෑම් කළ නිසා එදා සිටි රාජ්‍ය නායකයෝ යුද්ධය නැවැත්තුවා. 13 වැනි සංශෝධනය ගෙනාවා. මෙයට එදා කිසිවකු කැමැති වුණේ නැහැ.

මේ රට කොටස්වලට බෙදා පාලනය කළයුතු නැහැ. මේක කුඩා රටක්. මධ්‍යම රජයෙන් මෙය පාලනය කරන්න පුළුවන්. අවුරුදු 2500ක් තිස්සේ මේ රට ඒකීය රටක් ලෙස තබා ගැනීමට අපේ මුතුන් මිත්තන් ලක්ෂ ගණනක් දිවි පිදුවා. එහෙම රටක් 13 වැනි සංශෝධනයකින් බෙදන්න හදනවා.

TNA කියන්නේ මොකක්ද? විග්නේෂ්වරන් කියන්නේ මොකක්ද? හිස් තර්ක තමයි ඔවුන් කරන්නේ. විග්නේෂ්වරන් සිංහලයන් සමග කොළඹ සිටි පුද්ගලයෙක්. එහෙව් පුද්ගලයා උතුරට ගිහින් කියනවා සිංහලයාට උතුරේ ජීවත් වෙන්න අයිතියක් නැති බව. මෙවැනි පුද්ගලයකුට පළාත් සභා මගින් ඉඩම් හා පොලිස් බලතල ගියොත් මොකද වෙන්නේ. 1948 සිට මෙරට පාලනය කළ සිංහල නායකයෝ දෙමළ ජනතාව සැලසුම් සහගත ලෙස සමූල ඝාතනය කළා කියා ප්‍රඥප්තියක් ඔහු සම්මත කර ගත්තා. 1948 සිට අද දක්වා රට පාලනය කළ සිංහල නායකයෝ දෙමළ කාන්තාවන්ව සැලසුම් සහගත ලෙස වඳ භාවයට පත් කළා කියා ද ප්‍රඥප්තියක්ද සම්මත කර ගත්තා. මොවුන් වෙනම රටක් ලෙස ගමන් කිරීමට පළාත් සභා ඉල්ලනවා.

**මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නාහිමි-**

අප මේ වේලාවෙ 13ක් ඇදගෙන කුමක් කියනවාද කියා ඇතැමුන්ට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. රනිල් වික්‍රමසිංහ මහතාගේ කාලයේ විසිවන සංශෝධනයක් ගැන කතා කළේ 19 වැනි සංශෝධනය තවත් බලවත් කරන්න. හැබැයි මේ පාලන කාලයේ 20 වැනි සංශෝධනය ගෙන එන්නේ 19 වැනි සංශෝධනය අක්‍රිය කරන්න. 13 වන සංශෝධනය නැති නව ව්‍යවස්ථාවක් පිළිබඳවද අප කතා බහ කළා. එය මේ රටේ ජනතාව හැටනව ලක්ෂයක් ඡන්දවලින් පසුගිය ජනාධිපතිවරණයේදී අනුමත කළා.

## නව ව්‍යවස්ථාවක් හැදිය යුත්තේ සුළු ජාතීන් හෝ මහ ජාතිය සතුටු කිරීමට නොවේ

### මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නාහිමි

මේ වන විට පළාත් සභා ස්වභාවික මරණයකට ලක්වෙමින් පවතිනවා. මේකට යළි පණ නොදිය යුතුයි. රජයට මේ අවස්ථාවේ ඉදිරියට යාමට ගැටලු පවතිනවා නම් 20 වැනි සංශෝධනය කර ගත්තට කමක් නැහැ. හැබැයි මේ විස්සෙන් අරින දොරවල්වලින් අශ්වයො මෙන්ම බූරුවොත් රිංගා ගත හැකි බව මතක තබා ගත යුතුයි. ඒ නිසා වහ වහා අලුත් ව්‍යවස්ථාවක් හදන්න ඕනෑ. එහි 13 වැනි සංශෝධනයේ කිසිවක් නොතිබිය යුතුයි. නව ව්‍යවස්ථාවක් හැදිය යුත්තේ සුළු ජාතීන් හෝ මහ ජාතිය සතුටු කිරීමට නොවේ. එය මේ රටේ ඉතිහාසය විසින් සංස්කෘතිය විසින් ඉල්ලා සිටින ව්‍යවස්ථාවක් විය යුතුයි. විනිවිද භාවයෙන් එය ගෙන එන්න ඕනෑ.

මෝදි මහත්තයා පොඩි තෑග්ගක් එක්ක පණිවිඩයක්ද එවා තිබෙනවා. ඔහු 13 වැනි සංශෝධනය ක්‍රියාත්මක වීම පිළිබඳ කතා කළා. අප ඩොලර් මිලියන ගණනට ස්තූතියි කියනවා. හැබැයි 13 වැනි සංශෝධනය ක්‍රියාත්මක කරන්න කියා ලංකාවට කියන්න මොන අයිතියක්ද මෝදි මහත්තයාට තිබෙන්නේ. ලංකාව කියන්නේ ඉන්දියාවේ අසල්වැසියෙක් මිස යටත්වැසියෙක් නොවේ. 13 වැනි සංශෝධනය පිළිබඳ නිරවුල් මනසකින් අප කටයුතු කරන්න ඕනෑ. මිහිඳු හාමුදුරුවෝ පැමිණියේ සිංහල ද්වීපයට. මේක ගලේ කොටපු එකක්.

## 13 අපේ රටට බලහත්කාරයෙන් ගෙනාපු එකක්

### ජනාධිපති නීතිඥ මනෝහර ද සිල්වා

**ජනාධිපති නීතිඥ මනෝහර ද සිල්වා මහතා -**

13 වැනි සංශෝධනය පිළිබඳ පක්ෂව හෝ විපක්ෂව කතා කරන දේශපාලනඥයන් කී දෙනෙක් අද සිටිනවාද?. අප 13ට විරුද්ධයි. එය බලහත්කාරයෙන් ගෙන එන ලද්දක්. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අපට විවිධාකාරයෙන් ජාත්‍යන්තර බලපෑම් එල්ල වෙනවා. මෝදි අගමැතිද නොබෝදා මේ පිළිබඳ අපට මතක් කළා. 13 ගේන්න පෙර එදා ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කළේ ඇඳිරි නීතිය වෙලාවෙ. ඉන්දියාවේ තිබෙන ප්‍රහාරක ගුවන් යානා යම් ප්‍රමාණයකට පහත් කර කොළඹට ඉහළින් පියාසර කළහොත් ඒවායේ ශබ්දයට කොළඹ නගරයේ ගොඩනැගිලිවල වීදුරු බිඳ දැමිය හැකි බව එදා ඉන්දියාවේ නිලධාරියෙක් තමා හා පැවසූ බව මට විදේශ අමාත්‍යාංශයේ නිලධාරියෙක් පැවසුවා.

**ඡායාරූපය-**
**දුෂ්මන්ත මායාදුන්න**



# මහජන බැංකුව
## රන් භාණ්ඩ උකස් වෙන්දේසිය

මහජන බැංකුවේ පොලොන්නරුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයට අයත් පහත සඳහන් ශාඛා සහ සේවා මධ්‍යස්ථානවල 2019.06.30 දින දක්වා උකස් කරන ලදුව පහත උපලේඛනයේ සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ පහත දක්වා ඇති දිනයන්හි සහ ස්ථානයන්හි පෙ.ව. 9.00 ට ආරම්භ කර වෙන්දේසි කරනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය නැවත දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම, ඒකාබද්ධ කොට පැවැත්වීම හෝ මෙවැනි යම් කටයුත්තක් කිරීමේ අයිතිය බැංකුව සතුය.

| ශාඛාව / සේවා මධ්‍යස්ථානය | පහත දින දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ | වෙන්දේසියට යෝජිත දිනය | වෙන්දේසි පරිශ්‍රය |
|---|---|---|---|
| බකමූණ ශාඛාව - 242<br>දියබෙදුම සේවා මධ්‍යස්ථානය - 563 | 2020.10.16 | 2020.10.17/18 | බකමූණ ශාඛාව |
| තඹාල ශාඛාව - 351 | 2020.10.16 | 2020.10.17/18 | තඹාල ශාඛාව |
| වැලිකන්ද ශාඛාව - 254<br>සෙවනපිටිය සේවා මධ්‍යස්ථානය - 933 | 2020.10.21 | 2020.10.22/23 | වැලිකන්ද ශාඛාව |
| දෙහිඅත්තකණ්ඩිය ශාඛාව - 330<br>සිරිපුර සේවා මධ්‍යස්ථානය - 965<br>සඳුන්පුර සේවා මධ්‍යස්ථානය - 733 | 2020.10.23 | 2020.10.24/25 | දෙහිඅත්තකණ්ඩිය ශාඛාව |
| හබරණ ශාඛාව - 203 | 2020.10.23 | 2020.10.24/25 | හබරණ ශාඛාව |
| මැදිරිගිරිය ශාඛාව - 231<br>දියසෙන්පුර සේවා මධ්‍යස්ථානය - 939 | 2020.10.30 | 2020.10.31/ 2020.11.01 | මැදිරිගිරිය ශාඛාව |
| පොලොන්නරුව නගර ශාඛාව - 232<br>ලංකාපුර සේවා මධ්‍යස්ථානය - 580<br>ජයන්තිපුර සේවා මධ්‍යස්ථානය - 734 | 2020.10.30 | 2020.10.31/ 2020.11.01 | පොලොන්නරුව නගර ශාඛාව |
| හිඟුරක්ගොඩ ශාඛාව - 006 | 2020.11.06 | 2020.11.07/08 | හිඟුරක්ගොඩ ශාඛාව |
| පොලොන්නරුව ශාඛාව - 005<br>කදුරුවෙල සේවා මධ්‍යස්ථානය - 835 | 2020.11.06 | 2020.11.07/08 | කදුරුවෙල සේවා මධ්‍යස්ථානය |
| අරලගංවිල ශාඛාව - 253 | 2020.11.06 | 2020.11.07/08 | අරලගංවිල ශාඛාව |

**ප්‍රාදේශීය කළමනාකාර**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,**
**නව නගරය,**
**පොලොන්නරුව.**
**දුරකථන අංක : 027-2223900 / 2224404 / 2225760 / 2226626 / 2226625**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

# මහජන බැංකුව
## ගම්පහ ප්‍රාදේශිකය
## උකස් වෙන්දේසිය 2020

ගම්පහ ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛා හා සේවා මධ්‍යස්ථානවල 2019.02.28 දින දක්වා උකස් කරන ලදුව පහත උපලේඛනයේ සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ, පහත දක්වා ඇති දිනයන් හි හා ස්ථානයේ පෙ.ව. 9.00 ට ආරම්භ කර වෙන්දේසි කරනු ලබන බව මෙයින් දන්වමු.

| ශාඛාව | සේවා මධ්‍යස්ථානය | දින දක්වා බේරානොගත් | වෙන්දේසි දිනය සහ පවත්වනු ලබන ස්ථානය |
|---|---|---|---|
| මල්වාන<br>පූගොඩ<br>දෙල්ගොඩ | දෙම්පේ<br>වැලිවේරිය | 2020.10.16 | 2020.10.17<br>දෙල්ගොඩ |
| නිට්ටඹුව<br>වේයන්ගොඩ | තිහාරිය<br>පස්යාල<br>වතුපිටිවල<br>නයිවල | | 2020.10.17<br>නිට්ටඹුව |
| ගම්පහ<br>යක්කල<br>කිරිඳිවැල | ජා ඇල පාර<br>උඩුගම්පල<br>මුදුන්ගොඩ<br>ඌරාපොල | | 2020.10.17<br>ගම්පහ |
| මරඳගහමුල<br>මීරිගම | දිවුලපිටිය<br>දෙමන්හන්දිය<br>පල්ලේවෙල<br>කොටදෙනියාව | | 2020.10.17<br>මීරිගම |
| මිනුවන්ගොඩ<br>කටුනායක<br>සීදූව | ආඬිඅම්බලම<br>ඇවරියවත්ත<br>රද්දොළුගම | | 2020.10.17<br>මිනුවන්ගොඩ |
| මීගමුව<br>කොච්චිකඩේ | කෙලින්වීදිය<br>පිටිපන - ධීවර සේ.ම.<br>කටාන | 2020.10.17 | 2020.10.18<br>මීගමුව |
| ජා ඇල<br>වත්තල<br>පමුණුගම<br>කඳාන | දෙහියාගාත<br>ඒකල-මඩමහන්දිය<br>වැලිගම්පිටිය<br>ඇලකන්ද<br>වැලිසර | | 2020.10.18<br>ජා ඇල |
| රාගම<br>ගණේමුල්ල<br>කඩවත | මහබාගේ<br>බටුවත්ත<br>වැලිපිල්ලෑව<br>කිරිල්ලවල<br>කඩවත නගර | | 2020.10.18<br>රාගම |
| මහර<br>කිරිබත්ගොඩ<br>කැලණිය | එඬේරමුල්ල<br>මාවරමණ්ඩිය<br>සිංහාරමුල්ල<br>පැලියගොඩ | | 2020.10.18<br>කිරිබත්ගොඩ |

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය මහජනයාට වැඩිදුර දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම, ඒකාබද්ධ කර පැවැත්වීම හෝ යන මෙයින් යම් කටයුත්තක් සිදු කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

**ප්‍රාදේශීය කළමනාකාර - ගම්පහ**
**මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය (ගම්පහ)**
**අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

# මහජන බැංකුව
## උකස් වෙන්දේසිය

හම්බන්තොට ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛාවන් හා සේවා මධ්‍යස්ථානවල **2019-02-28** දින දක්වා උකස් කරන ලදුව පහත උපලේඛනයේ සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් භාණ්ඩ, පහත දක්වා ඇති දිනයන්හි හා ස්ථානයේ පෙ.ව.9.00 ට ආරම්භ කර වෙන්දේසි කරනු ලබන බව මෙයින් දන්වමු.

| ශාඛාව/ සේවා මධ්‍යස්ථානය | පහත දින දක්වා බේරා ගනු නොලබන උකස් භාණ්ඩ | වෙන්දේසි දිනය | වෙන්දේසි ස්ථානය |
|---|---|---|---|
| තංගල්ල - 067<br>තංගල්ල සේවා මධ්‍යස්ථානය<br>විතාරන්දෙනිය සේවා මධ්‍යස්ථානය<br>අම්බලන්තොට - 072<br>හුංගම සේවා මධ්‍යස්ථානය<br>වලස්මුල්ල - 120<br>අගුණකොළපැලැස්ස - 205<br>බෙලිඅත්ත - 244<br>මිද්දෙනිය - 265<br>කටුවන සේවා මධ්‍යස්ථානය | 16-10-2020 | 17-10-2020 | තංගල්ල සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය (තංගල්ල නගර සභා ගොඩනැගිලි පරිශ්‍රයේ පිහිටි) |
| හම්බන්තොට - 007<br>වීරවිල සේවා මධ්‍යස්ථානය<br>පරිපාලන සේවා මධ්‍යස්ථානය<br>සයුරුපාය මාගම්පුර වරාය සේවා මධ්‍යස්ථානය<br>තිස්සමහාරාමය - 061<br>ලුණුගම්වෙහෙර සේවා මධ්‍යස්ථානය<br>සූරියවැව ශාඛාව - 264<br>කුඩාවැල්ල - 288<br>රන්න - 345<br>වීරකැටිය - 350 | 16-10-2020 | 18-10-2020 | තංගල්ල සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය (තංගල්ල නගර සභා ගොඩනැගිලි පරිශ්‍රයේ පිහිටි) |

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය නැවත දැන්වීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම, ඒකාබද්ධ කර පැවත්වීම හෝ යන මෙයින් යම් කටයුත්තක් වුවද සිදු කිරීමේ අයතිය බැංකුව සතුව ඇත.

**ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,**
**තංගල්ල ශාඛාව (දෙවන මහල), නො.146ඒ, මාතර පාර, තංගල්ල.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating